

ජල සම්පාදන අමාත්‍යාංශය
நீர் வழங்கல் அமைச்சு
MINISTRY OF WATER SUPPLY

ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය
தேசிய நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபை
NATIONAL WATER SUPPLY & DRAINAGE BOARD



සෞභාග්‍යයේ දැක්ම ප්‍රකාශනයේ වැඩපිළිවෙලට අනුව
2025 දී සැමට පිරිසිදු පානීය නල ජලය ලබා දීමේ වැඩසටහන උදෙසා
ගම්පහ දිස්ත්‍රිකයේ ජනතාව වෙනුවෙන්
ගම්පහ, අත්තනගල්ල සහ මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ
වාරිමාර්ග අමාත්‍යාංශයේ මෙහෙයවීමෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගින් ඉදිවන

# බස්නාගොඩ ජලාශ ව්‍යාපෘතිය

## සඳහා මංගල පස් පිඩැල්ල කැපීමේ මහෝත්සවය

ජල මූලාශ්‍රය ලෙස බස්නාගොඩ ඇල හරස්කර මීටර 130ක පමණ දිග වේල්ලක් ඉදිකිරීමෙන්
කියුබික් මීටර මිලියන 3.5ක ධාරිතාවයකින් යුතු බස්නාගොඩ ජලාශය නිමකිරීමට නියමිතය.
මෙම වේල්ල උස මීටර 20 ක් වූ මීටර 80 පමණ දිගින් වූ
පස් වේල්ලක් සහ මීටර 50ක් පමණ දිග ගේට්ටු 03 කින් යුත් පිටවානකින් සමන්විත වේ.

කැළණි දකුණු ඉවුර ජල සම්පාදන ව්‍යපෘතිය මගින්
**නව ජල සම්බන්ධතා 120,000**ක් ද
කටාන ජල සම්පාදන ව්‍යපෘතිය මගින්
**නව ජල සම්බන්ධතා 20,000**ක් ද
ගම්පහ ප්‍රදේශයේ ජනතාව වෙත
දැනටමත් ලබා දී ඇති අතර,
ගම්පහ, අත්තනගල්ල සහ මිනුවන්ගොඩ
ඒකාබද්ධ ජල සම්පාදන ක්‍රමය මගින්

### ආවරණය වන ප්‍රදේශ

- ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය - වසම් 101
- අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය - වසම් 151
- මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය - වසම් 121
- මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය - වසම් 34
- මහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය - වසම් 36

### ක්‍රියාත්මක ඉදිකිරීම්

- කරස්නාගල ජල තුළුමුව සහ පොම්පාගාරය (85,000 $m^3$)
- කරස්නාගල ජල පවිත්‍රාගාරය (54,000 $m^3$)
- නිකහැටිකන්ද උස් මට්ටම් ජල තටාකය (10,000 $m^3$)
- නයිවල, මිනුවන්ගොඩ, බැලුම්මහර, පස්යාල, රන්පොකුණුගම නව ජල කුළුණු 05 (1500 $m^3$)
- නව සම්ප්‍රේෂණ නල කි.මී 90
- නව බෙදාහැරීම් නල කි.මී 630
- ගම්පහ කළමණාකරු කාර්යාලය, වැඩබාර නිලධාරී කාර්යාල සහ නිල නිවාස

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
අතිගරු ජනාධිපති
**ගෝඨාභය රාජපක්ෂ** මැතිතුමාගේ
මග පෙන්වීමෙන්
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍ය
ගරු **මහින්ද රාජපක්ෂ** මැතිතුමාගේ
උපදෙස් මත
පාර්ලිමේන්තු මන්ත්‍රී
ගරු **උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ** මැතිතුමාගේ
ආරාධනයෙන්
සංචාරක අමාත්‍ය
ගරු **ප්‍රසන්න රණතුංග** මැතිතුමා,
පළාත් අණ්ඩුකාරවර ඇතුළු
පාර්ලිමේන්තු මැති ඇමතිවරුන් සමගින්
ජල සම්පාදන අමාත්‍ය
ගරු **වාසුදේව නානායක්කාර** මැතිතුමාගේ
සහභාගිත්වයෙන්
වාරිමාර්ග අමාත්‍ය
ගරු **චමල් රාජපක්ෂ** මැතිතුමාගේ
සුරතින්

**2021 අප්‍රේල් මස 20 වන අඟහරුවාදා**
**ප.ව.2.30ට**

එළැඹෙන සුබ මොහොතින්
අත්තනගල්ල,කරස්නාගල ග්‍රාමයේ දී ආරම්භ වන වගයි.

**ඔබ සැමට ආරාධනා!**

ගම්පහ, අත්තනගල්ල සහ මිනුවන්ගොඩ ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය

මුළු ආයෝජනය
රුපියල් මිලියන
**33,060**

ග්‍රාම නිලධාරී වසම්
**443** ක්
ආවරණය කරමින්

නව ජල සම්බන්ධතා
**110,000**
අධික සංඛාවක් ලබා දෙමින්

**600,000**
අධික ජනතාවකට
සෙත සලසමින්

දිනමිණ
The Dinamina
35, ඩී. ආර්. විජයවර්ධන මාවත,
ලේක්හවුස්, කොළඹ.
දුරකතන - 2429429, 2331181, 2421181
ෆැක්ස් - 2429240
(කර්තෘ මණ්ඩලයට පමණයි)
2449069 (පොදු)
ඊ මේල් - editor.dinamina@lakehouse.lk
දැන්වීම් කළමනාකරු - 2429341
2021 අප්‍රේල් 20 අඟහරුවාදා

# වරාය නගරයට පිටුපා අපට ගොඩ යා හැකි ද?

දේශපාලන හා ආර්ථික වශයෙන් තීරණාත්මක අවස්ථාවකට අපි මුහුණ දී ඇත්තෙමු. පවත්නා ආර්ථික පසුබෑම පරාජය කොට වසර කිහිපයකින් දියුණුව කරා පියමනින්නේ ද නැතහොත් කඩාකප්පල්කාරීන්ට ඉඩ දී ආර්ථික අගාධයේ පතුලටම වැටෙන්නේ ද යන්න එහි අර්ථයයි. කොළඹ වරාය නගරය මේ සඳහා පාදක වන ප්‍රධාන සාධකයක් ලෙස පවතී. ආර්ථික විශ්ලේෂකයන්ගේ මතයට අනුව වරාය නගරය යනු මෙරට ආර්ථිකයේ හැරවුම් ලක්ෂයකි. එහෙත් එය සැලැසුම් කළ ආකාරයෙන් ක්‍රියාත්මක කිරීමට ඉඩ නොදීම සඳහා පිරිසක් ඉදිරිපත් වී සිටිති. ඔව්හු මේ වන විටත් ජනතාව මුළා කරමින් සිටිති. ඒ අතර ශ්‍රේෂ්ඨාධිකරණයට ද ගොස් සිටිති. වරාය නගරයට එරෙහිව පෙත්සම් විස්සක් ඉදිරිපත් වී ඇති බව ද කියති.

ශ්‍රී ලංකාව වැනි රාජ්‍යයකට විදේශ ආයෝජනවලින් තොරව ආර්ථික දියුණුවේ මංපෙත් විවර වන්නේ නැත. රට හා රටේ අනාගතය ගැන කල්පනා කරන ඕනෑම කෙනකු පළමුව වටහා ගත යුතු සත්‍යය එයයි. ලෝකයේ කිසිදු රාජ්‍යයක් හුදෙකලාව ඉදිරියට යෑමට උත්සාහ කරන්නේ නැත. එය නූතන ලෝකය තුළ ඉටු නොවන ප්‍රාර්ථනයකි. දිළිඳු රටවල් පමණක් නොව; පොහොසත් රටවල් පවා විදේශීය ආයෝජකයන් ආකර්ෂණය කර ගනු ලබන වැඩසටහන් හඳුන්වා දෙයි. අමෙරිකාව තුළ චීන ආයෝජකයන්ට ඉඩ තිබේ. චීනය තුළ අමෙරිකන් ආයෝජකයන්ට ඉඩ තිබේ. ඉන්දියාව ඉහත රටවල් දෙකෙහිම ආයෝජකයන් පිළි ගනී. බංග්ලාදේශය දකුණු ආසියාවේ ඉහළම ආර්ථික වෘද්ධිය සටහන් කරගෙන ඇති අතර අමෙරිකාව සමඟ ගිවිසුම් ගණනාවක් අස්සන් කර තිබේ.

ශ්‍රී ලංකාවේ බලයට පත් වූ සෑම ආණ්ඩුවක්ම විදේශීය ආයෝජන ගැන කතා කර තිබේ. ඒ සඳහා වැඩසටහන් ද ක්‍රියාත්මක කර තිබේ. එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩු වැඩි වශයෙන් විදේශ ආයෝජන ගැන විශ්වාසය තබාගෙන ක්‍රියා කර ඇත. ජේ. ආර්. ජයවර්ධන පාලන සමයේ මහ කොළඹ ආර්ථික කොමිසම ක්‍රියාත්මක කළ අතර ඊට කිසිවකු විරුද්ධ වූයේ නැත. එම කොමිසමේ වගන්තිවලට අනුව විදේශීය ආයෝජකයන්ට වැඩි නිදහසක් ලබා දී තිබිණි. ආයෝජන කලාප ක්‍රියාත්මක කළ අතර ඒවා නිදහසේ නිෂ්පාදන කටයුතු කරගෙන ගියේය. ඒ මඟින් රටට ආර්ථික වාසි ගණනාවක්ම ලැබිණි. ලැබුණු රැකියා ප්‍රමාණය විශාලය. එහෙත් විපක්ෂය අද වරාය නගරයට විරුද්ධ වී ඇත. එය තනිකරම දේශපාලන කුහකකමක් සේ සැලැකිය යුතුය.

රටේ ඉදිරි ගමනට බාධා කරන ප්‍රධාන බලවේග දෙකක් ඇති බව පැහැදිලිව දැක ගත හැකිය. එක බලවේගයක් ස්වකීය පටු දේශපාලන අරමුණු හා ඉලක්ක පසුපස හඹා යයි. අනෙක් බලවේගය ඕනෑම දෙයකට අකුල් හෙළමින් විරෝධතා පවත්වයි. මේ බලවේගයට අනුව කිසිවක් යහපත් නැත. ශ්‍රී ලංකාව නිදහසින් පසු එක තැන පල්වෙන ආර්ථිකයක් සහිත පසුගාමී රාජ්‍යයක් බවට පත් වී ඇත්තේ මේ බලවේග දෙක නිසාය. ලෝකය දෙස විවෘත මනසකින් බලන්නට හැකියාවක් ඉහත කණ්ඩායම්වලට නැත. එක්කෝ මේ බලවේග පරාජය කළ යුතුය. නැතහොත් ඔවුනට යටත් විය යුතුය. බලවේග පරාජය කළ හොත් රටට ඉදිරි ගමනක් තිබේ. බලවේගවලට පරාජය වුව හොත් රටේ ඊළඟ පරම්පරාවට අනාගතයක් ඉතිරි වන්නේ නැත.

වරාය නගර ව්‍යාපෘතිය නතර කිරීමට සිදු වුව හොත් බරපතළ ගැටලු සමූහයකට මුහුණ දීමට ශ්‍රී ලංකාවට සිදු වනු ඇත. මේ වරාය නගරය ඉදිකිරීම සඳහා චීන රජය වැය කර ඇති මුදල අමෙරිකන් ඩොලර් බිලියන විසිපහකට වැඩිය. එය මුහුද ගොඩකර නවීන තාක්ෂණය ඔස්සේ ඉදි කළ වෙළෙඳ නගරයකි. එබඳු ඉදිකිරීමකට අවශ්‍ය තාක්ෂණය හෝ ප්‍රාග්ධනය හෝ ශ්‍රී ලංකාවට නැත. චීන රජයේ අනුමැතියට යටත්ව චීන සමාගම් මෙබඳු ඉදිකිරීමකට ප්‍රවේශ වන්නේ අනාගත ආදායමක් අපේක්ෂා කරමින්ය. කොයි විදේශීය ආයෝජකයකු වුව රටකට ප්‍රවේශ වන්නේ අනාගත ආදායම් පිළිබඳ ඉලක්කයක් ඇතිවය. එය ව්‍යාපාරවල ස්වභාවය වෙයි. චීන සමාගම් ශ්‍රී ලාංකිකයාට ව්‍යායාම කිරීම සඳහා මුහුද ගොඩ කර පිට්ටනි හදන්නේ නැත.

වරාය නගරයට එරෙහිව විරෝධතා ගොනු කරන අයගේ මූලික තර්කයක් වන්නේ වරාය නගරය ශ්‍රී ලංකාවේ පාලනයෙන් නිදහස්ය යන්නය. මෙය අමූලික බොරුවකි. අදාළ එකඟතාවලට අනුව වරාය නගරයේ පාලනය සඳහා ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවක් පත් කරනු ලැබේ. එම කොමිෂන් සභාවේ කාර්යය වන්නේ එහි කළමනාකරණ කටයුතු මෙහෙයවීමය. ඒ වරාය නගරයේ ආර්ථික පැත්තය. එහි ආරක්ෂාව ශ්‍රී ලංකාවේ නීතියට අනුව සිදු වෙයි. ස්වදේශික පොලිසියට, ත්‍රිවිධ හමුදාවට ඕනෑම අවස්ථාවක වරාය නගරයට ඇතුළුවීමේ අවසරය තිබේ. චීන සමාගම්වලට එහි ආර්ථික කටයුතු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ අයිතිය ඇත්තේ නිශ්චිත කාලසීමාවකට පමණි. එම කාලය අවසන් වීමෙන් පසු වරාය නගරයේ සම්පූර්ණ අයිතිය ශ්‍රී ලංකාව සතු වනු ඇත. එය අපට වාසිදායක තත්ත්වයක් නොවේද?

චීනය ශ්‍රී ලංකාවට හිතවත් රාජ්‍යයකි. චීන - ශ්‍රී ලංකා සබඳතාවලට දිගු ඉතිහාසයක් තිබේ. එහෙත් එම සබඳතා අර්ථදායක කටයුතු සඳහා යොදා ගෙන ඇත්තේ ශ්‍රී ලංකාවේ නායකයන් දෙදෙනකු පමණක් බව ඉතිහාසය විමසන විට පෙනී යයි. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය චීනය සමඟ සබඳතා තර කර ගත් අතර ඒ ඔස්සේ ආර්ථික වාසි ගණනාවක් ද ලබා ගත්තාය. 1972දී පොලී රහිත ණය ලබාදීමට ද, පේෂ කර්මාන්තයේ දියුණුව සඳහා ආධාර ලබා දෙන්නට ද, චීනය ඉදිරිපත් විය. බණ්ඩාරනායක මැතිනියගෙන් පසු චීන - ශ්‍රී ලංකා සබඳතා හොඳින් තහවුරු කරගත් නායකයා වන්නේ මහින්ද රාජපක්ෂ මහතාය. වරාය නගරය මහින්ද මහතාගේ සංකල්පයක් වන අතර එය ඔහුගේ ජනාධිපති කාලය තුළ චීනය සමඟ ඒකාබද්ධ වී ආරම්භ විය. මෙය ඉදිරියට මිස ආපස්සට යා යුතු ව්‍යාපෘතියක් නොවේ.

1927දී මහත්මා ගාන්ධිතුමා ශ්‍රී ලංකාවට පැමිණියේය. එතුමා ශ්‍රී ලංකාවේ ප්‍රධාන නගර ගණනාවක සංචාරය කළ අතර ඒ සෑම අවස්ථාවකදීම ඉල්ලා සිටියේ ඉන්දියාවේ දේශීය රෙදි කර්මාන්තය දියුණු කරන්නට උදව් කරන්න කියාය. රටක නායකයන් මෙන්ම දේශපාලන පක්ෂ ද ජාතික ආර්ථිකය ගැන උනන්දු විය යුතුය. අවාසනාවකට මෙන් විපක්ෂයේ කිසිදු දේශපාලන නායකයකුට ඒ හැඟීම නැත.

දිල්රුගේ සීවිද

| | |
|---|---|
| ඉඳ හිට වැටෙන මහ වැසිවල තතු | පවසා |
| සැඩ වී තිබෙයි ඇළ, දොළ, ගං දිය | රකුසා |
| මරණයෙ දුක් පුවත් ඉන්නට නම් | නොඅසා |
| වතුරට බසින්නට පෙර බලනුව | විමසා |

# වරාය නගර ව්‍යාපෘතියේ නොපෙනෙන පැත්ත



ආචාර්ය සුරතිස්ස දිසානායක
පරිසර විද්‍යා හා සත්ත්ව විද්‍යා අධ්‍යයන අංශය
කොළඹ විශ්වවිද්‍යාලය

කොළඹ නගරය තුළ පෝට් සිටි නොහොත් වරාය නගරය ඉදිකිරීම් කටයුතු ආරම්භ වී බොහෝ කාලයක් ගත වුව ද ඒ සඳහා එල්ල වන විවිධ මතවාද තවමත් පවතී. වරාය නගරය යනුවෙන් හඳුන්වනු ලබන්නේ ශ්‍රී ලංකාවේ භූමියට පිටතින් එකතු වන නව භූමි ප්‍රමාණයකි. එය රටට අලුතින් එකතු වන්නේ සාගරයෙනි. ශ්‍රී ලංකාවේ වර්ග කිලෝමීටර් 65,610ක් වන භූමි ප්‍රමාණයට අලුතින් එකතු වන්නේ වර්ග කිලෝමීටර් 2.69කි. වරාය නගරය ගොඩනැගෙමින් පවතිනුයේ මෙම වර්ග කිලෝමීටර් 2.69ක කොටසෙහිය. හෙක්ටයාරවලින් ගත් විට හෙක්ටයාර 269කි. චීන රජය සමඟ ඇති කර ගනු ලැබූ ගිවිසුමකට අනුව මෙම නව නගරය කොළඹ අන්තර්ජාතික වෙළෙඳ නගරයක් ලෙස ඉදිකෙරේ. මේ සඳහා වැය වන මුදල ඩොලර් බිලියන 15ක් පමණ වනු ඇතැයි ඇස්තමේන්තු කර තිබේ.

මෙම වරාය නගරය බිහිවීමත් සමඟම එය අන්තර්ජාතික වශයෙන් ඉතාමත් වටිනා සන්ධිස්ථානයක් ලෙස සැලකිය හැකිය. එමෙන්ම මෙරටට පැමිණෙන සංචාරකයන් ප්‍රමාණය ද අති මහත් ලෙස ඉහළ යන බව පිළි ගත යුතු කරුණකි. ශ්‍රී ලංකාවේ ඇති අනෙක් භූමි භාගයන් ගත් විට ඉතා කුඩා ප්‍රදේශයක් තුළ විවිධ වූ පරිසර පද්ධතීන් රාශියක් ඇති එකම රට ශ්‍රී ලංකාවය. ශ්‍රී ලංකාව නැරඹීමට පැමිණෙන සංචාරකයන්ට අමතරව තවත් විශාල සංචාරකයන් සංඛ්‍යාවක් මෙම වරාය නගරය ගොඩනැගීම තුළ එයට සම්බන්ධ වීම අනිවාර්යයෙන්ම සිදු වනු ඇත.

## ව්‍යාපෘතීන්ට මුල් තැන

ඕනෑම ව්‍යාපෘතියක් ආරම්භ කිරීමේදී එහි හොඳ නරක දෙවර්ගයම පවතී. සමාජ ආර්ථිකමය තත්ත්වය දෙස බැලූ විට ශ්‍රී ලංකාව සංවර්ධනය වෙමින් පවතින රටකි. සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථිකමය තත්ත්වය නගාසිටුවීමට නම් මෙරට තුළ ආරම්භ කරනු ලබන ව්‍යාපෘති දෙස හොඳින් සලකා බැලීම වටී. එමෙන්ම එම ව්‍යාපෘතීන්ට මුල් තැන දිය යුත්තේ මෙරටේ සංවර්ධනය අත්‍යවශ්‍ය බැවිනි. රටක සංවර්ධනයක් සිදු වේ නම් එම රටේ ජනතාවට සුඛිත මුදිත ජීවිත ගත කිරීමේ හැකියාව නිරන්තරයෙන් හිමි වේ. විදෙස් රටවල සංචාරය සඳහා ගොස් එම රටවල දැ නිරීක්ෂණය කොට සතුටු වී ඒමට හැකියාවක් මෙරට සෑම පුද්ගලයකුටම නැත. සමස්තයක් ලෙස ගත් විට මෙරට බොහෝ ජනතාවට මිල මුදල් අග හිඟකම් තිබේ.

වරාය නගරය වැනි නගරයක් ඉදිකිරීමේදී නූතන තාක්ෂණ ශිල්ප ක්‍රම සියල්ල භාවිත කිරීමට සිදු වේ. එම ඉකිරීම තුළ මිල මුදල් අතින් අග හිඟකම් ඇති පුද්ගලයන්ට ද නව නගර සැලැස්ම තුළ ඇති නවීන දෑ භුක්ති විඳීමටත් ඒවා නරඹා සතුටු වීමටත් ආදි වශයෙන් බොහෝ දෑ විඳීමේ හැකියාව හිමි වනු ඇත. උදාහරණයක් ලෙස මෙම වරාය නගරය තුළ ඉදිවන මොනෝරේල් ක්‍රමය එනම් එක් පීල්ලක් තුළ දිවෙන දුම්රියන්හි අත්දැකීම් ලබා ගැනීමට ද හැකියාව උදා වනු ඇත. සිංගප්පූරුව, අමෙරිකාව වැනි රටවල පවතින සාගර පරිසර පද්ධතීන් හා සම්බන්ධ වුණු සාගර සත්වෝද්‍යාන මෙහි ද ඇති කළ හැකිය. එවිට සාගරවල ජීවත්වන ජීවීන් ස්වාභාවික ලෙසම එම සත්වෝද්‍යාන තුළට පැමිණීමේ හැකියාව ලැබේ. එවැනි සත්වෝද්‍යාන මෙම වරාය නගරය තුළ ද ඇති කිරීම මඟින් ශ්‍රී ලාංකික ජනතාවට ද එම අත්දැකීම විඳීමේ අවස්ථාව හිමි වන අතර ඉන් විනෝදය මෙන්ම අධ්‍යාපනය ද ලබා ගත හැකිය.

## මෙරටට පමණක් සීමා වී ද?

මෙවැනි නව නගර ඉදිකිරීමේ සංකල්පය මෙරටට පමණක් සීමා වුණු දෙයක් නොවේ. වෙනත් රටවල ද මීට වඩා විශාල වපසරියක නව නගර ඉදිකර තිබේ. අරාබි මුහුදේ ගොඩනගා ඇති ඩොලර් බිලියන 10.7ක් වැය වන සයින්බෝ ඕමාන් ඉන්ඩස්ට්‍රියල් සිටි ද වර්ග කිලෝමීටර් 11ක භූමි භාගයකින් යුක්ත වූවකි. කිං අබ්දුල්ලා ඉකොනොමික් සිටි, බ්ලූ සිටි, ග්‍රේට්ෆීල්ඩ් අයිලන්ඩ්, නිව් සිටි, වෝටර් ෆෝල් සිටි එවැනි නව නගරයන්ට උදාහරණ කිහිපයකි. මේ අයුරින් සලකා බලන කල්හි මැලේසියාව, නයිජීරියාව, චීනය, ඉන්දියාව, සවුදි අරාබිය, ඉක්වදෝරය, ඕමානය, කසකස්තානය, කෙන්යාව වැනි රටවල් 40ක මෙවැනි නව නගර ඉදිවෙමින් පවතී.

නව නගර සියල්ල ඉදිවන්නේ නූතන තාක්ෂණය උපයෝගී කර ගෙන වීම මෙහි ඇති විශේෂත්වයකි. එම නිසා මේවායේ සැලැස්ම ඉතා අලංකාරය. ඩොලර් බිලියන 500ක් පමණ වැය කරමින් තනනු ලබන ඊජිප්තුව සහ ජෝර්දානය තෙක් විහිදෙන නව නගරය වන්නේ සවුදි අරාබියේ ඇති නියෝම් නගරයයි. එය නූතනම නගරය ලෙස හැඳින්විය හැකිය. එය සවුදි අරාබි මුහුදු තීරයේ වර්ග කිලෝමීටර් 26,500ක භූමි ප්‍රදේශයකි. මේ වන විට අලුතින් ඉදිකර අවසන් වී ඇති නව නගරයක් ලෙස මැලේසියාවේ පුත්‍රජයා නගරය හැඳින්විය හැකි අතර එය ඉතා අලංකාරවත් නගරයක් වන අතර වර්තමානයේ සංචාරකයන්ගේ පාරාදීසයක් බවට ද පත් ව තිබේ.





කොළඹ වරාය නගරය

## පරිසරයට සිදු වන හානි

නව නගර ඉදිවීමේදී පරිසරයට හානි සිදු වීම නොවැළැක්විය හැකි තත්ත්වයකි. ජෛව විවිධත්වයට වන මෙම හානි දෙස බැලූ විට ඒවා නොසලකා හැරිය හැකි අවම ප්‍රමාණයේ හානි ලෙස පෙනෙන්නට තිබේ. ඊට හේතුව වන්නේ නව නගර නිර්මාණය ප්‍රධාන වශයෙන් සිදු වන්නේ නූතන තාක්ෂණ භාවිතයෙන් වීමය. එනම් මෙම නගර නිර්මාණයේදී පුනර්ජනනය කළ හැකි සම්පත් බහුලවම යොදා ගැනේ. ඒ තුළ පරිසර දූෂණය අවම වේ. එනම් නව නගර තුළ ඉදිවන ගොඩනැඟිලි සහ උද්‍යාන හරිත නගර සහ හරිත උද්‍යාන සංකල්පයට අනුකූලව ඉදිවේ.

වායුගෝලය දූෂණය වීම අවම වීම තුළ ඕසෝන් ස්ථරය හායනය වීම අඩු වේ. මේ නිසා පෘථිවියට පැමිණෙන අහිතකර පාරජම්බුල කිරණ පෘථිවිය තුළට පැමිණීම අඩු වේ. මේ නිසා සාගර පරිසර පද්ධතිවල ඇති ශාක ප්ලවාංග විනාශ වීම අඩු වේ. එම නිසා ශාක ප්ලවාංග මඟින් වායුගෝලයට පිට කරනු ලබන ඔක්සිජන් ප්‍රමාණය වැඩි වන අතර ප්‍රභාසංස්ලේෂණය සඳහා වායුගෝලයෙන් කාබන් ඩයොක්සයිඩ් ලබා ගැනීම වැඩි වේ. මේ නිසා වායුගෝලය තුළ ඔක්සිජන් සහ කාබන් ඩයොක්සයිඩ් ප්‍රතිශතය සමතුලිත මට්ටමක පවත්වා ගැනීමේ හැකියාව වැඩි දියුණු වේ. මේ ආකාරයෙන් පරිසර දූෂණය අවම වීම තුළ නව නගරයන්හි නිර්මාණය වන විවිධ කර්මාන්ත ශාලාවලින් වායුගෝලයට නිදහස් වන අහිතකර වායූන් අවම වේ. මේ නිසා අම්ල වැසි ඇති වීම ද අවම වනු ඇත. මේ නිසා විවිධ ස්මාරක ඛාදනය වීම, ගොඩනැගිලිවල තීන්ත ආලේපන ඛාදනය වීම සහ කෘෂිකාර්මික භෝගවල හරිත පටක විනාශ වීම යනාදි අහිතකර විපාකයන් සිදු නොවේ. මේ නිසා ආර්ථික භෝගයන්හි අස්වැන්න වැඩි වේ. මේ නිසා විශාල වශයෙන් ආර්ථික වාසි ළඟා වේ. එමෙන්ම හරිතාගාර වායූන් වායුගෝලයට නිදහස් වීම ද අවම වේ. මේ නිසා ගෝලීය උණුසුම අඩු වේ. ගෝලීය උණුසුම අඩු වීම තුළ වාසි රැසක් හිමි වේ.

## ජෛව විවිධත්වය සංරක්ෂණය වීම

මේ ආකාරයෙන් සලකා බැලූ විට අලුතින් ඉදිවන නව නගර තාක්ෂණය අතින් දියුණු හෙයින් නාගරික ජෛව විවිධත්වයට එල්ල වන තර්ජන අවම කිරීමට ද වැදගත් වේ. එමෙන්ම මෙම නගර තුළ පවතින ජලය, වාතය පිරිසුදු කරනු ලබන ක්‍රමවේදයන් ප්‍රාදේශීය දේශගුණික සංයමයන්, කාබන් ඩයොක්සයිඩ් දූෂණයන්, පාංශු ඛාදනය අවම වීම, ශබ්ද දූෂණය අඩු වීම යනාදී ක්‍රියාකාරකම් මඟින් ජෛව විවිධත්වය වැඩි දියුණු වනවා සේම මිනිසුන්ගේ මානසික සෞඛ්‍ය සම්පන්නභාවය ද වැඩි කෙරේ. එමෙන්ම මුහුද ගොඩ කර තනනු ලබන නව නගර සැලැස්ම මඟින් මිනිසුන්ගේ වාසස්ථාන වැඩි වීම තුළ ජෛව විවිධත්වය වැඩි දියුණු වී එය සංරක්ෂණය වීම ද සිදු වේ.

එමෙන්ම මේ තුළ ඇති වන අහිතකර ප්‍රතිඵල ලෙස සාගර පරිසර පද්ධතිවල ඇතැම් මුහුදු ජීවීන්ගේ වාසස්ථාන ඔවුනට අහිමි වේ. උදාහරණ ලෙස මුහුදු ඉකිරියන්ගේ සහ කොරල් පරයන්හි වාසස්ථාන අහිමි වීම පෙන්වා දිය හැකිය. එහෙත් මෙම නව නගර නිර්මාණයේදී මුහුදු ජීවීන්ට නව වාසස්ථාන ඇති වීම ද සිදු වේ. මෙම ජෛව විවිධත්වයේ ආර්ථික පාරිභෝජනය පාලනය කිරීම ද ජෛව විවිධත්ව සංරක්ෂණයට ඉතා වැදගත් වේ. මෙහි එක් පියවරක් වන්නේ අධි පාරිභෝජනය නැවැත්වීමය. අධි පාරිභෝජනයේදී අවශ්‍ය ප්‍රමාණයට වඩා සම්පත් භාවිත කිරීම නිසා ඇතැම් ජීවීන් වඳ වී යෑම නොහොත් නෂ්ට වී යෑම නවත්වා ගැනීමට පිළිවන. මේ ආකාරයට අධි පාරිභෝජනය නැවැත්වීම මඟින් අඩු වී ගිය ජීවී ගහනයන් හා පරිසර පද්ධතීන් නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීම මඟින් ද ජෛව විවිධත්වය සංරක්ෂණය කළ හැකි වේ.

අධි පාරිභෝජනය නැවැත්වීම මඟින් සිදු වන්නේ කෙටි කාලීන ආර්ථික වාසියකි. ජලය තුළ හා වෙනත් භෞමික පරිසර පද්ධති තුළ විකල්ප භාවිතයන් හුරු කරවීමෙන් අස්වැන්න නෙළන මට්ටම සහ ආදායම් අඩු වීම යනාදී දෑ වෙනස් කොට අධි පාරිභෝජනය වෙනස් කිරීමෙන් ජෛව විවිධත්වය සංරක්ෂණය කළ හැකි වේ. මෙම නව නගර තුළ පවතින ජෛව විවිධත්වය ලෙස සංරක්ෂණය කර ගැනීම මඟින් සමාජ ආර්ථිකමය තත්ත්වය ඉතා ආකර්ෂණීය තත්ත්වයට පත් කර ගැනීමේ හැකියාව පවතී. එමෙන්ම ස්වාභාවික පරිසර පද්ධතීන් අනවශ්‍ය ලෙස භාවිත කරමින් නිපදවනු ලබන වෙළෙඳ ද්‍රව්‍ය අවම කිරීම මඟින් ද ආර්ථිකමය වශයෙන් ජෛව විවිධත්වය පාලනය කළ හැකි වේ. මෙහිදී ඉතා වැදගත් වටිනාකමක් සහිත පරිසර පද්ධතීන් වැඩි ස්ථාන භාවිතය අවම කිරීම ද සිදු කළ හැකිය.

## සංචාරක පාරදීසයක්

මේ ආකාරයට සලකා බැලීමේදී වරාය නගරය ගොඩනැගීම ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථිකමය තත්ත්වය නගාසිටුවීම සඳහා ඉතා වැදගත් වන මර්මස්ථානයක් නැතහොත් සංචාරක පාරදීසයක් වනු නොඅනුමානය. මේ නිසා කොළඹ වරාය නගරය ඉදි කිරීම පිළිබඳව පවතින විවිධ මතවාද ඉතා හොඳින් නිරීක්ෂණය කොට මෙම නගරය නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය වන සියලුම දෑ මෙන්ම සියලුම සහයෝගයන් ලබා දීම තුළ ශ්‍රී ලංකාව සෞභාග්‍යයේ හිණි පෙත්තට රැගෙන යෑමේ හැකියාව ලැබෙනු ඇත.

සංවර්ධනය වන රටක් සංවර්ධිත තත්ත්වයට පත් කර ගැනීම සඳහා විශාල වෙහෙසක් ගත යුතු අතර ඒ සඳහා බොහෝ කාලයක් ද ගත වනු ඇත. එවැනි වාතාවරණයකදී ඇතැම් දේශපාලකයන් විසින් තමන්ගේ පටු අරමුණු මුදුන් පමුණුවා ගැනීම සඳහා විවිධ වූ ක්‍රියාකාරකම්වල නියැළෙනවා සේම ඇතැම් සංවර්ධිත රටවල් ද විදේශ ආයෝජනයන් වැළැක්වීම සඳහා විවිධ උපක්‍රම ද භාවිත කරනු ලබයි. ඇතැම්හු ශ්‍රී ලාංකිකයන් වුව ද හදවතින්ම ශ්‍රී ලාංකික නොවෙති. එවැන්නන් විසින් සිදු කරනු ලබන කඩාකප්පල්කාරී ක්‍රියාවන්ට හසු නොවී නිවැරදි දේ නිවැරදි ලෙස වටහා ගෙන හදවතින්ම ශ්‍රී ලාංකික වී මෙරට සෞභාග්‍යයේ මුදුන් පෙත්තට ඔසවා තබා ගැනීම සඳහා යුහුසුළුව ක්‍රියා කිරීම ශ්‍රී ලාංකිකයන්ගේ කාර්ය භාරය විය යුතුය. වරාය නගරයට බලපානු ලබන නීතිමය ගැටලු නීති විශාරදයන් විසින් විසඳා ගැනීමට ඉඩ හැර සාමාන්‍ය ජනතාව ඔවුනට හැකි උපරිම සහාය මෙම නගරය ගොඩනැගීම සඳහා ලබා දිය යුතුය. ඒ තුළ ශ්‍රී ලංකාව සෞභාග්‍යයේ දේශයක් කරා ඉතා ඉක්මනින් ඇදී එනු නොවැළැක්විය හැකි වනු ඇත.

**චතුමී පිට්පන**



# හාමතේ මිය යෑම වැනි අර්බුදයකට අපේ රට ගිහින් නැහැ



## ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සභාපති **ආචාර්ය ජගත් වැල්ලවත්ත**

පවතින කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ශ්‍රී ලංකාව ආර්ථික වශයෙන් කිසියම් පසුබෑමකට ලක්ව තිබෙන බව නොරහසකි. ඒ අනුව රට ඉදිරියේ පවතින අභියෝග ජය ගනිමින් පවතින තත්ත්වයට මුහුණ දෙන ආකාරය මෙන්ම වත්මන් රජයේ ආර්ථික කළමනාකරණ වැඩපිළිවෙළ කෙසේ සකස් විය යුතු ද? ඒ වෙනුවෙන් ගත හැකි හා ගත යුතු ක්‍රියාමාර්ග මොනවාද යන්න සහ අනාගත සැලසුම් සකස් විය යුත්තේ කෙසේ ද යන්න සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ සභාපති ආචාර්ය ජගත් වැල්ලවත්ත මහතා සමඟ කළ සංවාදයකි.

**■ කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ පසු බැස තිබෙන ශ්‍රී ලංකාවේ ආර්ථිකය නිවැරැදි කළමනාකරණයකින් යුතුව ඉදිරියට ගෙන යා යුත්තේ කෙසේ ද?**

වත්මන් රජය 'සෞභාග්‍යයේ දැක්ම' ප්‍රතිපත්ති ප්‍රකාශනය ඔස්සේ ඉදිරියට ගමන් කරමින් එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරන්නට පෙර කොවිඩ් 19 වසංගත තත්ත්වය ශ්‍රී ලංකාවේ ආර්ථිකයට යම්කිසි බලපෑමක් එල්ල කරනවා. ඒ සමඟම ශ්‍රී ලංකාවට පමණක් නොව අන්තර්ජාතික වශයෙන් ද බලපෑමක් ඇති වෙනවා. මේ තත්ත්වය තුළ සංචාරක කර්මාන්තය, ශ්‍රී ලංකාවේ තේ වෙළෙඳපොළ, අපනයන ආදායම, ඇඟලුම්, විදේශ රැකියා ආදියේ නිරතව සිටින විශාල පිරිසකට යම්කිසි බලපෑමක් එල්ල වුණා. මේ කරුණු සමඟ රටක් ලෙස අපිට ලැබෙන ප්‍රධාන ආදායම් මාර්ග රැසක් අහිමි වී තිබෙනවා. ආයෝජන ගත් විට විදේශ ආයෝජකයන්ට මෙරටට පැමිණීමට නොහැකි වුණා. ඒ වගේම රට අභ්‍යන්තරයේ පෞද්ගලික අංශයට ද කොවිඩ් තත්ත්වයෙන් බලපෑමක් ඇති වුණා. රුපියලේ අගය අවප්‍රමාණය වීම වැනි කරුණුත් එක්ක ඒ තත්ත්වය හොඳින් දැක ගන්න පුළුවන්. අද වන විට සංචාරක කර්මාන්තයේ නිරත වූවන් වෙන්න පුළුවන්, අනෙකුත් වෘත්තීයමය පිරිස් වෙන්න පුළුවන්, මේ අය කුමක් හෝ ආදායම් මාර්ගයක් සොයා ගෙන තිබෙනවා. සංචාරක ව්‍යාපාරය අද වන විට විශාල වශයෙන් කඩා වැටීමකට ලක්ව තිබෙනවා. සංචාරකයන්ගේ පැමිණීම විශාල වශයෙන් පහත වැටී තිබෙනවා. ඇතැමුන්ගේ විවිධ මත නිසා සංචාරකයන් මෙහි එන්නත් බියක් දක්වනවා. ලෝකයේ රටවල් කිහිපයක් මේ වන විටත් හුදෙකලා තත්ත්වයේ තිබෙන්නේ. එහෙත් ඇතැමුන් අහන්නේ ලංකාව හුදෙකලා කරන්නේ නැත්තේ ඇයි කියලයි. එහි වාසිය තිබෙන්නේ විපක්ෂයට විතරයි.

**■ මෙවැනි අභියෝග රැසකට මැදිව තිබෙන ශ්‍රී ලංකාව එම අර්බුදවලින් මුදා ගෙන ඉදිරියට ගෙන යෑම සඳහා වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ප්‍රමුඛ ආණ්ඩුවට හැකිවේ ද?**

පවතින තත්ත්වය තුළ කෙසේ හෝ ආර්ථිකය කළමනාකරණය කර ගැනීම වෙනුවෙන් ආණ්ඩුව යම් යම් වැඩපිළිවෙළ ක්‍රියාත්මක කර තිබෙනවා. මහ බැංකුව, මුදල් අමාත්‍යාංශය මෙන්ම ජනාධිපතිවරයාගේ හා අමාත්‍ය මණ්ඩලයේ මැදිහත්වීමෙන් ඒ කටයුතු කරගෙන යනවා. අද වන විට සංවර්ධන ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක වෙනවා. එහෙත් පසුගිය වසර පහක් පමණ අපේ රටේ සංවර්ධනය ඇනහිටියා. නමුත් එයින් නැඟී සිටින වත්මන් ආණ්ඩුව රටේ ඉදිරි ගමන වෙනුවෙන් කටයුතු කරමින් සිටින්නේ. එහි ප්‍රතිඵල බොහෝ වෙලාවට මේ වසර අවසන් වන විට දැක ගන්න පුළුවන් වෙයි.

**■ පවතින තත්ත්වය හමුවේ නිසි වැඩපිළිවෙළක් නොමැති බවටත් අභියෝග ජය ගැනීම සඳහා කිසිදු උත්සාහයක් නොගන්නා බවටත් යම් යම් පාර්ශ්ව ආණ්ඩුවට චෝදනා කරනවා. මේ තත්ත්වය කුමක් ද?**

අපිට තිබෙන එකම ගැටලුව තමයි අපිට පෙනෙන අර්බුදය ආර්ථික අර්බුදයකටත් වඩා එහා ගොස් විශාල අර්බුදයක් තිබෙන බවට මතයක් සමාජගත වී තිබීම. හාමතේ මිය යෑම වැනි අර්බුදයකට තවමත් අපේ රට ගිහින් නැහැ. එවැනි තත්ත්වයකට රට තල්ලු කරන්න වත්මන් ආණ්ඩුව සූදානම් වන්නෙත් නැහැ. නමුත් රට තුළ තිබෙන අර්බුදය විශාල එකක් බවට රට තුළ කතිකාවතක් ගොඩනැඟී තිබෙනවා. විපක්ෂයත් විවිධ මත ඉදිරිපත් කරනවා. අපි ලොකු අර්බුදයක ඉන්න බවට අතමුන් මත ප්‍රකාශ කරනවා. ලෝකයේ ඇතැම් රටවල් ගත් විට මේ පවතින තත්ත්වය තුළ ශ්‍රමිකයන් විශාල වශයෙන් රැකියාවලින් ඉවත් කළා. වැටුප් ගෙවීම නවතා දැමුවා. ඇතැම් කර්මාන්ත ශාලා අකර්මණ්‍ය වුණා. එවැනි දෙයක් සඳහා රජයේ මැදිහත්වීම අඩුයි. අපේ රටේ එවැනි එක් දෙයක් හෝ සිදු වෙලා නැහැ. රජයේ සේවකයන්ගේ වැටුප් කපලා නැහැ. රජයේ සේවකයන් සේවයෙන් ඉවත් කර නැහැ. පෞද්ගලික අංශයේ ද එවැන්නක් නැහැ.

මේ තත්ත්වය තුළ කෙසේ හෝ රට ඉදිරියට ගෙන යෑම සම්බන්ධයෙන් ආණ්ඩුවට විශාල ගෞරවයක් හිමි වෙනවා. නමුත් එවැන්නක් ඇතැමුන්ට පේන්නේ නැහැ. අනෙකුත් රටවල මෙන් සේවකයන්ගේ වරප්‍රසාද කිසිවක් කප්පාදු කර නැහැ. එවැන්නක් කරන්න බලාපොරොත්තු වන්නෙත් නැහැ. ඒ වෙනුවට රජයේ රැකියා වෙනුවෙන් තරුණ තරුණියන් ලක්ෂයක් බඳවා ගන්නවා. උපාධිධාරීන් බඳවා ගන්නවා. සෞභාග්‍යයේ දැක්ම වැඩපිළිවෙලත් ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක වෙනවා. ඇතැමුන් ආණ්ඩුව 'ෆේල්' කියා පවසනවා. විශාල වශයෙන් ආර්ථික අර්බුදයක ඉන්නවා කියලා පෙන්වන්න ඇතැමුන් උත්සාහ කරනවා. ඕනෑම රජයක් පත් කර ගන්නා විට ජනතාව මහා විශාල බලාපොරොත්තු දල්වා ගන්නවා. ඒවායින් සියයට 75ක් පමණ 2014 වන විට මෙය සියයට 70ක් පමණ වුණා. අද අපේ රට පමණක් නොවෙයි ලෝකයේම සංචාරක කර්මාන්තය කඩා වැටීමකට ලක්ව තිබෙනවා.

අපේ රට හුදෙකලා නොකර තිබුණ ද ලෝකයේ ඇතැම් රටවල් තවමත් තියෙන්නේ හුදෙකලා තත්ත්වයක. මේ නිසා සංචාරකයන් එන්නේ නැහැ. ගුවන් තොටුපළවල් වසා දමා තිබෙනවා. ඒවා බිඳ වැටෙන ප්‍රමාණය අනුව මිනිසුන්ගේ ආදායම් අහිමි වී තිබෙනවා. ඒකත් ප්‍රක්ෂේපනය කරන්නේ ආණ්ඩුවේ වරදක් විදියටයි. අද වන විට දේශපාලනික වශයෙන් විපක්ෂය ක්‍රියාත්මක වෙමින් සිටින්නේ අලුත් ක්‍රමවේදයන් එක්කයි. ඉන් ප්‍රධාන එක තමයි රජයත් සමඟ සිටි පක්ෂ සහ එහි නායකයන් රජයට විරුද්ධව මෙහෙයවීම. අභ්‍යන්තරයේ සිට ඒ කැරැල්ලට සම්බන්ධ වන බොහෝ දෙනා සිතන්නේ ඔවුන්ගේ මතය තමයි මහින්ද රාජපක්ෂ අගමැතිවරයා තමයි මේ දේශපාලන ව්‍යාපාරයේ හදවත, මුදුන් මුල කියලා. එයින් අනතුරුව රාජපක්ෂවරුන්ගේ දේශපාලනය නිමා වෙයි, සටන අපි අතට ගන්න ඕනෑ කියන මතය තමයි ඔවුන් තුළ තිබෙන්නේ. ඒ සඳහා අවශ්‍ය අලෙවිකරණ ප්‍රචාරණය තමයි මේ කර ගෙන යන්නේ.

පුද්ගලයෙක් වශයෙන් ගත් විට ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාට හයිය සහ හැකියාව තිබෙනවා. රාජ්‍ය නායකයා ලෙස ඒ මහතාට ඒ කටයුත්ත කරගෙන යෑමේ හැකියාව තිබෙනවා. නමුත් සිදුව තිබෙන්නේ අපේ මාධ්‍ය සෘණාත්මක දේ තමයි ප්‍රවෘත්තියක් ලෙස පළ කරන්නේ. මෙවැනි කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු කරමින් ආර්ථික පුනර්ජීවන හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන කාර්ය සාධන බළකායේ සභාපති බැසිල් රාජපක්ෂ මහතාගේ නායකත්වයෙන් විශාල වැඩ කොටසක් කරගෙන යනවා. රජය විසින් මේ කාලය තුළ කළ කාර්යභාරය හෝ ඇගයීමට ලක් වන්නේ නැහැ. පසුගිය රජයම මේ කාලයේත් තිබුණා නම් මීට වඩා අපට සිදු වන විනාශය ඉතා විශාලයි. කොරෝනා වසංගතය මේ තරම්ම රට පුරා ව්‍යාප්ත වෙද්දීත් මරණ අනුපාතය දශම 5ට අඩු සංඛ්‍යාවකින් පවතින්නේ කොහොම ද කියලා වෛද්‍ය පර්යේෂකයන් පර්යේෂණ සිදු කළ යුතු වෙනවා. ඒක ධනාත්මක වෙලා ඒ සම්බන්ධයෙන් කිසිවකු කතා කරන්නේ නැහැ.

ඒ ධනාත්මක තත්ත්වය කුමක් ද යන්න සොයන්න අපි යන්නේ නැහැ. දේශපාලනික වශයෙන් විපක්ෂය කර ගෙන යන ප්‍රචාරණ වැඩපිළිවෙළ මෙවර අමුතු තාලයකට කරන්නේ. තරුණ පරපුරට ආකර්ෂණීය පරිසරය වැනි මාතෘකා සොයා ගන්නවා. අභ්‍යන්තර අරගලයක් නිර්මාණය කරන්න හදනවා. එය සාර්ථක වන්නේ නැහැ. කෙසේ වෙතත් එවැනි අර්බුද එක්ක තමයි ආණ්ඩුව ඉදිරියට යන්නේ. සමාජය මේ තත්ත්වය තේරුම් ගන්නේ නැහැ. අද සමාජ මාධ්‍ය විසින් ජනමතය හසුරුවන තැනකට ගිහින් තිබෙනවා. අද පත්තර මිනිසුන්ට අවශ්‍ය නැහැ. කෙටි පණිවුඩ මඟින් ජනතාව ප්‍රවෘත්ති දැන ගන්නවා. පොත්පත් කියවන්නේ නැහැ.

> **අද සමාජ මාධ්‍ය විසින් ජනමතය හසුරුවන තැනකට ගිහින් තිබෙනවා**

**■ රටේ පවතින තත්ත්වය හමුවේ ඉදිරියට ගමන් කිරීමේදී රජය විසින් යම් යම් වැඩසටහන් ක්‍රියාත්මක කර තිබෙනවා. කෙසේ නමුත් ආර්ථික කළමනාකරණයේදී පවතින තත්ත්වය වෙනස් විය යුතු යැයි ඔබ විශ්වාස කරනවා ද?**

ශ්‍රී ලංකාවේ සමස්ත ආර්ථික ක්‍රියාවලියම විශාල වශයෙන් ප්‍රතිසංස්කරණයකට ලක් විය යුතු වෙනවා. අද වන විට ලෝකයේ කළමනාකරණ ක්‍රමවේද දියුණු වෙනවා. අපි කැමැති වුණත් අකමැති වුණත් ස්වයංපෝෂිත ආර්ථිකය කියන එකට සම්පූර්ණයෙන්ම යන්න අපිට බැහැ. නිෂ්පාදන නඟාසිටුවන්න, කර්මාන්ත දියුණු කරන්න ඕනෑ. 2018 වසරේදී කෘෂි ආර්ථික වර්ධන වේගය සෘණ මට්ටමක පැවතුණා. එවිට කාර්මිකකරණයට යන්නේ කෙසේ ද? නාගරීකරණය සිදුවන්නේ කෙසේ ද කියා කල්පනා කරනවා. නමුත් අපේ රටට අවශ්‍ය ආහාර ටික කෙසේ ද නිෂ්පාදනය කර ගන්නේ කියා සිතන්නේ නැහැ. උපාධිධාරියෙක් කල්පනා කරන්නේ රැකියාවක් ගන්නේ කෙසේ ද කියලයි. නමුත් ඔවුන් යම්කිසි නිෂ්පාදන ක්‍රියාවලියකට නායකත්වය දෙනවා කියා සිතන්නේ නැහැ. තමන්ගේ පෞද්ගලික අවශ්‍යතා පිළිබඳ කාරණා. එවිට මිනිසුන් පෙළ ගැසෙන්නේ පක්ෂයේ ප්‍රතිපත්ති මත නොවෙයි. බොහෝ වෙලාවට බලන්නේ කාටද දිනන්න පුළුවන් කියලයි. 2015 වසරේදීත් මේ ප්‍රශ්නය ඒ විදියටම දැක්කා.

මාස තුනකට එහා යා හැකි ප්‍රතිපත්තියක් නොමැති සන්ධානයකට තමයි 2015 වසරේදී මිනිසුන් ඡන්දය දුන්නේ. එතැනින් එහාට ආණ්ඩුව ගෙන යන්නේ කෙසේ ද යන්න සම්බන්ධයෙන් විශාල විභේදනයක් ඇති වුණා. එය කළමනාකරණය කර ගන්න ඒ ආණ්ඩුවට කිසිසේත්ම නොහැකි වුණා. ඒ හා සමාන දෙයක් මේ ආණ්ඩුටත් තිබෙනවා කියා මතයක් ඇතැමුන් ජනගත කරමින් යනවා. රටකට අර්බුද එන්න පුළුවන්. මේ රටේ ආර්ථික අර්බුදය පටන් ගත්තේ මේ රජය නොවෙයි. 2015 වසරේ පැමිණි රජය ඉහළ මට්ටමක තිබුණු දළ ජාතික නිෂ්පාදිතය, අවම කර තිබූ ණය ප්‍රමාණය, ඒක පුද්ගල ආදායම ආදි සියලු සාධක මෙන්ම ආර්ථික වර්ධන වේගය පහළම තැනකට ගෙනැවිත් දැම්මා. එහි ප්‍රතිඵල අදත් ගෙවමින් ඉන්නවා. ලෝක බැංකු වාර්තාවන්ට අනුව මේ වසරේ ණය අනුපාතය සියයට 115ක් පමණ වෙයි කියා කියනවා.



> **ආයතනයකින් ඉටුවිය යුතු සේවය නිසි පරිදි ඉටුවන්නේ නැති නම් ඉදිරියට යන්න බැහැ**

එසේ සිතන්නේ නැතිනම් ඒ පරම්පරාව ඊට වඩා පහළ පරම්පරාව සම්බන්ධයෙන් සිතන්න දෙයක් නැහැ. රැකියා මානසිකත්වය ලංකාවේ තිබෙන ප්‍රධාන ගැටලුවක්.

වැඩකරන සංස්කෘතිය සම්බන්ධයෙන් විශාල වෙනසක් අපිට අවශ්‍ය වෙනවා. වෙනත් රටවල අතිකාල පිළිබඳ ප්‍රශ්නයක් නැහැ. නමුත් අපේ රටේ අතිකාල පිළිබඳවත් අවධානය යොමු කරනවා. ආකල්පයම කරුණු පිළිබඳ ලොකු ගැටලුවක් තිබෙනවා. අපේ අය හිතන්නේ රැකියාවක් කිරීම දේශපාලනය කිරීමෙන් ලැබෙන තෑග්ගක් කියලයි. ආයතනයෙන් කරන්න ඕනෑ වැඩ ඉටු කර දීම පිළිබඳව රජයට කළ යුතු යුතුකම ඉටුකරන්නේ නැහැ. අන්තර්ජාතික වශයෙන් ආර්ථිකයට ගැළපෙන ක්‍රමවේදයන් සමඟ අපි අනුගත වන්නේ නැතිනම් එතන වැඩක් නැහැ. ඒ නිසා ආර්ථික කළමනාකරණ මොඩලයේම යම්කිසි වෙනසක් සිදුවීම අවශ්‍ය වෙනවා. එතැනදී සම්පූර්ණයෙන්ම බටහිරට ගැති වීමක් අපේක්ෂා කරන්නේ නැහැ. දේශීය ආර්ථිකයත් දේශීය කර්මාන්තත් එසැවෙන අතර උපක්‍රමික වශයෙන් අන්තර්ජාතික ආර්ථිකයේ නිසි පංගුව ලබා ගැනීම අවශ්‍ය වෙනවා. නවීන තාක්ෂණ කෘෂිකර්මයකට යෑම අවශ්‍ය වෙනවා. වස විසෙන් තොර කෘෂිකර්මාන්තයකට යෑම අවශ්‍ය වෙනවා.

ඒ වෙනුවෙන් තරුණ පරම්පරාවේ යොමු වීම අවශ්‍යයි. තාක්ෂණය මාර්ගයෙන් රටට ප්‍රතිඵල ලබාදෙන්න උත්සාහ කරන තරුණ පිරිස ගැනත් බලන්න ඕනෑ. ඔවුන්ට කොතරම් අනුබල දෙනවා ද යන්න සොයා බැලිය යුතුයි. තාක්ෂණික නවෝත්පාදනය අපිට අවශ්‍ය තැනකට පැමිණ තිබෙනවා. ඒ නිසා වැඩ කිරීමේ සංස්කෘතියක් ඇති කිරීමත් පවතින ආර්ථික ක්‍රමවේදයන්ගේ යම් යම් නවීකරණය ද අවශ්‍ය දෙයක්. එසේ නොවන්නේ නම් අර්බුද එනවා. කොරෝනා පැමිණි පසුව යළිත් වසංගතයක් එන්නේ නැහැ කියන්න බැහැ. ආණ්ඩුව ප්‍රධාන මෙහෙයුම්කරුවා ලෙස ඒ කාර්යය සඳහා ශක්තිමත්ව නායකත්වය දීම අවශ්‍යයි.

**■ මෙවැනි තත්ත්වයක් පවතින අවස්ථාවක විදේශ රටවලින් සිදු කරන ආනයන සීමා කිරීමට රජය පියවර ගෙන තිබෙනවා. එය කාලෝචිත පියවරක් සේ දකිනවා ද?**

දේශීය වශයෙන් සිදු වන නිෂ්පාදන ඉතිහාසයේ කවරදාටත් වඩා ඉදිරියට පැමිණ තිබෙනවා. ඖෂධ නිෂ්පාදන සංස්ථාව ඉතිහාසයේ පළමු වරට රුපියල් මිලියන 1,500 ට වඩා ලාභ ලබන තත්ත්වයට පැමිණ තිබෙනවා. කොවිඩ් වසංගතයත් සමඟ ලංකාවට අවශ්‍ය බෙහෙත් විශාල ප්‍රමාණයක් නිපදවන්න පියවර ගෙන තිබෙනවා. එවැනි කර්මාන්ත ශාලා විශාල ප්‍රමාණයක් ආරම්භ කරන්න රජය සැලසුම් කර අවසන්. ඒ වගේම අපේ රටට අවශ්‍ය ටයර් නිපදවන්නත් මේ වන විට පියවර ගෙන තිබෙනවා. ප්‍රධාන ටයර් කර්මාන්ත ශාලා පහක් පමණ ශ්‍රී ලංකාවේ ආරම්භ කරන්න සැලසුම් කර අවසන්. දැනටමත් ආරම්භ කර තිබෙන ටයර් කර්මාන්ත ශාලාව තුළ අන්තර්ජාතික මට්ටමේ ටයර් නිෂ්පාදනය සිදු වෙනවා. කෘෂිකර්මාන්තයත් අද වන විට ඉදිරියට පැමිණ තිබෙන්නේ. මේවායේ ප්‍රතිඵල ලැබෙන්න යම් කිසි කාලයක් ගත වේවි. බඩ ඉරිඟු නිෂ්පාදනය ගත් විට ඒවා සම්බන්ධයෙන් කතා කරනවා වෙනුවට පරිසරය සම්බන්ධයෙන් විශාල කතිකාවක් ඇති කර තිබෙනවා.

ආනයනය සීමා කිරීම ඉතාම වැදගත්. එසේ ආනයන සීමා නොකළා නම් අද වන විට ඇමෙරිකානු ඩොලරය රුපියල් 400ක් පමණ වෙන්න තිබුණා. හැම ආනයනයකම අවසානය තමයි අපි ඩොලර් ගෙවීම. අපිට වෙළෙඳ ශේෂය යන්න වඩා අවාසි සහගත ලෙස යන්නේ. අපේ රටේ නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා විශාල වශයෙන් විභවතාවන් තිබෙනවා. නමුත් අපි එතනට ගිහින් නැහැ. ටයිල් ආනයනය තහනම් කළ පසුව ටයිල් ආනයනකරුවන්ගේ සංගමයෙන් විශාල විරෝධතාවක් පැමිණියා. නමුත් මෙහිදී රජය යෝජනා කළේ නිශ්චිත විසඳුමකට යන්න කියලා. අපි ගන්නවා, විකුණනවා කියන ආර්ථිකයකට තමයි හුරු වී සිටින්නේ. නිෂ්පාදන ධනපති පංතියක් නොවෙයි. රෙදි ආනයනය නතර කළා කියා ගැටලුවක් නැහැ. ඇඟලුම් විශාල වශයෙන් අපේ රටේ නිෂ්පාදනය වෙනවා. ශ්‍රී ලංකාවේ පළමු කර්මාන්තය රෙදි කර්මාන්තය. නමුත් අපි ඒකට යන්නේ නැහැ. කපු අපේ රටේ වැවෙනවා. අපිට අවස්ථා විශාල වශයෙන් තිබෙනවා.

පවතින ක්‍රමය වෙනස් කළ යුතුයි. තමන්ගේ අභිවෘද්ධිය ගැන නොසිතන එක තමයි ප්‍රශ්නය. මිනිසුන් අද වගකීම් විරහිතවයි කටයුතු කරන්නේ. ඩෙංගු රෝගය උත්සන්න වෙලා රෝගියා මිය ගිය පසුව රෝහල කිසිවක් කළේ නැහැ කියනවා. උණ උත්සන්න වෙලා මරණාසන්න වෙනකොට තමයි රෝහලට එන්නේ. අපි පුරුදු වෙලා ඉන්නේ කාට හරි චෝදනා කරන්නයි. මේ ගැන කල්පනා කළ යුතුයි. අද වන විට කහ විශාල වශයෙන් වගා කරනවා. එම නිෂ්පාදන පැමිණි පසුව අතිරික්තයට කරන්නේ කුමක් ද කියා සිතා බැලිය යුතුයි. රජය හෝ රාජ්‍ය ආයතන මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමත් අවශ්‍යයි. ආණ්ඩුව මෙවැන්නකට වැඩපිළිවෙළක් සාදා තිබෙනවා. නමුත් ඒ ඒ ආයතන ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන ආකාරයේ ගැටලු පවතිනවා. පෞද්ගලික අභිවෘද්ධිය සම්බන්ධයෙන් සිතන එක අපි අත් හළ යුතුයි. පත්වීමක් දෙන්නේ තමන්ගේ පෞද්ගලික අභිවෘද්ධිය වෙනුවෙන් පමණක් නොවන බව තේරුම් ගත යුතුයි. ආයතනයකින් ඉටු විය යුතු සේවය නිසි පරිදි ඉටුවන්නේ නොමැති නම් ඉදිරියට යන්න බැහැ. මිනිසුන් කැපවීමෙන් කටයුතු කළ යුතුයි.

**මහින්ද අලුත්ගෙදර**
**ඡායාරූප - සුදත් මලවීර**




## නීතිය සදාචාරය නොතකා කටයුතු කරන්නන් තම අධ්‍යාපන මට්ටම ලෝකයට පෙන්වයි

සිරිත් මල්දම පුංචි දරුවන් සඳහා නිර්දේශිත පොතකි. මේ පොත් පත් කියැවිය යුතු යැයි ළමා පරපුරට බල කර ඇත්තේ අද හැදෙන උන් හෙට දැනුමින් ද බුද්ධියෙන් ද සදාචාරයෙන් ද බාහු බලයෙන් ද පිරිපුන් ඇත්තන් විය යුතු නිසාය. සිරිත් මල්දම මඟ හැරුණු උදවිය ඉබාගාතේ යන අන්දමත් සදාචාරයෙන් විලි බියෙන් තොරව හැසිරෙන අන්දමත් මේ පුංචි රටේ කොයි අස්සකින් මුල්ලකින් හෝ විටින් විට වාර්තා වන්නේ විලි ලැජ්ජාවේ බෑ කියන්නට කාරණා මතු කරමිනි.

ඇතැමකු පාරේ යන්නට දන්නේ නැත. තවකෙක් ඇඟ විලි වසා ගන්නට දන්නේ නැත. සමහරෙකුගේ කටට සීලාචාර බස හුරු නැත. තවත් උන් ප්‍රසිද්ධ තැන්වල කන්න බොන්න හැසිරෙන්න දන්නේ නැත. මේ පාඩම් මාලාව පුංචි ඇත්තෝ ඉගෙන ගන්නේ දෙකේ තුනේ පන්තිවලදීය. ඉකුත්දා අධිවේගී මාර්ගයේ අසීලාචාර ලෙස හැසුරුණු පිරිස අපිට සිහිපත් කළේ මීට වසරකට පමණ පෙර සීගිරියේ සීගිරි ළඳුන්ටත් නිගා දෙන ලෙස අසෝබනව හැසිරුණු පුවත, සිය වාහනයේ නළා හඬ නංවමින් සද්ධන්තයකු බිය ගන්වමින් විනෝද වූ පුවත ද ඇතුළු සිද්ධි කිහිපයකි.

මිනිස්සු දිනෙන් දින දියුණුව කරා යා යුතු අවදියක පිරිහීම කරාම යන්නේ අධ්‍යාපනයෙන් ලැබෙන පොතපතේ දැනුම මිස සමාජ අචාරධර්ම කලාව ප්‍රගුණ වීමක් සිදු නොවන නිසා බවට යමෙක් තර්කයක් ගෙනෙන්නේ නම් එය බැහැර කළ නොහැකිය. මෙදා අවුරුද්දේ රිය අනතුරු ද කටු කඩා ගෙන ඉහළ ගියේ මහ පාරේ සංයමය නොමැති නිසාය. අද ඇතැම් රියැදුරන් දන්නේ සුක්කානම කැරකවීම සහ තිරිංග තද කිරීම ගැන පමණි. වාහනයක් පැදවිය යුතු අන් කිසිදු සුදුසුකමක් සපුරා නොමැත. ලංකාවේ වාහන ප්‍රමාණය ජනගහනයට සාපේක්ෂව ඔරොත්තු දිය නොහැකි බව විටින් විට මතු වුණු බුද්ධිමතුන්ගේ හෙළි කිරීම් නිසා රජය වාහන ආනයනය ද සීමා කළේය. එදා වාහනයක හිමිකරුවෙක් යනු යමක් කමක් ඇතත් නැතත් දැන උගත් ඇත්තන්ටය. අද වාහන අතට ගන්නා ඇතැමුන්ට දැන උගත යුතු දෙයක් ද නැත. යමක් කමක් ද නැත. නමුත් ලොකු වාහනයක් ඇත. රිය පැදවීමට ගත් සහතිකයක් ද අතේ ඇත.

අධිවේගී මාර්ගයක ක්‍රියාත්මක වන්නේ වෙනත්ම රථ වාහන නීති පද්ධතියකි. එය ඉගැන්වීමට නැවත පාසලකට ගොඩ වැද්දවීමට වුවමනාවක් නැත. එය දැන ඉගෙන ගත යුතුය.

කැඩපත ඉදිරියේ පෙනෙන්නේ තමන්ගේ රුවමය. මේ පෙනෙන්නේ ද රට යන අතය. ශිෂ්ට සම්පන්න ජාතියක් යනු රටේ අනාගතයයි. එය පාසල් දරුවාගෙන් මෙන්ම සියලු පුරවැසියන්ගෙන්ම මෙම ශිෂ්ට බව අපේක්ෂා කරන්නකි. ඉකුත් දා තවත් පුවතක් මැවුණේ පොලිස් නිලධාරියකුගේ ක්‍රියාවකිනි. ඔහු ඇතැම් විට අමෙරිකාවේ මහත් ආන්දෝලනයකට ලක් වූ කළු ජාතිකයකු පොලිස් නිලධාරයකු විසින් මහ මඟදී ඝාතනය කළ සිද්ධිය අනුකරණය කළා වෙන්නට පුළුවන. නමුත් අමෙරිකානු සංස්කෘතියට වඩා ශ්‍රී ලාංකේය ජන සමාජයේ ඇවතුම් පැවතුම් කල් ක්‍රියාවන් බොහොම ඉහළ තැනක පසුවෙයි. ඒ නාමය කැත කර ගැනීම මුළු මහත් ජාතියම විනාශ මුඛයට යෑමේ පෙරනිමිත්තක් බඳුය.

රටේ නීති සම්ප්‍රදායට ගරු කිරීමේ වගකීම නොදන්නා තැනත්තා අතින් ඕනෑම දෙයක් සිදු වීමට ඉඩ කඩ වැඩිය. නමුත් දෙයක් සිදු වීමට මත්තෙන් ඒ ගැන දැනුම්වත් විය යුතුය. අද තාක්ෂණය බොහෝ සෙයින් දියුණුය. සමාජ දැනුම සොයා යාමට ඇති මංපෙත් බොහෝය. ෆේස් බුක්, යූ ටියුබ්වල කාලය කන ඇතැම් තරුණ උදවිය දෛනික ජීවිතයේ සිය කාර්යයන්වලදී නීති ගරුකව විනීතව හැසිරිය යුතු පිළිවෙත් හෝ දැනුම සොයා යෑමට වෙහෙසෙන්නේ නැත. ඒ කෙසේ වෙතත් නීතිය සදාචාරය නොතකා කටයුතු කරන ඇත්තන් තම අධ්‍යාපන මට්ටම, තම පවුල් පසුබිම යන සියල්ල ලෝකයට නිරාවරණය කර පෙන්වන බව පමණක්වත් සිහියට ගන්නේ නම් මැනවි.

**සකුන්තලා ජයසිංහ**

# විවාහක රූ රැජන ගෝරියෙන් රජයට ලක්ෂ 7ක් අලාබයි

## කුරුඳුවත්ත පොලිසිය අධිකරණයට කියයි

**සිරන්ජනි කුමාරි**

කොළඹ නෙළුම් පොකුණ රඟහලේදී ශ්‍රී ලංකා විවාහක රූ රැජන තරගාවලියේදී පුෂ්පිකා ද සිල්වාගේ කිරුළ බලහත්කාරයෙන් ඉවත් කිරීමේ සිද්ධියෙන් රජයට රුපියල් ලක්ෂ 07 අලාභයක් සිදු වී ඇති බවට කුරුඳුවත්ත පොලිසිය කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් බුද්ධික ශ්‍රී රාගල මහතා වෙත ඊයේ (19) කරුණු වාර්තා කර සිටියේය. ඊයේ මෙම නඩුව මහේස්ත්‍රාත් අධිකරණය හමුවේ කැඳවනු ලැබූ අවස්ථාවේ දී සැකකාරියන් දෙදෙනා අධිකරණය හමුවේ පෙනී සිටි අතර කුරුඳුවත්ත පොලිසිය මේ සිද්ධිය සම්බන්ධයෙන් අධිකරණය හමුවේ කරුණු වාර්තා කර සිටියේය. මේ සිද්ධිය සම්බන්ධයෙන් පුෂ්පිකා ද සිල්වා යන අය විසින් කුරුඳුවත්ත පොලිසිය වෙත කරනු ලැබූ පැමිණිල්ලකට අනුව පසුගිය 08 වන දින සැකකාරියන් දෙදෙනා කුරුඳුවත්ත පොලිසිය වෙත ප්‍රකාශ දීමට පැමිණි බව කුරුඳුවත්ත පොලිසිය අධිකරණය හමුවේ ප්‍රකාශ කළේය. තමන්ට සිදු වූ අපහාසය සම්බන්ධයෙන් සමාව ගැනීමකින් තොරව මෙම සිද්ධිය සමතයකට පත් කර ගැනීමට පුෂ්පිකා ද සිල්වා යන අය ප්‍රතික්ෂේප කළ බවත් එහිදී සමාව ඉල්ලීම සැකකාරියන් දෙදෙනා ද ප්‍රතික්ෂේප කළ බවත් කුරුඳුවත්ත පොලිසිය අධිකරණය හමුවේ ප්‍රකාශ කළේය.

එහිදී ප්‍රකාශ දීමෙන් අනතුරුව සැකකාරියන් දෙදෙනා පොලිස් ඇප මත මුදා හැරි බවත් ඒ අනුව අද දින අධිකරණය හමුවේ පැමිණිල්ල ගොනු කළ බවත් කුරුඳුවත්ත පොලිසිය අධිකරණයට දැන්වීය.

මේ සිදුවීමේ දී රජයට රුපියල් ලක්ෂ 07ක අලාභයක් සිදු වී ඇති බවට කුරුඳුවත්ත පොලිසිය කරුණු දක්වා සිටි අතර පුෂ්පිකා ද සිල්වා යන අයට සිදු වූ සිද්ධිය සම්බන්ධයෙන් සීසීටීවී දර්ශන ද ඇති බවට පුෂ්පිකා ද සිල්වා යන අය වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරයා අධිකරණය හමුවේ ප්‍රකාශ කර සිටියේය.

එහිදී රජයට රුපියල් ලක්ෂ හතක පාඩුවක් සිදු වූ බවට පොලිසිය විසින් ප්‍රකාශ කළ ද ඒ සම්බන්ධයෙන් කරුණු අධිකරණය හමුවේ ඉදිරිපත් කර නොතිබි බැවින් සැකකාරියන් දෙදෙනා ඇප මත මුදා හරින බවට මහේස්ත්‍රාත්වරයා ප්‍රකාශ කළේය.

2019 ලෝක විවාහක රූ රැජන කැරොලයින් ජූරි හා නිරූපණ ශිල්පිනී චූලා පද්මේන්ද්‍ර යන අයට රුපියල් ලක්ෂයක ශරීර ඇපයක් බැගින් නියම කර මුදා හැරීමට කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් බුද්ධික ශ්‍රී රාගල මහතා ඊයේ (19) නියෝග කළේය.

එසේම රජයට සිදු වූ යැයි කියන අලාභය සම්බන්ධයෙන් සාක්ෂි ඉදිරි දින ඉදිරිපත් කිරීමට පියවර ගන්නා ලෙස මහේස්ත්‍රාත්වරයා කුරුඳුවත්ත පොලිසිය වෙත නියම කළ අතර මෙම නඩුව නැවත ලබන ජූනි මස 28 වන දින කැඳවීමට නියෝග කළේය.

# මහරගම නගර සභාවේ මන්ත්‍රීවරියකට පහර දුන් සැකකාර මන්ත්‍රිනිය දැලේ

**සමීර අබේසිංහ නුගේගොඩ සමූහ සහ අවිස්සාවේල්ල විශේෂ-කල්පනී පද්මපෙරුම**

මහරගම නගර සභාවේ පොදුජන එක්සත් පෙරමුණේ නාගරික මන්ත්‍රීවරියකට පහරදීමක් සම්බන්ධයෙන් එම නගර සභාවේ සමගි ජන බලවේගයේ නාගරික මන්ත්‍රීවරියක වන ඉනෝජ් මුණසිංහ මහත්මිය මහරගම පොලීසිය විසින් ඊයේ (19) අත්අඩංගුවට ගෙන තිබේ. මහරගම නගර සභාවේ උප සභාපතිවරයාගේ අවමඟුල් උත්සවය දා මේ මන්ත්‍රීවරියන් දෙදෙනා අතර සිදු වූ බහින්බස් වීමක් දුරදිග යෑමෙන් පහරදීම සිදු කර තිබේ. පහර කෑමට ලක්වූ රසිකා ගුණසිංහ (36) මන්ත්‍රීවරියගේ අතකට හා උදරයේ ප්‍රදේශයේ තද කැක්කුමක් ඇතිවීම හේතුවෙන් ප්‍රතිකාර ලබා ගැනීමට ශ්‍රී ජයවර්ධනපුර මහා රෝහලට ඇතුළත් වී ඇති බවද පොලිසිය පැවැසීය.

විශ්‍රාමික උප සභාපති කරෝලිස් යන අයගේ අවමංගල්‍ය උත්සවයට සහභාගි වීම සඳහා ඉකුත් (15) වැනි දින මහරගම ගොඩිගමුව පොදු සුසාන භූමිය වෙත ගිය අවස්ථාවේදී ඉනොජා මුණසිංහ මන්ත්‍රීවරිය තමන් අසලට පැමිණ සංවර්ධන කටයුත්තක් සම්බන්ධයෙන් විමසා ඇති වූ බහින් බස් වීමකින් අනතුරුව තමන්ගේ අතකට පහරදී තල්ලු කර දැමූ බවත් ඇය රෝහල් පොලිසිය ලබාදුන් ප්‍රකාශයක සඳහන් වන බව පොලිස් නිලධාරියෙක් පැවැසීය. අත්අඩංගුවට ගත් සැකකාර මන්ත්‍රීවරිය නුගේගොඩ මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව රුපියල් ලක්ෂ දෙක බැගින් වූ ශරීර ඇප දෙකක් මත මුදා හරින ලෙසත් පහරදීම සම්බන්ධයෙන් තරයේ අවවාද කරන බවත් නැවත මේ නඩුව ජූලි මස දහනම වන දින කැඳවන ලෙසත් නුගේගොඩ මහේස්ත්‍රාත් අධිකරණයේ මහේස්ත්‍රාත් ප්‍රසන්න ද අල්විස් මහතා නියෝග කර තිබේ.

# රට වෙනුවෙන් නිවැරැදි දේ කරන ඕනෑම අවස්ථාවක එජාපය ආණ්ඩුවට සහාය දෙනවා

## හිටපු ඇමැති වජිර අබේවර්ධන

**මැද කොළඹ සමූහ ආරියරත්න ගනේගොඩ**

රට වෙනුවෙන් නිවැරැදි දේ කරන ඕනෑම අවස්ථාවක එක්සත් ජාතික පක්ෂය ආණ්ඩුවට සහයෝගය දෙන බව හිටපු ඇමැති වජිර අබේවර්ධන මහතා සිරිකොත පක්ෂ මූලස්ථානයේ දී පැවැති මාධ්‍ය හමුවකදී ඊයේ (19) පැවැසීය. වරාය නගරය සම්බන්ධයෙන් වන පනත පාර්ලිමේන්තුවට නොගෙනවිත් සියලු පක්ෂවල, විද්වතුන්ගේ අදහස් විමසා, ලෝක දේශපාලනයට හා විදේශ ප්‍රතිපත්තියට අනුව සකස් කළා නම් වඩාත් යෝග්‍ය බව ද හෙතෙම පැවැසීය. කොළඹ වරාය නගර භූමිය කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ කොටසක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට පාර්ලිමේන්තුවේදී කළ යෝජනාව අනුව එකම රටක නීති පද්ධති දෙකක් ඇතිවීම භයානක තත්ත්වයක් බව ද කීවේය.

# දේව මෙහෙයන්ට උපරිම ආරක්ෂාව දෙන්න

## පොලිස් මූලස්ථානයෙන් විශේෂ නිවේදනයක්

**භක්ති ධර්මප්‍රිය මෙන්ඩිස්**

පාස්කු ප්‍රහාරය සිදුවී වසර 2ක් ගතවන එළඹෙන 21 වනදා පැවැත්වෙන විශේෂ දේව මෙහෙයන් සහ වෙනත් ආගමික උත්සව සඳහා අවශ්‍ය උපරිම ආරක්ෂාව ලබා දෙන ලෙසට පොලිස් මූලස්ථානය විශේෂ නිවේදනයක් නිකුත් කර තිබේ.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන්, නියෝජ්‍ය පොලිස්පතිවරුන්, කොට්ඨාස භාර පොලිස් අධිකාරිවරුන්, පොලිස් අධිකාරිවරුන් සහ පොලිස් ස්ථානාධිපතිවරුන් වෙත එම නිවේදනය නිකුත්කර ඇති බව පොලිස් මාධ්‍ය ප්‍රකාශක නියෝජ්‍ය පොලිස්පති නීතිඥ අජිත් රෝහණ පවසයි.

ඒ අනුව, අදාළ සිහිකිරීම සිදුකරන දේවස්ථානවල පියතුමන්ලා, පූජකතුමන්ලා සහ ආගමික නායකයන් හමුවී ඔවුන් සමඟ සාකච්ඡා කර එම වැඩ සටහන් සම්බන්ධයෙන් අවශ්‍ය පරිදි උපරිම ආරක්ෂාවක් සලසන ලෙස පොලිස් මූලස්ථානය විසින් සියලුම ප්‍රාදේශය අධීක්ෂණ නිලධාරීන් සහ පොලිස් ස්ථානාධිපතිවරුන් වෙත දැනුම් දී තිබේ.

# තහනම් උත්තේජක ලැයිස්තුව හෙට පාර්ලිමේන්තුවට

**ස්වර්ණා විජේකෝන්**

ලෝක උත්තේජන මර්දන නියෝජ්‍යායතනය විසින් 2021 වර්ෂයේදී විවිධ ක්‍රීඩාවන් සඳහා හඳුන්වාදෙනු ලැබූ තහනම් උත්තේජක ඇතුළු තහනම් ද්‍රව්‍ය ලැයිස්තුව හෙට(21) පාර්ලිමේන්තුවේ අනුමැතියට ඉදිරිපත් කරන බව තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍ය නාමල් රාජපක්ෂ මහතා පවසයි.

ලෝක උත්තේජන මර්දන නියෝජ්‍යායතනය විසින් විවිධ ක්‍රීඩාවන් සඳහා තහනම් උත්තේජක ද්‍රව්‍ය ලෙස නම් කරන ලැයිස්තුවක් නිකුත් කරන අතර නොදැනුවත්ව හෝ ක්‍රීඩකයන් මෙම ද්‍රව්‍යයන් තම කුසලතා වර්ධනය සඳහා භාවිත කිරීම ඔවුන් එම තරග ඉසව්වේ තහනමට ලක්වීමට හෝ වෙනයම් ක්‍රියාමාර්ගයකට යොමු කිරීමට හේතුවක් වේ. මේ අනුව 2021 වර්ෂයේ ජනවාරි 01 දින සිට මෙම වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා වලංගු වන තහනම් ද්‍රව්‍ය ලැයිස්තුව මෙසේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිත වේ. මීට අදාළ ගැසට් නිවේදනය පසුගිය පෙබරවාරි 23 වැනිදා නිකුත් කළ බවද අමාත්‍ය නාමල් රාජපක්ෂ මහතා ප්‍රකාශ කළේය. විවිධ ක්‍රීඩා ඉසව්වල නියැළෙන තරගකරුවන් තරග කාලසීමාව තුළදී විශේෂයෙන් සඳහන් කරන ලද අවස්ථාවලදී භාවිත නොකළ යුතු සහ අපහරණයට ලක්විය හැකි ද්‍රව්‍යන් ලෙස භාවිත නොකළයුතු ද්‍රව්‍ය ගණනාවක් මේ මගින් නම්කොට තිබේ.

# පන්නිපිටියේ පාසල් සිසුන් 6කට කොරෝනා

කොට්ටාව, පන්නිපිටිය ප්‍රදේශයේ පිහිටි පාසලක ළමයි 06 දෙනකු කොවිඩ් ආසාදිතයන් බවට හඳුනා ගෙන ඇති බව ප්‍රදේශය භාර මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු තහවුරු කරති.

එම විදුහලේ ප්‍රාථමික අංශයේ ඉගෙනුම ලබන ළමයි සිව්දෙනකු සහ 08 වසරේ ඉගෙනුම ලබන ළමුන් දෙදෙනකුට මෙලෙස වෛරසය ආසාදනය වී ඇති බවට සිදුකළ පීසීආර් පරීක්ෂණවලදී තහවුරු වී ඇත. මේ අතර ඊයේ දිනයේදී මෙරටින් කොරෝනා ආසාදිතයන් 357 දෙනකු වාර්තා වී ඇති අතර ඉන් 70 දෙනෙක් විදේශගතව සිට මෙරට පැමිණි අය වෙති.

# ජල මාපක සොරා ගැනීමේ සිද්ධියට සැක දැරණියගල ප්‍රා/සභා සභාපති යළි රිමාන්ඩ්

**අරණායක ප්‍රදීප් කුමාර ධර්මරත්න**

ජාතික ජල සම්පාදන මණ්ඩලයට අයත් ජල මාපක 98ක් සොරකම් කිරීමේ සිද්ධිය සම්බන්ධයෙන් සැකපිට අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාර ගතකොට සිටි දැරණියගල ප්‍රාදේශීය සභාවේ එජාප සභාපති ලක්ෂ්මන් රාජකරුණා මහතා ඊයේ (19) අවිස්සාවේල්ල මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් පසු මැයි 03 වැනිදා දක්වා තවදුරටත් රක්ෂිත බන්ධනාගාර ගත කරන ලෙස අවිස්සාවේල්ල මහෙස්ත්‍රාත් ජනක සමරසිංහ මහතා නියෝග කළේය.

දැරණියගල කඹුරුගම මියනවිට ප්‍රදේශයේ ජාතික ජල සම්පාදන මණ්ඩලයට අයත් ජල ව්‍යාපෘතියක තිබූ ජල මාපක 98ක් සොරකම් කිරීමේ සිද්ධිය සම්බන්ධයෙන් එජාප ප්‍රාදේශීය සභා සභාපතිවරයා දැරණියගල පොලීසිය විසින් ඉකුත් 18 වැනිදා දෙහිඔවිට ප්‍රදේශයේ දී අත්අඩංගුවට ගෙන පොදු දේපල පනත යටතේ 18 වැනිදා අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු 19 දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කෙරිණි.

# සිසුන්ගෙන් 90%ක් පාසල් ඇවිත්

**සිතාරා සේනානි**

රජයේ සියලු පාසල්වල දෙවන වාරය ඊයේ (19) ආරම්භ වූ අතර, එදින පැමිණීමට නියමිතව සිටි සිසුන්ගෙන් සියයට අනූවක් පමණ පාසල් වෙත පැමිණ සිටි බව අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාසල් කටයුතු) එල්.එම්.ඩී. ධර්මසේන මහතා පැවසීය. ගම්බද පාසල්වල සිසුන්ගේ පැමිණීම නාගරික පාසල්වල සිසුන්ගේ පැමිණීමට වඩා මෙදින ඉතා ඉහළ අගයක් ගෙන තිබූ බව කී අතිරේක ලේකම්වරයා, ඉදිරි දිනවල සිසුන්ගේ පැමිණීම තවදුරටත් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කරන බවද කීය.

# සතොස ආදායම කෝටි 275යි

**අනුර ප්‍රේමලාල්**

සිංහල හා හින්දු අලුත් අවුරුදු කාල සීමාව තුළ එනම් අප්‍රේල් 01 දින සිට 13 වැනි දින දක්වා දිවයින පුරා සතොස අලෙවිසල් ජාලය රුපියල් කෝටි 275ක වාර්තාගත ආදායමක් උපයා ඇත.

පෙර වසරවලට සාපේක්ෂව මෙම වසරේ දී ආදායම ඉහළ නැංවීම සඳහා වෙළෙඳ ඇමැති ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතාගේ සංකල්පයක් මත ක්‍රියාත්මක කරන ලද භාණ්ඩ වර්ග 27ක මිල ස්ථායීකරණ වැඩසටහන හා සතොස සහන මල්ල ව්‍යාපෘතිය බෙහෙවින් ඉවහල් වී තිබේ.

# වරාය නගරයේ මුදල් පාලනය පාර්ලිමේන්තුව යටතට ගත යුතුයි

## ලක්ෂ්මන් කිරිඇල්ල

**අසේල කුරුළුවංශ**

වරාය නගරයේ මුදල් පාලනය පාර්ලිමේන්තුව යටතට ගත යුතු බව සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී, විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ලක්ෂ්මන් කිරිඇල්ල මහතා පවසයි.

පාර්ලිමේන්තුව මඟින් වසරකට වරක් රජයට සම්බන්ධ ආයතනවල ගිණුම් අධීක්ෂණය කරන බවත් කෝප්,කෝපා හා මුදල් කාරක සභාවට වරාය නගරයේ ගිණුම් පරීක්ෂා කිරීමේ හැකියාවක් නොමැති බවත් ඒ මහතා කීය.

අධික වර්ෂාවත් සමඟ ජලයෙන් යටවූ මහනුවර සුදුහුම්පොළ නිවාස හිමියන්ගේ සුවදුක් විමසීමට පෙරේදා (18) පැමිණි අවස්ථාවේ මන්ත්‍රීවරයා මේ බව ප්‍රකාශ කළේය.

# රුපියලේ අගය වැඩි වෙලා

**මහින්ද අලුත්ගෙදර**

අමෙරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල ස්ථාවර මට්ටමට පැමිණ තිබේ. ඒ අනුව පැවැති අගයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අගය ශ්‍රීඝ්‍ර ලෙස ඉහළ ගොස් ඇති බව ශ්‍රී ලංකා මහබැංකු වාර්තා පෙන්වා දෙයි.

## 01 වැනි පිටුවෙන්...

### අධිවේගි මාර්ගවලින් ...

අදාළ කාලසීමාව තුළ වාහන 1,236,288 කට අධික ප්‍රමාණයක් කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය, පිටත වටරවුම මාර්ගය හා දක්ෂිණ අධිවේගී මාර්ගයේ ගමන් කර ඇත.

මේ කාලසීමාව තුළ වැඩිම වාහන ප්‍රමාණයක් අධිවේගී මාර්ගවල ගමන් කර ඇත්තේ අප්‍රේල් 10 වැනිදා ය. එම සංඛ්‍යාව 141,187 කි. එදින උපයා ඇති ආදායම රුපියල් කෝටි 3.8 ( මිලියන 38)කට අධිකය. උත්සව සමයේ සමස්ත අධිවේගී මාර්ග පද්ධතිය තුළින් ලබා ගත් ආදායම, සිදුවූ රථ වාහන අනතුරු පිළිඳව සවිස්තර වාර්තාවක් ඊයේ (19) අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු හා කළමනාකරණ අංශයේ වැඩබලන අධ්‍යක්ෂ එම්. ලොඩ්වික් මහතා විසින් මහාමාර්ග ඇමැතිවරයා වෙත භාර දෙනු ලැබීය. මේ පිළිබඳව අදහස් දැක්වූ ඇමැති ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා,

එදා ජ.වි.පෙ. කිව්වේ දක්ෂිණ අධිවේගී මාර්ග හදනකොට කිව්වේ රාජපක්ෂලාට ඇඹුල්තියල් ගෙනියන්න තමයි මේ අධිවේගී මාර්ගය හදන්නේ කියලා. නමුත් දක්ෂිණ අධිවේගී මාර්ගය නිසා කාලය ඉතිරි වෙනවා. අද මේ අධිවේගී මාර්ග පද්ධතිය නිසා ගම්බිම් බලා යන ජනතාවට ප්‍රතිලාභ ලැබෙනවා. ඔවුන්ගේ ඉන්ධන පිරිවැය සහ ගමන් කාලය මේ අධිවේගී මාර්ග පද්ධතිය නිසා අඩු වෙනවා. රුපියල් මිලියන 349කට ආසන්න ආදායමක් මේ අධිවේගී මාර්ග පද්ධතිය නිසා අද අපට ලැබී තිබෙනවා. හණමිටි අදහස් තිබෙන මිනිසුන් සිටින තාක් මේ රට දියුණු කරන්න බැහැ. එම නිසා අපි ජනතාව තුළ ආකල්පමය වෙනසක් ඇති කළ යුතු යැයි පැවසීය.

### ශ්‍රීලනිපොස පක්ෂ ...

කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් මැයි දින පෙළපාළි නොපවත්වා සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව මැයි දින රැලිය පමණක් පැවැත්වීම පිළිබඳ මෙහි දී පක්ෂ නායකයන්ගේ අවධානය යොමු වීම විශේෂත්වයකි.

ඊයේ පෙරවරු 10.30ට අරලියගහ මන්දිරයේ දී එම රැස්වීම කැඳවා තිබුණු අතර පළාත් සභා මැතිවරණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ සහ ආණ්ඩුවේ හවුල්කාර පක්ෂ අතර පවතින මතභේද ඉවත්කර ගැනීම ඇතුළු කරුණු කිහිපයක් සාකච්ඡා කිරීම සඳහා පැවතිණි. එම රැස්වීමට 51 දෙනකුට ආරාධනා කර තිබේ. කෙසේ වුවද විමල් වීරවංශ, උදය ගම්මන්පිල සහ වාසුදේව නානායක්කාර ඇමැතිවරුන් එහිදී පෙන්වා දී ඇත්තේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ සමඟ ගිවිසුම්ගත පක්ෂ ඇත්තේ 14ක් පමණක් බවත් සාමාන්‍යයෙන් පක්ෂ නායක රැස්වීමට 20 දෙනකුට ආසන්න පිරිසක් සහභාගී වන නමුත්, මෙම රැස්වීමට 51 දෙනකුට ආරාධනා කර ඇති බවත්ය.

ඒ අනුව තම පක්ෂවල ගැටළු මෙම රැස්වීමේ දී සාකච්ඡා කළ නොහැකි බැවින් වෙනත් දිනයක ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට යෝජනා කර අදාළ ඇමැතිවරුන් තිදෙනා අරලියගහ මන්දිරයෙන් පිටව ගොස් ඇති බවද වාර්තා වෙයි.

### විශ්වවිද්‍යාල 27දා ...

සෞඛ්‍ය නිර්දේශවලට දැඩි ලෙස අනුගත වෙමින් මෙසේ විශ්වවිද්‍යාල විවෘත කරන බවද ඇමැතිවරයා කියයි. ඇමැති මහාචාර්ය ජී.එල්. පීරිස් මහතා මේ බව පැවසුවේ කොළඹදී ඊයේ (19) පැවති ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මාධ්‍ය හමුවේදී ය. නේවාසිකාගාර විවෘත කිරීමේදී ගැටලුවක් පවතින බැවින් විශ්වවිද්‍යාල ආරම්භයේ දී 4 වැනි හා 3 වැනි වසරේ සිසුන් පමණක් ගෙන්වා ගන්නා බවද ඇමැතිවරයා එහිදී සඳහන් කළේය. ඉන් පසු පළමු හා දෙවැනි වසරේ සිසුන් සඳහා පන්ති ආරම්භ කිරීමට නියමිත බව කී ඇමැතිවරයා, විශ්වවිද්‍යාල විභාග පැවැත්වීමට අවශ්‍ය සියලු කටයුතු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සංවිධානය කර ඇතැයි ද කීය. විෂය මාලා ආවරණය කර ගැනීමට ඇති අවශ්‍යතාව මත මේ තීරණය ගත් බවත් ඇමැතිවරයා සඳහන් කළේය.

මෙවර අපොස උසස් පෙළ විභාගය ඔක්තෝබර් මස 4 වැනි දින සිට ඔක්තෝබර් 30 වැනිදා දක්වා පැවැත්වෙන බවද, ශිෂ්‍යත්ව විභාගය ඔක්තෝබර් මස 3 වැනි ඉරිදා දින පැවැත්වෙන බවද සඳහන් කළ ඇමැතිවරයා, අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය 2022 වසරේ ජනවාරි අවසන් සතියේ පැවැත්වෙන බවද පැවසීය.

### වරාය නගර ...

අගවිනිසුරු ජයන්ත ජයසූරිය මහතාගේ ප්‍රධානත්වයෙන්, බුවනෙක අලුවිහාරේ, ප්‍රියන්ත ජයවර්ධන, මුර්දු ප්‍රනාන්දු, ජනක් ද සිල්වා යන මහත්වරුන් ගෙන් සමන්විත පංච පුද්ගල විනිසුරු මඬුල්ල හමුවේ කැඳවනු ලැබිණ. මෙම පනත් කෙටුම්පතට එරෙහිව පෙත්සම් 19ක් ගොනු කර තිබුණි. ශ්‍රී ලංකා නීතිඥ සංගමය, එක්සත් ජාතික පක්ෂ සභාපති වජිර අබේවර්ධන සහ මහලේකම් පාලිත රංගේ බණ්ඩාර, සමගි ජනබලවේගයේ මහලේකම් රංජිත් මද්දුම බණ්ඩාර, එහි තරුණ පෙරමුණේ හර්ෂණ රාජකරුණා, ජනතා විමුක්ති පෙරමුණ දේශපාලන මණ්ඩල සභික වසන්ත සමරසිංහ යන මහත්වරුන්, තොරතුරු තාක්ෂණ වෘත්තීයවේදීන්ගේ සංගමයේ සභාපති ජී කමල් රේණුක පෙරේරා, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ එහි විධායක අධ්‍යක්ෂ පාක්‍යසෝති සරවනමුත්තු, ලෙස්ලි දේවේන්ද්‍ර, ජී.එස්.ශ්‍යාමලී, මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමියන්, රජික කොඩිතුවක්කු, ආචාර්ය අජන්තා පෙරේරා, බන්දුල චන්ද්‍රසේකර, ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල්, නාගානන්ද කොඩිතුවක්කු, ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපති ජනාධිපති නීතිඥ සාලිය පීරිස්, එහි ලේකම් නීතිඥ රජීව් අමරසූරිය, රවීනා ගයේන්දී ද සිල්වා විසින් මෙම පෙත්සම් ගොනු කර තිබුණි. මෙම පෙත්සම්වල වගඋත්තරකරු ලෙස නීතිපතිවරයා නම් කරනු ලැබ සිටිති.

පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන 'කොළඹ වරාය නගර ආර්ථික කලාප විශේෂ කොමිසම් සහා පනත් කෙටුම්පත'ට එරෙහිව ගොනු කර ඇති පෙත්සම්වල විරුද්ධව කරුණු දැක්වීම සඳහා මැදිහත් පාර්ශ්ව පෙත්සම් කිහිපයක් ද ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කර තිබේ.

ජනාධිපති ලේකම් ආචාර්ය පී බී ජයසුන්දර, අධ්‍යාපන ඇමැති මහාචාර්ය ජී. එල්.පීරිස්, කැබිනට් මණ්ඩල ලේකම්වරයා, මුදල් ඇමැතිවරයා, පොදුජන පෙරමුණේ නීතිඥ සංගමය ඇතුළු පිරිසක් විසින් මෙම අතරමැදි පෙත්සම් ගොනු කර ඇත.

මෙම සියලු දෙනාටම කරුණු දැක්වීමට අවස්ථාව දිය යුතු බැවින් පෙත්සම් පිළිවෙළින් කැඳවීමටත් , එක් පෙත්සමක්වෙනුවෙන් එක් නීතිඥවරයකුට විනාඩි 20-30ක කාලයක් කරුණු දැක්වීමට ලබා දීමටත් විනිසුරු මඬුල්ල තීරණය කළ බව අගවිනිසුරු ජයන්ත ජයසූරිය මහතා සඳහන් කළේය. ඒ අනුව කරුණු දැක්වීම අරඹන ලදී.

එම පනත් කෙටුම්පත නීතියක් බවට පත් වීමට නම් පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බහුතර ඡන්දයෙන් සහ ජනතාව විසින් ජනමත විචාරණයක දී සම්මත කළ යුතු බවට තීන්දු කරන ලෙස සිය පෙත්සම් මගින් පෙත්සම්කරුවෝ ශ්‍රේෂ්ඨාධිකරණයෙන් ඉල්ලා සිටිති.

ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාව හා ස්වෛරීත්වයට හානි කරමින් වරාය නගර කොමිසම පනත යටතේ කොමිසම ස්ථාපිත කර බලය පැරීමට කටයුතු කර ඇති බව පෙත්සම්වල සඳහන් වේ.

කොළඹ වරාය නගර කොමිසම යටතේ වරාය නගරයේ ව්‍යාපාර ආරම්භ කරන ව්‍යාපාරිකයන්ට විශාල බදු සහනදීම, බදු රහිත වැටුප් සහ අක්වෙරළ මූල්‍ය මධ්‍යස්ථාන ක්‍රියාත්මක කිරීම හා මූල්‍ය විශුද්ධිකරණයට ඉඩ සැළසීම, වසර 40ක් දක්වා බදු විරාම පැවරීම යනාදිය මෙන්ම වෙනම පරිපාලන ව්‍යුහයක් රටේ පාලනයට පරිබාහිරින් පිහිටුවීම යනාදී කරුණු තුළින් ශ්‍රී ලංකාවේ ස්වෛරීත්වයට හානි කර ඇති බව පෙත්සම්වල සඳහන් වේ.

මෙම කොමිසම පිහිටුවීම මගින් රටේ ජාතික ආරක්ෂාවට සහ ජාතික ආර්ථිකයට තර්ජනයක්වන බවද පෙත්සම් මගින් පෙන්වා දී ඇත.

වරාය තුළ ඇති ඉඩම් පැවරීම බදු දීම, විකිණීම සම්බන්ධයෙන් වන පූර්ණ බලය මෙම කොමිසමට පැවරීම මෙමගින් සිදු වන අතර එම පරිශ්‍රයේ වැඩ කරන අයගේ වීසා අනුමත කිරීමේ පූර්ණ බලය ද එයට හිමිවන බව පෙත්සම්වල සඳහන් වේ.

එසේම වරාය නගරය තුළ ට පමණක් ක්‍රියාත්මක වන විශේෂ බදු සහන සහ වරප්‍රසාද මෙමගින් හඳුන්වා දී ඇති අතර එය පාර්ලිමේන්තුව සතු මූල්‍ය බලය කප්පාදු කිරීමක් බවට පැමිණිලි කරමින් මෙම පෙත්සම් ගොනු කර ඇත.

එබැවින් මෙම පනත් කෙටුම්පතේ වගන්ති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 01,03,04,(d) (e),12(1),14(1)g, 27(2)a ,27(3),148,154(g),යන වගන්තිවලට පටහැනි බවට තීරණය කරන ලෙස පෙත්සම් මගින් ඉල්ලා ඇත.

## 01 වැනි පිටුවෙන්...

### කෝටියක කසළ තේ ...

අපනයනය කිරීමට සූදානම් කර තිබූ මෙම සකළ තේ තොගය ශ්‍රී ලංකා රේගු අපනයන පහසුකම් සැපයීමේ මධ්‍යස්ථානයේදී අත්අඩංගුවට ගෙන තිබෙන බව රේගු මාධ්‍ය ප්‍රකාශක, නියෝජ්‍ය රේගු අධ්‍යක්ෂ (නීති කටයුතු) සුදත්ත සිල්වා මහතා පවසයි.

### වරාය නගර ව්‍යාපෘතියෙන් ...

වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනත තුනෙන් දෙකක බලයකින් පාර්ලිමේන්තුවේ සම්මත කළ යුතුද නැද්ද බවට තීරණය වන්නේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දෙන තීන්දුව අනුව යැයි ද ප්‍රේමජයන්ත මහතා පැවැසීය.

### විනාඩි 2ක ...

කොළඹ දී ඊයේ (19) පැවැති මාධ්‍ය හමුවකදී කාදිනල් හිමිපාණෝ මෙම ඉල්ලීම කළ අතර 2019 වසරේ අප්‍රේල් 21 වන දින කොටහේන කොච්චිකඩේ ශාන්ත අන්තෝනි කතෝලික දේවස්ථානයේ උදෑසන 8.45ට මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරය එල්ල වූ බැවින් එය සිහිකිරීම වෙනුවෙන් එලෙස නිහඬතාවක් පවත්වන ලෙස උන්වහන්සේ ඉල්ලා සිටියහ.

පසුව දේව මෙහෙයන් පවත්වා ප්‍රහාරයෙන් මියගිය ජනතාව වෙනුවෙන් ශෝකය පළ කරන බවත් උන්වහන්සේ පැවැසූහ.

### ඉතාලියේ සේවය ...

පෙරේදා (18) සවස 4.00 පමණ එම සිරුර රැගෙනවිත් ඇති අතර මියගොස් ඇති පුද්ගලයා ගම්පහ, නැඳුන්ගමුව ප්‍රදේශයේ පදිංචිව සිටි 32 හැවිරිදි පුද්ගලයකු බව වාර්තා වේ. ඔහු ඉතාලියේ, ඇප්‍රේනියා නගරයේ සේවය කළ අයකු බව පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා පැවසීය.

ඔහු සේවය කළ ස්ථානයේ ඇති වූ යම් සිද්ධියකදී මේ පුද්ගලයා මියගොස් ඇති බවත් ඉන්පසුව ඔහුගේ සිරුර ශ්‍රී ලංකාවට රැගෙනවිත් ඇති බවත් පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා සඳහන් කළේය.

# දුහුනන්ට සෙවණ දුන් මහා වනස්පතිය

## රත්නායක වනසිංහ



ගෙවී ගිය අප්‍රේල් දොළොස් වෙනිදා මහනුවර පෞරාණික මහයියාව පොදු සුසාන භූමියේ දුම් බටයෙන් ඉහළට නැගුණු සුදු පාට දුම් රැල්ල, සුදු පාට හදවතක් තිබූ මහාමේරුවක් වැනි මිනිසකුට අයත් විය. මනුස්ස ගුණධර්ම පිළිබඳ පිවිතුරුම පැහැය ඒ සුදුපාටෙහි අන්තර්ගතව තිබුණාට සැක නැත. ඔහුගේ ජීවිතය පරිත්‍යාගයන්ගෙන්, අත දීම්වලින් හා මග පෙන්වීම්වලින් පිරී පැවතිණි. රත්නායක වනසිංහ නම් වූ උදාර මිනිසාට අයත් වූ ඒ ගුණාංග තුනෙන්ම ජීවිතය සරි කරගත් අපට ඔහුගේ අහිමි වීම ගැන විශේෂ වැලපුමක් ඇත.

පසුගිය දශක පහේ හයේ මහනුවර ඉතිහාසය ලියන විට රත්නායක වනසිංහ නාමය එයට ඇතුළත් විය යුතුමය. ඔහු කොළඹ නුවර යා කළ සංස්කෘතික තානාපතිවරයෙක් විය. වට වන්දනාවේ යන විට සිරිමහ බෝධිය වඳින්නට අනුරාධපුරයට ගොඩ වදින්නාක් මෙන් මහනුවරට අවටින් හෝ මහනුවර යන බොහෝ කලාකරුවන් සහ සංස්කෘතික වියතුන් එකල නව කච්චේරි ගොඩනැගිල්ලේ පිහිටි ඔහුගේ නිවස්නයට ගොඩවැදී යෑමේ පුරුද්දක් තිබිණි. ඒ ඔහුගේ මිත්‍රශීලී බවට හා බහුශ්‍රැත බවට ප්‍රණාම පුදන්නටය.

ඔහු තමන්ගේම අත්දැකීම් ඇසුරෙන් හා විශ්වාස පද්ධතියක් ඔස්සේ අර්ථ දක්වා ගත් සමාජවාදී දැක්මක් තිබිණි. ඇතැම් විට අපට ගැටෙන්නට සිදු වූයේ ඒ කාරණය සම්බන්ධව පමණකි. වනසිංහයන් උපත ලැබූ බදුල්ල දිස්ත්‍රික්කයේ පස්සර, ලුණුගල ගම්මානයේ සිට මහනුවරින් අවසන් වූ රාජ්‍ය සේවකයකු, ජනමාධ්‍යවේදියකු හා කලාකරුවකු ලෙස ගෙවා දැමූ ජීවිතය පරාර්ථයෙන් පිරී පැවතිණි.

ගම, නගරය හා ලෝකය ගැන එක ලෙස වැටහීමක් තිබුණු වනසිංහයන් ඒ වැටහීම ලබා ගත්තේ අත්දැකීම්, ආශ්‍රයන් හා කියවීම ඇසුරෙනැයි මට සිතේ. 'ජීවිතයට අර්ථයක් සැපයිය හැක්කේ පරාර්ථ සේවයෙනැයි ' විශ්වාස කළ වඳ වී යන ඩයිනෝසර පරපුරක වැදගත් සාමාජිකයකු වන ඔහු ඒ බව සිය ජීවිතයෙන්ම උදාහරණ කොට පෙන්වීය. ඔහුගේ පරම්පරාවේ උගතුන්ට හිමි උරුමයක් වූ ද්විභාෂක බවට අමතරව දෙමළ භාෂා පරිහරණයෙහිද වනසිංහයෝ සමත්කම් පෑහ. එහෙයින්ම ඔහුගේ මිත්‍ර වළල්ල සෑම ජාතිකයකුගෙන්ම සැදුණු එකකි. සෑම තරාතිරමක උගත්තු ඒ වළල්ල තුළ සිටියෝය. වනසිංහයන් අනුදත් දේශපාලනය නිසා මහපොළොවේ දූවිලි කමින් වැඩ කරන මිනිසුන්ද ඔහු හිතමිත්‍රාදීන් ලෙස ඇසුරු කළේය. එතුමන් කැටිව ගමනක් යතොත් ගමනාන්තයට යෑමට සාමාන්‍ය කෙනකුට ගත වන කාලයට වඩා පස්ගුණයක්වත් ගත වේ. ඒ ඔහුට හමු වන අනේකවිධ මිතුරන් සමග නැවතී මඳක්' කතා කරන්න වැය වන කාලය නිසාය.

දශකයකට ආසන්න කාලයක් ඔහු සමග වූ සමීප ඇසුර නිසා ඔහු අනුදත් අතීත සමාජය වෙත පියමං කිරීමට මටද වාසනාව ලැබිණි. ඌව පළාත් වැසියකුවූ ඔහු, ඒ පළාතේම තමන් කළ දිගුකාලීන රාජ්‍ය සේවා ජීවිතය හා ඊට සමාන්තරව දිගාමඩුල්ල ආශ්‍රිත අත්දැකීම් අපට ගෙනහැර පෑවේ නාටකීය ආකාරයකිනි. එතුමන්ට මායාරංජන් වැනි අපේ රටේ ප්‍රදේශීය ජන ජීවිතය වාර්තා කළ මහා ලේඛකයන් සමග සමීප ඇසුරක් තිබිණි. වනසිංහයන්ගේ භද්‍ර යෞවනයේ ජීවිතය බෙදා හදා ගත් ප්‍රධාන සමකාලීනයන් කිහිපදෙනකුගේ නම් මට මතකය. ඒ එස්.ජී. පුංචිහේවා, පියසේන කහඳගමගේ හා පියදාස වැලිකන්නගේ ය. ඔවුන් තිදෙනා හා ඔහු ඇසුරු කළ එවැනි තවත් බොහෝ දෙනෙක් ලාංකේය සාහිත්‍ය ක්ෂේත්‍රයේ සහ වෘත්තීය ක්ෂේත්‍රයන්හි තමන්ගේම වූ අනන්‍යතාවන් පිහිටුවූවෝය. කහඳගමගේ මහතා මා පළමු වරට දුටුවේත් වනසිංහ මහතා එකල පදිංචිව සිටි මහනුවර නිවසේදීය.

මෙම ලිපියේ උද්ධෘත කොට දක්වන යෙදුම වන 'මහනුවර වනස්පතිය' යන්නට වනසිංහයන් සුදුසුකම් ලබන්නේ කෙසේද? කලාවේල සමාජ දේශපාලන ජීවිතයේ විවිධ මානයන්හි නියුතු මහ පිරිස් වෙත ඔහු දුන් සෙවණ නිසාවෙනි මේ යෙදුම ඔහුට ගැළපෙන්නේ. ඔහු අපට අහිමි වන්නේ ඔහුගේ අසූ නව වන වියේදීය. ඔහු සමග ඇසුරු කළෝ පරම්පරා ගණනාවකට අයත් උදවියය. වනසිංහයෝ ඒ පසු පරම්පරාවන් සමග ඇසුරු කිරීමේදී ඔවුන්ට සවන් දුන් අතර ඔවුන් මැනවින් වටහා ගත්හ. නැඟී එන නිර්මාණශීලීන්ට නොමසුරුව අතහිත දුන්හ.

විශ්‍රාම ජීවිතයෙන් පසුව මහනුවර යටිනුවර වීදියේ ඔහු ආරම්භ කළ කුඩා අවන්හල බොහෝ කලාකරුවන්ට හා සමාජ ක්‍රියාධරයිනට අපූරු 'සම්මුඛ ස්ථානයක්' විය. ඊට පෙර එවැන්නන්ට මුණගැසීමට තැනක් වූයේ ගුණසේන සාප්පුවයි. ෂෝපන්හවර් සහ නීට්ෂේ ගැන පොතක් පවා ලියූ ඩයස් ගුනවර්ධන එකල එහි කළමනාකරුවා විය. වනසිංහ මහතාගේ අවන්හලට හිටිවන කවියන් , අනෙකුත් සාහිත්‍යධරයන්, පත්තරකාරයන්, නර්තන ශිල්පීන් , ධර්මසේන පතිරාජ වැනි සිනමාවේදීන්, සුචරිත ගම්ලත් වැනි විචාරකයන් පවා ගොඩවූයේ තේ බොන්නට නොව 'සහෘද සම්මුඛ සුවය' විඳින්නටය.

වනසිංහ මහතා හිටිවන කවියකු නොවූවද මහනුවර තරුණ කවි සමාජයේ බලවත් අනුග්‍රාහකයෙකි. පනහේ හැටේ දශකවල මහනුවර සමාජයේ මහපොළොවේ දේශපාලනයේ හැටි මේ යැයි හඳුනා ගන්නට වනසිංහ මහතා මඟින් හඳුනාගත් සුමනදාස නන්දසේන වැන්නෝ මට මහත්සේ මහෝපකාරී වූහ.

වනසිංහ මහතාගේ සාහිත්‍ය දර්ශනය බොහෝ විට සැකසී තිබණේ සමාජ සත්තා යථාර්ථවාදය ඇසරෙනි. පරිවර්තන යුගයේ සෝවියට් ලේඛකයන් සහ ඔවුනගේ නිර්මාණ අභ්‍යන්තරය ගැන අවබෝධයෙන් හා මතකමාත්‍ර වශයෙන් වූ දැනුමක් ඔහුට තිබිණ. වී.එස්.නයිපෝල් වැනි ලේඛකයන් සහ වොලී සොයින්කා, චිනුවා අචිබේ වැනි අප්‍රිකාවේ සමාජ දේශපාලන ගැඹුර නිර්මාණයට නැංවූ ලේඛකයන් ගැන වනසිංහයින්ට ගැඹුරු අවබෝධයක් තිබිණි. ඔහුගේ ප්‍රාර්ථනාව වූයේද ලංකාවේ තරුණ ලේඛකයන් අචිබේලා, සොයින්කාලා මෙන් අප සමාජයේ සමාජ දේශපාලන යථාව ගැඹුරින් නිරූපණය කළ යුතු බවයි. වනසිංහයෝම වී.එස්.නයිපෝල්ගේ කෘතියක් වන එසටමැක්"එරුඑ මිගියුල් වීදිය නමින් සිංහලයට නැඟුවේය.

රත්නායක වනසිංහයන්ගේ දීර්ඝ මාධ්‍ය මෙහෙවරෙහි මිහිරිතම ඵලය 'උඩරට සංදේශය' නම් පුවත්පත් කොළමයි. එය ඔහු රචනා කළේ 'නිලමේ' නම් අනවර්ථ නාමයෙනි. දයාසේන ගුණසිංහයන්ගේ ආරාධනයෙන් දිවයින පුවත්පත ආරම්භයේ ලියන්නට පටන්ගත් මෙම අගනා කොලම අවුරුදු විසිපහකට වැඩි කාලයක් ඔහු රචනා කළේය. සමහර විට පුවත්පතක පළවූ දීර්ඝතම කොලම 'උඩරට සංදේශය' විය හැකිය. තම කුඩා අවන්හලෙහි හමු වන ලොකු කුඩා සිවිල් බල සහිත හා රහිත මිනිසුන් ඇසුරු කිරීමෙන් ලබන තොරතුරු හා තමාගේම වූ අත්දැකීම් හා සමාජාවබෝධය මිශ්‍ර කරමින් ඔහු සතිපතා ලියූ උඩරට සංදේශය යුක්තිය පතා වූ මහජනයාගේ ගතු කීම මැනවින් සටහන් විය.

වනසිංහයන්ගේ දීර්ඝ, පරාර්ථකාමී සාධු චර්යාව බොහෝ දුහුනන්ට සෙත සැලසීය. නිසි අත්වැලක් විය. එවැනි උපත් දුලබ උපත් ගණයට වැටේ. විශේෂයෙන් අනිකා හඹායමින් පරමාර්ථ සාධනයේ යෙදෙන සමාජයක එසේ නොවන්නේ කෙසේදැයි සිය ජීවිතයම උදාහරණ කොට පෙන්වා ලීය. පුරෝගාමියාණනි ඔබට සුබ ගමන්.

**චන්ද්‍රරත්න බණ්ඩාර**

# නිවැරදි තොරතුරු ජනගත කිරීමට හැකි උපරිම උත්සාහ කරනවා

## රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ වැඩ භාරගනිමින් ප්‍රවීණ මාධ්‍යවේදි මොහාන් කියයි



නිවැරදි තොරතුරු, නිවැරදිව ජනගත කිරීමට කටයුතු කරමින් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත කාර්ය භාරය ඉටු කිරීමට හැකි උපරිම උත්සාහය ගන්නා ලෙස රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් මොහාන් සමරනායක මහතා පවසයි.

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේදී ඊයේ (19) අභිනව ධුරයේ රාජකාරි භාරගනිමින් ප්‍රවීණ මාධ්‍යවේදී මොහාන් සමරනායක මහතා මේ බව පැවසීය.

වැඩිදුරටත් ඒ මහතා ඉල්ලා සිටියේ, ජනතාව වෙනුවෙන් යහපත්, සාධාරණ හා යුක්තිගරුක සමාජයක් ගොඩනැගීමට කටයුතු කරන ලෙසත් ඒ සඳහා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ලෙස නිවැරදි තොරතුරු භාවිතා කරන ලෙසත්ය.

කවර හෝ රටක ප්‍රගමනයේදී අතිශය වැදගත් සාධකයක් ලෙස තොරතුරු, ප්‍රවෘත්ති හා දැනුම නම් කළ හැකි බවත් දැනුම හා තොරතුරු පාලනය කරන්නාට රටත් ජනතාවත් පාලනය කළ හැකි බවත්, නිවැරදි තොරතුරුවලින් ජනතාව සන්නද්ධ කරන ප්‍රමාණයට ජනතාව නිවැරදි තොරතුරු ගන්නා බවත්, ඒ නිවැරදි තොරතුරු හරහා පවත්නා ආණ්ඩුවේ ආර්ථික, සමාජීය හා දේශපාලනික ප්‍රතිපත්ති සාර්ථක කරගැනීමට හැකියාවක් පවතින බවත්, මොහාන් සමරනායක මහතා වැඩිදුරටත් පැවසීය.

එම නිසා නිවැරදි තොරතුරු ලබා දෙමින් ජනතාව දැනුම්වත් කිරීමේ කාර්යභාරය ප්‍රශස්ත මට්ටමට දියුණු කරගැනීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටින බවද ඒ මහතා කීය.


### වෙළෙඳ අමාත්‍යාංශය
### සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව

## බදු පදනම මත කාර්යාල පරිශ්‍ර සහ ගබඩා ලබාදීම සඳහා මිල ගණන් කැඳවීම

සමුපකාර තොග වෙළෙඳ සංස්ථාවට අයත් පහත සඳහන් කාර්යාල පරිශ්‍ර සහ ගබඩා බදු පදනම මත ලබාදීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබේ.

| අනු අංකය | ස්ථානය | ව. අ. ප්‍රමාණය |
|---|---|---|
| 01 | මාළිගාවත්ත සතොස ගබඩා සංකීර්ණය අංක 160, කොළඹ 10. ගොඩනැගිලි අංක 3 | 100 |
| 02 | තිග්‍රිස් ගොඩනැගිල්ල, නො. 109, යෝර්ක් වීදිය, කොළඹ 01 | 25092 |
| 03 | බදුල්ල සතොස පරිශ්‍රය, අංක 29, බණ්ඩාරවෙල පාර, බදුල්ල | 21522 |
| 04 | මාතර සතොස, නො. 16 ගුඩ්ෂෙඩ් පාර, මාතර. | 21207 |
| 05 | ඩී. ආර්. විජේවර්ධන මාවත, අංක 40, කොළඹ 10. | 20753 |
| 06 | සතොස පරිශ්‍රය, නන්දිමිත්‍ර මාවත, කතරගම, පළමු මහල. | 1350 |
| 07 | සතොස හන්දිය, 484 තොග ගබඩාව, හිඟුරක්ගොඩ. | 7100 |
| 08 | ඩී. ආර්. විජේවර්ධන මාවත, අංක 109, තොග ගබඩාව. | 21223 |

මුදල් අයකැමි වෙත ආපසු නොගෙවනු ලබන රු. 1,000.00 ක ගාස්තුවක් ගෙවීමෙන් පසු ප්‍රසම්පාදන අංශය වෙතින් ටෙන්ඩර් අයදුම්පත් ලබාගත හැකිය. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේදී රු. 15,000.00 ක ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් තැන්පතුවක් 2021.05.11 වන දින පෙ.ව. 10.00 ට පෙර ගෙවිය යුතුය.

ටෙන්ඩර් අයදුම්පත් 2021.05.11 වන දින මධ්‍යහ්න 12.00 පැයට ප්‍රථම අංක 20 දරන ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට කටයුතු කළ යුතු අතර, එම අවස්ථාවේදීම මිල ගණන් විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට අයදුම්කරුට හෝ ඔහුගේ බලයලත් එක් නියෝජිතයෙකුට සහභාගි විය හැකිය.

කාර්යාල පරිශ්‍ර පරීක්ෂා කිරීම 2021.04.27 වන දින සිට 2021.05.07 වන දින දක්වා රජයේ කාර්යාල වැඩකරන දින තුළ පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා සිදු කළ හැකිය. වැඩිදුර තොරතුරු හා කාර්යාල පරිශ්‍ර පරීක්ෂා කිරීම සඳහා පහත දුරකථන අංක අමතා විස්තර ලබාගන්න.

- දු.ක. අංක – 0112337549 / 2435554
- ජංගම දු.ක. අංක – 077-6939606 (සම්පත් මහතා)

අවසන් තීරණය ටෙන්ඩර් මණ්ඩලය සතුය.

**සභාපති, ප්‍රසම්පාදන කමිටුව,**
**සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව,**
**අංක 27, වොක්ෂෝල් වීදිය,**
**කොළඹ 02.**



### සී/ස ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව
### ග්‍රාමීය නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන අමාත්‍යාංශය

## දැන්වීමයි

නිවෙස්වල නාන කාමර තුළ සහ මුලුතැන් ගෙවල්වල බිමට සහ බිත්ති මත ඇතිරීමට යොදගන්නා පිඟන් ගඩොල් වර්ග (Wall Tile & Floor Tile) අප ආයතනය විසින් ආනයනය කිරීමට අදහස් කර ඇත.

එම ව්‍යාපාරයන්හි දැනට යෙදී සිටින එම ද්‍රව්‍ය අලෙවියට කැමැත්තක් දක්වන සමාගම් / ව්‍යාපාරිකයන් වෙත මෙයින් ඇරයුම් කරන අතර, ඒ සඳහා අප ආයතනයේ ලියාපදිංචි විය යුතු වේ.

අදාළ පෝරමයන් 2021.04.29 දින තෙක් මෙම කාර්යාලයේ පරිපාලන අංශය වෙතින් ලබාගත හැකිය. වැඩි විස්තර සඳහා සී/ස ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ සාමාන්‍යාධිකාරී අමතන්නේ නම් මැනවි.

**සභාපති,**
**සී/ස ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව**
**අංක 541, ශ්‍රී සංඝරාජ මාවත,**
**කොළඹ 10.**
**දුරකථන අංක 011-2345914 / 011-2326701-2**



### පරිසර අමාත්‍යාංශය
### ජී.එස්.එම්.බී. ටෙක්නිකල් සර්විසස් (පුද්) සමාගම

## ජී.එස්.එම්.බී. ටෙක්නිකල් සර්විසස් (පුද්) සමාගම යටතේ කෑගල්ල සහ කොළඹ වැලි අංගන ස්ථාපිත කිරීම සඳහා මිල ගණන් කැඳවීම
**ටෙන්ඩර් අංකය - GSMBTS/PUR/NCB/2021-17**

පරිසර අමාත්‍යාංශය යටතේ ස්ථාපිත රාජ්‍ය ව්‍යාපාරික සමාගමක් වන ජී.එස්.එම්.බී. ටෙක්නිකල් සර්විසස් (පුද්) සමාගම යටතේ කෑගල්ල සහ කොළඹ යන දිස්ත්‍රික්කයන්හි වැලි අංගන ස්ථාපිත කිරීමට ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලය තීරණය කර ඇත. මේ සඳහා පර්චස් 60කට නොඅඩු ඉඩම් දෙකක් අදාල දිස්ත්‍රික්ක තුළින් වෙන වෙනම තෝරා ගැනීමට අවශ්‍යව ඇත. එසේම මනම්පිටිය වැලි ව්‍යාපෘතියේ සිට තෝරාගනු ලබන ඉඩම් දක්වා, වැලි ප්‍රවාහනය සඳහා ටිපර් රථ යෙදවීමද කොන්ත්‍රාත්කරු විසින් සිදුකළ යුතුය. මේ සඳහා සුදුසුකම් ඇති සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

මිල කැඳවීමේ කොන්දේසි ඇතුලත් ටෙන්ඩර් ලේඛණ ජී.එස්.එම්.බී. ටෙක්නිකල් සර්විසස් (පුද්) සමාගමේ, ප්‍රසම්පාදන අංශය වෙතින් ආපසු නොගෙවන **රු.2000.00** ටෙන්ඩර් ගාස්තුවක් ගෙවා **2021/04/20** දින සිට **2021/05/10** දින දක්වා **පෙ.ව. 09.00** සිට **ප.ව. 03.00** දක්වා පහත ලිපිනයෙහි සඳහන් අප සමාගමෙන් ලබා ගත හැක. (ලංසු ලේඛනය මිලදී ගැනීමට පෙර **www.gsmbts.gov.lk** යන වෙබ් ලිපිනයට පිවිසීමෙන් ලංසු ලේඛණ පරීක්ෂා කළ හැකිය.)

සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රිකා පිටපත් දෙකකින් යුතුව (මුල් පිටපත හා අනු පිටපත යනුවෙන් සඳහන් කර) **2021/05/11** දින **ප.ව. 02.00ට** පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ පහත ලිපිනයෙහි සඳහන් අපගේ ප්‍රධාන කාර්යාලයේ 3 වන මහලේ, ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැක. ටෙන්ඩර් විවෘත කිරීම **2021/05/11 ප.ව 2.00ට** ජී.එස්.එම්.බී. ටෙක්නිකල් සර්විසස් (පුද්) සමාගමේ රැස්වීම් ශාලාවේදී සිදු කරනු ලැබේ. මේ සඳහා ඔබට හෝ ඔබ ආයතනයේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැක. ප්‍රමාදවී ලැබෙන මිල ගණන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**0112827850** දුරකථන අමතා ප්‍රසම්පාදන අංශයෙන් මේ පිළිබඳව වැඩි විස්තර ලබා ගත හැක.

**සභාපති**
**ප්‍රසම්පාදන කමිටුව,**
**ජී.එස්.එම්.බී. ටෙක්නිකල් සර්විසස් (පුද්) සමාගම,**
**190/A, රත්නවීර ගොඩනැගිල්ල,**
**ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ.**



## ලංකා බැංකුව

**නැගෙනහිර පළාතේ පහත සඳහන් ශාඛාව ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දිගුකාලීන බදු පදනම මත සුදුසු ගොඩනැගිල්ලක් අවශ්‍ය කර තිබේ.**

### කාරයිතීව්

### අපේක්ෂිත ගොඩනැගිල්ල පහත සඳහන් පහසුකම් සපුරාලිය යුතුය

- ගොඩනැගිල්ල නීත්‍යානුකූලව ඉදිකර තිබිය යුතු අතර, වසර 10 ට වඩා පැරණි නොවිය යුතුය.
- ගොඩනැගිල්ලේ මුහුණත අවම වශයෙන් අඩි 30 ක් සහිතව ප්‍රධාන පාරට මුහුණලා නගර මධ්‍යයේ පිහිටා තිබිය යුතුය.
- අවම වශයෙන් වාහන 04 ක් නවතා තැබීමට ඉඩකඩ තිබිය යුතුය.
- අවම වශයෙන් වර්ග අඩි 2000 – 2500 ක බිම් ප්‍රමාණයක් තිබිය යුතුය. දෙමහල් ගොඩනැගිල්ලක් නම් බිම් මහලේ අවම වශයෙන් වර්ග අඩි 2000 ක බිම් ප්‍රමාණයක් තිබිය යුතුය.
- ගොඩනැගිල්ල සතුව 60AMP තෙකලා විදුලිය, නල ජලය, ශ්‍රී ලංකා ටෙලිකොම් දුරකථන සබඳතාවය, කාන්තාවන් හා පිරිමින් සඳහා වෙන් වෙන් වශයෙන් වූ වැසිකිළි පහසුකම් හදිසි පිටවීමේ දොරටුව සහ අනෙකුත් යටිතල පහසුකම් තිබිය යුතුය.
- ගොඩනැගිල්ලේ ගෙබිම නිසිලෙස ටයිල් (2'X2') අතුරා තිබිය යුතුය.
- සිවිලිම සවිකර තිබිය යුතුය.
- විදුලි ජනක යන්ත්‍රය සඳහා ගොඩනැගිලලේ පසුපස හොඳින් වාතශ්‍රය සහිත වර්ග අඩි 100 ක (10'X10') කාමරයක් තිබිය යුතුය. (විදුලි ජනක යන්ත්‍රය හැසිරවීම සඳහා වෙනම මාර්ගයක් තිබිය යුතුය)
- ආබාධිත පුද්ගලයන් සඳහා වන බෑවුම් මඟ තිබිය යුතුය.
- ලීටර් 1000 ක ධාරිතාවයක් සහිත ජල ටැංකියක් තිබිය යුතුය.
- ගොඩනැගිල්ලේ පසුපස දොරවල් හා ජනෙල් සවිමත් යකඩ ග්‍රිල් යොදා ආරක්ෂා කර තිබිය යුතුය.
- ගොඩනැගිල්ල සඳහා ගිනි රක්ෂණය තිබිය යුතුය.

මේ සම්බන්ධව උනන්දුවක් දක්වන ගොඩනැගිලි හිමිකරුවන්, අනුමත කරන ලද ගොඩනැගිලි සැලැස්මේ පිටපතක් සමග සියලුම විස්තර සහිතව පහත සඳහන් ලිපිනයට දින 14 ක් ඇතුළත අයදුම් කළ යුතුය. කවරයේ වම්පස ඉහළ කෙලවරේ "**කාරයිතීව් ශාඛාව සඳහා සුදුසු ගොඩනැගිල්ලක්**" යනුවෙන් සඳහන් කළ යුතුය.

**සහකාර මහා කළමනාකරු (නැගෙනහිර පළාත)**
**ලංකා බැංකුව,**
**නැගෙනහිර පළාත් කාර්යාලය,**
**අංක 455, කෙලින් වීදිය,**
**ත්‍රිකුණාමලය.**



## ලංකා බැංකුව

**නැගෙනහිර පළාතේ පහත සඳහන් ප්‍රාදේශීය කාර්යාලය ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දිගුකාලීන බදු පදනම මත සුදුසු ගොඩනැගිල්ලක් අවශ්‍ය කර ඇත.**

### මඩකලපුව ප්‍රාදේශීය කාර්යාලය

### අපේක්ෂිත ගොඩනැගිල්ල පහත සඳහන් පහසුකම් සපුරාලිය යුතුය

- ගොඩනැගිල්ල නීත්‍යානුකූලව ඉදිකර තිබිය යුතුය.
- ගොඩනැගිල්ල ප්‍රධාන පාරට මුහුණලා නගර මධ්‍යයේ පිහිටා තිබිය යුතුය.
- වාහන නවතා තැබීම සඳහා ප්‍රමාණවත් ඉඩකඩ තිබිය යුතුය.
- අවම වශයෙන් වර්ග අඩි 2,000 – 3,000 ක බිම් ප්‍රමාණයක් තිබිය යුතුය. දෙමහල් ගොඩනැගිල්ලක් නම් බිම් මහලේ අවම වශයෙන් වර්ග අඩි 2,000 ක බිම් ප්‍රමාණයක් තිබිය යුතුය.
- ගොඩනැගිල්ල සතුව 60AMP තෙකලා විදුලිය, නල ජලය, ශ්‍රී ලංකා ටෙලිකොම් දුරකථන සබඳතාවය, කාන්තාවන් හා පිරිමින් සඳහා වෙන් වෙන් වශයෙන් වූ වැසිකිළි පහසුකම් හදිසි පිටවීමේ දොරටුව සහ අනෙකුත් යටිතල පහසුකම් තිබිය යුතුය.
- කාර්ය මණ්ඩල නිල නිවාස සකස් කර ගැනීම සඳහා පුද්ගලයන් හතර දෙනෙකුට නවාතැන් ගත හැකි කාමර දෙකක් අවම වශයෙන් තිබිය යුතු අතර, නිල නිවාසය සඳහා වෙනම ප්‍රවේශයක් තිබිය යුතුය.
- ගොඩනැගිල්ලේ ගෙබිම නිසි ලෙස ටයිල් අතුරා තිබිය යුතුය.
- සිවිලිම සවිකර තිබිය යුතුය.
- විදුලි ජනක යන්ත්‍රය සඳහා ගොඩනැගිල්ලේ පසුපස හොඳින් වාතාශ්‍රය සහිත වර්ග අඩි 100 ක (10'X10') කාමරයක් තිබිය යුතුය. (විදුලි ජනක යන්ත්‍රය හැසිරවීම සඳහා වෙනම මාර්ගයක් තිබිය යුතුය)
- ආබාධිත පුද්ගලයන් සඳහා වන බෑවුම් මග තිබිය යුතුය.
- ලීටර් 1000 ක ධාරිතාවයක් සහිත ජල ටැංකියක් තිබිය යුතුය.
- දොරවල් සහ ජනෙල් සවිමත් යකඩ ග්‍රිල් යොදා ආරක්ෂා කර තිබිය යුතුය.
- ගොඩනැගිල්ල සඳහා ගිනි රක්ෂණය තිබිය යුතුය.

මේ සම්බන්ධව උනන්දුවක් දක්වන ගොඩනැගිලි හිමිකරුවන්, අනුමත කරන ලද ගොඩනැගිලි සැලැස්මේ පිටපතක් සමග සියලුම විස්තර සහිතව පහත සඳහන් ලිපිනයට දින 14 ක් ඇතුළත යොමු කළ යුතුය. කවරයේ වම්පස ඉහළ කෙලවරේ "**මඩකලපුව ප්‍රාදේශීය කාර්යාලය සඳහා සුදුසු ගොඩනැගිල්ලක්**" යනුවෙන් සඳහන් කළ යුතුය.

**සහකාර මහා කළමනාකරු (නැගෙනහිර පළාත)**
**ලංකා බැංකුව,**
**නැගෙනහිර පළාත් කාර්යාලය,**
**අංක 455, කෙලින් වීදිය,**
**ත්‍රිකුණාමලය.**





# අභියෝග ජය ගනිමින් ජනතා අපේක්ෂා ඉටු කර ගැනීමට කැප වී ක්‍රියා කළ යුතුයි

## ● අවුරුදු උදාවෙන් පසු රාජකාරි අරඹමින් ජනපති කියයි



**නුවන් කොඩිකාර**

අභියෝග ජය ගනිමින් ජනතා අපේක්ෂා සාක්ෂාත් කර ගැනීමට සුභවාදී ආකල්පයෙන්, අධිෂ්ඨානයෙන් සහ කැපවීමෙන් ක්‍රියා කළ යුතු බව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා පැවසීය.

අලුත් අවුරුදු උදාවෙන් පසු නව වසරේ රාජකාරි කටයුතු ආරම්භ කරමින් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ඊයේ (19) පෙරවරුවේ ජනාධිපති කාර්යාලයේ දී මැති ඇමතිවරුන් සහ සිය කාර්ය මණ්ඩලය හමු වීමෙන් පසු එසේ කියා සිටියේය.

උදා වූ සිංහල, දෙමළ අලුත් අවුරුද්දට මැති ඇමැතිවරුන්ට සහ කාර්ය මණ්ඩලයට සුබ පැතුම් එක් කළ ජනාධිපතිවරයා පිරිස සමග සුහද කතාබහකද නිරත විය.

ජනාධිපති ලේකම්, ආචාර්ය පී.බී. ජයසුන්දර මහතාගේ ප්‍රධානත්වයෙන් සංවිධාන කර තිබූ තේ පැන් සංග්‍රහයට ද රාජපක්ෂ මහතා ඇතුළු පිරිස එක් වූහ.

මැති ඇමැතිවරු, ජනාධිපති ලේකම් පී.බී. ජයසුන්දර, ජනාධිපති ප්‍රධාන උපදේශක ලලිත් වීරතුංග, ජනාධිපති අතිරේක ලේකම් (පාලන හා මෙහෙයුම්) විශ්‍රාමික මේජර් ජෙනරාල් කේ.බී. එගොඩවෙලේ, ජනාධිපති පෞද්ගලික ලේකම් සුගීශ්වර බණ්ඩාර මහත්වරුන් ඇතුළු ජනාධිපති කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීහු සහ රාජ්‍ය නිලධාරීහු මේ අවස්ථාවට එක්ව සිටියහ.





# අලුත් අවුරුද්දෙන් පසු අගමැති කාර්ය මණ්ඩලයේ වැඩ ආරම්භ කළ මොහොතේ...

අලුත් අවුරුද්දෙන් පසු අගමැති කාර්ය මණ්ඩල කාර්යාල කටයුතු අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් ඊයේ (19) පෙරවරුවේ අරලියගහ මන්දිරයේ දී ආරම්භ විය.

අගමැති මහින්ද රාජපක්ෂ මහතා මෙහිදී සිය කාර්ය මණ්ඩලයේ නිලධාරීන් ඇතුළු සියලු සාමාජිකයන්ට අලුත් අවුරුදු සුභාශිංසන එක් කළේය.

කාර්ය මණ්ඩල සාමාජිකයන් ද අලුත් අවුරුද්දේ වැඩ ආරම්භ කිරීමට පෙර අගමැතිවරයාගේ ආශිර්වාදය ලබාගැනීම විශේෂත්වයකි.

ප්‍රවාහන ඇමැති ගාමිණී ලොකුගේ, අගමැති ලේකම් ගාමිණී සෙනරත්, අගමැති කාර්ය මණ්ඩල ප්‍රධානී යෝෂිත රාජපක්ෂ මහත්වරුන් ඇතුළු අතිරේක ලේකම්වරුන්, ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරුන් ඇතුළු අගමැති කාර්ය මණ්ඩලයේ සාමාජිකයෝ සහ අගමැතිවරයාට අයත් අමාත්‍යාංශවල පෞද්ගලික කාර්ය මණ්ඩලද මේ අවස්ථාවට එක්ව සිටියහ.



# වරාය නගර පනත් කෙටුම්පත ගැන මහ සඟරුවන දැනුම්වත් කිරීමට ආණ්ඩුව ගත් තීරණය අගය කරනවා

## ● රාමඤ්ඤ මහා නිකායේ මහානායක මකුලෑවේ විමල මහනාහිමි



**මහින්ද අලුත්ගෙදර**

කොළඹ වරාය නගර විශේෂ ආර්ථික කලාප පිහිටුවීමට අදාළ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් භික්ෂූන් වහන්සේ ඇතුළු ආගමික නායකයන් දැනුම්වත් කිරීමට රජය ගෙන ඇති තීරණය අගය කරන බව රාමඤ්ඤ මහා නිකායේ මහානායක මකුලෑවේ විමල මහනාහිමියෝ පැවසූහ.

මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳපොළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය ඇමැති අජිත් නිවාඩ් කබ්රාල් සහ සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග මහත්වරුන් ඇතුළු පිරිසක් මහානායක හිමියෝ බැහැදැක මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් සාකච්ඡා කළ අවස්ථාවේ මහ නායක හිමියෝ මෙසේ පැවසූහ.

කොළඹ වරාය නගරය පිළිබඳ මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් විවිධ චෝදනා එල්ල වන හෙයින් පනත් කෙටුම්පත පිළිබඳ මහා සංඝරත්නය ඇතුළු ආගමික නායකයන් දැනුම්වත් කිරීමට ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා තීරණය කර තිබෙන අතර ඒ අනුව රාමඤ්ඤ නිකායේ මහානායක මකුලෑවේ විමල නාහිමියන් බැහැ දැක ආශිර්වාද ගැනීමෙන් අනතුරුව ඇමැතිවරු අදාළ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් මහානායක හිමියන් සමග සාකච්ඡා කළහ.

වරාය නගරය පිළිබඳ පනත් කෙටුම්පතට අදාළව මාධ්‍ය ඔස්සේ පළ කෙරෙන අදහස් පිළිබඳ පමණක් මෙතෙක් දැනුවත්ව සිටි බව සඳහන් කළ නා හිමියෝ මහා සංඝරත්නයට පනත් කෙටුම්පත සහ අදාළ තොරතුරු ලබාදීමට ජනාධිපතිවරයා ගෙන ඇති තීරණය අගය කරන බවද සඳහන් කළහ. අජිත් නිවාඩ් කබ්රාල් ඇමැතිවරයා මෙහිදී කොළඹ වරාය නගර විශේෂ ආර්ථික කලාප පිහිටුවීමට අදාළ පනත් කෙටුම්පත මහනායක හිමියන්ට පිළිගැන්වීය. නායක හිමිවරුන්ගේ මාසික රැස්වීමේ දී පනත් කෙටුම්පත දීර්ඝව අධ්‍යයනය කරන බව එහිදී මහා නායක හිමියෝ පැවසූහ.

ඉදිරිපත් කර ඇති පනත් කෙටුම්පත මගින් වරාය නගර භූමිය කිසිසේත් අන්සතු කර නැති බව අජිත් නිවාඩ් කබ්රාල් මහතා මෙහිදී පැහැදිලි කළේය. රටේ සෙසු අණපනත්වලට යටත්ව වරාය නගරය පාලනය වන බව පනත් කෙටුම්පතේ පැහැදිලිව සඳහන් වන බව ප්‍රසන්න රණතුංග ඇමැතිවරයා පෙන්වා දුන්නේය. ඒ මහතා අවධාරණය කළේ මේ වරාය නගරය වෙනම රටක් ලෙස හැඳින්වීම ජනතාව නොමග යැවීමට කළ දෙයක් බවයි.

පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට යොමු කර ඇති පෙත්සම් විභාග කිරීමේ දී රටට අහිතකර කොටස් ඇත්නම් ඒවා ඉවත් කිරීමට නියෝග කෙරෙන නිසා අනවශ්‍ය ලෙස කලබල වියයුතු නැති බවත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූල නැති කිසිවකට අධිකරණයේ සහාය හිමි නොවනු ඇති බවත් මහානායක හිමියෝ එහිදී සිහිපත් කළහ. මේ වනවිට පාස්කු සිද්ධිය පිළිබඳ වාර්තාව සහ පුරාවිද්‍යා පනත් කෙටුම්පත ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධයෙන් ද ඒ පිළිබඳ ප්‍රවීණතා සහිත නායක හිමිවරුන්ගේ ප්‍රධානත්වයෙන් යුත් කමිටු මගින් අධ්‍යයන කරමින් පවතින්නේයැයි සඳහන් කළ මහානායක හිමියෝ මේ පනත් කෙටුම්පතේ සඳහන් කරුණු සම්බන්ධයෙන් ද අධ්‍යයනය කරන බව පැවසූහ.

ඇමැති ප්‍රසන්න රණතුංග මහතා මෙහිදී අවධාරණය කළේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල හෝ රටේ භෞමික අඛණ්ඩතාවට හා ස්වෛරීත්වයට හානිවන කිසිදු තීන්දුවක් රජය විසින් නොගන්නා බවයි. විපක්ෂය ඒ සම්බන්ධයෙන් විවිධ බොරු ප්‍රචාර කරන නිසා මහා සංඝරත්නය සහ ජනතාව ඒ සම්බන්ධයෙන් දැනුම්වත් කිරීමට කටයුතු කරමින් සිටින බවද පෙන්වා දුන්නේය.

පාර්ලිමේන්තු මන්ත්‍රිනි කෝකිලා ගුණවර්ධන මහත්මිය ඇතුළු පිරිසක් ද මේ අවස්ථාවට එක් වූහ.

# වරාය නගර ව්‍යාපෘති පනතින් වෙන රටක් නිර්මාණය වන්නේ නෑ

## ● රාජ්‍ය ඇමැති සුසිල් ප්‍රේමජයන්ත

**පහන් විජේසේකර**

වරාය නගර කලාපයේ ඉඩම් මිලදී ගැනීම, බද්දට ගැනීම මෙන්ම ව්‍යාපාරික කටයුතු සිදු කිරීමට අදාළ බලපත්‍ර දීම තීරණය කරන්නේ වරාය නගර ආර්ථික කොමිෂන් සභාව විසින් බව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල සහ දුරස්ථ ඉගෙනුම් ප්‍රවර්ධන රාජ්‍ය ඇමැති සුසිල් ප්‍රේමජයන්ත මහතා පැවැසීය.

එබැවින් වරාය නගර ව්‍යාපෘතිය හරහා මෙරට චීන කොලනියක් වන බවට කියන ප්‍රකාශ සම්බන්ධයෙන් අනියත බියක් ඇති කරගත යුතු නැති බව ද රාජ්‍ය ඇමැතිවරයා කීය.

හෙතෙම මේ බව කියා සිටියේ කොළඹ වරාය නගරය බොරුව සහ සත්‍ය මැයෙන් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේදී ඊයේ (19) පැවැති මාධ්‍ය හමුවට එක් වෙමිනි.

එහිදී වැඩිදුරටත් රාජ්‍ය ඇමැතිවරයා මෙසේද කීය.

මේ පනතින් වෙනත් භූමි ප්‍රදේශයක් හෝ රටක් නිර්මාණය වන්නේ නැහැ. රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පස්වැනි වගන්තියේ පැහැදිලිව කියනවා ජනරජයට අයත් දේශය පරිපාලන දිස්ත්‍රික්ක 25න්ද දේශීය ජල තීරයෙන්ද සමන්විත වන්නේය කියා. මේ පනතේ කොහේ හෝ තිබෙනවද වෙනත් දිස්ත්‍රික්කයක් වෙන රටක් හැටියට නැහැ. මෙය කොළඹ දිස්ත්‍රික්කයේම කොටසක්. මේ පනත් කෙටුම්පතේ 72 වන පිටුවේ මෙහි සීමා ගැන සඳහන් වෙනවා.

ව්‍යතිරේක හා ප්‍රතිලාභ පිළිබඳ පනත් 14ක් නම් කර තියෙනවා. නාගරික සංවර්ධන අධිකාරී පනත, මහ නගර සභා ආඥා පනත, වාණිජ බේරුම්කරණ මධ්‍යස්ථානය, නගර සැලසුම්කරණ ආඥා පනත, ක්‍රමෝපායික සංවර්ධන ආඥා පනත, කියන පනත් විතරයි අදාළ නොවන්නේ. විගණකාධිපතිවරයාගේ කාර්යභාරයට යටත්ව තමයි මේ කොමිෂන් සභාවේ අරමුදල් ක්‍රියාත්මක කරන්නේ.

මේ පිළිබඳ පාර්ලිමේන්තුවට සභාගත කරන්න ඕනෑ ජනාධිපතිවරයාට වාර්ෂික ගිණුම් වාර්තා යොමු කිරීමෙන් පසුව. ඒක පවා මේ පනතේ සඳහන් වෙනවා. මෙකේ යම් යම් සංශෝධන තියෙනවා නම් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් මග පෙන්වීමක් කරයි. එතැනින් එහාට පාර්ලිමේන්තුවට පනතක් ගේන්නේ වාද විවාද කර රටට ගැලපෙන සංශෝධන ඉදිරිපත් කරන්නයි. මේක කෙටුම්පතක් පමණයි. ශ්‍රේෂ්ඨාධිකරණයෙන් දෙන සංශෝධන ගැන බලමු.

තුනෙන් දෙකක බලයකින් මෙය සම්මත විය යුතුද කියා තීරණය කරන්නේ ශ්‍රේෂ්ඨාධිකරණය දෙන තීන්දුවත් එක්ක. මේක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සංශෝධනයක් නෙමෙයි. මේක සාමාන්‍ය පනත් කෙටුම්පතක් නිසා අවශ්‍ය වෙන්නේ සාමාන්‍ය බහුතරයක්.

නමුත් 2/3ක් අවශ්‍ය බවට යම් වගන්තීන් උපුටා දක්වා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මගපෙන්වීමක් කළොත් විතරයි 2/3ක් අවශ්‍ය වෙන්නේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රධාන වගන්ති 9ක් තියෙනවා. ඒවාට අනනුකූලද නැද්ද කියා ශ්‍රේෂ්ඨාධිකරණය විමසා බලල තීරණයක් දෙයි.

1988දී 13වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පළාත් සභා පිහිටුවන කොටත් ලංකාවටම පළාත් 9ක් ස්ථාපිත කරන ගැටලුවක් මතු වුණා. මේක ඇවිල්ලා විශේෂිත කලාපයක්. එහෙනම් කටුනායක නිදහස් වෙළෙඳ කලාපය ගැනත් ප්‍රශ්න කරන්න පුළුවන් ඇයි රට පුරා වෙළෙඳ කලාප දාන්නේ නැත්තේ කියලා. එහෙම කළොත් සාමාන්‍ය නීතිය පිළිබඳ ප්‍රශ්න ඇති වන්න පුළුවන්. ඒ නිසා තමයි යම් කිසි කලාපයකට අයත් විශේෂිත නීති ක්‍රියාත්මක වෙන්නේ. අපේ රටේ විතරක් නෙමෙයි සංවර්ධනය වූ සංවර්ධනය වෙමින් පවතින රටවල විශාල තරගයක් තියෙනවා. ආයෝජකයෝ ආකර්ෂණය කරගැනීමේදී යම් ආකාරයක ප්‍රතිලාභයක් යම් නිදහසක් දෙන්න වෙනවා.

මේකේ ප්‍රධාන අරමුණ වෙන්නේ ආයෝජන එක්රැස් කරගෙන ආයෝජනවලින් සංවර්ධනය කිරීම. යම් වාණිජ ආරවුලක් ඇතිවෙලා අධිකරණයට ගියාට ඒ නඩුවලට ප්‍රමුඛතාවක් දිය යුතු බවට අදහස් පළ වුණා. ව්‍යතිරේක පනත් 7 ඇරුණාම අනිත් නීතිය ක්‍රියාත්මක වන බව පැහැදිලියි. රටේ අපරාධ නීතිය ක්‍රියාත්මක වන්නේ නැහැ කියා කොහෙවත් සඳහන් වෙන්නේ නැහැ.

අපේ රටේ මුදල් විශුද්ධිකරණ පනතක් තියෙනවා. ඒ යටතේ දැනටත් අධිකරණවල අපරාධ නඩු ගොනු කර තියෙනවා. හැබැයි මේ කලාපයේ මුදල් විශුද්ධිකරන පනත ඉවත් කරනවා කියා සඳහන් වන්නේ නැහැ. කොළඹ මහ නගර සභාවට කාලයක් තිබුණා සන අපද්‍රව්‍ය ටිකවත් බැහැර කරගන්න බැරි. වත්මන් ජනාධිපතිවරයා එදා නාගරික සංවර්ධන අධිකාරියේ ලේකම් හැටියට ඉඳල ඒ වැඩේ හරියට කළේ.

1933 මොන්ටිවීඩියෝ සම්මුතිය රටවල් සමූහයක් අතර ඇති කරගත් සම්මුතියක්. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සම්මත කරගත් සම්මුතියක් නොවේ. උදාහරණයක් ලෙස තිරසර සංවර්ධන ඉලක්ක 17 නම් එ.ජා. සංවිධානයේ රටවල් 196ක් අතර සම්මත කරගත් දෙයක්. මං ඉහත කියපු විශේෂ පනත් 7 හැර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, සාමාන්‍ය නීතිය, නීතිමය ප්‍රතිපාදන ක්‍රියාත්මක වෙනවා. යම් කිසි නිදහසක් ලබා දෙනවා හැරෙන්න වෙනම රටක් බවට පත්වන්නේ නැහැ. මෙහි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වැනි වගන්තිය පැහැදිලිව සඳහන් කර තියෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වගන්තියේ ඉඳල තමයි රාජ්‍ය මූල්‍ය පාලනයට පාර්ලිමේන්තුවේ බලය තියෙන්නේ.

විගණකාධිපතිවරයාගේ විගණන වාර්තාව ඉදිරිපත් කර තමයි ඕනෑම රාජ්‍ය ව්‍යවසායක්, රාජ්‍ය දෙපාර්තමේන්තුවක් කෝප් හරහා සාකච්ඡා කරන්නේ. එතකොට අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තමයි ක්‍රියාත්මක කරන්නේ. එහෙම නම් කොහොමද වෙන රටක් වෙන්නේ. මේක ඊළමක් කරයි කියා බොරු ප්‍රචාර යවන්නත් පුළුවන්. ඊළමක් හදන්න ගිය එක නවත්වා ගන්න බැරිව එදා හිටපු එජාපය 2002 දී ප්‍රභාකරන් සමග ගිවිසුමක් අස්සන් කළා. ඊළම නොනිල වශයෙන් දෙන්න ඔන්න මෙන්න තිබුණේ.

හැබැයි 2005දී මහින්ද රාජපක්ෂ මහත්තයා බලය ලබාගෙන ගෝඨාභය රාජපක්ෂ මහතා ආරක්ෂක ලේකම් වෙලා රණවිරුවන්ගේ කැපවීමෙන් ඒ තත්ත්වය පරාජය කළේ. නීත්‍යානුකූල ව්‍යවස්ථාවෙන් හෝ ආයුධ බලයෙන් ඊළමක් හැදෙන එක නවත්වපු නායකයෝ දෙන්නෙක් ආයෙත් ඊළමක් හැදෙන්න දෙන්නේ නැති බව ජනතාවට විශ්වාසයි. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාට 69 ලක්ෂයක් විධායක බලය දුන්නේ යම් වර්ධනයක් කර විධායකය බලාත්මක කරන්න.

ඒකට සහයෝගය දිය හැකි 2/3ක පාර්ලිමේන්තු බලයක් ලබා දුන්නා. මේ නීතිය හා විධායක බලය ක්‍රියාත්මක කර රටේ අඩපණ වෙලා තිබූ ආර්ථිකය ගොඩගන්නට අවශ්‍යයි. ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා මේ රට බාරගන්නකොට කොවිඩ් නැතිව රටේ ආර්ථික වර්ධන වේගය තිබුණේ 2.4ක් විදියට. ඒ වගේම ණය කන්දරාවක් ගොඩ ගැහිලා තිබුණා. මේ රජය නෙමෙයි වෙනත් රජයක් තිබුණත් මේ හා සමානව හෝ අඩු-වැඩි වශයෙන් පනතක් ගෙනඒමට අවශ්‍ය වෙනවා මෙවැනි කලාපයක වාණිජ කටයුතු සිදු කිරීමට.

කිසිදු පාර්ලිමේන්තුවකට අනාගත පාර්ලිමේන්තුවක් බැඳ තබා ගන්න බැහැ. අද තියෙන පාර්ලිමේන්තුව මේක සම්මත කරන්න පුළුවන්. හැබැයි අනාගතයේදී එන පාර්ලිමේන්තුවකට මේ නීති සංශෝධනය කිරීමට පුළුවන්. හැබැයි අද තිබෙන තත්ත්වය හැටියට ආයෝජකයෝ එන්න නම් ආයෝජන ප්‍රතිලාභවලින් වෙනත් ආයෝජන සිදු කිරීමට කාලසීමාවක් අවශ්‍ය වෙනවා. ඒ නිසා තමයි අවුරුදු 35ත් අවුරුදු 99ත් වශයෙන් බදු දෙන්න කටයුතු කරන්නේ.

දැන් ඉන්න ජනාධිපතිවරයා මේ රටේ ජනතාව පත් කර ගත්තේ අවුරුදු 5කට. එතුමාගේ කාලසීමාවේදී මාර්තු මාසයේ කොරෝනා රැල්ල ආවා. අගෝස්තු මාසයේ මහ මැතිවරණය පැවැත්වූවා. නැවත සැප්තැම්බර්වල කොරෝනා දෙවැනි රැල්ල ඇවිත් දැන් ඒ තත්ත්වයෙන් මිදීගෙන එන අවස්ථාවක් . තව වසර 3 1/2කට වැඩි කාල සීමාවක් තිබෙනවා. පාර්ලිමේන්තුවේ 2/3 බලයක් දීලා තියෙන්නෙත් වසර 5කට. කවුරුහරි හිතනවා නම් මේ කාලසීමාවට පෙර මේවා වෙනස් වෙයි කියා ඒක සිහිනයක් විතරයි.

# දේවස්ථානවලට හෙට විශේෂ ආරක්ෂාවක් යෙදීම පැලැස්තර දැමීමක්

## අගරදගුරු හිමිපාණෝ

**නුවන් හෙට්ටිආරච්චි**

පාස්කු ප්‍රහාරය සිදුවූ හෙට (21) දින විශේෂ ආරක්ෂාවක් දේවස්ථානවලට සැපයීම පැලැස්තර දැමීමක් බවත්, කළ යුතු වන්නේ රටේ ජනතාවගේ ජාතික ආරක්ෂාව තහවුරු කිරීම බවත් කොළඹ අගරදගුරු අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ පැවසූහ.

එසේම පාස්කු ප්‍රහාරය සම්බන්ධව සිදුකළ පරීක්ෂණ පිළිබඳව වත්මන් ජනාධිපතිවරයාගේ සහ අගමැතිවරයාගේ මැදහත්වීමත්, හිටපු ජනාධිපතිවරයාගේ සහ අගමැතිවරයාගේ මැදිහත්වීම් පිළිබඳව ප්‍රසාදයක් නොමැති බවත්, එම නිසා රට අදටත් අනාරක්ෂිතව පවතින බවත් එම හිමියෝ සඳහන් කළහ. මේ බව කාදිනල් හිමිපාණන් සඳහන් කළේ කොළඹ අගරදගුරු නිල නිවසේ ඊයේ (19) පැවති මාධ්‍ය හමුවකදීය.

එහිදී කාදිනල් හිමිපාණෝ මෙසේ ද කීහ.

මේ ප්‍රහාරයේ බලපෑම සිදුවුණේ අපිට විතරක් නෙවෙයි. මෙහිදී කතෝලික බැතිමතුන් මිය ගියා. තුවාල ලැබුවා. අංගවිකල වුණා. හැබැයි මෙතන සිංහල, දෙමළ, මුස්ලිම් හැමෝම ඉන්නවා. මේ ප්‍රහාරය කාලයක් තිස්සේ සැලසුම් සහගතව කරපු දෙයක්. මේ අය අන්තවාදීන්. මේ කට්ටියට ඉදිරියේදී වුණත් තවත් පිරිසකට එරෙහිව ප්‍රහාර දියත් කරන්න පුළුවන්. මේ අයට කිසිම දහමක් නැහැ. ඒ නිසා මේ දේවල් වළක්වා ගැනීමට රජය පියවර ගත යුතුයි. අන්තවාදීන් යම් දේශපාලන බලවේග විදිහටත් ක්‍රියාත්මක වෙන්න පුළුවන්. මේක ජාත්‍යන්තරව සිදුවූ දෙයක් වෙන්නත් පුළුවන්. මේ සියල්ල සිදුවූ ආකාරය පිළිබඳව සොයා බලා නිසි ලෙස කටයුතු සිදු නොවීම ඉතාමත් බරපතළයි. මේ පිළිබඳව නිහඬ පිළිවෙතක් අනුගමනය වීම ඊට වඩා බරපතළයි. මොකද මේ ප්‍රහාරය පිළිබඳව සුළුකොට තැකීම ගැන කනගාටුවක් තියෙනවා. අනික තමයි මේ ගැන කිසිම නායකයෙක් හරියට හොයල බැලුවේ නැහැ. 2006 ඉඳල මේ අන්තවාදීන් ඉඳලා තියෙනවා. නමුත් කවුරුවත් මේවා ගණන් ගත්තේ නැහැ. මේ රජය වුණත් පරීක්ෂණ නොකර නීතිපතිවරයාට මේ ගැටලුව යොමු කරල බලා ඉඳීම වැරදියි. අනික මේ පාස්කු සැමරුමෙන් අපි ඉල්ලන්නේ සාධාරණයක් කරන්න කියල. නැතිව කාටවත් හිරිහැර කරන්න කියලා නෙවෙයි. අපිට අවශ්‍ය මේ අන්තවාදය මුලින් උදුරල දාන්න. මේ තුවාලය ඉක්මනට සනීප කරන්න. නැතිව පාස්කු ප්‍රහාරය වූ දින දේවස්ථානවලට විශේෂ ආරක්ෂාව ලබාදීම නෙවෙයි, මුළු රටේම එහෙනම් ආරක්ෂාව ලබාදිය යුතුයි. අපි දන්නේ නැහැ ඊළඟ ප්‍රහාරය කොහෙටද, කොතනටද කියලා. එතැනින් තැන අල්ලගෙන පැලැස්තර දැමීම නෙවෙයි කළ යුත්තේ. හැම දෙයක් පිළිබඳව කරුණු විමසා බලා පරීක්ෂණ කරල ඊට අදාළ පාර්ශ්ව මේ සමාජයෙන් ඉවත් කිරීම. නැත්නම් කිසි දිනක මේ ත්‍රස්තවාදය ඉවර වෙන්නේ නැහැ. මේක මුස්ලිම් අයගේ ගැටලුවක් නෙවෙයි. සුළු අන්තවාදීන්ගේ ගැටලුවක්. ඒ දේ දැන්ම විසඳීම කළ යුතු වෙනවා. මොකද මුස්ලිම් අය නැතිව ආණ්ඩු හදනවා කියල ආපු රජයක් ඔවුන්ගේ සහය මතින් ගිහින් මේ ප්‍රශ්න යට ගහන්න හොඳ නැති නිසා. මේ අතපෙවීම්වල ආරම්භය ලෝක දේශපාලනයෙන් විය හැකියි.

ඒ කෙසේ වුණත් 20 වන ව්‍යවස්ථා සංශෝධන සම්මත වන අවස්ථාවේ ඒ බව මේ රජයත් පසුගිය රජය වගේම ඔප්පු කළා. එකම පක්ෂයේ හත්දෙනෙක් ව්‍යවස්ථාවට පක්ෂව ඡන්දය දීලා එහි නායකයා විතරක් විපක්ෂව ඡන්දය දෙනවා. ඊට සතියකට කලින් රිෂාඩ්ගේ මල්ලි නිදහස් වෙනවා. මේවා ඇතුළේ අපට පේනවා මේ රජයේ ක්‍රියා කලාපය. අනික පාස්කු කොමිසමේ වාර්තාවේ අනුබල දුන්න අය ගැන සඳහන් වෙනවා. ඒ අය ගැන කිසිදු පරීක්ෂණයක් සිදුවෙලා නැහැ. අතරින් පතර කෙනෙක් අල්ලගෙන හිරේ දැම්මට වැඩක් නැහැ. සියලුම වැරදිකරුවන්ට දඬුවම් ලබාදිය යුතුයි. මරණයට පත්වුණ අයට සාධාරණයක් ලබාදීමට නම් මේ රජය ස්ථිර තීන්දුවක් අරන් මේ පරීක්ෂණ සිදුකරල මේ සාධාරණය කරනවා වෙනුවට විවිධ සීනිබෝල කතා කියනවා. ඒ මගින් කිසි දිනක මේ අන්තවාදය අවසන් වෙන්නේ නැහැ. ඒ නිසා අපි මේ 21 සිහි කරන්නේ මියගිය අය. ඒ සඳහා අපි දේව මෙහෙයක් සහ විනාඩි දෙකක නිහැඬියාවක් ප්‍රකාශයට පත් කළා. අදටත් රටේ අවදානමක් තියෙනවා මේ අන්තවාදීන් මේ සමාජයේ ඉන්නවා. ඔවුන් හඳුනාගෙන ඔවුන්ට නිසි පිළියම් යොදන තෙක් මේ අවදානම පහව යන්නේ නැහැ. අපි එතකං බලං ඉන්නවා අවධානයෙන්. ඒ වගේම අපි ආරාධනා කරනවා සියලුම පූජකවරුන්ට, ආගමික නායකයන්ට සහ ජනතාවට මේ ගැටලුව විසඳා ගැනීමට දේශපාලනික වශයෙන් බෙදී වෙන්වී නොසිට එකතුවෙන ලෙස. ඒ සඳහා තමයි අපි ආරාධනා කරන්නේ හෙට දින 8.45ට විනාඩි දෙකක නිහැඬියාවක් පවත්වන ලෙස.

අතිඋතුම් මැල්කම් කාදිනල් රංජිත් හිමිපාණෝ, අතිඋතුම් වැලන්ස් මෙන්ඩිස් හිමිපාණෝ, අතිඋතුම් රේමන්ඩ් වික්‍රමසිංහ හිමිපාණෝ සහ අතිඋතුම් ජේ. ඩී. ඇන්තනි ජයකොඩි හිමිපාණෝ සහභාගී වී සිටියහ.

# කොළඹ වරාය නගරය ඉතා කාලෝචිත ව්‍යාපෘතියක්

## බෙල්ලන්විල ධම්මරතන හිමි

**සුභාෂිණී සේනානායක**

කොළඹ වරාය නගරය ඉතා කාලෝචිත ව්‍යාපෘතියක් බව ආචාර්ය බෙල්ලන්විල ධම්මරතන හිමියෝ පවසති.

ලංකාවේ බිම් අඟලක්වත් අරගෙන නෙමෙයි මේ පෝට් සිටිය ගොඩ නැගෙන්නේ අලුත් කොටසක් එක් කර ඉදි කෙරෙන මේ ව්‍යාපෘතිය ඉතාම කාලෝචිත ව්‍යාපෘතියක්. ලක්ෂයකට අධික ප්‍රමාණයකට රැකියා ලැබෙනවා. ඔවුන්ට වැටුප් ලැබෙන්නේ විදේශ විදේශ මුදල් වලින් බව කතා කරනවා. අපේ මුදල බාල්දු වී තිබෙන අවස්ථාවක ඒ මුදල් මාරු කළාම විශාල මුදලක් අපිට ලැබෙනවා යැයි ද උනවහන්සේ කියා සිටියේය.

කාලකන්නි ඊර්ෂ්‍යාවෙන් රටේ සංවර්ධනය ගැන නොබලා රටේ ගමන වේගවත් වීම බලා විපක්ෂයද මේ අවස්ථාවේ සහාය දිය යුතුබව ද උන්වහන්සේ අවධාරණය කරති.

උන්වහන්සේ මේ බව කියා සිටියේ ඊයේ (19) බෙල්ලන්විල රාජමහා විහාරස්ථාවේ පැවැති මාධ්‍ය හමුවකට එක් වෙමිනි.

එහිදි උන්වහන්සේ මෙසේද අදහස් පළ කළහ.

විදේශ රටවල ජීවත් වූ සහ ඒ රටවල් වල කරුණු ගැන දැනුවත් අයෙක් හැටියට අපේ ආර්ථිකය ඉදිරියට ගෙන යන මෙන්ම රැකියා විරහිත බාවයට පිළියම් දෙන විසඳුමක් පෝට් සිටි ව්‍යාපෘතිය. බාල්දු වෙමින් යන රුපියල නගා සිටිවූමට හොඳ විසඳුමක් දෙන රටේ ආර්ථිකය ඉදිරියට ගෙන යන ප්‍රධාන කාර්යයක් හැටියට වරාය නගරය හඳුන්වන්න පුළුවන්. සිංගප්පූරුව කුඩා රටක් ඒත් දියුණු රටක්. එහි දියුණුවට මූලික වූයේ වරාය සහ එහි ගුවන් තොටුපොළ ඉහළ මට්ටමකට දියුනු කරගත් නිසයි. වරාය නගරය සංවර්ධනය වුනේ මහින්ද රාජපක්ෂ මහතා ජනාධිපතිවරයා ලෙස සිටියදීයි. එදා කිව්වා පරිසරය විනාශ වෙනවා කියා කිව්වා. මම එදාත් අදහස් දක්වමින් කියා සිටියේ මුළු සංගප්පූරුව පෝට් සිටියක් ලෙස තමයි කටයුතු කරන්නේ කියලායි. සිංගප්පූරුවේ රට වටේම විශාල නෞකා නවත්වා තිබෙනවා. එහි කිසිදු පරිසර විනාශයක් සිදු වී නැහැ. එදා ගෙන ගිය බොරු ප්‍රචාරම අදත් කරනවා. ලංකාව චීන කොලනියක් බවට ලංකාව පත් කරන්න යනවා කියා රටේ ජනතාව නොමග යවන්න ප්‍රකාශ කරනවා. මෙවැනි ප්‍රකාශ කිරීම මහා අවාසනාවක්. රටේ දේශපාලඥයන් මෙවැනි ප්‍රකාශ සිදු නොකළ යුතුයි. චීනය සමග අපි මිත්‍ර වුනේ බණ්ඩාරනායක රජය කාලේ. අපිට සහල් හිගයක් ආවාම රබර් සහ සහල් ගිවිසුමකින් අපි ඒ තත්ත්වයෙන් මිදුනා. අපි වසර 30 යුද්ධයකට මුහුණු දුන්නා. අපේ භූමියෙන් තුනෙන් එකක් අහිමි වීමට ගියා.

# ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ නිලවරණය වළක්වමින් වාරණ නියෝගයක්

**රෝෂන් තුෂාර**

අද (20) සහ හෙට (21) පැවැත්වීමට නියමිතව තිබු ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ නිලවරණය වළක්වමින් එම සභාවට එරෙහිව වාරණ නියෝගයක් කොළඹ ප්‍රධාන දිසා විනිසුරු අරුණ අළුත්ගේ මහතා ඊයේ (19) නිකුත් කළේය.

ශ්‍රි ලංකා වෛද්‍ය සභාවේ සභාපති මහාචාර්ය වජිර දිසානායක, ලේඛකාධිකාරී වෛද්‍ය ආනන්ද හපුගොඩ මහත්වරුන්ට මේ වාරණය නිකුත් කළේය.

හිනිදුම රෝහලේ වෛද්‍ය ජයසුන්දර හා බන්ධනාගාර රෝහලේ වෛද්‍ය කපිල චන්දන පැවරූ නඩුවක් සළකා බැලිමෙන් පසුව මේ වාරණය නිකුත් කළේය.

# කොළඹ වරාය නගරය මෙරට භූමියට එක් කිරීමෙන් රටේ ස්වෛරීභාවයට සහ භෞමික අඛණ්ඩතාවට හානිවනවා

## ජනාධිපති නීතිඥ කේ. කනගේශ්වරන් ශ්‍රේෂ්ඨාධිකරණයේදී කියයි

**නෙල්කා මැදගෙදර**

'කොළඹ වරාය නගරය' කෘත්‍රිමව නිර්මාණය කරන ලද්දක් වන බැවින් එය මෙරට භූමියට එක්කර ගැනීම මගින් රටේ ස්වෛරීභාවයට සහ භෞමික අඛණ්ඩතාවට හානිවන බව ජනාධිපති නීතිඥ කේ. කනගේශ්වරන් මහතා ඊයේ (19) ශ්‍රේෂ්ඨාධිකරණයේදී සඳහන් කළේය.

විශේෂිත සුදුසුකම් පැහැදිලිව දක්වා නැති පුද්ගලයන් හත්දෙනකු මේ කොමිෂන් සභාවට තනි පුද්ගලයකු විසින් පත්කිරීම ජාතික ආරක්ෂාවට මෙන්ම ජාතික ආර්ථිකයට ද තර්ජනයක් වන බව ද ඒ මහතා සඳහන් කළේය.

පාර්ලිමේන්තු අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති එම පනත් කෙටුම්පත අභියෝගයට ලක්කරමින් ගොනු කළ පෙත්සම් කැඳවූ අවස්ථාවේදී මේ බව ප්‍රකාශ කරනු ලැබීය. 'කොළඹ වරාය නගර ආර්ථික කලාප විශේෂ කොමිෂන් සභා පනත් කෙටුම්පතට' අභියෝග කරමින් ගොනුකර තිබූ පෙත්සම් විභාගය පංච පුද්ගල ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඬුල්ල හමුවෙහි ඊයේ (19) ආරම්භ කරන ලදී.

අගවිනිසුරු ජයන්ත ජයසූරිය, බුවනෙක අලුවිහාරේ, ප්‍රියන්ත ජයවර්ධන, මුර්දු ප්‍රනාන්දු, ජනක් ද සිල්වා යන පංච පුද්ගල විනිසුරු මඬුල්ල හමුවෙහි පෙත්සම් කැඳවනු ලැබිණ.

ශ්‍රී ලංකා නීතිඥ සංගමය, එක්සත් ජාතික පක්ෂ සභාපති වජිර අබේවර්ධන, මහලේකම් රංගෙ බණ්ඩාර, ජනතා විමුක්ති පෙරමුණ, සමගි ජන බලවේගය ඇතුළු දේශපාලන පක්ෂ, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ඇතුළු සිවිල් සංවිධාන සහ පුද්ගලයන් විසින් මේ සම්බන්ධ පෙත්සම් 19ක් ගොනු කර තිබිණි.

පෙත්සම්වල වගඋත්තරකරු ලෙස නම් කර සිටින්නේ නීතිපතිවරයාය.

මේ පනත් කෙටුම්පතෙහි ඇතැම් වගන්ති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි බැවින් එය නීතියක් බවට පත්වීමට නම් පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකේ බහුතර ඡන්දයෙන් සහ ජනමත විචාරණයකින් සම්මත කළ යුතු බවට තීන්දු කරන ලෙස ඉල්ලා මේ පෙත්සම් ගොනුකර තිබේ.

මේ පෙත්සම් ඊයේ (19) කැඳවූ අවස්ථාවේදී පනත් කෙටුම්පතට පක්ෂව අතරමැදි පෙත්සම් කිහිපයක් ද ගොනුකර ඇති බව ඒ වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරු අධිකරණයට දන්වා සිටියහ.

ඒ අනුව අංක පිළිවෙළින් පෙත්සම් 23 කැඳවීමටත් එක් නීතිඥවරයකුට විනාඩි 20 - 30 අතර කාලයක් කරුණු දැක්වීමට අවස්ථාව දෙන බව අගවිනිසුරු ජයන්ත ජයසූරිය මහතා සඳහන් කළේය.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනය වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ කේ. කනගේශ්වරන් මහතා කරුණු ඉදිරිපත් කළේය.

එම පනත් කෙටුම්පතේ ඇතැම් වගන්ති මගින් ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවයට සහ භෞමික අඛණ්ඩතාවයට හානි වන බව ඒ මහතා සඳහන් කළේය. මිනිසා විසින් නිර්මාණය කළ කෘත්‍රිම බිම්කඩක් කිසිදු රටක භෞමික අඛණ්ඩතාවට සහ ස්වෛරීභාවයට හානි නොකළ යුතු බව ඒ මහතා කීය. බ්‍රිතාන්‍ය ආධිපත්‍යයෙන් මිදීම සමග ශ්‍රී ලංකාව ස්වාධීන, ස්වෛරී රටක් බවට පත් වූ බව ඒ මහතා කීය. ලංකාවේ සාගර කලාපය පසුව ප්‍රකාශ කෙරුණ බව ද ශ්‍රී ලංකාවේ පරිපාලන කලාපය දිස්ත්‍රික්ක 25කින් සමන්විත වූ බවට හෙතෙම සඳහන් කෙළේය.

මේ පනත් කෙටුම්පත මගින් කෘතිමව සකස් කළ බිම්කඩක් ශ්‍රී ලංකා භූමි ප්‍රමාණයට එක්කිරීමට උත්සාහ කරන බව පෙන්වා දුන් ජනාධිපති නීතිඥවරයා එම භූමි ප්‍රමාණය ලංකා භූමි ප්‍රමාණයෙන් වෙන්වූ කෘත්‍රිම බිමක් බවත් සඳහන් කළේය. මේ කෘත්‍රිම බිම කිසිදු පුද්ගලයකුට අයත් නොවන අතර, පාර්ලිමේන්තුව නියෝජනය කරන දිස්ත්‍රික්ක 25න් එකකට හෝ එය අයත් නොවන බව ඒ මහතා සඳහන් කළේය. යම් යම් හේතූන් මත දිස්ත්‍රික්කවල සීමා මායිම් වෙනස් විය හැකි වුවත් එය ශ්‍රී ලංකාවේ භූමි ප්‍රමාණය තුළ සිදුවන බව හෙතෙම කීය. එහෙත් මෙහිදී වෙනමම කෘතිම බිමක් කොළඹ දිස්ත්‍රික්කයට ඈඳා ගැනීමට උත්සාහ කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 5 වන වගන්තියට පටහැණි බව ජනාධිපති නීතිඥවරයා සඳහන් කළේය. එසේම ලංකාවේ ස්වෛරීභාවයෙහි මූලික පදනමට එමගින් හානි වන බව ඒ මහතා සඳහන් කළේය.

ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව ඉඩම් සම්බන්ධව ක්‍රියාත්මක වන බව ඒ මහතා කීය. වගුරු බිම් ආදිය වාණිජ හෝ වෙනත් කටයුතු වෙනුවෙන් සිදු කළ හැකි බව එම සංස්ථා පනතෙහි සඳහන් වේ. ස්වාභාවික බිම්කඩක් මිස කෘතිම බිම්කඩක් ගොඩකිරීම එම පනතට පටහැනි බව ඒ මහතා සඳහන් කළේය.

ලංකා භූමිය ලෙස හඳුනාගත් භූමි ප්‍රමාණයට කෘත්‍රිමව ඉදිකළ බිම්කඩක් එකතු කර ගැනීම මෙරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පමණක් නොව අන්තර්ජාතික නීතියට ද පටහැනි බව හෙතෙම කීය. පනත් කෙටුම්පතෙහි ඒ සම්බන්ධව ඇති වගන්තිය ජනමත විචාරණයකින්, පාර්ලිමේන්තුවේ 2/3 බහුතරයෙන් සම්මත වුවද එය අන්තර්ජාතික නීතිය මගින් පිළිනොගන්නා බව හෙතෙම කීය.

බ්‍රිතාන්‍ය පාලන කාලයේදීම රාජකීය ඉඩම් ලෙස ශ්‍රී ලංකා භූමි භාගය හඳුන්වා ඇති අතර, කෘත්‍රිමව ඉදිකළ භූමි ප්‍රමාණය කිසිසේත්ම රාජකීය ඉඩමක් ලෙස හඳුන්වා දිය නොහැකි බව ඒ මහතා කීය.

ඒ අනුව කෘතිම බිම්කඩක් ශ්‍රී ලංකා භූමියට එකතු කර ගැනීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, ඉඩම් ප්‍රතිසංස්කරණ පනත, සාගර කලාප පනත මෙන්ම අන්තර්ජාතික නීතියට ද පටහැනි බවට ඒ මහතා කරුණු ඉදිරිපත් කෙළේය.

රටක භූමි භාගය ලෙස පිළිගනු ලබන්නේ ස්වාභාවිකව නිර්මාණය වූ බිමක් මිස මිනිසා විසින් කෘතිමව සකස් කළ බිමක් නොවන බව ඒ මහතා කීය.

මේ කොමිසමට පත්කරන පුද්ගලයන් කවරේද, කුමන අධ්‍යාපන මට්ටමක ද සහ ඔවුන්ගේ සුදුසුකම් කුමක් ද යන්න පිළිබඳව කිසිවක් නොසළකා හැර ඇති බව ඔහු පෙන්වා දුන්නේය. ජනාධිපතිවරයාට කැමැති පුද්ගලයන් පස්දෙනකු ඊට පත්කිරීමට අවස්ථාව දී ඇති බව ද එය ගැටලු සහගත බව ද ඒ මහතා සඳහන් කළේය.

එකම රටක්, එකම නීතියක් යන්නට පටහැනි වන කරුණක් බව පෙන්වා දුන්නේය. පනත් කෙටුම්පතෙහි 35 (A) සහ (B) යන වගන්ති මගින් වරාය නගරයෙහි සේවය කරන දේශීය විදේශීය සියලු දෙනාට බදු සහන ලබා දී ඇති බව ඒ මහතා පෙන්වා දුන්නේය. එක් කොටසක් පමණක් එලෙස බදුවලින් නිදහස් කිරීම දේශීය ආදායම් පනතට ද පටහැනි බව සඳහන් කළ ඒ මහතා පාර්ලිමේන්තු අනුමැතියෙන් තොරව බදුවලින් නිදහස් කිරීම හෝ බදු සහන ලබාදීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වන ව්‍යවස්ථාවට සම්පූර්ණයෙන් පටහැනි බව ඔහු පෙන්වා දුන්නේය.

## වරාය නගර පනතට එරෙහි පෙත්සම් විභාගය

එසේම මේ පනත් කෙටුම්පතෙහි වගන්ති කිහිපයක් බැංකු පනතට පටහැණි බව ජනාධිපති නීතිඥවරයා පෙන්වා දුන්නේය. මේ කලාපයෙහි බැංකු කටයුතු ඉන්දියාවෙන් පැමිණි කනකපුල්ලේ කෙනකුට වුව ද කළ හැකි බවත්, එය අධීක්ෂණය කිරීමේ බලයක් කිසිදු රාජ්‍ය ආයතනයකට දී නැතැයි පෙන්වා දුන් ඒ මහතා මුදල් විශුද්ධිකරණයෙහි යෙදෙන්නන්ට නිසි ලෙස කටයුතු කළ හැකි පරිදි දිව්‍ය විමානයක් මෙමගින් සකස් කර ඇති බව ඒ මහතා සඳහන් කෙළේය.

ජනතාවගේ මුදල් සම්බන්ධ සම්පූර්ණ බලය පාර්ලිමේන්තුව සතුවන අතර, එම බලය වරාය නගරයෙන් ඉවත් කර ඇති බව කීය. මෙරට ජනතාවට, ජනතාවගේ ස්වාධීනත්වයට, රටේ ස්වෛරීභාවයට, භෞමික අඛණ්ඩතාවයට හානි වන ඕනෑම ක්‍රියාකාරකමක් වරාය නගර කලාපය තුළ සිදුකිරීමට මෙම පනත් කෙටුම්පත මගින් අවස්ථාව සලසා ඇති බව ජනාධිපති නීතිඥවරයා සඳහන් කළේය.

මේ කලාපය තුළ සිටින්නන්ගේ ආගමන විගමන කටයුතු අදාළ කොමිසමට පැවරීමක් මෙමගින් සිදුකරන අතර, එම කටයුතු ආගමන විගමන දෙපාර්තමේන්තුවට ලබා නොදීම නීතිවිරෝධී බව ඒ මහතා කීය. මෙම පනත් කෙටුම්පත රටට පිරිමැසිය නොහැකි හානියක් සිදු කරනු ඇති බව පවසමින් ඔහු කරුණු දැක්වීම අවසන් කළේය.

මේ පනත් කෙටුම්පතට මූලික විරෝධතා ඉදිරිපත් කරන බව පෙත්සම්කාර රේණුක පෙරේරා මහතා වෙනුවෙන් පෙනී සිටි නීතිඥ දර්ශන වේරදුවගේ මහතා සඳහන් කෙළේය.

මෙම වරාය නගර කලාපය තුළ සිටින්නන්ට තමන්ට නීති සකසා ක්‍රියාත්මක කිරීමේ බලයක් දී ඇති අතර, එය පාර්ලිමේන්තුව සතු බලය උදුරා ගැනීමක් බව ඒ මහතා සඳහන් කළේය. එම බලය එහි වෙසෙන්නන් භාවිතා කළ හොත් එය නැවත ලබාගැනීමට ජනාධිපතිවරයාට හෝ නැති බව ඔහු කීය.

ශ්‍රී ලංකාව ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයකි. එහි සෑම බිම් අඟලක්ම එම ජනරජයට අයත් වේ. ඊට පරිබාහිරව බිම් කොටසක් ඉදිකිරීම රටේ ස්වෛරීභාවයට මෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 1, 2, 3 ව්‍යවස්ථාවන්ට සහමුලින්ම පටහැනි බව නීතිඥවරයා සඳහන් කළේය. ගැසට් පත්‍රයක් මුද්‍රණය කිරීමෙන් පසු පාර්ලිමේන්තුවේ දැනගැනීමට පමණක් එය ඉදිරිපත් කරන බව පනත් කෙටුම්පතෙහි සඳහන් වේ. පාර්ලිමේන්තු අනුමැතියට නොව දැනගැනීමට යමක් ඉදිරිපත් කරන බව ඒ මහතා කීය. මේ පනත් කෙටුම්පතේ වගන්ති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 1, 2, 3 වගන්තිවලට සහමුලින්ම පටහැණි බව ඒ මහතා සඳහන් කළේය.

මේ පනත් කෙටුම්පතට එරෙහිව පුරවැසි බලය සංවිධානයේ කැඳවුම්කරු ගාමිණී වියන්ගොඩ ඉදිරිපත් කර ඇති පෙත්සමක් වෙනුවෙන් ජනාධිපති නීතිඥ එම්. ඒ. සුමන්තිරන් මහතා කරුණු දක්වමින් මෙසේ කීය.

ශ්‍රී ලංකා භූමි භාගයට අයත් නොවන බිම්කඩක් සම්බන්ධයෙන් වන පනත් කෙටුම්පතක් පිළිබඳව අධිකරණයේ මතය විමසන ප්‍රථම අවස්ථාව මෙයයි. මේ කොමිසමට පත්කළ යුතු පුද්ගලයන් කවුරුන්දැයි මෙහි සඳහන්ව නෑ. මෙරට පුරවැසියකුට මෙන්ම විදේශිකයකුට ද මේ කොමිසමෙහි සාමාජිකයකු ලෙස කටයුතු කළ හැකියි. මූල්‍ය බලය පාර්ලිමේන්තුවෙන් ඉවත් කිරීම පමණක් නොව අධිකරණ බලය ද අත්තනෝමතික ලෙස මේ කලාපයෙන් ඉවත් කිරීම මෙහිදී සිදු කර තිබෙනවා.

මෙය ස්වාධීන, ස්වෛරී රාජ්‍යයක් සම්පූර්ණ වශයෙන් විදේශිකයන්ට පාලනය කිරීමට දීමක් බඳුයි. මෙම කොමිසමේ සාමාජිකයන්ට රිසි ලෙස කටයුතු කළ හැකියි. කිසිවකුට එය පාලනය කළ නොහැකියි. බැලූ බැල්මට ජාතික ආර්ථිකය වර්ධනය කිරීම සඳහා මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළ බව සඳහන් නමුත් එය ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකය ලෙස කොතනකවත් සඳහන් වන්නේ නෑ. එය කාගේ හෝ ආර්ථිකයක් සංවර්ධනය කිරීම සඳහා විය හැකියි.

වෙනත් ඕනෑම රටක පුරවැසියකුට ඕනෑම ආකාරයකින් සොයා ගත් මුදල් මේ වරාය නගර කලාපයෙහි ආයෝජනය කිරීමට නීතිමය අයිතියක් මෙමගින් දෙනවා. එය මෙරට පුරවැසියකුට කළ නොහැකියි.

එක්සත් ජාතික පක්ෂයේ මහලේකම් රංගෙ බණ්ඩාර මහතා විසින් ගොනු කළ පෙත්සම වෙනුවෙන් නීතිඥ එරාජ් ද සිල්වා මහතා කරුණු ඉදිරිපත් කළේය. වරාය නගරය වටා පූර්ණ ඒකාධිකාරයක් ගොඩනැඟීම මෙමගින් සිදු කරන බව ඔහු සඳහන් කළේය.

මෙම වරාය නගර කලාපය කෘතිමව ඉදිකර ගත් කොටසක් වන අතර, සියලු දෙයින් නිදහස් කර ඇති නිසා මෙරට අධිකරණයක එහි කටයුතු ප්‍රශ්න කිරීමේ බලයක් නැති බව ඔහු කීය. මේ කලාපය තුළ සේවය කරන, පදිංචි පුද්ගලයන් පමණක් නොව එහි යන අමුත්තන්ට පවා විශේෂ බදු සහන වරප්‍රසාද ලබාදීමක් මෙමගින් සිදු කරන අතර, එය මෙරට ජනතාවගේ මූලික අයිතීන් උල්ලංඝනය කිරීමක් බව ද ඒ මහතා කීය.

එසේම මෙම කොමිසමේ ගිණුම් සහ ආධාර ගිණුම් දෙකක් මෙහි තිබෙන බව පෙන්වා දුන් ඒ මහතා ඒවා විගණනනය කිරීමේ බලය විගණකාධිපතිවරයාට ලබා දී නැති බව ඔහු පෙන්වා දුන්නේය.

මෙම වරාය නගර කලාපයේ ව්‍යාපාර කටයුතු ද ඒකාධිකාරයකට පැවරීමක් සිදු කරන බව පෙන්වා දුන් ඒ මහතා අවසර ලත් විශේෂිත ව්‍යාපාරිකයන්ට පමණක් මෙහි ආයෝජන කිරීමේ අවස්ථාව දී ඇති බව කීය.

සමස්තයක් ලෙස ගත් විට මෙම පනත් කෙටුම්පතෙහි වගන්ති මෙරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට මෙන්ම නීතිරීති පනත් කිහිපයකටම පටහැණි බව ඔහු සඳහන් කළේය. සිහින දූපතක, සිහින කොමිසමක් බිහිකරන මෙම පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැණි බැවින් එය පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බහුතර ඡන්දයෙන් සහ ජනමත විචාරණයකින් සම්මත විය යුතු බවට ප්‍රකාශ කරන්නැයි ඔහු අධිකරණයෙන් ඉල්ලා සිටියේය.

පෙත්සම්කාර එක්සත් ජාතික පක්ෂ සභාපති වජිර අබේවර්ධන මහතා වෙනුවෙන් ජනාධිපති නීතිඥ රොනල්ඩ් පෙරේරා මහතා කරුණු ඉදිරිපත් කළේය.

මෙම පනත් කෙටුම්පතේ වගන්ති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට, නාගරික සංවර්ධන අධිකාරි පනත, නගර සභා පනත යනාදියට පටහැණි බවට ඔහු සඳහන් කළේය. රජයට ආදායම් ලැබෙන විශාල බදු රැසකින් මේ කලාපය නිදහස් කිරීමට මේ කොමිෂන් සභාවට බලය ලැබෙන බව ඔහු කීය. එසේම මේ වරාය නගර කලාපය ව්‍යාපාර කටයුතු සඳහා පමණක් නොව පුද්ගලයන් පදිංචි වීමට ද සැලසුම් කර ඇති බව ඔහු කීය. එහි පදිංචිකරුවන්ට ඡන්ද බලය ලැබෙන්නේ ද යන්න ගැටලුවක් බවත්, එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 1, 2, 3 යන වගන්තිවලට පටහැනි බවත් ඒ මහතා සඳහන් කළේය.

සමගි ජනබලවේගයේ මහලේකම් රංජිත් මද්දුමබණ්ඩාර මහතා වෙනුවෙන් පෙනී සිටි නීතිඥ තිසත් විජේගුණවර්ධන මහතා කරුණු දක්වමින් සාමාජිකයන්ගේ සුදුසුකම් හෝ කිසිවක් නොතකා මෙම කොමිසමට සාමාජිකයන් පත්කිරීමේ අත්තනෝමතික බලය ජනාධිපතිවරයාට මෙමගින් ලබා දී ඇති බව ඔහු සඳහන් කෙළේය. එම අත්තනෝමතික බලය මගින් පත්කරන කොමිසමට අසීමාන්තික බලයක් ලබා දී ඇති බව ඔහු සඳහන් කළේය.

ව්‍යාපාර කටයුතුවල නිරත වීමට එහි කටයුතු කිරීමට පමණක් නොව එම නගර කලාපය නැරඹීමට පුද්ගලයකුට අවශ්‍ය නම් ඒ සඳහා කොමිසමේ අවසරය ලබාගත යුතු බව ඔහු පෙන්වා දුන්නේය.

තමන්ගේ දුක්ගැනවිලි අධිකරණයට ඉදිරිපත් කිරීමේ හැකියාව මෙරට ජනතාවට තිබෙනවා. එහෙත් එම හැකියාව සහ බලය අධිකරණයෙන් ඉවත් කිරීමක් මෙම කොමිසමෙන් සිදු වෙනවා. මෙම කොමිසමේ සංයුතිය, එහි ක්‍රියාකලාපය සහ බලය මෙරට ජනතාවගේ ස්වෛරීභාවයට හානි කරනවා. එය ජාතික ආරක්ෂාවට ද තර්ජනයක්. මේ කොමිසමට අත්තනෝමතික බලයක් ලබා දී තිබෙනවා. මෙම පනත් කෙටුම්පතේ වගන්ති කිහිපයක්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනියි. මෙම පනතින් ජාතික ආර්ථිකය, රටේ ස්වෛරීත්වය සහ ජාතික ආරක්ෂාවට විශාල තර්ජනයක් ඇති කරන නිසා එයට විරුද්ධ වන බව ඔහු සඳහන් කළේය.

සමගි ජන බලවේගයේ තරුණ පෙරමුණ වෙනුවෙන් ගොනු කළ පෙත්සම සම්බන්ධයෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ ෆර්මාන් කාසිම් සඳහන් කළේ මේ වරාය නගර කලාපය මෙරට දිස්ත්‍රික්ක 25ට අයත් නොවන බවය. මෙම කොමිසමේ සාමාජිකයන්ට අවශ්‍ය සුදුසුකම් කුමක්ද යන්න සඳහන් කර නැති බව පෙන්වා දුන් ඔහු කිසිවෙකුත් නොදන්නා සාමාජිකයන් පිරිසක් රටේ භූමිභාගයට අයත් නොවන වෙනම බිම් කොටසක් පාලනය කිරීම මෙරට බහුතරයක් වූ සාමාන්‍ය ජනතාවගේ මූලික අයිතීන් උල්ලංඝනය කරන බව ඔහු පෙන්වා දුන්නේය.

ජනතා විමුක්ති පෙරමුණ ගොනු කළ පෙත්සම වෙනුවෙන් පෙනී සිටි නීතිඥ ශාන්ත ජයවර්ධන මහතා ද මෙහිදී කරුණු ඉදිරිපත් කළේය.

වරාය නගර කලාපයේ ගිණුම්වල විගණන කටයුතු විගණකාධිපතිවරයාට නොපවරා වෙනත් අයකුට පැවරීම මගින් සිදු කර ඇත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සංශෝධන කිරීමක් බව ඔහු සඳහන් කළේය. එය සහමුලින්ම මෙරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැණි බව ද ඔහු සඳහන් කළේය.

**පෙත්සම් වැඩිදුර විභාගය අද (20) පැවැත්වේ.**

# බෙදුම්වාදය පරාජය කළ නායකයන් රට පාවා දෙන්නේ නෑ

## ● ඇමැති ප්‍රසන්න රණතුංග



**මහින්ද අලුත්ගෙදර**

තිස් වසරක යුද්ධයක් නිමා කර, බෙදුම්වාදය පරාජය කළ නායකයන් බලයේ සිටින අවස්ථාවක රට පාවා දෙන අන්දමේ කිසිදු තීරණයකට ඉඩක් හිමි නොවන බව සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග මහතා පවසයි.

ඇමැතිවරයා මේ බව පැවැසුවේ රාමඤ්ඤ මහා නිකායේ මහා නායක මකුලෑවේ විමල නාහිමි බැහැදැකීමෙන් අනතුරුව මාධ්‍ය වෙත අදහස් දක්වමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා මෙසේ ද කීය.

'රටේ ස්වෛරීභාවයට සහ භෞමික අඛණ්ඩතාවට අබමල් රේණුවකින් හෝ හානියක් වීමට වත්මන් ආණ්ඩුව ඉඩ තබන්නේ නෑ. විපක්ෂය ආණ්ඩුවට එරෙහිව රටේ බොරු බිල්ලන් මවනවා. අපේ රට වැනි රටවල් දියුණු වෙනවා දකින්න බලවත් රටවල් අකමැතියි. බලයට පත් වන ආණ්ඩුවක් රට ආර්ථික වශයෙන් ශක්තිමත් කරන තීන්දු තීරණ ගන්න අවස්ථාවලදී ඒ රටවල රාජ්‍ය නායකයන් වෙනස් කරන්න බලවත් රටවල් පියවර ගන්නවා. ඒක 2015දීත් කළා. ඒ අයට ඕන විදිහට පාලකයන් පිරිසක් පත් කරගෙන ඒ අයට ඕනෑ විදිහට රට කළා. දැන් ආයෙත් රටේ ආර්ථිකය ශක්තිමත් වන වැඩපිළිවෙළක් හදන කොට ඒ අයගේ ඉත්තෝ එළියට බැහැලා කෑ ගහනවා. 2015දීත් ජනාධිපති අපේක්ෂකයෙක් ඔහුව මරන්නයි ඉන්නේ, අඩි හයේ වළකට යවන්නයි ඉන්නේ කිවුවා. අපේ ආණ්ඩුව පත් වුණාට පසුව එහෙම දේවල් සිද්ධ වුණා ද? ඒ අය නම් දේශපාලන පළිගැනීම් කළා. යහපාලන ආණ්ඩුව තරම් රට පාවා දුන් ආණ්ඩුවක් ඉතිහාසයේ නෑ.

සමහර ගිවිසුම් පාර්ලිමේන්තුවටත් එළි කළේ නෑ. අප එහෙම කරන්නේ නෑ. විනිවිදභාවයෙන් පනත් කෙටුම්පතක් ඇමැති මණ්ඩලයට ඉදිරිපත් කර තිබෙනවා. මේ වෙනකොට ඒ කෙටුම්පත ශ්‍රේෂ්ඨාධිකරණයේ අභියෝගයට ලක් වෙලා. ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව ලැබුණාට පසුව ඒ තීරණයට අනුව නීති අණ පනත් හදන තැන්වලට යොමු කර, නැවතත් කැබිනට් එකට ගෙනත් පාර්ලිමේන්තුවේ සාකච්ඡා කර, අලුත් අදහස් සහ යෝජනා එකතු කර විනිවිදභාවයෙන් කටයුතු කරන ආණ්ඩුවක්. විජේදාස රාජපක්ෂ මන්ත්‍රීවරයා ජනාධිපතිවරයාගේ සහ බැසිල් රාජපක්ෂ මහතාගේ දරුවන් ගැනත් කතා කළා. එතුමගෙ දරුවෝ මොකද කළේ. ඒ අයගේ දරුවෝ ටික එකතු වෙලා බාල බෙහෙත් ගෙනත් රටේ මිනිසුන්ට දුන්නා.

මේ හැමෝම බලන්නේ අවස්ථාවෙන් ප්‍රයෝජන අරන් බලය ගන්න පුළුවන් ද කියන එක විතරයි. එදා ප්‍රේමදාස ආණ්ඩුව තමයි කොටින්ට සල්ලි සහ ආයුධ දුන්නේ, වෙනම පළාතක් හදන්න. අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්න සජිත්ලා, චම්පිකලා උත්සාහ කළාට වැඩක් නෑ. වරාය නගරය පාලනය වෙන්නේ ශ්‍රී ලංකා රජයේ නීති රීති යටතේ. බොරු කියලා ජනතාව මුලා කරන්නයි පාඨලීලා උත්සාහ කරළන්නේ.'

# කොළඹ වරාය පනත් කෙටුම්පතේ වැරදි ඇත්නම් පෙන්වා දිය හැකියි

## ● රාජ්‍ය ඇමැති නිමල් ලාන්සා

**ක්‍රිසන්ති විතාරණ**



කොළඹ වරාය ආර්ථික කලාප විශේෂ කොමිෂන් සභා පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනැවිත් නියමිත කාලයේදී ඕනෑම අයකුට අධිකරණයට ගොස් එහි වැරදි ඇත්නම් පෙන්වා දිය හැකි බවත්, වැරදි තිබේ නම් ඒවා නිවැරදි කරගැනීමට අවස්ථාව ඇති බවත් ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය ඇමැති නිමල් ලාන්සා මහතා පැවැසීය.

රාජ්‍ය ඇමැතිවරයා මේ බව සඳහන් කළේ පසුගියදා ජා ඇල පැවති උත්සවයකදී වත්මන් දේශපාලන තත්ත්වය පිළිබඳව අදහස් දක්වමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ රාජ්‍ය ඇමැතිවරයා මෙසේ ද කීය.

'යහපාලන කාලයේදී මෙන් කිසිම පනතක් හොර රහසේ සම්මත කරන්නේ නෑ.තිස් අවුරුදු යුද්ධය අවසන් කර රටට සාමය උදා කර දුන්නේ රාජපක්ෂවරුන්. ඒ නිසා රාජපක්ෂවරුන් කවදත් රට ආරක්ෂා කරනවා මිස රට පාවා දෙන්නේ නෑ.

විපක්ෂය කරන්නේ හැමදාම චෝදනා කරන එක. ඒ අය වැඩක් කරන්නේ නෑ. අප ආණ්ඩුවක් ලෙස වැඩ කරනවා. ජනාධිපතිවරයා ඉතාමත් පැහැදිලිවම රටට ආදරය කරන නායකයෙක්. ඕනෑම කෙනකුට ප්‍රජාතන්ත්‍රවාදී අයිතියක් තිබෙනවා, තමන්ගේ අදහස් ප්‍රකාශ කරන්න. ඒ අදහස් ප්‍රකාශ කිරීමට රජය කිසිවිටෙක බාධා කරන්නේ නෑ. රජයක් ලෙස ජනාධිපතිවරයා රටට හිතකර තීන්දු ගන්නවා හැරෙන්නට රටට අහිතකර තීන්දු ගන්නේ නෑ. පාර්ලිමේන්තුවට ගෙන එන්නේ නැතුව කිසිදු පනතක් සම්මත කරන්න බෑ.

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ කියන්නේ ප්‍රධාන පක්ෂයක්. ඒ ප්‍රධාන පක්ෂයේ වෙනත් පක්ෂ විශාල සංඛ්‍යාවක් ඉන්නවා. එම පක්ෂවලට ඔවුන්ගේ අනන්‍යතාව තුළ රැස්වීම් තියන්න, කතා කරන්න අවස්ථාව තිබෙනවා. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ අගමැතිවරයාගේ නායකත්වයෙන් රැස්වීම් තියනවා. ඒ සඳහා සියලු පක්ෂ සහභාගී වෙනවා. ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ සියලු දෙනා එක ස්ථාවරයක ඉන්නවා.

ජනාධිපතිවරයා ජනතාවට සවන් දී කටයුතු කරන නායකයෙක් බව අද ඔප්පු කර තිබෙනවා. මේ රටේ බහුතරය ජනාධිපතිවරයා ගෙන යන වැඩපිළිවෙළ පිළිබඳව සෑහීමකට පත් වෙලා ඉන්නවා.'

# සජිත් මන්ත්‍රය ජප කර ආසන පනහක් ගත්තා

## මන්ත්‍රී ලක්ෂ්මන් කිරිඇල්ල

**කරල්ලියද්ද සමූහ - කේ. විජේසිරි නිශ්ශංක**



සජිත් සජිත් කියන මන්ත්‍රය ජප කර කර අප ආසන පනහක් ගත් බව මහනුවර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ලක්ෂ්මන් කිරිඇල්ල මහතා පැවැසීය.

මන්ත්‍රීවරයා එසේ ප්‍රකාශ කළේ කුණ්ඩසාලේ මැතිවරණ කොට්ඨාසයේ සමගි ජන බලවේගයේ පක්ෂ කාර්යාලයක් දිගන නගරයේ විවෘත කළ අවස්ථාවේදීය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ මන්ත්‍රීවරයා මෙසේ ද කීය.

'අප එක්සත් ජාතික පක්ෂයේ ඉන්න කාලයේ සෑම ගමකම සමිතියක් හැදුවා. ඒවා සියල්ලම ලියාපදිංචි කළේ සිරිකොතේ. නාම ලේඛන සියල්ලම තිබුණේ එතැන. සමගි ජනබලවේගය හැදුවාට පසුව කිසිම නාම ලේඛනයක් අපට ගන්න බැරි වුණා. එක්සත් ජාතික පක්ෂයෙන් වෙන් වෙලා මැතිවරණ සටනක් කර ලිපියක් යවන්න පාක්ෂිකයන්ගේ ලිපිනයක්වත් නෑ. අප මැතිවරණයට ඉදිරිපත් වෙලා සජිත් සජිත් කියන මන්ත්‍රය ජප කර තමයි ආසන පනස් ගණනක් ගත්තේ. මැතිවරණයෙන් පසුව අප තේරුම් ගත්තා, අපට සිරිකොතෙන් නම් ලැයිස්තු ලැබෙන්නේ නෑ කියලා. අද පොහොට්ටුවට ඡන්දය දුන් කෙනෙක් හොයා ගන්න නෑ.

සමහර මාධ්‍ය රජය වෙනුවෙන් ඇප වුණා. අද මේ ආණ්ඩුවට මොකද වෙලා තියෙන්නේ. ආණ්ඩුවේ ඉන්න කොට වෙන ප්‍රතිපත්තියක්. විපක්ෂයේ ඉන්න කොට වෙන ප්‍රතිපත්තියක්. ඒක තමයි මේ රජයට වෙලා තියෙන්නේ. එදා කියූ දේවල් අද වෙනස් වෙලා. බලය ලැබුණාට පසුව රාජ්‍ය සම්පත් විකුණන්නේ නෑ කියලා නැගෙනහිර ජැටිය ඉන්දියාවට දෙන්න උත්සහා කළා. මහා සංඝරත්නය සහ වෘත්තීය සමිති ඉදිරිපත් වෙලා එය නතර කළා. දැන් බටහිර ජැටිය දෙන්න යනවා.'

# ආණ්ඩුවට එල්ල වන සියලු විවේචන ආශීර්වාද ලෙස භාර ගන්නවා

## ● ඇමැති ජනක බණ්ඩාර තෙන්නකෝන්

**මහින්ද අලුත්ගෙදර**

වත්මන් ආණ්ඩුවට එල්ල වන සියලු විවේචන ඵලදායී රාජ්‍ය පාලනයක් සඳහා වන ආශිර්වාද ලෙස භාර ගන්නා බව රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන ඇමැති ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා ප්‍රකාශ කරයි.

ඇමැතිවරයා මේ බව සඳහන් කළේ පල්ලෙපොල ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල් කිහිපයකට නිවාසාධාර දීමේ උත්සවයකට එක් වෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා මෙසේ ද කීය.

'රජය ආරම්භ කරන විවිධ සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් ඇතැම් සිවිල් සංවිධාන පක්ෂග්‍රාහී විවේචන එල්ල කරනවා. එවැනි බොහෝ විවේචන සත්‍යතාවයෙන් තොර ද්වේශ සහගත විවේචන. තවත් සමහරක් විවේචනවල අප නිවැරදි විය යුතු තැන් පිළිබඳවත් සඳහන් වෙනවා. කොහොම වුණත් අපට එල්ල වන මේ සියලු විවේචන ඵලදායී රාජ්‍ය පාලනයකට වන ආශිර්වාද ලෙස භාර ගන්නවා.



නව රජය බලයට පත්වුණේම දැඩි මූල්‍ය දුෂ්කරතාවක රට හිර වෙලා තිබූ වෙලාවක. ඒ මොහොතේ අප රජයක් විදියට ආනයන සීමා කිරීමට පියවර ගත්තේ රටින් ගලා යන විදෙස් විනිමය සංචිතය තවදුරටත් රටේ ඉතුරු කර ගැනීමට.

ඒ වෙනුවට අප මේ රටේ නිෂ්පාදනය කළ හැකි සෑම දෙයක්ම රටේම නිෂ්පාදන කිරීමේ සංකල්පය හඳුන්වා දුන්නා. මෙයට දිය හැකි සරලම උදාහරණය තමයි කහ ආනයනය සීමා කිරීමට අප ගත් තීරණය. එදා දැඩි විරෝධයක් අපේ රජයට ඇති කරන්න විපක්ෂය උත්සාහ ගත්තා. නමුත් අප රට වෙනුවෙන් එදා ගත් තීරණයේ ප්‍රතිඵල අද අප භුක්ති විඳිනවා. මේ වගේම විරෝධයක් එදා අප අධිවේගී මාර්ග හදන විටත් ඇති කළා. නමුත් දැන් අපට පේනවා, ඒ විවේචනය කළ අයම මේ අධිවේගී මාර්ගවල ගිහින් තමන්ගේ රාජකාරී ඉටු කර ගන්නා ආකාරය. අද අපේ රජය ගන්න ඇතැම් තීන්දු තීරණ මේ මොහොතේ ජනප්‍රිය නොවෙන්න පුළුවන්. නමුත් මේ තීරණ තමයි අනාගත ශ්‍රී ලංකාවේ හැඩහුරුකම තීරණය කරන්නේ.

නායකයෙක්, රජයක් සිටිය යුත්තේ ජනප්‍රිය තීන්දු තීරණ ගැනීමට නොව නිවැරදි තීන්දු තීරණ ගැනීමටයි. අපේ මූලික ඉලක්කයවී තිබෙන්නේ ගම සංවර්ධනය කර ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමයි. මොකද අපේ රට තාම ග්‍රාමීය ආර්ථිකය මත පදනම් වූ රටක් ලෙස අපට හඳුනාගන්න පුළුවන්. මේ නිසයි කෘෂිකර්මය වගේම ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීමට ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාවට නංවා තිබෙන්නේ. අඩු ආදායම්ලාභී ඔබ වෙනුවෙන් මේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමෙනුත් අප අපේක්ෂා කරන්නේ ශක්තිමත් මිනිසෙක් නිර්මාණය කිරීමයි. ඒ වෙනුවෙන් ගමක් ගමක් පාසා අඩු ආදායම්ලාභී අය සොයා ගිහින් මේ ආකාරයට හිසට සෙවණක් සමග හිතට නිවනක් දෙන්නට අප කටයුතු කරනවා.'

පාර්ලිමේන්තු මන්ත්‍රී ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා ද මේ අවස්ථාවට එක් විය.

# පෝට් සිටි පනත් කෙටුම්පත ගැන ජනමත විචාරණයක් අවශ්‍යයි

## ● ප්‍රජාතන්ත්‍රවාදය සඳහා නීතිඥයෝ සංවිධානයේ නීතිඥ සුනිල් වටගල

**නදී මාණික්කගේ**



පෝට් සිටි පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ජනමත විචාරණයක් අනිවාර්යයෙන්ම අවශ්‍ය බව ප්‍රජාතන්ත්‍රවාදය සඳහා නීතිඥයෝ සංවිධානයේ නීතිඥ සුනිල් වටගල මහතා පෙරේදා (18) පැවැසීය.

ඒ මහතා මේ බව පැවැසුවේ කොළඹ සමාජය හා සාමයික කේන්ද්‍රයේදී පැවති මාධ්‍ය හමුවක් අමතමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේ ද කීය.

'ප්‍රජාතන්ත්‍රවාදය සඳහා නීතිඥයෝ සංවිධානය හැටියට මෙයට පෙර ජාතික වැදගත්කමක් තිබෙන ගැටලු වගේම නීතියේ ආධිපත්‍ය පිළිබඳව කරුණු මතු වන අවස්ථාවලදී මේ රටේ ජනතාව දැනුම්වත් කර තිබෙනවා. ඒ වගේම කොළඹ වරාය නගර කොමිෂන් සභා පනත සම්බන්ධයෙන් මේ මොහොතේ ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝගයට ලක් වෙමින් තිබෙනවා. එය අපේ රටේ නීතියේ පරමාධිපත්‍යයට කොපමණ බලපෑම් කර තිබෙනවාද යන්නත්, එය රටේ භූ දේශපාලනයට අදාළ වන ආකාරය පිළිබඳවත් පැහැදිලි කළ යුතුයි.

මේ පනත් කෙටුම්පත පිළිබඳව අධිකරණයට යා හැකිව තිබුණේ එක දවසක් විතරයි. ඒ දවසේදී පෙත්සම් 14ක් සියලු නීතිඥ ප්‍රජාවගේ ධෛර්යමත්භාවයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කළා.

මෙතැන තිබෙන නිමිත්ත ලංකා රාජ්‍ය සතුව තිබෙන භූමියක් සම්බන්ධයෙන් යෝජිත පනතක වගන්තිවල සමස්ත අර්ථය සලකා බලන්න ඕනෑ. මේ වගන්ති අයත් කොමිෂන් සභාව පිහිටවූවාම කෝප් කමිටුව, රාජ්‍ය ගිණුම් කමිටුව, රාජ්‍ය විගණනය යන කිසිවකට යටත් වෙන්නේ නෑ. හත් දෙනකුට නොවැඩි පස් දෙනකුට නොඅඩු කොමිෂන් සභාවක් ජනාධිපතිවරයා විසින් පත් කර මෙහි කටයුතු පවත්වාගෙන යනවා. මෙය පාර්ලිමේන්තුවට වගකියන්නේ නෑ කියන එක මෙයින් පැහැදිලි වෙනවා. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 05 වැනි වගන්තියේ ශ්‍රී ලංකාව අර්ථ නිරූපනය කර තිබෙනවා. "ශ්‍රී ලංකා ජනරජයට අයත් දේශය පරිපාලන දිස්ත්‍රික්ක 24කින් ද, දේශ සීමා ජල තීරයකින් ද සමන්විත වන්නේය" කියලා සඳහන් වෙනවා. අක්කර 1,115ක බිම්කඩ මේ යෝජිත පනතේ 52 සහ 53 වගන්තිවලට අදාළව මෙරට ක්‍රියාත්මක පනත් 15කින් නිදහස් කර තිබෙනවා.

ඒ වගේම යෝජිත පනතේ 73 වගන්තියට අදාළව පනත් 07කින් නිදහස් කර තිබෙනවා. ලංකාවේ නීතිය මේ බිම්කඩට අදාළ වෙන්නේ නැත්නම් එතැන තිබෙන්නේ වෙනත් රාජ්‍යයක කොළනියක්. මේ බිම්කඩ නිර්මාණය කළේ ලංකාවේ ගල්, පස්, අපේ මුහුදේ වැලි එකතු කිරීමෙන්. හැබැයි ඒ බිම්කඩට අපේ රටේ නීතියෙන් නිදහස් කර දෙනවා. මොන්ටෙවිඩියෝ සම්මුතියට අදාළව වෙනම රාජ්‍යයක් පිහිටුවීමට අදාළ මූලික කොන්දේසි 04ක් තිබෙනවා. නිශ්චිත ජනගහනයක් ඉන්න ඕනෑ. යෝජිත කොමිෂන් සභා පනත යටතේ වාසික සහ අනේවාසික කියලා නිශ්චිත කර තිබෙනවා.

# මේ ආණ්ඩුව බලයට ගේන්න වෙහෙසුණු අයටම අද ආණ්ඩුව එපා වෙලා

## ● මන්ත්‍රී ජේ. සී. අලවතුවල

**කුරුණෑගල දකුණ සමූහ - එම්. මහරූප්**

'මේ රජය බලයට පත් කරන්නට දර දිය ඇද්ද උදවියටම අද රජය එපා වෙලා. තව කොපමණ කාලයකට රජය පවත්වාගෙන යන්නට හැකි වේවිද යන ප්‍රශ්නයක් දැන් පැන නැගිලා. සිංහල අවුරුද්දට බඩු මිල අඩු කරන්නට ගැසට් නිකුත් කරමින් එක ඇමැතිවරයෙක් විහිළු සැපයුවා. දැන් මුදල් රාජ්‍ය ඇමැතිවරයා පෝට් සිටිය ආරක්ෂා කරගන්නට අලුත්ම තාලේ විහිළු සපයන්නට පටන්ගෙන තිබෙනවා.' යැයි සමගි ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ජේ. සී. අලවතුවල මහතා ප්‍රකාශ කර සිටියේය.

මන්ත්‍රීවරයා මේ බව පැවැසුවේ පෙරේදා (18) පැවති ප්‍රවෘත්ති සාකච්ඡාවකදීය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ මන්ත්‍රීවරයා මෙසේ ද කීය.

'පෝට් සිටි ව්‍යාපෘතියට අදාළව වරාය කොමිෂන් සභාවේ කෙටුම්පත් සම්මුතිය අනුව ජනාධිපතිවරයාට මේ ව්‍යාපෘතියට සම්පූර්ණයෙන්ම විදේශිකයන් පත් කිරීමේ හැකියාව ලැබෙනවා. විදේශිකයන් පත්වුවහොත් එය භයානක තත්ත්වයක් බවට පත් විය හැකියි. ජනතාව මේ පිළිබඳව දැඩි අවධානයෙන් සිටිය යුතුයි.



# තම ගජ මිතුරන්ට හම්බ කරන්න ඉඩදී මේ ආණ්ඩුව බලා ඉන්නවා

## ● මන්ත්‍රී මනුෂ නානායක්කාර



**කරල්ලියද්ද සමූහ - කේ. විජේසිරි නිශ්ශංක**

'මේ ආණ්ඩුව තම ගජ මිතුරන්ට හම්බ කරන්න ඉඩදී බලා ඉන්නවා. මේ හේතුව නිසා අද ජනතාවගේ දහසක් බලපොරොත්තු කඩා වැටිලා. අපට ඉතා ඉක්මනින් ආණ්ඩුවක් ගන්න පුළුවන් තැනට රාජපක්ෂ ආණ්ඩුව පත් වෙලා. යැයි ගාල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී මනුෂ නානායක්කාර මහතා ප්‍රකාශ කළේය.

ඒ මහතා මේ බව ප්‍රකාශ කළේ සමගි ජන බලවේගයේ මෙහෙයවීමෙන් කුණ්ඩසාලේ දිගන නගරයේ පිහිටි පක්ෂ කාර්යාලයේදී පැවති ජනහමුවකදීය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේ ද පැවැසීය.

'මේ රජයට බලය ගන්න ඡන්දය දුන් හැට නව ලක්ෂයක් වූ ජනතාවගේ ප්‍රශ්න විසඳී නෑ. පඩි වැඩි වෙලා නෑ. බඩු මිල අඩු වෙලා නෑ. ගොවියා අපහසුතාවට පත් වෙලා. ලෝක සෞඛ්‍ය සංවිධානය අනුමත නොකළ එන්නත් මෙරටට ගෙනැවිත් තිබෙනවා. ජනතාව අමාරුවේ දාන තැනට වැඩ කරලා. මේ ආණ්ඩුව සෘජුවම වග කියන්න ඕනෑ මිලියන විසි දෙකක ජනතාවට වස පොල්තෙල් කවන්න සැලසූ එකට. මේක රසායනික ප්‍රහාරයක්. ත්‍රස්තවාදී ප්‍රහාරයක් වගේ දෙයක්.

# පළාත් සභා ක්‍රමය අහෝසි කිරීමට දෙමළ ජාතික සන්ධානය ඉඩ දෙන්නේ නෑ

## ● මන්ත්‍රී එම්. ඒ. සුමන්තිරන්



**උතුරු පළාත් විශේෂ - රසුල දිල්හාර ගමගේ**

පළාත් සභා ක්‍රමය අහෝසි කිරීමට දෙමළ ජාතික සන්ධානය ඉඩ නොතබන බවත්, දෙමළ ප්‍රශ්නය විසඳීමට ප්‍රායෝගික නොවන වත්මන් පළාත් සභා ව්‍යුහය ඒ අයුරින්ම පිළිගැනීමට ඔවුන් සූදානම් නොමැති බවත් දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රී එම්. ඒ. සුමන්තිරන් මහතා පැවැසීය.

මන්ත්‍රීවරයා මේ බව පැවැසුවේ යාපනයේ වඩමරච්චි ප්‍රදේශයේ පිහිටි ඉලංකෙයි තමිල් අරුසු කච්චි පක්ෂ කාර්යාලය ඉදිරිපිට පැවති පූජාවකට සහභාගී වීමෙන් පසුව මාධ්‍යවේදීන් නැගූ ප්‍රශ්නවලට පිළිතුරු දෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ මන්ත්‍රීවරයා මෙසේ ද කීය.

'දැන් පළාත් සභා මැතිවරණය පවත්වනවාද නැද්ද කියන කාරණය ගැන මේ දවස්වල විශාල කඹ ඇදිල්ලක් තිබෙනවා. භික්ෂූන් වහන්සේලා මේකට විරුද්ධව කතා කරනවා. රජය පළාත් සභා මැතිවරණය ගැන විවිධ කතා කියනවා. අප කියන්නේ එකම එක කාරණයයි. මේ රජයට නොවෙයි, කිසිම රජයකට පළාත් සභා ක්‍රමය අහෝසි කරන්න අප ඉඩ දෙන්නේ නෑ.ඉන්දියාවේ පූර්ණ සහාය ගෙන අප ඒ ක්‍රියාව වළක්වනවා.

# වරාය නගරය ප්‍රශ්නය වැඩිපුරම කරේ තියාගෙන යන්නේ ආණ්ඩුවේම අය

## ● මන්ත්‍රී නලීන් බණ්ඩාර

**මල්ලවපිටිය සමූහ - අනුර දිසානායක**



'අපට පේන විදිහට වරාය නගරය ප්‍රශ්නය වැඩිපුරම කරේ තියාගෙන යන්නේ ආණ්ඩුවේම කට්ටිය. ඒක ඉතාම භයානක තත්ත්වයක්. මුරුත්තෙට්ටුවේ ආනන්ද හිමි වගේම මේ රජය බලයට ගේන්න වෙහෙස වූ අයත් පෝට් සිටි කියන සටන් පාඨය කරේ තියාගෙන ඉන්නවා වගේ පේනවා. විජේදාස රාජපක්ෂ මහතා මේ පිළිබඳව ප්‍රකාශයක් කර තිබෙනවා. මේ වගේ සටන් දියාරු කරන්න ආණ්ඩුවෙන්ම කණ්ඩායමක් හදන එක තමයි මේ අයගේ ක්‍රමය. මෙවැනි සැලසුම් කලිනුත් ක්‍රියාත්මක වෙලා තිබෙනවා.' යැයි සමගි ජන බලවේගයේ කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී නලීන් බණ්ඩාර මහතා පසුගියදා කුරුණෑගල පැවති මාධ්‍ය හමුවකදී පැවැසීය.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ මන්ත්‍රීවරයා මෙසේ ද කීය.

'කොළඹ වරාය නැගෙනහිර ජැටිය පිළිබඳ සටනත් ජයග්‍රහණය ආසන්නයේ තිබියදී ආණ්ඩුවේ කට්ටියක් සටන් පාඨ කරට ගත්තා වගේ පෙන්නුවා. අවසානයේ වෘත්තීය සමිති අරගලය පැත්තක තිබියදී අමාරුවෙන් ගත් ජයග්‍රහණයක් බව පෙන්වන්න ආණ්ඩුවේ පාර්ශ්ව කටයුතු කළා.

වරාය නගර ප්‍රශ්නයත් එවැනිම දෙයක් විය හැකියි. මේ සටන කරේ තියාගෙන ගිය අය ප්‍රවෘත්ති සාකච්ඡාවක් තියා ජනතාව ගොනාට අන්දවනවා. ඒ හරහා චීනයට අවශ්‍ය දේවල් සහ රාජපක්ෂලාට අවශ්‍ය දේත් ඉෂ්ට කර ගන්න යනවාද කියන සැකය මතු වෙනවා. වරාය නගරය පිළිබඳ ප්‍රශ්නය පැත්තක තිබ්බත් මේ වන විට ලංකාව චීනයේ කොලණියක් බවට පත්වී හමාරයි. අපේ මුදල් අමාත්‍යාංශය චීනයේ ශාඛාවක් වගේ. ලක්ෂ දෙකක් පමණ චීන කම්කරුවන් මේ රටේ වැඩ කරනවා. චීන කොවිඩ් එන්නත් ලංකාවට ගෙනාවේ ඒ චීන කම්කරුවන්ට.

අපේ ආණ්ඩුව කාලයෙත් මේ වරාය නගරය පිළිබඳ සාකච්ඡා කළා. එදා චීන ව්‍යවසායකයන් එකඟ වෙලා තිබුණා, කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයට ඇතුළත් කරන්න. විවාදයක් තිබුණා කොළඹ මහ නගර සභාවට ඇතුළත් කරනවාද නැත්නම් වෙනම නගර සභාවක් විදියට ක්‍රියාත්මක කරනවාද කියලා. එහෙම තිබෙද්දී දැන් වෙනම රාජ්‍යයකට අවශ්‍ය අණ පනත් රෙගුලාසි ඇතුළත් පනත් ගේන්න හදන එක භයානකයි.

විපක්ෂය විදිහට සමගි ජන බලවේගයේ අප මේ සටන අතට ගන්නවා. හෙට අනිද්දා වෙනකොට ලංකාවෙන් 'ශ්‍රී' අකුර හැලිලා 'චී' අකුර ඇතුළත් වෙන්න පුළුවන්. එතරම්ම මේ රජය චීනයට ගැති වෙලා. චීනය හමුවේ නිවට නියාලු ප්‍රතිපත්තියක ඉන්නේ.

විජේදාස රාජපක්ෂ මහතා කියනවා, ජනාධිපතිවරයා තමන්ට පරුෂ වචනයෙන් බැන්නා කියලා. අප සතුටු වෙනවා, බැන්න බව රටට කියන්න තරම් විජේදාස රාජපක්ෂ මහතාට කොන්දක් තිබුණ එක ගැන. ආණ්ඩුව ඇතුළේ ඇවිලෙමින් තිබූ ගිනි පුපුරු දැන් ගිනි කන්දක් බවට පත් වෙමින් තිබෙනවා. මේ රටේ බොහෝ දෙනෙක් දැන් ඉන්නේ විරේක බෙහෙත් බීලා පස්ස පැත්ත මහගත්ත අය වගේ. කතා කරන්න බැරුව ඉන්නේ. මහපු නූල් ටික ලිහලා දැම්මාම විරේක බීපු එකේ ප්‍රතිඵල බලන්න පුළුවන්.'

ක්‍රීඩා SPORTS

sports.dinamina@lakehouse.lk

# දිල්හාර ලොකුහෙට්ටිගේට අයිසීසීයෙන් වසර 8ක තහනමක්



**ෆවුස් මොහොමඩ්**

ශ්‍රී ලංකා ක්‍රිකට් පිලේ හිටපු තුන් ඉරියව් ක්‍රීඩක දිල්හාර ලොකුහෙට්ටිගේට අන්තර්ජාතික ක්‍රිකට් කවුන්සිලය (අයිසීසී) මගින් වසර අටක තහනමක් පනවා ඇත. අයිසීසී දූෂණ විරෝධී නීතිරෙගුලාසි වගන්ති තුනක් උල්ලංඝනය කිරීම හේතුවෙන් මේ තහනම පනවා ඇති අතර, වසර 8ක් යන තුරු ඔහුට කිසිදු ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධ කිසිදු ආකාරයක ක්‍රියාකාරකම්වලට සහභාගි විය නොහැකිය.

ඔහු සම්බන්ධව එල්ල වූ දූෂණ චෝදනා සඳහා සිදු කරනු ලැබූ පරීක්ෂණවලට සහයෝගය නොදැක්වීම මත මේ තහනම පනවා ඇතැයි වාර්තා වේ.

ඔහු අයිසීසී දූෂණ විරෝධී නීති සංග්‍රහයේ තරගයක ප්‍රතිඵලය, ප්‍රගතිය හා පැවැත්ම නොසුදුසු ලෙස වෙනස් කිරීමට හෝ ඒ සඳහා සැලසුම් කිරීමට කරනු ලැබූ උත්සාහයකට සම්බන්ධ වීම, ඒ සඳහා සෘජුව හෝ වක්‍රාකාරව ක්‍රීඩකයකුගෙන් ඉල්ලීම හෝ ඔහු පොලඹවා ගැනීමට හෝ උපදෙස් දීමට කටයුතු කිරීම සහ විනය පද්ධතියට පටහැණිව දූෂිත කටයුතු සඳහා කරනු ලැබූ ඇරියුම් පිළිබඳ තොරතුරු අයිසීසීයට හෙළි කිරීමට අසමත් වීම දිල්හාර ලොකුහෙට්ටිගේ වරදකරු වීමට බලපෑ කරුණු අතර වේ.

එක්දින තරග 9කට සහ විස්සයි20 තරග 2කට ක්‍රීඩා කර ඇති ලොකුහෙට්ටිගේ අවසන් වරට ශ්‍රී ලංකා පිල නියෝජනය කළේ 2013 වසරේදී ඉන්දියාවට එරෙහිවය.

# මුරලි සුවෙන්



**ෆවුස් මොහොමඩ්**

හෘදයාබාධයක් හේතුවෙන් චෙන්නායි නුවර ඇපලෝ රෝහලට ඇතුළත් කළ බව කී හිටපු දඟපන්දු යවන ක්‍රීඩක මුත්තයියා මුරලිදරන් ඊයේ රෝහලෙන් පිටව ගිය බව වාර්තා වේ.

මේ දිනවල පැවැත්වෙන අයිපීඑල් තරගාවලියේ දී සන්රයිස් හයිද්‍රබාද් කණ්ඩායමේ පුහුණු කාර්ය මණ්ඩලයේ කටයුතු කරමින් සිටින මුරලිදරන් පෙරේදා චෙන්නායි නුවර ඇපලෝ රෝහලට ඇතුළත් වූයේ angioplasty වෛද්‍ය ප්‍රතිකාරය සඳහා බව ආරංචි මාර්ග සඳහන් කරයි.

මීට පෙර ධමනි අවහිර වීම වැළැක්වීම සඳහා ඔහු 'ස්ටෙන්ට්' ප්‍රතිකාර ලබා ගැනීමක් සිදු කර තිබූ බවත්, පසුගිය මාර්තු මාසයේදී නැවත එහි යම්කිසි අවහිරතාවක් පෙන්නුම් කර තිබීම හේතුවෙන් කලින් යොදාගත් පරිදි මේ වෛද්‍ය ප්‍රතිකාරය සිදු කිරීමට රෝහලට ඇතුළත් වූ බවත් එම ආරංචි මාර්ග වැඩි දුරටත් සඳහන් කරයි.

ඒ අනුව ප්‍රතිකාර ගැනීමෙන් පසු ඔහු රෝහලෙන් පිටව ගොස් ඇති අතර, ඔහුගේ සුවෙන් පසුවන බවත්, ඔහුට සුපුරුදු පරිදි දෛනික ක්‍රියාකාරකම්වල නිරත විය හැකි බවත් ඇපලෝ රෝහල් ආරංචි මාර්ග සඳහන් කරයි.

# ධවාන් තනි අතින් දිල්ලි පිල දිනවයි

ශිකර් ධවාන්ගේ අනුකම්පා විරහිත පිතිහරඹය හේතුවෙන් අයිපීඑල් තරගාවලියේ පන්ජාබ් කිංග්ස් පිලට එරෙහිව පෙරේදා රාත්‍රී පැවැති තරගයෙන් කඩුලු 6ක ජයක් වාර්තා කිරීමට දිල්ලි කැපිටල්ස් පිල සමත් විය.

කාසියේ වාසිය දිනූ දිල්ලි පිලේ ඇරියුමෙන් පළමුව පන්දුවට පහර දුන් පන්ජාබ් පිල ඕවර 20 අවසානයේ කඩුලු 4කට රැස් කළ ලකුණු 195 හඹා ගිය දිල්ලි පිල තරගය ජය ගත්තේ ඕවර 18.2කදී කඩුලු 4ක් පමණක් අහිමි වීමෙන් පසුවය.

දිල්ලි පිලේ ජයග්‍රහණයට මං විවර කළ ආරම්භක පිතිකරු ශිකර් ධවාන් පන්දු 49කින් ලකුණු 92ක් රැස් කළ අතර, ඊට හතරේ පහර 13ක් සහ හයේ පහර 2ක් ඇතුළත් විය.

# නිව්යංග්ස් පරදා කොළඹ දිදුලයි



## විනිසුරුට බැන වැදුණු නිව්යංග්ස් නිලධාරියා පිටියෙන් නෙරපයි

**ප්‍රින්ස් ගුණසේකර**

ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය සංවිධාන කරන වෘත්තීය පාපන්දු තරගාවලිය ආරම්භ කරමින් වෙන්නප්පුව නිව්යංග්ස් හා කොළඹ පාපන්දු සමාජය අතර පැවැති තරගයෙන් කොළඹ පාපන්දු සමාජය ගෝල් 4-0ක පහසු ජයක් වාර්තා කළේය. පසුගිය කාලය පුරා පැවැති ප්‍රධාන තරගාවලි කිහිපයකදීම ශූරතා දිනාගත් කොළඹ පාපන්දු සමාජය ඊයේ දිනයේදී සිය සුපුරුදු දක්ෂතා අතරට පැමිණ වෙන්නප්පුව නිව්යංග්ස් පිලට ප්‍රබල පීඩනයක් එල්ල කළේය.

නිව්යංග්ස් පිලේ පසුබැසීම මැද තරග විනිසුරුට බැන වැදීම හේතුවෙන් නිව්යංග්ස් පිලේ නිලධාරියකුට රතු කාඩ් අවවාද ලබාදී පිටියෙන් නෙරපීමට තරග විනිසුරු ක්‍රියා කිරීම කැපී පෙනෙන සිදුවීමක් විය. ඒ අනුව ඔහුට තරග දෙකක තහනමක් පැනවෙනු ඇත.

කොළඹ සුගතදාස ක්‍රීඩාංගණයේ පැවැති මෙම තරගයේ පළමු භාගයේදී කොළඹ පාපන්දු සමාජය ගෝල් 1-0කින් ඉදිරියෙන් සිටි අතර, තරගයේ 13වැනි මිනිත්තුවේදී සර්වාන් ජොහාර් එල්ල කළ නිදහස් පහර ගෝල් කණුව ඉදිරියේ සිටි චමෝද් දිල්ෂාන් හිසෙන් නිවැරදි ඉලක්කයට යොමු කොට සාර්ථක ප්‍රතිඵල නෙලා ගත්තේය.

අනතුරුව නිව් යංග්ස් පිලට 32වැනි මිනිත්තුවේදී ගෝලයක් එල්ල කිරීමට අගනා අවස්ථාවක් උදා වුවද අයිවරි කොස්ට් ක්‍රීඩක දෝසෝ මමෝදූට එහි නිසි ප්‍රයෝජනය ලබා ගැනීමට නොහැකි විය. ගෝල් කීපර් ඉදිරියට පැමිණි මොහොතේ ගෝල් කණුව දෙසට එල්ල කළ පහර ඉවතට ඇදී යෑමෙන් නිව්යංග්ස් බලාපොරොත්තු සුන් වී ගියේය.

තරගයේ 51 වැනි මිනිත්තුවේදී කොළඹ පාපන්දු සමාජයේ මුෂාකීර් රාසීක් වේගයෙන් ගෝල් කණුව දෙසට පන්දුව ගෙන එද්දී ගෝල් කීපර් ධනුෂ්ක රාජපක්ෂ ඉදිරියට පැමිණ නීති විරෝධී ආවාරණයකට උත්සාහ කිරීමට යෑමෙන් කොළඹ පාපන්දු සමාජයට දඩුවම් පහරක් පිරිනැමුණු අතර, එය සාර්ථක කර ගැනීමට සර්වාන් ජොහාර් සමත් විය. එවිට කොළඹ පිල ගෝල් 2-0ක් ලෙස ඉදිරියෙන් සිටියේය.

කොළඹ සමාජයට 3වැනි ගෝලය 79වැනි මිනිත්තුවේදී වාර්තා වූයේ නායක මොමස් යාපෝ ගෝල් කණුව ඉදිරියට පන්දුව ගෙන යද්දී නිව්යංග්ස් ගෝල් කීපර් ඇද වැටීමෙනි. ගෝල් කීපර්ට ඉහළින් පන්දුව ගෝල් කණුවට යොමු කිරීමට යාපෝ සමත් විය. 85වැනි මිනිත්තුවේදී කොළඹ පාපන්දු සමාජයට චමෝද් දිල්ෂාන් තම දෙවැනි ගෝලය එක්කර දුන් අතර, රවුම් මොහිදීන් ඔහුට අනගි සහයක් ලබා දුන්නේය.

අද පස්වරු 4.30ට ඩිෆෙන්ඩර්ස් හා රිනවුන් අතර තරගයත්, සී හොක්ස් හා බ්ලූ ඊගල්ස් අතර තරගයත් සුගතදාස පිටියේ පැවැත්වීමට සැලසුම් කොට ඇත.

# ඔලිම්පික් ගෞරව සඳහා තිලකා නම් කරයි



මේ වසරේ ශ්‍රී ලංකාවේ ඔලිම්පික් කාන්තා හා ක්‍රීඩා සම්මානය සඳහා තිලකා ජිනදාස නම් කරයි. 1988 සෝල් ඔලිම්පික් ක්‍රීඩා උලෙළේ දී ශ්‍රී ලංකාව නියෝජනය කළ ප්‍රථම ඔලිම්පික් ක්‍රීඩිකාව තිලකා වන අතර, ඇය මලල ක්‍රීඩා හා නෙට්බෝල් යන දෙඅංශයෙන්ම ශ්‍රී ලංකාව නියෝජනය කළ අන්තර්ජාතික ක්‍රීඩිකාවක වීම විශේෂ සුදුසුකමක් වී ඇත. අඛණ්ඩව දකුණු ආසියානු ක්‍රීඩා උලෙළ පහකට රට නියෝජනය කළ එකම ශ්‍රී ලාංකික ක්‍රීඩිකාව ඇය වන අතර, රන් පදක්කමක්, රිදී පදක්කමක් සහ ලෝකඩ පදක්කම් 4ක් ඇතුළුව සියලු ක්‍රීඩා සඳහා පදක්කම් දිනා ඇත.

වසර 1997 දී සිංගප්පූරුවේ පැවති ආසියානු නෙට්බෝල් ශූරතාව ශ්‍රී ලංකාව දිනාගනිද්දී ඇය නෙට්බෝල් කණ්ඩායමේ පුහුණුකාරිනිය වූවාය.

"ඔලිම්පික් කාන්තා ක්‍රීඩා සම්මානය සඳහා නම් කිරීම මහත් ගෞරවයක් හා වරප්‍රසාදයක්. මා ඉහළ මට්ටමේ ක්‍රීඩාවන් දෙකක් සමඟ සම්බන්ධ වී සිටීම හේතුවෙන් මේ අවස්ථාව හිමිව තිබෙනවා. නෙට්බෝල් හා මලල ක්‍රීඩා සඳහා රට වෙනුවෙන් මා උපරිම දායකත්වය ලබාදී තිබෙනවා. ක්‍රීඩිකාවක වගේම පුහුණුකරුවකු ලෙස කටයුතු කළ මගේ ලොකුම ආශාව වන්නේ මේ රටේ කාන්තා ක්‍රීඩාවට සමානාත්මතාවය සඳහා සටන් කිරීමයි" නාමයෝජනා පිළිබඳ තිලකා ජිනදාස මෙණෙවිය සිය අදහස් ප්‍රකාශ කළාය.

මලල ක්‍රීඩිකාවක්ව සිටියදී ශ්‍රී ලංකාවේ ක්‍රීඩාවට කාන්තා සහභාගීත්වය අවම බව ඇයට හැඟුණි. එබැවින් ක්‍රීඩාවේ කාන්තාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා පුහුණුකරුවකු වීමට ඇය තීරණය කළාය. ඇය සිය අත්දැකීම් ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශවල ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ජීවිතයට සමීප කිරීමට වෙහෙසුණාය.

ඇයගේ මඟ පෙන්වීම යටතේ ශ්‍රී ලංකාව 2009දී සහ 2018 දී දෙවරක් ආසියානු නෙට්බෝල් ශූරතාව දිනා ගැනීමට සමත් විය. එසේම, 2011 සහ 2019 ලෝක කුසලාන නෙට්බෝල් ශූරතාවලියට තරඟ කිරීමට ශ්‍රී ලංකාව අවස්ථා දෙකේදීම සුදුසුකම් ලබා ඇත. ඇගේ පුහුණු දිවිය දශක දෙකකට වැඩි කාලයක් පුරා පැතිරී ඇති අතර, ඇය ශ්‍රී ලංකාවේ කාන්තා ක්‍රීඩා නඟා සිටුවීමට ඉමහත් දායකත්වයක් ලබා දී තිබේ.

තිලකා ජිනදාස මාලදිවයිනේ සහ බෲනායි දරුස්සලාම් හි ජාතික කණ්ඩායම් සඳහා නෙට්බෝල් පුහුණුකාරිනිය ලෙස සේවය කළ අතර, එම රටවල සීමිත සම්පත් සමඟ ක්‍රීඩිකාවන්ගේ ක්‍රීඩාව නඟා සිටුවීම සඳහා ඇය සිය විශේෂඥ දැනුම බෙදා ගත්තාය.

# පාසල් ක්‍රිකට් පිටියේ ප්‍රමුඛතම සම්මාන උලෙළ අදයි



2019 වසරේ පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා කොළඹ රාජකීය විදුහලේ කමිල් මිශාර

**ෆවුස් මොහොමඩ්**

මෙරට පාසල් ක්‍රිකට් පිටියේ විශිෂ්ටතම ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දස්කම් ඇගැයීමට ලක් කෙරෙන ප්‍රමුඛතම සම්මාන උලෙළ ඔබ්සර්වර් - ශ්‍රී ලංකා ටෙලිකොම් මොබිටෙල් වසරේ පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා සම්මාන උලෙළ ශ්‍රී ලංකා ක්‍රිකට් පිලේ හිටපු නායකයකු සහ තේරීම් කමිටු ප්‍රධානියකු වූ සනත් ජයසූරිය මහතාගේ ප්‍රධානත්වයෙන් අද (21) පස්වරුවේ බණ්ඩාරනායක අනුස්මරණ අන්තර්ජාතික සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වේ.

වසර 1979 දී ආරම්භ වූ මේ උත්කර්ෂවත් සම්මාන උලෙළ මෙවර පැවැත්වෙන්නේ 42 වැනි වරටය.

කොවිඩ් වසංගතය හේතුවෙන් පසුගිය වසරේ පැවැත්වීමට නොහැකි වූ මේ සම්මාන උලෙළ මෙවර පැවැත්වෙන්නේ වසර 2019-2020 තරගවාරයේ පාසල් ක්‍රීඩක ක්‍රීඩිකාවන් දැක්වූ දස්කම් සැලකිල්ලට ගනිමිනි.

මෙරට පාසල් ක්‍රිකට් ක්‍රීඩකයන්ට පළමුවරට සම්මාන ප්‍රදානය ආරම්භ කිරීමෙන් දශක 4කට පසු පාසල් ක්‍රිකට් ක්‍රීඩිකාවන්ගේ දස්කම් ද අගයමින් 2019 වසරේ සිට වසරේ පාසල් ක්‍රිකට් ක්‍රීඩිකාව සඳහා සම්මාන ප්‍රදානය ද ආරම්භ කරමින් ඔබ්සර්වර් පාසල් ක්‍රිකට් සම්මාන උලෙළ තවත් පියවරක් ඉදිරියට තැබුවේය. ඒ අනුව අවසන් වරට පැවති සම්මාන උලෙළේදී (2019දී) කොළඹ රාජකීය විදුහලේ කමිල් මිෂාර වසරේ පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා ලෙස අභිෂේක ලබද්දී රත්ගම දේවපතිරාජ විදුහලේ උමේෂා තිමේෂණී වසරේ පාසල් ක්‍රිකට් ක්‍රීඩිකාව ලෙස සම්මානයට පාත්‍ර වූවාය.

ගත වූ දීර්ඝ කාලපරිච්ඡේදයේදී මේ ස්වර්ණමය සම්මානයට පාත්‍ර වූ ක්‍රීඩකයෝ රැසක් පසුකාලීනව ජාතික කණ්ඩායම නියෝජනය කරමින් ශ්‍රී ලංකාවට අන්තර්ජාතික කීර්තියක් අත්කර දීමට සමත්වූහ.

දශක 4ක් පුරා ජාතික තලයේ ක්‍රීඩකයන් බිහි කළ ඔබ්සර්වර් වසරේ පාසල් ක්‍රිකට් ක්‍රීඩකයා සම්මාන උලෙළ මෙවර අභිෂේක ගන්වනු ලබන ක්‍රිකට් ක්‍රීඩකයා සහ ක්‍රීඩිකාව ඉදිරි අනාගතයේදි ශ්‍රී ලංකාවට අන්තර්ජාතික කීර්තියක් දිනා ගැනීමට විශිෂ්ට දායකත්වයක් ලබා දෙනු නිසැකය.



2019 වසරේ පාසල් ක්‍රිකට් ක්‍රීඩිකාව රත්ගම දේවපතිරාජ විදුහලේ උමේෂා තිමේෂණී







රසමංජරිය
සතියේ රස මංජුසාව

# නිෂ්පාදකවරයා ආයෝජකයෙක් පමණක් නොවෙයි



## චිත්‍රපට නිෂ්පාදක අනූෂ සංජීව එදිරිමුණි

වසංගතයක් මැද වුව සිනමාවට වසන්තය කැන්දන්නට සමත්වූ colombo (කොළඹ) සිනමාපටය ප්‍රේක්ෂක අවධානය නොඅඩුව ලබමින් සාර්ථකව තිරගත වන විට එහි නිෂ්පාදක අනූෂ සංජීව එදිරිමුණි සමග කරන ලද කතාබහකි මේ.

**● අතිශයින්ම දුෂ්කර කාලවකවානුවක වුවත් colombo (කොළඹ) චිත්‍රපටය සාර්ථකව තිරගත වෙනවා. ඒ පිළිබඳව නිෂ්පාදකවරයා වශයෙන් ඔබේ අදහස් කුමක්ද?**

කොවිඩ් වසංගත තත්වය නිසා වසා තිබූ සිනමා ශාලාවලට යහපත් කාල පරිච්ඡේදයක් උදා කරන්නට colombo (කොළඹ) සිනමාපටය තුළින් හැකියාව ලැබුණා. මෙතරම් අසීරු කාලයක වුණත් ඉහළ ආදායමක් ලබමින් තිරගතවන colombo ප්‍රේක්ෂක ආකර්ෂණය ඉහළින්ම දිනාගත්, චිත්‍රපටයක් තුළ තිබිය යුතු සියලු ගුණාංග රැගත් චිත්‍රපටයක්. මේ චිත්‍රපටය මෙතරම් සාර්ථක වන්නට හේතුව ලෙස මම දකින්නේ පවතින අභියෝගය භාරගැනීම සහ එයට සාර්ථකව මුහුණ දීමට හැකි ලෙස සැලසුම් සකස් කිරීම. කර්මාන්තයක් ලෙස සිනමාව ඉහළට ඔසවා තබන්නට හැකියාව අපට තිබෙනවා. ඒ පිළිබඳව හරි අවබෝධයකින් ක්‍රියාත්මක වීමයි කළ යුත්තේ.

**● colombo නිර්මාණය වූ ආකාරය පිළිබඳවත් කෙටි හැඳින්වීමක් කළොත්?**

මෙහි අධ්‍යක්ෂ අසම ලියනගේ විසිතුන් හැවිරිදි තරුණ චිත්‍රපට අධ්‍යක්ෂවරයෙක්. ඔහු මාව මුණ ගැසී මේ කටයුත්ත පිළිබඳව කතාබහ කළා. දීර්ඝ සාකච්ඡා වාර කිහිපයකින් පසු අපි මේ චිත්‍රපටය නිර්මාණය කරන්නට අවශ්‍ය පසුබිම සකස් කර ගත්තා. colombo යන නම අසම ගේ. චිත්‍රපටය රූගත කිරීමෙන් අනතුරුව එහි ප්‍රචාරණයේ දී colombo කියන ඉංග්‍රීසි වදනයත් සමඟ කොළඹ යනුවෙන් සිංහල භාෂාවෙනුත් යොදා ගන්නට මම සැලසුම් කළේ සිංහල භාෂාව ප්‍රමුඛත්වය ලබා දෙන රටක සිංහලෙන් නමක් කියවීම තුළ වැඩි ප්‍රේක්ෂක ආකර්ෂණයක් ලබා ගන්නට හැකි වන නිසා. colombo වාණිජ සහ කලාත්මක යන අංශ දෙකටම අදාළ ලක්ෂණවලින් යුක්ත චිත්‍රපටයක්. එහි හේමාල් රණසිංහ ගේ සහ ධර්මප්‍රිය ඩයස් ගේ රංගනය අති විශිෂ්ටයි. එසේම චිත්‍රපටයට දායක වී සිටින අනෙකුත් ජනප්‍රිය සහ නවක නළු නිළියන් ගේ රංගන පරාසය ද සුළුකොට තකන්නට බැහැ. අනිත් විශේෂත්වය මේ නිර්මාණයට දායක වූ බොහෝ දෙනෙක් සිනමාවට අලුත් අය. මමත් සිනමාපට රාශියකට සම්බන්ධ වී තිබුණත් නිෂ්පාදනය කියන භූමිකාව හොබවන පළමු චිත්‍රපටය.

**● චිත්‍රපට නිෂ්පාදකවරයෙකු ගේ භූමිකාව පිළිබඳව ඔබේ අදහස කුමක්ද?**

චිත්‍රපට නිෂ්පාදකවරයා යන්නෙන් බොහෝ දෙනා අදහස් කරන්නේ චිත්‍රපටයකට මුදල් යොදවන තැනැත්තා. නමුත් නිෂ්පාදකවරයා යන චරිතය එතනට ලඝු කොට තබන්නට හැකියාවක් නැහැ. වේදිකා නාට්‍ය නිෂ්පාදක යනුවෙන් හඳුන්වන්නේ මුදල් ආයෝජකයා නොවෙයි. එසේම චිත්‍රපට නිෂ්පාදකවරයකුටත් මුදල් ආයෝජනයට එහා ගිය යම්කිසි විශාල කාර්යභාරයක් තිබෙනවා. වේදිකා නාට්‍යවල මුදල් යොදවන්නා අර්ථපති ලෙස හඳුන්වනවා. ඒ චරිතයම සිනමා කර්මාන්තය වෙත අවතීර්ණ වන විට ඔහුට දෙන්නට නමක් නොමැති නිසා නිෂ්පාදකවරයා යන නම ලැබෙනවා.

**● ඔබේ සිනමා ගමන්මග ගැනත් කතා කරමු.**

රෝස වසන්තය චිත්‍රපටයෙහි ප්‍රචාරක මෙහෙයුම් කළමනාකරු ලෙස මම සිනමා කර්මාන්තයට එකතු වුණා. එතැන් සිට වන්ෂොට් වන්, සලෙළු වරම, ඉරමැදියම, හිරිපොද වැස්ස, දවල් මිගෙල් රෑ දනියෙල්, පත්තිනි නවරියන් ඇතුළු චිත්‍රපට රාශියකට සම්බන්ධ වී කටයුතු කළා.

**● චිත්‍රපටයක් සාර්ථක කර ගැනීමට එහි තිබිය යුතු ගුණාංග ලෙස ඔබ දකින්නේ මොනවාද?**

සිංහල සිනමාවේ නිර්මාණය වන චිත්‍රපට ඒවා කෙරෙහි අනුකම්පාවෙන් දයාවෙන් නැරඹිය යුතු යැයි අදහසක් අප තුළ තිබෙනවා. එය සම්පූර්ණයෙන්ම වැරදියි. අප චිත්‍රපටයක් නැරඹිය යුත්තේ එය නැරඹීමට අපේ සිතෙහි ආශාවක් සහ යම්කිසි උත්තේජනයක් ඇති වීම නිසයි. එම උත්තේජනය ඇති කිරීමට බලපාන ප්‍රධාන හේතුව ප්‍රචාරණ කළමනාකරණය. නමුත් ප්‍රචාරණ කළමනාකරණය කෙතරම් ඉහළ මට්ටමක තිබුණත් අසාර්ථක චිත්‍රපටයක් නම් මිනිසුන් වැලඳ ගන්නේ නැහැ.

චිත්‍රපටයක් කියන්නේ නිර්මාණය කර ඔහේ ප්‍රදර්ශනය කරන දෙයක් නොවෙයි. එය ඊට වඩා විශාල ව්‍යාපෘතියක්. එය සාර්ථක ව්‍යාපෘතියක් විය යුතුයි. අපේම නිර්මාණයක් හෝ වේවා එසේත් නැත්නම් විදෙස් සිනමාපටයක ප්‍රතිනිර්මාණයක් හෝ වේවා ඒ සෑම එකකම පාහේ මිනිසුන්ගේ රසවින්දනයට උචිත ආකාරයෙන්, තරු ගුණයෙන් යුතු රංගන ශිල්පීන්ගේ දායකත්වය ලබා ගනිමින් උසස් මට්ටමේ නිර්මාණ බවට පත් කළ යුතුයි.

**● ඔබ අදහස් කරන්නේ කොවිඩ් වසංගතයෙන් පසු දැන් සිනමා කර්මාන්තයට යහපත් කාල වකවානුවක් උදා වී ඇති බවද?**

සිනමාවට යහපත් කාලයක් උදා කර ගැනීමට සම්පූර්ණ විය යුතු ප්‍රධානම සාධකය පවතින පාරිසරික තත්ත්වය නොවේ. චිත්‍රපටයෙහි ඇති ගුණාත්මක භාවයයි. colombo ඒ සියල්ලෙන් සම්පූර්ණ චිත්‍රපටයක් නිසා ඉතා සාර්ථකව තිරගත වනවා. එය දකින විට මේ අවස්ථාවේ චිත්‍රපටයක් තිරගත කළහොත් අතිශයින් සාර්ථක වේ යැයි යම් කිසිවකු විසින් විශ්වාස කරනවා නම් එය වැරදියි. නිර්මාණය සාර්ථක එකක් නම් එය සාර්ථකව ප්‍රේක්ෂකයන් අතරට ගමන් කරයි.

චිත්‍රපටයකට අවශ්‍ය කරන පෝෂණ ගුණයක් තිබෙනවා. ඒ පෝෂණය සහිතව චිත්‍රපටයක් මුදා හරින්නට හැකිනම් එය නිර්මාණය කරන්නේ කවරකු වුවත් චිත්‍රපටය ප්‍රේක්ෂකයන්ගේ ආදරය නිතැතින්ම දිනා ගන්නවා.

**දිල්රූ ජයසේකර**

## හිරු ගම්මාරච්චිගේට සම්මානයක්



ස්පෙෂල් ඔලිම්පික් සෙරන්ඩිබ් (ශ්‍රී ලංකා) ආයතනය විසින් ජාත්‍යන්තරව පවත්වන්නට යෙදුණු කෙටි චිත්‍රපට තරගයෙන් ප්‍රථම ස්ථානය ලබන්නට හෙලවුඩ් ඇක්ටින් ස්කූල් රංග පාසලෙන් සිනමා අධ්‍යාපනය ලැබූ 'හිරු ගම්මාරච්චිගේ' විසින් රචනා කර අධ්‍යක්ෂණය කළ 'who is she?' චිත්‍රපටය සමත් විය. ඇයට එම සම්මානය ලබා දෙන අවස්ථාවට හෙලවුඩ් ඇක්ටින් ස්කූල් හි ප්‍රධානාචාර්ය ප්‍රවීණ චිත්‍රපට අධ්‍යක්ෂක සුගත් සමරකෝන් මහතා ඇතුළු කාර්ය මණ්ඩලය ද ප්‍රවීණ කලාකරුවන් සහ ආරාධිත අමුත්තන් රාශියක් ද සහභාගී වූහ.

## ප්ලේ හවුස් වෙතින් දරුවන් වෙනුවෙන්



සෝමලතා සුබසිංහගේ ප්ලේ හවුස් ආයතනය විසින් ඉදිරිපත් කරන 'ළමුන් සඳහා නිර්මාණාත්මක ක්‍රියාකාරකම්' පාඨමාලාවේ නවතම කණ්ඩායම මැයි මස 8 වන සෙනසුරාදා පෙරවරු 9ට ආරම්භ වෙයි.

සෞන්දර්යාත්මක අත්දැකීම් මගින් ළමුන්ට තුලනාත්මක කායික හා මානසික ප්‍රවර්ධනයක් ලබාදීම, ළමුන්ගේ ක්‍රීඩාශීලිත්වය, ප්‍රබෝධමත් භාවය වර්ධනය කරමින් සංගීතය, නැටුම්, රංගනය හා චිත්‍ර යනාදී මූලික කලා ශිල්ප පිළිබඳව ළමුන්ගේ දක්ෂතාව දියුණු කිරීම මෙම පාඨමාලාවේ අරමුණයි.

## කබඩි දැන් රිදී තිරයේ



නිශාන්ත ජයවර්ධනගේ නිෂ්පාදනයෙන් සහ නව පරපුරේ සිනමා අධ්‍යක්ෂකවරයකු වන හර්ෂ උඩකන්ද ගේ අධ්‍යක්ෂණයෙන් නිර්මාණය වූ කබඩි චිත්‍රපටය අප්‍රේල් 16 වනදා සිට දිවයින පුරා සිනමාහල්වල තිරගත වීම ආරම්භ විය. දර්ශන් ධර්මරාජ්, ශ්‍රියන්ත මෙන්ඩිස්, අමිල කරුණානායක, සෙනාලි ෆොන්සේකා, අනුජ් රණසිංහ, විනු සිරිවර්ධන, නිල්මිණි කෝට්ටෙගොඩ, දමිතා අබේරත්න, පියුමි බොතේජු, කුමාරි මුණසිංහ, ආනන්ද වික්‍රමගේ ඇතුළු රංගන ශිල්පීන් පිරිසක් මේ සඳහා රංගනයෙන් දායකත්වය දක්වති.

**දිල්රූ**

## රිසිර අවුරුදු කුමර කුමරියෝ



රිසිර ටීවී මඟින් සංවිධානය කරන ලද අලුත් අවුරුදු උලෙළේ අවුරුදු කුමරා ලෙස සතිශ් ලක්ෂාන් කිරුළ පැළඳි අතර

දෙවන ස්ථානය ඔශාන් සොයිසා ද තුන්වන ස්ථානය දිනෙත් සාරංග හිමිකර ගත්හ.

රිසිර අවුරුදු කුමාරිය ලෙස කිරුළ පැළැඳුවේ සයුරි නෙත්යානි පෙරේරායි. එහි දෙවන ස්ථානය තමාලි ප්‍රියදර්ශනීට ද තෙවන ස්ථානය ඩිනාලි පීරිස්ට හිමි විය. උලෙළ නැරඹීමට කලාකරුවන් රැසක් සහභාගී වූහ.


**ලක්ෂාන්**

## තෙළි තුඩින් හැඩ මවන සිත්තරාවි සුලෝචනා

දෙව් දේවතාවුන් එකත්පස්ව හිඳ වන්දනා කරයි. මාර සෙනඟ සිහි ගන්වන යක්ෂ සමූහයක් ඊට නුදුරින් පෙනේ. ඒ කාගේ කාගේත් නෙත් හැරවී ඇත්තේ එකම දෙසටය. ඒ, සිතුවමේ හරි මැදට වන්නට තිලෝගුරු සම්මා සම්බුදු රජාණන් වහන්සේ වැඩ වෙසේ. ඒ සිත්තම සෞම්‍ය ළා පැහැයකින් වර්ණ ගැන්වී තිබේ . ඉන් උපද්දවන්නේ සන්සුන් හැඟීමකි. තණ්හා, ආශා, රාග, ද්වේෂ, මෝහාදී පුහුදුන් ගති ද සිතුවමකදීවත් කාමභෝගී ජීවිත ගත කරන ඇත්තන්ට අමතක කළ හැකි නොවේ. ජීවිතයට උරුම ඒ ගුණ අගුණ සියල්ල එකට එකම බිතු සිතුවමකට එක්වූ විට ජීවමාන රූ පෙළක් මනස් තලයේ ඇඳේ. සැබැවින්ම අප ද එතැන හිදිනු දැනේ. විචිත්‍ර තොරණක් දෙස බලා හිඳින්නාක් වැනි හැඟීමකි එවිට සිතට නැඟෙන්නේ. එයින් හද විලම සන්සුන් කෙරේ.

මේ තෙලිතුඩින් මැවෙන එතරම්ම සොඳුරු දනව්වක් කරා පිය නැඟීමකි. එහෙත් ඒ, මහ මං මැදින් හෝ නිල්වන් දිය දහරා හරහා යෙදෙන ගමනක් නොවේ. එබඳු වෙහෙස මහන්සියක් ඇය අප කරා ගෙන නොයේ. ඉඳින්, එකම බිමක එකම වෙහෙරක හිඳිමින් එකම එක සිත්තරාවක් ඒ නා නා විධ ඉසව් කරා අප කැඳවාගෙන යෑමට දැන් සූදානමිනි.

ඇයත් සිතුවමත් එකකට එකක් වෙන් කළ නොහැකි සැටියකි. ජීවිකාවත් ජීවිතයත් ඇයට දෙකක් නොවේ. උපන් බිමත් ගුරු වෘත්තියත් එසේමය. ඒ දුලබ වරම එකම ගම්මානයකදී උරුම කර ගන්නට තරම් වාසනා මහිමයක් ඈ සතුවන සැටියකි. කඨෝර කළුගල් සිතුවමත් සිනිඳු කැන්වසයක් මත චිත්‍ර මැවුමත් දෙකෙහිම එකම උපේක්ෂාවකින් යුතුව නියැළෙන්නටත් ඈ සමත්ය.



සුලෝචනා වජිරකාන්ති

අද අපේ කතානායිකාව ඇයයි. මෙරට විහාර සිතුවම් කලාවේ නිරත කාන්තාවන් පිළිබඳ ඉතිහාසයෙන් අසන්නට ලැබෙන්නේ අඩුවෙනි. එය එසේ තිබියදී අද කාලයේ කාන්තාවක් වශයෙන් සුලෝචනා ඒ කෙරෙහි යොමු වීම විශේෂයකි.

එමෙන්ම ඇයව කවුරුත් හඳුනාගෙන සිටිනනේ බහුචරිතධාරිණියක වශයෙනි. ඒ, චිත්‍ර ගුරුවරියක්, රෙදි පින්තාරු ශිල්පිනියක් පමණක් නොවෙයි, ගෘහ නිර්මාණ සැලසුම් ශිල්පිනියක් විදියටත් ඈ ප්‍රකටයි. එසේම, මවකගේ භූමිකාවද ඉටුකරමින් විහාර චිත්‍ර පිටපත් කිරීමේ නිරත මේ සිත්තරාවගේ සිත කියවන්නයි අප දැන් යොමු වෙන්නේ.

'මං පුංචි කාලේ ඉඳන්ම චිත්‍රවලට ආසයි. ඒත් මෙතරම්ම දුරක් එන්නට කුඩා කාලේදී මට මඟ පෙන්නුවේ සමරකෝන් බණ්ඩා චිත්‍ර ගුරුතුමා. මං අද ගුරුවරියක් විදියට චිත්‍ර උගන්වන ඉබ්බාගමුව මධ්‍ය මහා විද්‍යාලයේ පන්තියේ ඉදිරිපස පේළියකට වෙලා අකුරු කළ අතීතයක් මට තියෙනවා. ඒක මට ආඩම්බරයක්.

සෞන්දර්ය විශ්ව විද්‍යාල ප්‍රවේශයට මට මඟ පෙන්නුවේ රම්බඩගල්ල සහ ඉබ්බාගමුව මධ්‍ය විද්‍යාලවල ගුරු මව්පියවරු. සරසවියේදී රාජ්‍ය චිත්‍ර හා මූර්ති තරගවලියේදී 2008 වර්ෂයේ බිතු සිතුවම් අංශයෙන් මුල් තැන ලැබීම මගේ ගමනට හොඳ කොළ එළියක් වුණා. ඉන් එහාට මට ආශා ඇතිවුණේම පන්සල් චිත්‍ර පිටපත් කිරීමටයි.

දෙගල්දොරුව, මුල්කිරිගල රජමහා විහාරවලින් ඒ භාරදූර කාර්යයට අත් පොත් තබන්නට ඉඩ ලැබුණා. ඒ වගේමයි, කුරුණෑගල, සැඟෑලෙන, බුළුවල රජමහා විහාරය. ඒ වගේම, නාවුල, අඹන, මොරගල්ල, ශ්‍රී සුදර්ශනාරාමයේ සිතුවම් නිර්මාණයටත් මට ඉඩහසර පාදා දුන්නු මාරක ධම්මරතන හිමියන්ව මං සිහිකළ යුතුමයි.

බිතු සිතුවම් පිටපත් කිරීම බැරෑරුම්. පුරාවිද්‍යා, මධ්‍යම සංස්කෘතික අරමුදල, බුද්ධ ශාසන අමාත්‍යංශවල අනුමැතිය නැතිව ඒ කටයුත්තේ නියැළිය නොහැකියි. ඒ වගේම කාලයක් ඒ කටයුත්තට ගත වෙනවා. සමහර චිත්‍රවලට මාසයක් විතර ගත කරන්න වෙනවා. තෙල් සායම් මාධ්‍ය කරගෙනයි මං චිත්‍ර පිටපත් කරන්නේ.

උසස් පෙළ පන්තිවලට චිත්‍ර කලාව ඉගැන්වීම මට පාසලෙන් බාරවී තිබෙන වගකීමක්. නිවාඩු කාලයේදීයි විහාර චිත්‍ර නිර්මාණයකට යොමු වෙන්නේ. ඒ සඳහා මගේ ස්වාමි පුරුෂයා ඇතුළු පවුලේ අයගෙන් ලැබෙන සහාය අතිවිශාලයි. දරු දෙදෙනා එක්ක ගිහින් චිත්‍ර පිටපත් කළ යුතු විහාරය කිට්ටුව නැවතිලායි මං හුඟක් නිර්මාණ කළ මේ කටයුතු ඉටුකරන අතරේ අධ්‍යාපනපති උපාධියට අදාළ විභාගයට මේ දිනවල සූදානම් වෙනවා.'



**සටහන - නුවන් ජයවික්‍රම**



සෆාරි ජීප් රියැදුරෝ කබලෙන් ළිපට
පිටුව 16



කෝටියක කේරළ ගංජා ටිපර් රියක
පිටුව 17



ඇළහැර ගම්වාසීන්ට වන අලි කරදර
පිටුව 18

බී.එම්. විජේසූරිය - අනුරාධපුර මධ්‍යම විශේෂ

## විවිධ ගිනි අවි නිපදවූ අයෙක් කොටු වෙයි

විදේශීය නිෂ්පාදිත අර්ධ ස්වයංක්‍රිය ගිනි අවියක් වන බෝර 12 ගිනි අවියට ඉතා සමාන අන්දමින් ගිනි අවි නිපදවූ පුද්ගලයකු අනුරාධපුර කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් විසින් නිපදවූ අවියක් සමඟ සැකපිට අත්අඩංගුවට ගෙන තිබේ.

තිරප්පනය පොලිස් වසමේ පතිරාජගම ප්‍රදේශයේ පදිංචි තරුණයකු සන්තකයේ මෙරට නිෂ්පාදිත ගිනි අවියක් තිබෙනා බවට පොලිස් නිලධාරීන්ට ලැබුණු තොරතුරකට අනුව වැටලීම සිදු කර සැකකරු අත්අඩංගුවට ගෙන තිබේ.

සැකකරු විසින් අදාළ ගිනි අවිය විදේශීය නිෂ්පාදිත බෝර -12 අර්ධ ස්වයංක්‍රීය ගිනි අවියට සමානවම තනා තිබූ බවත් ඊට බෝර-12 වර්ගයේ ගිනි අවිවලට යොදන පතුරම් යෙදිය හැකි බව පොලිසිය සිදු කළ පරීක්ෂනවලදී අනාවරණයවී තිබිණි. සැකකරු විසින් ගිනි අවි නිපදවා හේන් ගොවීන්ට අලෙවි කරනා බවට පොලීසියට සැක මතුවී තිබෙනා අතර ඔහු ගිනි අවි කිහිපයක්ම නිපදවා ඇති බව පොලිසිය සිදු කළ මූලික පරීක්ෂණවලදී අනාවරණයවී තිබුණි.

සිරි අබයසිරි - මාතලේ මධ්‍යම සමූහ

## ලැගුම්හලක් තුළ සිට මාතලේට කුඩු බෙදූ කතක් අත්අඩංගුවට

උත්සව සමය තුළදී මාතලේ හා මාතලේ නගරය අවට ප්‍රදේශවල මත්ද්‍රව්‍යන්ට අබ්බැහිවූවන්ට ලැගුම්හලක් තුළ නවාතැන් ගෙන කුඩු හා අයිස් නමැති මත්ද්‍රව්‍ය ජාවාරමේ යෙදුණු කාන්තාවක් සමග කුඩු හා අයිස් නමැති මත්ද්‍රව්‍ය තොගයක් අත්අඩංගුවට ගැනීමට හැකිවූ බව මාතලේ පොලීසිය පවසයි.

මාතලේ තැන්න ඕවිලිකන්ද මාර්ගයේ ලැගුම්හලක කාමරයක් කුලි පදනම මත ලබාගෙන ඒ තුළ නැවති කුඩු හා අයිස් නැමති කෘත්‍රිම මත්ද්‍රව්‍ය ජාවාරමේ යෙදී සිටියදී මාතලේ කොට්ඨාස අපරාධ අංශයට ලැබුණු තොරතුරකට අනුව සිදු කරන ලද වැටලීමකදී අදාළ කාන්තව සමග කුඩු ගෑම් 3,330ක් හා අයිස් මිලිග්‍රෑම් 250ක් සැකපිට අත්අඩංගුවට ගැනීමට හැකිව ඇත.

අත්අඩංගුවට පත් කාන්තාව මහනුවර ගොලිඔය ප්‍රදේශයේ පදිංචිකාරියක් වන අතර ඇය මාතලේ ඇතුළු ප්‍රදේශ රැසක් සඳහා මහාපරිමාණයෙන් කුඩු හා අයිස් මත්ද්‍රව්‍ය බෙදා හරින ජාවාරම්කරුවකුගේ තැරැව්කරුවකු ලෙස කටයුතු කරන බවට සිදු කරන ලද විමර්ශනයන් ගෙන් අනාවරණ කර ගැනීමට හැකිව ඇති අතර අදාළ ජාවාරම්කරු නීතියේ රැහැනට හසුකර ගැනීමට පරීක්ෂණ කටයුතු ආරම්භ කර ඇති බව පොලීසිය සඳහන් කරයි.

එස්. දීයගහගේ - දකුණු පළාත් සංචාරක

## දුම්රියේ හැපී අයෙක් ජීවිතක්ෂයට

මුහුදුබඩ දුම්රිය මාර්ගයේ රත්ගම පින්තාලිය දුම්රිය හරස් මාර්ගයේදී පෙරේදා (18) රාත්‍රී දුම්රියේ හැපි පුද්ගලයකු මිය ගොස් ඇතැයි රත්ගම පොලීසිය පවසයි. මෙම අනතුරින් මිය ගොස් ඇත්තේ බූස්ස කදුරුපේ පදිංචිකරුවකු වූ කේ.වී. විමලරත්න (60) නමැති අයෙකි.

මිය ගිය පුද්ගලයාගේ මරණ පරීක්ෂණය ඊයේ (19) කරාපිටිය ශික්ෂණ රෝහලේදී පැවැත්වීමට නියමිතව තිබිණි.

#කොටදෙනියාව සමූහ එම්.පී. කුමාර



# නිදන කාමරයේ විදුලි පංකාව යට බංකරයක බෝර 12හේ තුවක්කුවක්

## කොත්තමල්ලි බෝතලය ඇතුළේ පතුරොම්

බලපත්‍රයක් නොමැතිව බෝර දොළහේ තුවක්කුවක් හා එම වර්ගයේ පතුරොම් පහක් නිදන කාමරයේ පොලව යට තැනූ බංකරයක සඟවා තබාගෙන සිටි බව කියන තිදරු පියෙකු පෙරේදා 18 සවස පමුනුවත්ත කරගහතැන්න නිවසකදී අත්අඩංගුවට ගත් බව මීරිගම පොලිසිය කියයි.



මෙසේ අත්අඩංගුවට ගැනුනේ ලී මෝලක සේවය කරන බව කියන 31 හැවිරිදි පුද්ගලයෙකි. මීරිගම පොලිස් ස්ථානයේ අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක එම්.පී. විමලරත්න මහතාට ලැබුණු තොරතුරක් අනුව මෙම වැටලීම කරන ලද්දේ කාන්තා හා ළමා කාර්යාංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක කාංචනා සමරකෝන මහත්මිය ඇතුළු පොලිස් කණ්ඩායමක් විසිනි.

පොලිස් කණ්ඩායම නිවස දැඩි සෝදිසියට ලක් කරන අවස්ථාවේ සැකකරුගේ නිදන කාමරයේ ඇද අසල තබා තිබූ සිටුවන විදුලි පංකාවක් ඉවත් කිරීමේදී වටරවුමක් ආකාරයට තැනූ භූගත බංකරයක් සොයා ගැනීමට හැකිවී ඇත.

බෝර 12 තුවක්කුව එහි බද පහලට සිටින ආකාරයට භූගත බංකරයේ කෙළින් අතට සිටුවා තබා තිබීයදී ඉවතට ගැනීමට පොලිසිය පියවර ගනු ලැබීය.

වටරවුමක් ආකාරයට තැනූ බංකරය මත පාපිස්නාවක් දමා ඒ මත විදුලි පංකාව සිටුවා තබා ඇත්තේ කිසිවෙකුට සැකයක් ඇති නොවන්නට බව පොලිසිය සැකකරයි. පොලිසිය සැකකරුගේ නිවස දැඩි සෝදිසියට ලක් කිරීමේදී කුස්සියේ රාක්කයක තිබූ කොත්තමල්ලි අඩංගු ප්ලාස්ටික් බෝතලක සඟවා තිබූ බෝර 12 පතුරොම් පහක් අඩංගු කවරයක් සොයා ගැනිමට හැකිවී ඇත.

මෙම තුවක්කුව හා පතුරොම් මියගිය තම පියා විසින් කළකට පෙර ගෙන එන ලද එකක් බව සැකකරු පොලිසිය කළ ප්‍රශ්න කිරීමේදී හෙලි කර ඇතත් හමුවූ තුවක්කුව හා පතුරොම්වල තත්ත්වය අනුව ඒවා පියාගේ මරණයට පෙර ගෙනා එකක්දැයි දැඩි සැකයක් පොලිසිය ට ඇතිවී ඇත. සැකකරුට තුවක්කුව ලැබුනු ආකාරය හා කිසියම් අපරාධයක් සඳහා යොදවාගෙන ඇද්දැයි හෙලි කර ගැනිමට පරීක්ෂණ පැවැත්වෙන අතර සැකකරු අත්තනගල්ල අධිකරණය හමුවට ඉදිරිපත් කිරීමට නියමිතය. ගම්පහ කොට්ඨාස බාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි කේ.කේ. ඉන්දික ද සිල්වා හා අත්තනගල්ල සහකාර පොලිස් අධිකාරි ප්‍රභාත් දයානන්ද මහත්වරුන්ගේ උපදෙස් හා මීරිගම පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක එස්.ඩී.ආර්. ප්‍රියන්ත මහතාගේ මෙහෙයවීම යටතේ කාන්තා හා ළමා කාර්යාංශයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක කාංචනා සමරකෝන මහත්මිය, අපරාධ විමර්ශන අංශයේ ස්ථානාධිපති උප පොලිස් පරීක්ෂක එම්.පී. විමලරත්න මහතා සමග පොලිස් සැරයන්වරුන් වන 6862 බණ්ඩාර, 14815 උපනන්ද, 49748 ලසන්ත, 51521 සුගත් 64854 සේනාරත්න යන නිලධාරීහු මෙම වැටලීමට එක්වූහ.


බී.එම්. විජේසූරිය - අනුරාධපුර මධ්‍යම විශේෂ

## අනියම් පෙම වැරදී පුද්ගලයෙක් මරුට

අනියම් සම්බන්ධතාවක් දුරදිග ගොස් පුද්ගලයකු තියුණු කඩුවකින් අමානුෂික ලෙස කපාකොටා ඝාතනය කර ඔහුගේ ත්‍රීරෝද රථයට ගිනි තබා විනාශ කිරීම සම්බන්ධයෙන් සැකපිට අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කළ දෙදරු පියෙකු ලබන මස (03) දක්වා රක්ෂිත බන්ධනාගාර ගත කරනා ලෙස අනුරාධපුර ප්‍රධාන මහෙස්ත්‍රාත් අතිරේක දිසා විනිසුරු නාලක ජයසූරිය මහතා ඊයේ (19) නියෝග කළේය.

මෙසේ රක්ෂිත බන්ධනාගාර ගත කෙරුණේ හීනාබෝවාගම හිදෝගම ලිපිනයේ පදිංචි එච්.බී. වීරසූරිය යන සැකකරුයි. සැකකරු අධිකරණයට ඉදිරිපත් කළ හිදෝගම පොලිසියේ අපරාධ නඩු මෙහෙයුම් අංශය කියා සිටියේ දිගු කලක සිට පවතින අනියම් සම්බන්ධතාවක් හේතුවෙන් ඝාතනය සිදුව තිබෙනා බවයි. මරණකරු සැකකරුගේ නිවෙසට ආසන්නයෙන් පදිංචිව සිටිනා බවත් ඔහු සැකකරුගේ බිරිය සමඟ කලක සිට අනියම් සබධතාවක් පවත්වා තිබෙනා බවත් ඔහු විටින් විට ඝාතනය සිදු කළ සැකකරු අවඥාවට ලක්කරමින් කටයුතු කිරීම නිසා සැකකරු ඊට දැඩි කෝපයෙන් සිට ඇති බව පොලීසිය සිදු කළ පරීක්ෂණවලදී අනාවරණයවූ බව අධිකරණයට දැන්වූවේය.

එස්. දීයගහගේ - දකුණු පළාත් සංචාරක



## හෙරොයින් ප්‍රවාහනය කරමින් සිටි අයෙක් අල්ලයි

රුපියල් කෝටියක් පමණ වටිනා හෙරොයින් ග්‍රෑම් 126 මිලිග්‍රෑම් 105ක් මෝටර් රථයකින් ප්‍රවාහනය කරමින් සිටි පුද්ගලයෙකු පෙරේදා (18) රාත්‍රී අත්අඩංගුවට ගත් බව ගාල්ල පොලීසිය පවසයි. මෙසේ අත්අඩංගුවට ගෙන ඇත්තේ ගාල්ල බෝපෙ පදිංචි 25 හැවිරිදි විවාහකයෙකි.

සැකකරු හෙරොයින් ප්‍රවාහනය කරන බවට ලැබුණු තොරතුරක් අනුව පොලිස් නිලධාරීන් ඔහුගේ මෝටර් රථය පසු පස හඹාගොස් මහත් වෙහෙසක් දරා ගාල්ල අම්බලන්වත්ත ප්‍රදේශයේදී මග හරස් කොට ඔහු ගමන් කළ මෝටර් රථය නවතා පරීක්ෂා කිරීමේදී මෙම හෙරොයින් තොගය සහ රුපියල් 38,000ක මුදලක්ද ජංගම දුරකතන දෙකක්ද හෙරොයින් මනින විද්‍යුත් තරාදියක්ද සොයාගෙන ඇත.

ඩබ්.ක්‍රිස්පිල් බෙනඩික් ප්‍රනාන්දු -පුත්තලම සමූහ

## යකඩ කූරකින් ඇන තම සහෝදරිය මරලා

යකඩ කූරකින් ඇන තම සහෝදරිය ඝාතනය කර පලා ගොස් ඇතැයි සැකකරන මිය ගිය තැනැත්තියගේ සොහොයුරෙකු අත්අඩංගුවට ගැනීමට නොරචෝලෙ පොලිසිය පරීක්ෂණ ආරම්භ කර ඇත. සිද්ධියෙන් මිය ගොස් ඇත්තේ ඒත්තාලේ ආලංකුඩාහි පදිංචිව සිටි අබ්දුල් රසාක් අනුස්රියා මර්ලින් නම්වූ 43 හැවිරිදි වියේ පසුවූ ආබාධිත තැනැත්තියකි.

19 දා අලුයම 2.30 ට පමණ මිය ගිය තැනැත්තිය නිදාසිටි කාමරයට කඩාවැදී ඇති සැකකාර සොහොයුරා යකඩ කූරකින් ඇන තම සොහොයුරිය මෙසේ ඝාතනය කර පලාගොස් ඇති බව නොරචෝලෙ පොලිසිය මෙම ඝාථනය පිලිබඳව පවත්වන ලද මුලික පරීක්ෂණවලදී හෙලිවී ඇත.

ඩබ්.ඒ. පියතිලක - මැදිරිගිරිය සමූහ

## ගවයන් ගාල් කිරීමට ගිය ගොවියාට වන අලි ප්‍රහාරයක්



ගවයන් ගාල් කිරීමට ගිය ගොවියාට වන අලියකු (18) දින පස්වරුවේදී පහරදීමෙන් මරණයට පත්ව ඇති බව මැදිරිගිරිය පොලිසිය කියයි.

වන අලියා පහරදීමෙන් මියගොස් ඇත්තේ අංක 152, පල්ලියගොඩැල්ල, මැදිරිගිරිය. ලිපිනයේ පදිංචිව යු අඹුලාහසන් (58) දරුවන් හය දෙනෙකුගේ පියෙකි.

මැදිරිගිරිය පොලිසිය කළ විමර්ශන අනුව මෙම පුද්ගලයා (18) දින පස්වරු 2.30 පමණ නිවසින් පිටව ගොස් ඇත්තේ සින්නවෙලු ප්‍රදේශයේ සිටින තම ගවයන් ගාල් කිරීම සඳහාය.

ගවයන් ගාල් කිරීමෙන් පසු වෙනදා එන වේලාවට නොපැමිණි බැවින් ජංගම දුරකතනය ඇමතුම් ලබා ගත්තත් ප්‍රතිචාරයක් නොදැක්වීම නිසා සැක සිතූ දරුවන් විසින් ගවයන් ගාල් කරන ස්ථානය පරීක්ෂා කිරීමට ගොස් සොයා බලන විට තම පියා එම ස්ථානයේ මැරී වැටී සිටින අයුරු දැක තිබේ. පසුව පොලීසිය සහ වනජීවී නිලධාරීන් දැනුවත් කර තිබේ.

පොලොන්නරුව කොට්ඨාසය භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි ඔෂාන් හේවාවිතාරණ මහතාගේ උපදේස් පරිදි මැදිරිගිරිය පොලිස් ස්ථානයේ ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක වසන්ත පිටිගල ඇතුළු පිරිසක් වැඩිදුර පරීක්ෂාණ පවත්වයි.

අවිස්සාවේල්ල විශේෂ කල්පනී පද්මපෙරුම

## හිල්ටන් හෝටලය දරුවන් සමඟ අවුරුදු සමරයි





කොළඹ හිල්ටන් හෝටලය මෙවර අවුරුදු උත්සවය සමරනු ලැබුවේ, කුඩා දරුවන්ට ශ්‍රී ලාංකීය රස කැවිලි සෑදීම හුරු කිරීම උදෙසා විශේෂ වැඩසටහනක් හෝටල් පරිශ්‍රයේදී පවත්වමිනි. කුඩා දරුවන්ට රස කැවිලි සාදන ආකාරය පිළිබඳ දැනුම්වත් කිරීම හා ප්‍රායෝගික ව අත්හදා බැලීමට අවස්ථාව ලබා දීම ද මෙහි විශේෂත්වයකි.

බොරලැස්ගමුව සමූහ- සෙනවිරත්න කහටපිටිය

## ලලිත් ඇතුලත්මුදලි 28 වැනි ගුණානුස්මරු පින්කම 23දා

බුද්ධිමත් කෘතහස්ත දේශපාලන නායකයකු වශයෙන්ද මෙරටේ අධ්‍යාපනය නංවාලීමේ අරමුණින් මහපොළ සංකල්පයේ නිර්මාතෘවරයා වශයෙන් ද කටයුතු කළ සමස්ත ජනතාවගේම ආදරය හා ගෞරවයට පාත්‍ර වූ හිටපු ආරක්ෂක අමාත්‍ය දිවංගත ලලිත් ඇතුලත්මුදලි මහතාගේ 28 වන ගුණානුස්මරණ පිංකම මේ මස 23 වන දිනට යෙදී ඇත.

එබැවින් ඒ වෙනුවෙන් එතුමා සිහිපත් කරමින් පහත සදහන් පරිදි පිංකම් මාලාවක් දෙහිවල සහ රත්මලාන සංවර්ධන පදනම හා ලලිත් ඇතුලත් මුදලිසමරු පදනම් කේන්ද්‍රය එක්ව සංවිධානය කර ඇත. 23 වන දින පෙරවරු 8.15 ට කොළඹ 7 රාජකීය විදුහල අසල පිහිටි ඒ මහතාගේ පිළිරුවට පුෂ්පෝපහාර දැක්වීම හා එදිනම පෙර වරුවේ 10.00 ට ගල්කිස්ස මැලිබන් මංසන්ධියේ පිහිටි ඒ මහතාගේ පිළිරුවට පුෂ්පෝපහාර දැක්වීමත් සිදුකරනු ලබන අතර , එදිනම ප.ව.6.00 ට කෝට්ටේ ශ්‍රී නාගවිහාරස්ථානයේදී බෝධිපූජා පිංකමක්ද සිදු කෙරේ .

27 වන අඟහරුවාදා දින පෙ.ව 11.00 ට රත්මලාන පරම ධම්ම චෛතිය පිරිවෙන් විහාරස්ථානයේදි 62 නමක් විෂයෙහි පිරිනැමෙන සපිරිකර සංඝගත දක්ෂිණාවක් පිරිනැමීමටද කටයුතු සංවිධානය කරනු ලැබ ඇත .මේ සඳහා සහභාගිවන සියලු දෙනා පවතින කෝවිඩ් වසංගත නීතිරිති අනුගමනය කරන ලෙසත් ඉල්ලා සිටී .

බී.ටී. තඹවිට-මතුගම

## බැටරියකින් වැඩකරන තුවක්කුවක් තිනියාවල

බෝර 12 ගිනි අවියකට සමානව බැටරියකින් ක්‍රියාකරන කොටන තුවක්කුවක් සමග පුද්ගලයෙකු තිනියාවල පොලිසිය විසින් පසුගිය 18 වනදා රාත්‍රියේ අත් අඩංගුවට ගෙන ඇත.

අනවසර ගිනි අවියක් සන්තකයේ තබාගෙන සතුන් දඩයමේ නිටතවන බවට පොලිස් විශේෂ කාර්යාංශයේ තිනියාවල පොලිසියට අනුයුක්ත නිලධාරියාට ලැබුණු තොරතුරක් අනුව සිදුකළ වැටලීමකදී මෙම සැකකරු සමග ගිනි අවිය අත් අඩංගුවට ගෙන ඇත.

වෝට් 09 බැටරියකින් ක්‍රියාකරන ලෙස නිපදවා ඇති මෙම ගිනි අවියට වෙඩි බෙහෙත් කෙටීම සිදුකළ යුතුව ඇති අතර මෙම අත් අඩංගුවට ගත සැකකරු විසින්ම මෙම ගිනි අවිය නිපදවා ඇති බවට මුලික පොලිස් පරීක්ෂණ වලදී හෙළිවී ඇත.මීට වසර තුනකට පමණ පෙර විදේශ රැකියාවක නිරතව සිට මෙරටට පැමිණ ඇති මෙම සැකකරු තේ වගාවේ නිරතව සිට ඇති අතර සතුන් දඩයම සඳහා මෙම ගිනි අවිය භාවිත කර ඇති බවට පොලිසියට තොරතුරු ලැබී ඇති අතර ඔහු මෙම ගිනි අවිය වෙනත් නීති විරෝධී කටයුතු වලට භාවිත කර ඇතිදැයි තිනියාවල පොලිසිය වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

සිරි අබයසිරි -මාතලේ මධ්‍යම සමුහ

## මිහිතල දිනය නිමිත්තෙන් මාතලේට හරිත උද්‍යානයක්

ලෝක මිහිතල දිනයට වසර 50ක් සපිරිම නිමිත්තෙන් මෙම මස (22) වන දින මාතලේ දුම්බර රිවස්ටන් කදුපන්තියේ මැදවත්ත ආශ්‍රිතව හරිත උද්‍යානයක් ස්ථාපනය කිරිමට පියවර ගෙන ඇතැයි ගැෆෙක් ශ්‍රී ලංකා සංවිධානයේ සභාපති ගාමිණි ජයතිස්ස මහතා පවසයි.

එම වැඩ සටහනට සමගාමීව තල් ශාකය ශ්‍රී ලංකාවේ සංස්කෘතික ශාඛය බවට පත්කරන ලෙස අදාළ අංශ වෙතින් ඉල්ලිමටත් මෙම කදු පන්තියේ තල් ශාඛය ප්‍රමුඛ ශාඛය බවට පත් කිරිමට පියවර ගෙන ඇත.



# විල්පත්තු සපත්තු පාලම අබලන්

## සෆාරි ජීප් රියැදුරෝ කබලෙන් ළිපට

විල්පත්තුව වනෝද්‍යානය ලංකාවේ ඇති විශාලතම ජාතික වනෝද්‍යානයයි. මෙහි එක මායිමක් අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති අතර වැඩි කොටසක් අයත් වන්නේ වයඹ පළාතටය. ඒ අනුව ක්ෂීරපායි විශේෂ තිහකට පමණ නිවහන වී ඇති විල්පත්තු වනෝද්‍යානයේ ලංකාවට ආවේණික මෙන්ම සංචාරක පක්ෂි විශේෂ රාශියක්ම දැකගැනීමට හැකියාව ඇත.

නමට ම සරිලන අයුරින් විල්පත්තු වනෝද්‍යානය තුළ විල් පිහිටා ඇති අතර විල්පත්තු වනෝද්‍යානය ලංකාවේ ඇති විශාලතම සහ පැරණිම වනෝද්‍යානය ලෙස සැලකේ.

තවද පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් පොම්පරිප්පු නම් ස්ථානය පිහිටන්නේද මෙම වනය තුළයි. ඈත අතීතයේ එනම් අදින් වසර මිලියන 12කට පමණ පෙර මුහුදෙන් ඉහළට එසවුණු කොරල්පර ශ්‍රී ලංකාවේ දක්නට ඇත්තේ දෙකකි. ඉන් එකක් යාල ජාතික වනෝද්‍යානයට අයත් මිනිහාගල්කන්ද නම් වූ ස්ථානය වන අතර අනෙක විල්පත්තුව ජාතික වනෝද්‍යානය වෙයි.

විල්පත්තුව ජාතික වනෝද්‍යානයේ සැඟවුණු අතීතය පිළිබඳව විමසීමේ දී පුරාවිද්‍යාත්මක අතින් සුවිශේෂී වටිනාකම් දක්නට ලැබේ.

මෙතෙක් සොයාගත් එසේම නොදන්නා වටිනා සංස්කෘතියක් මේ වන බිමේ වැළලී තිබේ. එනම් අදින් වසර ගණනාවක කාලයකට අයත් ප්‍රාග් ඓතිහාසික යුගයේ ගල් ආයුධ හමු වීමත්, පූර්ව ඓතිහාසික යුගයට අයත් වළං කටු හා යකඩ තාක්ෂණය භාවිත කළ බවට මෙවලම් හමු වීමත් මේ රටේ සැඟවුණු ඉතිහාසයක් කියාපාන්නකි.

මේ ස්ථාන අතර පොන්පරිප්පුව නම් ප්‍රදේශයෙන් ඉපැරණි සුසාන භූමියක සලකුණු හමු විය. මෙහි මිනිස් සිරුරු 8,000ත් 12,000ත් අතර ප්‍රමාණයක් වළ දමා තිබුණු බැව් හමු වන සුවිසල් මැටි භාජනවලින් කියාපායි. බාහිරින් වනාන්තරයක් ලෙස දිස් වුවත් මෙහි භූ ගර්භයේ සැඟවී ඇත්තේ කියා නිම කළ නොහැකි ඉතිහාසයකි.

අදින් වසර 2,500කට පමණ පෙර කාලය පිළිබඳව විමසීමේ දී ඉපැරණි විහාරස්ථාන හා දේවස්ථාන 68ක් මේ වන බිමෙන් හඳුනාගෙන ඇත.

වර්ෂ 1905දී රක්ෂිත භූමියක් ලෙස ප්‍රකාශයට පත් කෙරුණු විල්පත්තු ජාතික වනෝද්‍යානය හෙක්ටයාර 131,693.7ක විශාලත්වයක් අත් වී ඇත. එනම් වත්මන් විල්පත්තුව ජාතික වනෝද්‍යානය කොටස් පහකින් යුත් උද්‍යාන සංකීර්ණයකි.

මුළු වනෝද්‍යානයේම තිබෙන විල්ලු ගණන 40ක් වන අතර ඉන් ප්‍රධාන විල්ලු ගණන 27කි. කොක්කාරිය හා ලුණුවිල යන විල්ලු කරදිය විල්ලු ලෙස හැඳින්වෙයි. මෙයින් කොක්කාරිය විල්ලුව ප්‍රමාණයෙන් විශාල වන අතර ඉතිරි විල්ලු 24 මිරිදිය විල්ලු ලෙස හැඳින්වෙයි. විල්ලුවලින් ගහන වූ ප්‍රදේශයක් බැවින් මේ වනෝද්‍යානයට විල්පත්තුව යනුවෙන් නම පටබැඳී ඇති බැව් ඉතිහාසගත කරුණුවලට අනුව අනාවරණය වෙයි.

2014 වසරේ මුල් භාගයේදී විල්පත්තුව ජාතික වනෝද්‍යානයට පිවිසීම සඳහා එළුවන්කුලම ප්‍රදේශයෙන් ස්ථාපිත කළ නව පිවිසුම් දොරටුවේ ආරම්භයත් සමඟ 2015 වසරේ සිට වනාතවිල්ලුව සංචාරක පුරවරයක් බවට පරිවර්ථනය වන්නට විය.

ඒ අනුව දෙස් විදෙස් සංචාරකයන්ගේ සොදුරු පාරාදීසයක් සේම නව තෝතැන්නක් ලෙස ගගේවාඩිය සංචාරක කර්මාන්තයේ නව පිබිදීමක් ඉතිහාස වංශ කතාවට එක්විය. ඒ අනුව ගගේවාඩිය ප්‍රදේශය ඉල්ලක කර ගනිමින් පළමු නිවාඩු නිකේතනය ඉදිවීමත් සමඟ දෙස් විදෙස් සංචාරකයන්ගේ සුව පහසුව සඳහා තවත් නිවාඩු නිකේතන 14ට ආසන්න ප්‍රමාණයක් ඒ අවට ස්ථාපිත විය.

ඒ සමගම විල්පත්තුව ජාතික වනෝද්‍යානය නැරඹීමට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයන්ගේ සංචාරය පහසු කරනු පිණිස 2015 වසරේ මුල් භාගයේදී සෆාරි ජීප් රථ 15ට ආසන්න ප්‍රමාණයකින් සැදුම් ලත් 'තම්බපණ්ණි සෆාරි ජීප් රථ සංගමය' පිහිටුවා ගන්නා ලද්දේ එළුවන්කුලම පිවිසුම ඉලක්ක කර ගනිමිනි.

මෙම ජීප් රථ සංගමයේ වත්මන් සභාපතිවරයා ලෙස ඩබ්ලිව්. අමිත් ප්‍රියංකර මහතා කටයුතු කරන අතර සුරාජ් ගුණවර්ධන මහතා එහි ලේකම් ධුරය හොබවති. භාණ්ඩාගාරික ලෙස ජී. ජී. අජිත් ප්‍රියන්ත මහතා කටයුතු කරන අතර මෙහි සාමාජිකයින් 20ක් පමණ නිත්‍ය සාමාජිකත්වය දරති.

තවද මෙම සෆාරි ජීප් රථ හිමියන් විසින් දෙස් විදෙස් සංචාරකයන්ට ලබා දෙන සේවාව අන් කිසිදු උද්‍යානයක දක්නට නොලැබෙන බව අමුතුවෙන් කිව යුතු නැතැයි සිතිය හැක්කේ මෙහි පැමිණෙන සංචාරකයන් වනය, සතුන්, කුරුල්ලන්, ශාක ආදි වර්ගීකරණය පිළිබඳව පරීක්ෂණයට අවශ්‍ය තොරතුරු සහ ඒ ආශ්‍රිත මාර්ගෝපදේශනයට අදාළ විශේෂ පුහුණුවකින් සකසුරුවම් වූ පිරිසක් හෙයිනි.

එදා සිට අද දක්වා වූ කාල පරාසය තුළ කටුනායක ගුවන් තොටුපළේ සිට පැය දෙකක් වැනි කෙටි කාලයකින් සංචාරකයන් පසුගිය වර්ෂයන්වල වැල නොකැඩී ඇදෙන්නත්, ඔවුන්ගේ ආකර්ශනය නොඅඩුව ලැබෙන්නටත් එළුවන්කුලම පිවිසුම ආශිර්වාදයක් බවට නතු වන්නට වූ සුවිශේෂි විශේෂත්වය වනුයේ කල්පිටිය අර්ධද්වීපයේ පිහිටා ඇති දූපත් සමූහය සේම කොරල්පර, ඩොල්ෆින්, කඩොලාන නැරඹීමේ පහසුව මෙන්ම ගගේවාඩිය සංචාරක පුරවරය තුළ ජල ක්‍රීඩාව සහ වන ජීවි අත්දැකීම ඔවුන්ට එකවරම ලබා ගැනීම හේතුවෙනි.

ඒ අනුව ජර්මන්, ඔස්ට්‍රේලියානු, එංගලන්ත, ඇමෙරිකානු, ඉතාලි, බ්‍රිතාන්‍ය, ප්‍රංශය, රුසියාව වැනි රටවල සිටින විදේශීය සංචාරකයන් බහුතරයක් එළුවන්කුලම පිවිසුම ඔස්සේ සංචාරය සඳහා එක්වීම නිරායාසයෙන්ම සිදු වන අතර එසේ පැමිණෙන සංචාරකයන්ට ජලය සහ වන ජීවි යන අත්දැකීම සුවසේ විඳීමට ඇති එකම පාරාදීසමය සංචාරක පුරවරය ලෙස මෙය නම් කළ හැකිය.

මෙම සංචාරකයන් විල්පත්තුව ජාතික වනෝද්‍යානයට දකුණු මායිම්ව ගලා බසින කලාඔය ගංකොමලිය යාකරන සපත්තු පාලම තරණය කරමින් සෆාරි ජීප් රථවලට අමතරව සිය පෞද්ගලික වාහන ඔස්සේද වනයට ප්‍රවේශ වූ විට ජෛව විවිධත්වයෙන් පිරි වනෝද්‍යානයේ දැක බලා ගැනීමට හැකියාව තිබේ.



වන ජීවි අධ්‍යක්ෂ ජනරාල් එම්. ජී. සී. සූරියබණ්ඩාර

2014 වසරේ මුල් භාගයේදී විල්පත්තුව ජාතික වනෝද්‍යානයට ප්‍රවේශ වීම සඳහා එළුවන්කුලම ප්‍රදේශයෙන් කලා ඔය නිම්නය යා කර එවකට ඉදිකර තිබූ සපත්තු පාලම උපයෝ කර ගනිමින් නව පිවිසුම් මාර්ගයක් ස්ථාපිත කර දෙස් විදෙස් සංචාරකයන්ට පහසුවෙන් සෆාරි හෝ තමන්ගේ පුද්ගලික වාහන මඟින් විල්පත්තුව නැරඹීමට මනා හැකියාව පැවතීම නිසාවෙන් මෙරට සංචාරක කර්මාන්තයේ ලාභ ලබන කේන්ද්‍රස්ථානයක් බවට විල්පත්තුව පත්ව තිබුණි.

නමුත් පසුගිය යහපාලන රජය සමයේ විල්පත්තුව ඔස්සේ මන්නාරමට ගමන් කිරීම සඳහා අවසරය ලැබීමත් සමඟින් මෙම පාලම මතින් කල්පිටිය, පුත්තලම ආදි ප්‍රදේශවල සිට මන්නාරම දක්වා පොදු ප්‍රවාහන බස් රථ සහ විශාල බර වාහන දිනකට කිහිප වතාවක්ම ධාවනයේ යෙදවීම හේතුවෙන් මෙම සපත්තු පාලම දැඩි ලෙස අබලන් තත්ත්වයට පත්වී තිබේ. ඒ සමග කබලෙන් ළිපට වැටුණු සෆාරි ජීප් රථ හිමියෝ ඇතුළු නිවාඩු නිකේතන සංචාරක බංගලා අවට ආපනශාලා මෙන්ම මේ සංචාරක කර්මාන්තය ආශ්‍රිතව සෘජුව සහ වක්‍ර මුදල් ඉපයූ බොහොමයකගේ බඩේ පහර වැදී හමාරය.

වසර ගණනාවක් එළුවන්කුලම සෆාරි ජීප් රථ හිමියන්ද මෙම පාලම අබලන් වීම හේතුවෙන් ආර්ථිකමය වශයෙන් දැඩි ලෙස පාඩු ලබමින් සිටියදී තවත් පසෙකින් මෙරට සංචාරක ආකර්ශනය දිනූ එළුවන්කුලම පිවිසුම අද වන විට අඳුරු වළාවකින් වැසී යමේ ප්‍රවනතාවයක් දක්නට ලැබේ.

විල්පත්තුව නැරඹීමට පැමිණෙ බොහෝ සංචාරකයන් තමන්ගේ පෞද්ගලික වාහන උපයෝගි කර ගනිමින් සංචාරයේ යෙදුණද අද වන විට ඔවුන්ට ඒ වරප්‍රසාදයද සම්පූර්ණයෙන් අහිමිව ගොස් හමාරය. ඒ හේතුව නිසාවෙන් ඔවුන්ට සිය වාහන කලාඔය නිම්නයේ ගාල් කර දැඩි අසීරුතාවයෙන් පා ගමනින් කලාඔය තරණය කර යෑමට සිදුව තිබේ. එසේ වාහන ගාල් කර ගියද ඒවා ආරක්ෂා කිරීමට කිසිදු වැඩපිළිවෙළක් සංවිධානය නොකර තිබීම හේතුවෙන් රිළවුන්, වඳුරන් ආදි වන සතුන්ගේ ග්‍රහණයට නතුව වාහනවලට දැඩි අලා හානිද සිදු වන බවට සංචාරකයෝ මැසිවිලි නඟති.

තවද මෙම පාලම මෙසේ ප්‍රතිසංස්කරණය නොකර තිබීම හේතුවෙන් නුදුරේදී විල්පත්තුව ජාතික වනෝද්‍යානයට ඇතුළු වන එළුවන්කුලම පිවිසුම සම්පූර්ණයෙන්ම අහිමි වන ලකුණු මතුවෙමින් තිබෙනවා පමණක් නොව මෙරට සංචාරක කර්මාන්තය සම්පූර්ණයෙන් වලපල්ලට යෑමේ පෙර මං සලකුණු පහළ වෙමින් තිබේ.

එයට බලපාන ප්‍රධාන හේතුව කොළඹ ප්‍රදේශවල සිට පැමිණෙන සංචාරකයන් ජලයට දක්වන දැඩි බිය නිසාවෙන් පාගමනින් පාලම තරණය කිරීමට දක්වන අකමැත්ත සේම, අබාධිත හෝ වයෝවෘද්ධ වූ සිය මාපියන් කැටුව එන බහුතරයක් පිරිසට මෙම පාලම මතින් යෑමට නොහැකිවී යෑම හේතුවෙන් ඔවුන් ආපසු හැරී යන අවස්ථා බහුලව දක්නට ලැබේ.

එපමණක් නොව පාලම අබලන් තත්ත්වයේ පැවතීම හේතුවෙන් මේ වන විට එගොඩ මෙගොඩ ගෙන යෑමට නොහැකිව සෆාරි ජීප් විශාල ප්‍රමාණයක් විල්පත්තුව ජාතික වනෝද්‍යානයේ ගාල් කර තැබීම නිසාවෙන් ඔවුන්ට නිසි වේලාවට එකී වාහන පිරිසුදු කිරීමට නොහැකි වී ඇත. පවතින අයහපත් සෞඛ්‍ය තත්ත්වය හමුවේ සංචාරකයන් එම වාහනවල ගමන් කිරීමට දැඩි බියක් පලකරන අතර තවද රාත්‍රී කාලයේ රිළවුන්, වඳුරන් ආදි වන සතුන් එකී වාහන ඔවුන්ගේ නාවාතැන් බවට පත් කරගෙන තිබීම හේතුවෙන් වාහනවලද දැඩි අලභහානී සිදුවී ඇති බවද සෆාරි ජීප් රථ හිමියෝ චෝදනා නඟති.

මේ ගැටලු නිසාවෙන් සෘජු සහ වක්‍ර ලෙස සංචාරක කර්මාන්තය ආශ්‍රිතව නියැළෙමින් මුදල් උත්පාදනය කරනු ලබන 1,500කට ආසන්න පිරිසකගේ ආර්ථිකයටද බලපෑම් එල්ල වී ඇති බවට කර්මාන්තය ආශ්‍රිතව යැපෙන්නෝ මැසිවිලි නඟති.

සංචාරක කර්මාන්තයේ ප්‍රගමනයට රජයෙන් ලැබෙන දායකත්වය ප්‍රමාණවත් නොවන බව ඔවුහු පවසති.

එසේ තව දුරටත් සංචාරකයන්ට මෙවැනි කෙනෙහෙලිකම් සිදු වන්නේ නම් නුදුරේදී සංචාරක කර්මාන්තයට කණකොකා හඬන්නා සේම අපගේ වැදගත්කමකින් සමන්විත ස්ථාන සංචාරකයන්ගේ සිතැඟි පරිදි පෙන්වීමට ඔවුනට නොහැකිවන බවටද අනතුරු අඟවති.

**මේ සම්බන්ධයෙන් අප දුරකතනයෙන් කළ විමසුමකදී සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පවසා සිටියේ මෙවන් අදහසකි.**



සංචාරක අමාත්‍ය
ප්‍රසන්න රණතුංග

"මම ඒ සම්බන්ධයෙන් දැනුවත්. අපි මාර්ග සංවර්ධන අධිකාරියත් එක්ක සම්බන්ධ වෙලා නිමල් ලංසා ඇමතිතුමා ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කරලා මේ වසරේ ඒ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරන්න කටයුතු කරලා තියෙනවා. මේ කටයුතු වසර ගණනාවක් සිද්ධ වෙලා නැහැ. වසර ගණනාවක් සංවර්ධනය නොකරපු වැඩ අද වන විට අපිට කරන්න සිද්ධ වෙලා තියෙන්නේ. පහුගිය වර්ෂයන්වලදීත් ඔය සම්බන්ධයෙන් අපි සාකච්ඡා කළා. නමුත් මේ වසරේ අපි ප්‍රතිපාදන වෙන් කරලා ඉදිකිරීම් කටයුතු කඩිනමින් ආරම්භ කරන්න සූදානම් වෙන්නේ" යනුවෙනි.

**මේ සම්බන්ධයෙන් වන ජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් එම්. ජී. සී. සූරියබණ්ඩාර මහතාගෙන් කළ විමසීමේ දී ඔහු පවසා සිටියේ,**

"ඒ කියන්නේ මෙහෙමයි අපි ඔය සම්බන්ධයෙන් ඔය කියන ස්ථානයේ තාවකාලික පාලමක් ඉදිකරන්නත් අපි සහ අපේ පාර්ශ්වකරුවන් විදියට කටයුතු කරන ජීප් රථ හිමියන් එකතුවෙලා කටයුතු සිදු කළේ. ඊට අමතරව අපේ සැලස්සමක් තියෙනවා ඔය ස්ථානයේ එල්ලෙන පාලමක් ඉදිකරන්න. ඒ කටයුත්ත ඉතාමත් ඉක්මනින් සිදු කෙරෙනවා. මොකද අපිට වෙන ව්‍යාපෘතියකින් තමයි ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලැබෙන්නේ. එල්ලෙන පාලමක් කියන්නෙ සෆාරි ජීප් රථ ගමන් කරන ආකාරයට තමයි අපි පාලම ඉදිකරන්න සැලසුම් සකස් කරමින් පවතින්නේ. මොකද සෑම දිනකම සෆාරි ජීප් රථ උද්‍යානය ඇතුළේ ගාල් කරලා තියන්න අපහසුයි. නමුත් අපි දැනට තාවකාලිකව අවරය දීලා තියෙනවා එම ජීප් රථ උද්‍යානය තුළ ගාල් කිරීමට"





කේ. ප්‍රියංකර කළුපහන - වනාතවිල්ලුව සමූහ

කන්තලේ සමූහ සුමිත්‍රා කුමාරිහාමි

# කැෂියර් ලාච්චුවකින් සුක්ෂමව සල්ලි හොරකම් කරලා

කැෂියර් ලාච්චුවකින් මුදල් සොරා ගැනීමක් සම්බන්ධයෙන් අධිකරණය හමුවට පමුණුවා සිටි පුද්ගලයෙකු වරද පිළිගැනීම නිසා රුපියල් ලක්ෂ 2ක ශරීර ඇප මත මුදා හැරීමට නියෝග කළ කන්තලේ දිසා විනිසුරු හා මහෙස්ත්‍රාත් තිෂානි තේනබදු මහත්මිය මැයි 10 වැනිදා යළි අධිකරණය හමුවේ පෙනී සිටින ලෙස ද නියෝග කළාය.ඇප මත නිදහස් වූයේ කන්තලේ අග්බෝපුර ප්‍රදේශයේ පදිංචි 53 හැවිරිදි ත්‍රිරෝද රථ රියැදුරෙකි. මීට මාස දෙකකට පමණ පෙර තමා මුදල් ලාච්චුවේ යතුර නැතිවීම නිසා අලුත් යතුරක් කපා ගෙන ඒමට තමා කාලයක සිට ළඟින් ආශ්‍රය කළ ත්‍රිරෝද රථ රියැදුරකු ලෙස සේවය කරන තැනැත්තෙකුට එම කාර්ය භාරදී ඇත්තේ ඒ හිතවත්කම මතයි. නගරයේ ලී වෙළෙඳ සලක් පවත්වාගෙන යන මෙම ව්‍යාපාරිකයාගේ පවුලේ ගමන් බිමන් මෙන්ම බැංකු කටයුතු ද සිදු කරන මෙම රියැදුරු ව්‍යාපාරිකයා කී ලෙසම අලුත් යතුරක් දින දෙක තුනක් තුළදී සාදා ගෙනත් දීමට තරම් කාරුණිකවී තිබුණි. කෙසේ හෝ මාස දෙකක් තුනක් යනවිට තම වෙළෙඳ ව්‍යාපාරයේ මුදල්වල යම් අඩුවීමක් දක්නට ඇති බවට ව්‍යාපාරිකයාට වැටහුණි. ඒ අනුව තම ව්‍යාපාරික ස්ථානයේ සවිකර ඇති සී.සී.ටී.වී. පද්ධතිය පරීක්ෂා කර බැලීය.එවිට දැක ඇත්තේ තමා විශ්වාස කළ තැනැත්තා විටින් විට ලාච්චුව විවෘත කොට මුදල් සොරකම් කරන ආකාරයයි. සිද්ධිය පොලීසියට දැන්වීමෙන් පසු එදිනම සැකකරු අත්අඩංගුවට ගෙන අධිකරණය හමුවට පැමිණ වීමෙන් පසු වරද පිළිගැනීම නිසා මෙසේ ඇප මත මුදාහරින ලදී.කන්තලේ මූලස්ථාන පොලිස් ස්තානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක එච්.එම්.පී.බී. විජේසිරි මහතාගේ උපදෙස් මත අපරාධ විමර්ශන අංශය වැඩිදුර පරීක්ෂණ මෙහෙයවයි.

රසුල දිල්හාර ගමගේ - උතුරු පළාත් විශේෂ

# කෝටියක කේරළ ගංජා ටිපර් රියක සඟවා රැගෙන ගිය සැකකරුවෝ කොටු





මන්නාරම ඉලුප්පකඩවෙයි පොලීසිය විසින් යළිත් වරක් රුපියල් කෝටියක් පමණ වටිනා කේරළ ගංජා කිලෝ ග්‍රෑම් 90ක ප්‍රමාණයක් ටිපර් රථයක සඟවා ගෙන යමින් සිටියදී සැකකරුවන් තුන් දෙනෙකු සමග (18) අත්අඩංගුවට ගෙන තිබේ.

මන්නාරම, ඉලුප්පකඩවෙයි පොලීසියට ලද තොරතුරක් මත ඉලුප්පකඩවෙයි සිප්පි ආරු ඇලේ වැලි රැගෙන යෑම සඳහා යැයි කියමින් පැමිණි ටිපර් රථයක් පරීක්ෂා කිරීමේදී මෙම කේරළ ගංජා තොගය හමු වී තිබේ.

අත්අඩංගුවට පත් වූ සැකකරුවන් තුන් දෙනා වයස අවුරුදු 21, 31 හා 44 යන වයස්වල පසු වන අතර ඔවුන් වවුනියාවේ කූමාංකුලම හා තවසිකුලම යන ප්‍රදේශවල පදිංචිකරුවෝ වෙති.

සැකකරුවන් තුන් දෙනා කෙරළ ගංජා තොගය සමග මන්නාරම අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට ඉලුප්පකඩවෙයි පොලීසිය පියවර ගෙන තිබේ.

මන්නාරම ඉලුප්පකඩවෙයි පොලිසියේ නිලධාරීන් විසින් පසු ගිය සතියේද කේරළ ගංජා හා බලපත්‍ර රහිත වියළි කහ තොගයක් අත්අඩංගුවට ගෙන තිබිණි.

කේ.ඒ. මෛත්‍රීපාල - දමන සමූහ

## බුද්ධංගල ප්‍රතිමා වහන්සේගේ වැඩ නිම කිරීමට පින් කැමති ඔබටත් ආරාධනා



නැගෙනහිර පළාතට අයත් ඓතිහාසික දිගාමඩුලු රාජධානියේ උහන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බුද්ධංගල ග්‍රාම නිලධාරී වසමේ බුද්ධංගල අභය භූමිය තුළ මුහුදු මට්ටමේ සිට උස අඩි 232ක් වන උසම ගල්තලාව මත ඉදිවන සමාධි බුද්ධ ප්‍රතිමා වහන්සේ නැගෙනහිර පළාතේ අම්පාර, මඩකළපුව, දෙදිගාවේ බහුතරයක් ජනයාගේ නෙතට දර්ශනය වන අයුරින් ඉදි වීම විශේෂත්වයකි.පසුගිය 2020 වසරේ අගෝස්තු මස 28 වැනිදා මේ ප්‍රතිමා වහන්සේ වෙනුවෙන් ගඩොල් තැන්පත් කිරීමේ කටයුතු සිදු කෙරිණි. එදා සිට මේ දක්වා මෙම ප්‍රතිමා වහන්සේ ගඩොලින් නිර්මාණය කිරීමේ කටයුතු බොහෝ සෙයින් නිමා කර ඇත. කපරාදු කටයුතු නිමවා තීන්ත ආලේප කිරීම සහ පරිශ්‍රයේ කටයුතු සඳහා කාලය, ධනය, ශ්‍රමය, වැය කිරීමට සිදුව ඇත. මේ පරිශ්‍රය තුළ සිදු වන ඉදිරි කටයුතු ඉංජිනේරු මහත්වරුන්ගේ ගණනය කිරීම් අනුව ප්‍රතිමා වහන්සේ ඝන අඩි 18,800ක් පමණ ප්‍රමාණයක් තිබෙන බවත් එක් ඝණ අඩියක් වෙනුවෙන් රුපියල් 1,346ක පිරිවැයක් දරන්නට සිදු වන බවත් එවැනි සුළු මුදලක් ඕනෑම කෙනෙකුට දායකත්වය ලබා දීමට හැකියාව ඇත. 2022 වෙසක් පෝයට පෙර මෙම සමාධි බුද්ධ ප්‍රතිමා වහන්සේගේ වැඩ කටයුතු නිමා කර ලෝකවාසී බෞද්ධ ජනතාවට වැදුම්, පිදුම් කරන නැගෙනහිර පළාතේ සුවිශේෂී බෞද්ධ පුන්‍ය ආයතනයක් ලෙස මේ ස්ථානය ඉදිරි කටයුතු කර ගැනීමට දායක වන ඔබට පුන්‍යානුමෝදනා.

සමන්තා කංකානම්ගේ - බෙලිහුල්ඔය සමූහ

# පිළිකාකාරක රූපලාවණ්‍යය ශරීර ආලේපන තොගයක් සොයා ගනී



රත්නපුර දිස්ත්‍රික් ලේකම් මාලනී ලොකුපෝතාගම මහත්මියගේ උපදෙස් හා මත පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ රත්නපුර දිස්ත්‍රික් ප්‍රධානී උදය නාමල්ගම මහතාගේ මෙහෙය වීමෙන් මිනිස් සමට සහ ශරීරයට නුසුදුසු රුපියල් ලක්ෂ දෙකක් පමණ වටිනා පිළිකාකාරක රූපලාවණ්‍යය ආලේපන ඇහැලියගොඩ ප්‍රදේශය ආශ්‍රිතව සිදු කරන ලද වැටලීම්වලදී අත්අඩංගුවට ගත් බව උදය නාමල්ගම මහතා පැවසීය. මෙම වැටලීම්වලදී අත්අඩංගුවට ගත් බොහොමයක්ම ආලේපන වර්ග විදෙස් රටවල සිට මෙරටට ගෙන්වන ලද ඒවා බවද පැවසූ ඒ මහතා මෙම ආලේපන අලෙවි කළ අලෙවිය සඳහා ප්‍රදර්ශනය කළ වෙළෙඳසල් 10කට විරුද්ධව අවිස්සාවේල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරීමට නියමිත බවද පැවසීය. මේ පිළිබඳ වැඩිදුරටත් කරුණු පැහැදිලි කරමින් නාමල්ගම මහතා පැවසූයේ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය 2018 මැයි මස 03 වැනි දින නිකුත් කර ඇති අංක 2069/37 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් සමෙහි ආලේප කරන්නා වූ සියලුම ක්‍රීම් හා දියර වර්ග ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතර 743 මගින් නිශ්චිත කර ඇති බැරලෝහ උපරිම සීමාවන්ට අනුකූල වන්නේ නම් මිස එවැනි ක්‍රීම් හා දියර වර්ග නිෂ්පාදනය, ආනයනය, බෙදාහැරීම, ඇසුරුම් කිරීම, ගබඩා කිරීම හෝ තොග හෝ සිල්ලර වශයෙන් විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම සපුරා තහනම් වන බව පැවසීය.එමෙන්ම සමෙහි ආලේප කරනු ලබන ක්‍රීම් හා දියර වර්ග මිලදී ගැනීමේදී ඒවායේ ඇසුරුම්වල පහත සඳහන් තොරතුරු ඇත්නම් පමණක් ඒවා මිලදී ගන්නා මෙන් උදය නාමල්ගම මහතා මහජනතාවගෙන් ඉල්ලා සිටියි.

සුමිත්‍රා කුමාරිහාමි - කන්තලේ සමූහ

## "ජීව තුරු උදාන" කන්තලේදී



ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සංකල්පයක් වන සෞභාග්‍යයේ දැක්ම යටතේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද "ජීව තුරු උදාන" වැඩසටහනේ දී මුරුංගා පැළ ලක්ෂයක් ලබාදීම පසුගියදා (17) කන්තලේ ගංතලාව බෝධිමණ්ඩලාරාමයේදී පැවැතිණි.

ත්‍රිකුණාමලය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී කපිල නුවන් අතුකෝරළ මහතා මෙහිදී මුරුගා පැළ ගොවි ජනතාවට ප්‍රදානය කළ අයුරුයි මේ.

ත්‍රිකුණාමලය මහ දිසාපති සමන් දර්ශන පාඩිකෝරාළ, කන්තලේ ප්‍රාදේශීය සභා සභාපති සමන් ඒකනායක යන මහත්වරු ඇතුළු විශාල පිරිසක් මෙම අවස්ථාවට සහභාගිවී සිටියහ.

ඒ.ටී.එම්. ගුණානන්ද - ත්‍රිකුණාමලය විශේෂ

## බෝර 12 හා බෙහෙත් කොටන තුවක්කුවක් සමඟ සැක අයෙක් අත්අඩංගුවට

ඇමෙරිකාවේ නිෂ්පාදිත බෝර 12 තුවක්කුවක් හා මෙරට නිෂ්පාදිත බෙහෙත් කොටන තුවක්කුවක් සමඟ ඇතාබැදි වැව ප්‍රදේශයේ දී සැකකරුවකු අත්අඩංගුවට ගැනීමට මොරවැව පොලීසිය සමත් වූහ.

මොරවැව පොලිස් ස්ථානාධිපති ප්‍රධාන පොලිස් පරීක්ෂක වසන්ත චන්ද්‍රලාල් මහතාගේ මෙහෙය වීම යටතේ උප පොලිස් පරීක්ෂක ප්‍රදිප් සැරයන්වරුන් වන (2646) දිසානායක, (36501) උද්දික යන නිලධාරීහු මෙම වැටලීම සිදු කර සැකකරුවන් අත්අඩංගුවට ගනු ලැබූහ.

බෝර 12 තුවක්කුව සැකකරුගේ නිවෙසේ තිබී සොයාගත් අතර බෙහෙත් කොටන තුවක්කුව සැකකරුගේ ගෙවත්තේ ළිඳට දමා තිබියදී සොයා ගැනීමට පොලිසිය සමත් වූහ. බෝර 12 තුවක්කුව සැකකරුට ලැබුණු ආකාරය සෙවීමට විශේෂ විමර්ශනයක් ආරම්භ කර ඇති අතර සැකකරු පවසන්නේ තමන් හේනේ සිටියදී පුද්ගලයකු මෙම තුවක්කුව තමන්ට ගෙනවිත් දුන් බවයි. සැකකරු තුවක්කුව සමඟ ත්‍රිකුණාමල මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතය.

මොරවැව පොලිසිය සිද්ධිය සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂණ මෙහෙයවයි.

අනුරුද්ධ සුබසිංහ - කුරුණෑගල මධ්‍යම සමූහ






## කිරිමැටියාව විදුහලේ ගොඩනැඟිලි රැසකට හානි

පසුගියදා ඇදහැළුණු ධාරානිපාත වර්ෂාවත් සමග හැමූ සුළඟින් පඩුවස්නුවර නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කටුපොත, කිරිමැටියාව ශ්‍රී සුමනසාර නවෝද්‍යා මහා විද්‍යාලයේ ගොඩනැඟිලිවලට දැඩි හානි සිදුව තිබෙන අතර විද්‍යාල භූමියේ ඇති තේක්ක ගස් 32ක්ද සම්පූර්ණයෙන් කඩා වැටී ප්‍රදේශයේ නිවාස කිහිපයකටද වර්ෂාවෙන් හා සුළඟින් හානි සිදුව තිබේ.මේ වන විට විදුලියද ඇණ හිට තිබෙන අතර පඩුවස්නුවර නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ආපදා කළමනාකරණ නිලධාරීන් පිරිසක් පැමිණ සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණ ආරම්භ කර ඇත.



ඩබ්. ක්‍රිස්පිල් බෙනඩික් ප්‍රනාන්දු - පුත්තලම සමූහ

## සූර්වී ළිඳකට වැටී සිටි පුද්ගලයා ගම්වාසීන් බේරා ගෙන

අධික ලෙස මත්පැන් පානය කර ඇති නාඳුනන පුද්ගලයකු පාළු ළිඳක වැටී කෑගසමින් සිටින විට එම ශබ්දය ඇසී එක් රොක්වූ අසල්වාසීන් පිරිසක් එම තැනැත්තා ගොඩගෙන මාදම්පේ පොලීසියට භාරදී ඇත.ඉකුත්දා (16) සවස මාදම්පෙ තඹගල්ල ගම්මානයේදී මෙසේ පාළු ළිඳක වැටී ඇත්තේ අධික ලෙස මත්පැන් පානය කර තමන් පදිංචි නිවෙස සොයා ගැනීමට නොහැකිව ඇවිදිමින් සිටි අයෙකි.අනුරාධපුරයේ පදිංචිකරුවකු වන මොහු මාදම්පෙ ප්‍රදේශයෙන් විවාහයක් කරගෙන බිරිඳගේ නිවෙසේම නතරවී එම ප්‍රදේශයේම ඇගළුම්හලක රැකියාව කර ඇති බවත් සිද්ධියවූ දින අධික ලෙස මත්පැන් පානය කර යමින් සිටියදී මෙසේ පාළු ළිඳකට වැටී ඇති බවත්ය. මාදම්පෙ පොලිසිය වැඩිදුර පරීක්ෂණ පවත්වයි.

මහානාම ගලහිටියාව - මහනුවර උතුර

## මහනුවර නාය යෑමේ අවදානම් ප්‍රදේශයක් ලෙස නම් කරයි



මහනුවර දිස්ත්‍රික්කය මේ වන විට නාය යෑම් අවදානම් ප්‍රදේශයක් ලෙස නම් කර ඇතැයි ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සඳහන් කරයි. කඳුකරයට ඇදහැළෙන මහ වැසි හේතුවෙන් මහනුවර දිස්ත්‍රික්කයේ නිවාස දෙසිය හතරක නිවැසියන් 878 දෙනකු පීඩාවට පත්ව ඇතැයි එම මධ්‍යස්ථානයේ මහනුවර දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂ ඉන්දික රණවීර මහතා පැවසීය.
මහනුවර කඩවත් සතර ගඟවට කෝරළය, මැදදුම්බර, පාතහේවාහැට, හාරිස්පත්තුව, පාතදුම්බර සහ තුම්පනේ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලින් වැඩිම හානි සිදුව ඇතැයිද ඒ මහතා කීය.මහනුවර දිස්ත්‍රික් ලේකම් චන්දන තෙන්නකෝන් මහතාගේ උපදෙස් පරිදි විපතට පත්වූවන්ට සහන සැලසීම මේ වන විට ආරම්භ කර ඇතැයිද හන්තාන ප්‍රදේශයේ හානියට පත් නිවාස පිරිසුදු කිරීම ශ්‍රී ලංකා යුද හමුදාව සහ මහනුවර මහ නගර සභාව එක්ව සිදුකරන බවත් හෙතෙම සඳහන් කළේය.

හැටන් මධ්‍යම විශේෂ

# ආරුමුගන් තොණ්ඩමන් සංවර්ධන නව පදනමක් ඇරඹේ

ආරුමුගන් තොණ්ඩමන් සමාජ සංවර්ධන පදනම යනුවෙන් නව පදනමක් ආරම්භ කිරීම අගමැති අර්යා ශිරන්ති රාජපක්ෂ මහත්මියගේ ප්‍රධානත්වයෙන් කොටගල පිහිටි ලංකා කම්කරු කොංග්‍රස් මුලස්ථානයේදි (සී. ඩබ්ලිව්. එෆ්.) ආරම්භ කිරීම පෙරේදා (18) දින සිදු කරන ලදී. තම පියා වන දිවංගත ආරුමුගන් තොණ්ඩමන් මහතා විසින් කර ගෙන ගිය සමාජ සංවර්ධන කටයුතු ඉදිරියටත් ගෙන යෑමේ අරමුණ මත මෙම සමාජ සංවර්ධන පදනම ආරම්භ කළ බව වතු නිවාස හා ප්‍රජා සංවර්ධන රාජ්‍ය ඇමති ජීවන් තොණ්ඩමන් මහතා පවසන ලදි. මෙම සමාජ සංවර්ධන පදනම මගින් ඉදිරියේදි වතුකරයේ විවිධ සමාජ සංවර්ධන වැඩ කටයුතු ඉටු කිරීමට පියවර ගන්නා බවද ඔහු වැඩි දුරටත් පවසන ලදි.





රසුල දිල්හාර ගමගේ - උතුරු පළාත් විශේෂ

## අයියනාර් කෝවිලේ පින්කැටය හොරු කඩලා

යාපනය කොකුවිල් ශ්‍රී අයියනාර් කෝවිලේ පින්කැටය පසුගියදා (17) රාත්‍රී කිසියම් පිරිසක් විසින් සොරකම් කොට තිබේ.කෝවිල් බාරකාර මණ්ඩලය මේ පිළිබඳව කොකුවිල් පොලීසියට පැමිණිලි කොට ඇති අතර එම පින්කැටයේ තිබූ මුදල් ප්‍රමාණය කොතෙක්දැයි නොදන්නා බවද ඔවුන් පොලීසියට පවසා තිබේ.යාපනය කොකුවිල් පොලීසිය සිද්ධිය පිළිබදව පරීක්ෂණ පවත්වා ගෙන යයි.

ඇළහැර සමූහ - සරත් වෙලගෙදර

# ඇළහැර වන අලි කරදරෙන් ගම්වාසීන්ට උන් හිටි තැන් අහිමි වෙලා



ඇළහැර සරුබිම, සෑගල, බටුහේන, ජයසිරිපුර යන ගම්මානයට කඩාවදින වන අලින් නිවාස කඩාදමා ගෙවතු වගාවන් විනාශ කිරීම නිසා ගම්වාසීහු අන්ත අසරණ තත්ත්වයට පත්ව සිටිති.
සවස 6 වනවිට ගම්මානවලට කඩාවදින අලින් මාර්ගයේ ගමන්කරමින් නිවාසවල වී කෑමට පුරුදුවී ඇති නිසා තමාට නිවාසවල රැඳී සිටීමටවත් නොහැකි තත්ත්වයට පත්ව ඇතැයි ගම්වාසීහු පවසති.
ගම්මානවලට කඩා වදින වන අලින් පසුගිය දිනවල අත්තනකඩවල යාය 31 ගම්මානයේ ගොවි මහතකුට පහරදී මරා දැමූ අතර යාය 26 ගම්මානයේදි ත්‍රිරෝද රථයකට පහරදී තිබිණි.
මේ අලි කරදරය පිළිබඳ අංගම්මැඩිල්ල වනජීවී අඩවි සහකාර ඩී.එම්.ඒ.එම්. ජිනේස් මහතාගෙන් විමසූ විට හෙතෙම පැවැසුවේ මෙවැන්නකි.
ගම්මානවලට අලි කඩා වැදි නිවාස කඩා දමා ගොවි තැන් විනාශ කරන බව ඇත්ත. අප ගම්මානවලට එන අලි එළවා හරිනවා. එහෙත් අප එලවන අලි නැවත ගම්මානවලට එනවා. මෙයට විසඳුමක් සොයන්න වෙනවා . අප කාර්යාලයෙන් පාලනය වන ග්‍රාමසේවා නිලධාරි වසම් 36ක් තිබෙනවා. එහෙත් සේවය සඳහා ඉන්නේ නිලධාරීන් 8 දෙනයි. අපට ඇති එකම වාහනයේ රියැදුරු ස්ථාන මාරුවක් අරන් ගිහින් දැනට මාස දෙකක් පමණ වෙනවා. තවම රියැදුරකු නෑ.

මස්කෙලිය සමූහ - ගාමිණී බණ්ඩාර ඉලංගන්තිලක

## නල්ලතන්නිය ශ්‍රීපාද ධර්ම මධ්‍යස්ථානය ඉදිරිපස ප්‍රධාන වාහල්කඩ තොරණ විවෘත කළ දා...



නල්ලතන්නිය-ශ්‍රීපාද මාර්ගයේ, නල්ලතන්නිය ශ්‍රීපාද ධර්ම මධ්‍යස්ථානය ඉදිරිපස අභිනවයෙන් ඉදිකරන ලද පියදස් ශ්‍රී ස්වර්ණ ප්‍රධාන වාහල්කඩ තොරණ ශ්‍රීපාදස්ථානයේ මහා සංඝරත්නයේ සහභාගීත්වයෙන් සෙත් පිරිත් සජ්ඣායනා මධ්‍යයේ පසුගියදා (18) විවෘත කෙරිණි.
ශ්‍රීපාදස්ථානාධිපති, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ කුලපති, රත්නපුර දිසාවේ ප්‍රධාන සංඝනායක බෙංගමුවේ ශ්‍රී ධම්මදින්න නායක හිමියන්ගේ අනුශාසනා පරිදි පුෂ්පසිරි ලියනගේ හා නලින් ලියනගේ යන දානපති මහත්වරුන් දෙපළගේ පෞද්ගලික දන පරිත්‍යාගයෙන් දිවංගත තම මව්පියන් දෙපළට පින් පිණිස මේ වාහල්කඩ ඉදිකරළ අතර මේ සඳහා රුපියල් මිලියන 134ක මුදලක් වැය කර තබිණි.

රාගම සමූහ

## උරුමයක අරුමය එළිදැක්වීම උත්සවාකාරයෙන්



සෝලියස් මැන්දිස් නම් අග්‍රගණ්‍ය චිත්‍ර ශිල්පියාගේ සුරතින් සම්බුද්ධ ශාසනයට දායාදවූ ඓතිහාසික කැලණි රාජමහා විහාරස්ථානයේ නිමැවුණු සිතුවම් සියල්ල ඡායාරූප ගතකර ඓතිහාසික වටිනා කමකින් යුත් පිටු 504කින් සමන්විත උරුමයක අරුමය ග්‍රන්ථය එළිදැක්වීම පසුගියදා (8) කැලණි රජමහා විහාරස්ථානයේදී මහා සංඝරත්නය සහ දේශපාලන නියෝජිතයන්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් සිදු කෙරිණි.
වර්ග අඩි 11,000ක් තුළ සිතුවම් කර ඇති සියලුම සිතුවම් ඉමහත් පරිශ්‍රමයක් දරමින් ඡායාරූප ගතකර නව තාක්ෂණය උපයෝගී කර ගනිමින් පැරණි සිතුවම් වලට කිසිදු හානියක් නොවන අන්දමින් මේ උරුමයක අරුමය ග්‍රන්ථය ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ බිතුසිතුවම් සංරක්ෂණ අංශය සහ ඡායාරූප අංශය සමත්වී තිබීම සම්බුද්ධ ශාසනය උදෙසා ඉටුකළ මාහැඟි මෙහෙවරක් යැයි මව් අවස්ථාවට එක්වෙමින් පුණ්‍යානුමෝදනා කළ කැලණි රාජමහා විහාරාධිපති මහාචාර්ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත හිමිපාණන් වහන්සේ පැවැසූහ.
මේ අවස්ථාවට පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් මහාචාර්ය අනුර මනතුංග, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ විශ්‍රාම ලත් පොදුසේවා අධ්‍යක්ෂ එම්.බී. හේරත්, දේශපාලන අධිකාරිය නියෝජනය කරමින් ජාතික උරුම ප්‍රාසාංගික කලා ග්‍රාමීය කලා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය විදුර වික්‍රමනායක, දේශීය වෛද්‍ය ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍ය සිසිර ජයකොඩි, මැටි හා වේවැල් පිත්තල භාණ්ඩ රාජ්‍ය ඇමති ප්‍රසන්න රණවීර, හිටපු අමාත්‍ය විජේදාස රාජපක්ෂ මහත්වරු ඇතුළු පිරිසක් එක්ව සිටියහ.

වජිර පුජිත ගුණවර්ධන - තෙලිජ්ජවිල සමූහ

## රුක් රෝපණ නැකතට ඇමැති ඩලස් පැළයක් සිටුවයි



රටට හුස්ම දින ජාතික රුක් රෝපණ නැකත අප්‍රේල් 16 වැනි දා පූර්ව භාග 6.40ට යෙදී තිබිණි.
එම ජාතික රුක් රෝපණ වැඩසටහනේ කඹුරුපිටිය ආසන වැඩසටහන විදුලි බල අමාත්‍ය ඩලස් අලහප්පෙරුම මහතාගේ සහභාගිත්වයෙන් කඹුරුපිටිය සපුගොඩ ඉලංගම්ගොඩ පුරාණ විහාරස්ථානයේ දී පැවැත්විණි.
එම අවස්ථාවේදී අමාත්‍යවරයා විහාරාධිපති සියම් මහා නිකායේ ශ්‍රී රෝහණ පාර්ශ්වයේ අනුනායක ඔමාරේ කස්සප නාහිමියන් බැහැදැක ආශිර්වාද ලබාගැනීමෙන් අනතුරුව විහාර භූමියේ රන් තැඹිලි පැළයක් රෝපණය කළේය.

ජී.පී.ඒ. වීරසූරිය - බදුල්ල දකුණ සමූහ

## වාඩියගමට යන පාර හදලා දුන්නොත් පින්



රජය ක්‍රියාත්මක කර ඇති ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන කෘෂි නිපැයුම් ප්‍රවාහනයට මනා රුකුලක්. මේ නිසා ගොවි ප්‍රජාවට අවම මිලකට සිය නිපැයුම් අලෙවි ස්ථාන කරා ප්‍රවාහනය කරගත හැකියි. එහෙත් නිසි මාර්ග පහසුවක් නොමැතිවීම නිසා කුරුවිතැන්න,වාඩියගම ගොවීහු සිය කෘෂි බෝග ප්‍රවාහනය සඳහා අධික ප්‍රවාහන වැයක් දරති.
මෙයට හේතුව කුරුවිතැන්න ප්‍රධාන මාර්ගයේ සිට වාඩියගම ග්‍රාමය වෙත ප්‍රවේශ වන මාවත වළ ගොඩැලි සහිත බොරළු-වැලි මගක් වීමයි. මේ දුෂ්කරතාව මග හරවා ගැනීමට කිලෝ මීටර 2ක් පමණ වූ වාඩියගම මාවත කාපට් කරදෙන ලෙස මා මෙ ගම් වැසි ගොවි ප්‍රජාව වෙනුවෙන් රජයෙන් ඉල්ලා සිටිනවා යැයි වාඩියගම පාරම්පරික ගොවි ආර්.එම්. එන් චන්ද්‍රසේන මහතා පවසයි.

රාහුල් සමන්ත හෙට්ටිආරච්චි - අම්බලන්තොට සමූහ

## අම්බලන්තොට ගෙවතු වගාවට කජු පැළ



වැව්ලි කර්මාන්ත හා කුඩා වැව්ලි බෝග සංවර්ධන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන පොකුරු ගම්මාන වැඩසටහන යටතේ අක්කර කාලකට වැඩි සෑම ගෙවත්තක් සඳහා කජු පැළ ලබාදීමේ වැඩසටහන යටතේ අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගෙවතු සඳහා කජු පැළ ලබාදීමේ වැඩසටහන පරිසර අමාත්‍ය මහින්ද අමරවීර මහතාගේ ප්‍රධානත්වයෙන් පසුගිය 18දා අම්බලන්තොට මල්පෙත්තාව ප්‍රදේශයේදී සිදුකෙරිණි.
මෙහිදී අක්කර කාලක වපසරියකින් යුත් ගෙවතු වෙනුවෙන් කජු පැළ 18 බැගින් ප්‍රතිලාභීන් 60 දෙනකුට ලබාදීම සිදුකරන ලදි.

ආනන්ද විජේතිලක - මාවතගම විශේෂ

## යටිවල ශ්‍රී ගුණවර්ධනාරාමයේ තෙල් ඇඹුල් ගෑමේ උත්සවය



මාවතගම යටිවල ශ්‍රී ගුණවර්ධනාරාම විහාරස්ථානයේදී මෙවරත් හිසතෙල් ගෑමේ පුණ්‍ය මහෝත්සවය පැවැත්විණි. එහිදී විහාරාධිපති හුණුපොළ ශාන්තදේව හිමියෝ නැකත් චාරිත්‍ර අනුව ප්‍රථමයෙන් බුදු පිළිම වහන්සේට නානු මුර මංගල්‍යය පවත්වා පැමිණ සිටි දායක පිරිසට හිසතෙල් ගෑම සිදු කළහ.

අම්බලන්ගොඩ සමූහ - ආර්. ඥාණදාස


## වේනමුල්ල ජනසෙත සමිතියේ බක්මහ උළෙල දා...



අම්බලන්ගොඩ වේනමුල්ල ජනසෙත සුබසාධක හා අවමංගල්‍යාධාර සමිතියේ හෙහෙයවීමෙන් දිඹුල්දූව විද්‍යාරතන විද්‍යාලයීය ක්‍රීඩා පිටියේදී පවත්වනු ලැබූ අවුරුදු උත්සවයේදී බනිස් කෑම තරගයේ අවස්ථාවකි මේ.

මැදිරිගිරිය සමූහ - ඩබ්ලිව්. ඒ. පියතිලක

## හිඟුරක්ගොඩ විදුලි රැහැන් කඩා වැටීමෙන් ගම්මාන රැසක විදුලිය බිඳවැටීම්



හිගුරක්ගොඩ ප්‍රදේශයට 16 දින පස්වරුවේ වර්ෂාව සමඟ ඇතිවූ තද සුළං තත්ත්වයක් හේතුවෙන් කිරිමැටිය ගම්මානයේ අධිබලැති (වොට් 33000) විදුලි රැහැන් කණු 5ක් කඩා වැටීම හේතුවෙන් ගම්මාන කීපයකට විදුලිය විසන්ධි වී ඇති බව දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකයේ සහකාර අධ්‍යක්ෂ උපුල් නානායක්කාර මහතා පවසයි.
මෙසේ කඩා වැටී ඇත්තේ හිගුරක්ගොඩ කිරිමැටිය ගම්මානය හරහා ඇති අධිබලැති විදුලි රැහැන් කණු කිපයකි.
එම සුළඟ හෙතුවෙන් දියසෙන්පුර මහතලාකොලවැව ප්‍රදේශයේ නිවාස කිපයකට ද සුළං හෙතුවෙන් සුළු හානි සිදුව ඇති බව දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකයේ සහකාර අධ්‍යක්ෂ උපුල් නානායක්කාර මහතා වැඩිදුරටත් සඳහන් කළේය. ගම්මාන කිපයකට විදුලිය විසන්ධි වීම පිළිබඳ මින්නේරිය ප්‍රාදේශීය විදුලි ඉංජිනේරු කාර්යාලයෙන් විමසීමේදී එහි විදුලි ඉංජිනේරු උදිත රාජපක්ෂ මහතා පවසා සිටියේ කඩා වැටී ඇති විදුලි කණු පැය 24ක් ගත විමට පෙර යථා තත්ත්වයට පත් කර පාරිභෝගික ජනතාවට විදුලිය විදුලිය ලබාදීමට කටයුතු කරන බවයි.

ප්‍රසාද් පූර්ණමාල් - පුත්තලම දිසා සමූහ

## දුම්මලසූරියේ රක්ෂිතයක කසිප්පු තිප්පොළක් වටලයි

දුම්මලසූරිය ගහලගස්වල ප්‍රදේශයේ ඔය රක්ෂිතයක දීර්ඝ කාලයක සිට පවත්වාගෙන ගිය නීති විරෝධී මත්පැන් නිෂ්පාදනාගාරයක් වැටලීමට දුම්මලසූරිය පොලීසියේ නිලධාරීහු පසුගියදා (18) සමත් වූහ.
වැටලීම සිදුකරන අවස්ථාවේ පුද්ගලයන් දෙදෙනකු මත්පැන් නිෂ්පාදනය කරමින් සිට ඇති අතර ඔවුන් දෙදෙනාද සැකපිට අත්අඩංගුවට ගෙන ඇත. මීට අමතරව මොවුන් විසින් නිෂ්පාදනය කරන ලද මත්පැන් බෝතල් දෙසීයක් සමඟ පෙරුම් උපකරණ රැසක්ද අත්අඩංගුවට පත්ව තිබේ. මෙලෙස නිෂ්පාදනය කරන ලද නීති විරෝධී මත්පැන් නුවර,ගම්පහ ,කොළඹ ඇතුළු ප්‍රදේශ කීපයකට බෙදා හැර ඇති බව වාර්තා වේ. සැකකරුවන් සමග මත්පැන් හා උපකරණ කුලියාපිටිය අධිකරණයට ඉදිරිපත් කිරීමට නියමිතය

# ජනපති කළ වැඩ කොටස ගමේ ජනතාව හොඳින් දන්නවා

## රාජ්‍ය ඇමැති ඉන්දික අනුරුද්ධ

**උපාලි කරුණාරත්න**



කවුරු කුමන විවේචන සිදු කළත් ජනාධිපතිවරයා කොපමණ වැඩ කොටසක් සිදු කරනවා ද කියා ගමේ ජනතාව හොඳින් දන්නා බව ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් සහ ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය ඇමැති ඉන්දික අනුරුද්ධ මහතා ප්‍රකාශ කළේය.

රාජ්‍ය ඇමැතිවරයා මේ බව කියා සිටියේ පසුගියදා (11) 'ඔබට ගෙයක් - රටට හෙටක්' ජාතික නිවාස වැඩසටහන යටතේ ගම්පහ දිස්ත්‍රික්කයේ, දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නව නිවාස 05ක් ජනතා අයිතියට පත් කිරීමේ අවස්ථාවට සහභාගී වෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ රාජ්‍ය ඇමැතිවරයා මෙසේ ද කීය.

'පසුගිය කාලයේ රුපියල් ලක්ෂ 15ක මාසික ආදායමක් තිබූ ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව වත්මන් රජය බලයට පත්වීමෙන් පසු එහි මාසික ආදායම රුපියල් ලක්ෂ 1,500ක් දක්වා වැඩි කර තිබෙනවා. වත්මන් විපක්ෂ නායකවරයා එදා නිවාස ඇමැතිවරයාව සිටියදී ඉදි කළේ නිවාස 5,000 පමණ ප්‍රමාණයක්. වත්මන් රජය වසර 1 1/2ට නිවාස 10,000කට වඩා ඉදිකළා.

දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඉහළ මඩම්පැල්ල නැගෙනහිර, පල්ලියපිටිය බටහිර, බෝමුගම්මන උතුර, කෝන්ගොඩමුල්ල බටහිර සහ නැගෙනහිර කළුවාරිප්පුව ප්‍රදේශවලදී මේ නිවාස විවෘත කිරීම් සිදු කළා.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය අනුව, අගමැති මහින්ද රාජපක්ෂ මහතාගේ උපදෙස් මත, ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් සහ ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය මේ ජාතික නිවාස වැඩසටහන ක්‍රියාත්මක කරනවා. මේ වැඩසටහනේ පළමු අදියර යටතේ ග්‍රාමසේවා මට්ටමින් දිවයින පුරා නිවාස 14,022ක් ඉදි කෙරෙනවා. එහි දෙවන අදියර ද මේ වන විට ආරම්භ කර තිබෙනවා.'

මේ අවස්ථාවට ප්‍රාදේශීය දේශපාලඥනයන් ඇතුළු රාජ්‍ය නිලධාරීහු සහභාගි වූහ.

# සංචාරක කර්මාන්තය නංවාලීමට මධ්‍යම ආණ්ඩුව සහ පළාත් පාලන ආයතන ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්මක්

## සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග

**මහින්ද අලුත්ගෙදර**

සංචාරක කර්මාන්තය නංවාලීමට මධ්‍යම ආණ්ඩුව පළාත් සභා සහ පළාත් පාලන ආයතන ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්මක් කඩිනමින් ක්‍රියාවට නැංවීමට රජය පියවර ගෙන තිබේ.

ඒ සඳහා දිස්ත්‍රික් මට්ටමින් සංචාරක ක්ෂේත්‍රයට අදාළව හඳුනාගත් ව්‍යාපෘති රැසක් හඳුනාගෙන ඇතැයි සංචාරක ඇමැති ප්‍රසන්න රණතුංග මහතා සඳහන් කරයි.

මේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට දිවයිනේ සියලුම දිස්ත්‍රික්කවලට සංචාරක අමාත්‍යාංශයේ සහ සංචාරක සංවර්ධන අධිකාරියේ නිලධාරියකු බැගින් නිලධාරීන් දෙදෙනෙකු මේ වන විට නම් කර තිබේ.

එම නිලධාරීන් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව හරහා හඳුනාගත් යෝජනා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව මගින් අමාත්‍යාංශයට යොමු කිරීමෙන් පසු අමාත්‍යාංශය හා සංචාරක සංවර්ධන අධිකාරිය එක්ව ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරීමට සැලසුම් කර ඇතැයි ද ඇමැතිවරයා පෙන්වා දෙයි.

2021 සිංහල හින්දු අලුත් අවුරුද්දෙන් පසුව සංචාරක අමාත්‍යාංශයේ රාජකාරී ආරම්භ කිරීමේ අවස්ථාවට එක්වෙමින් ඇමැතිවරයා මේ බව සඳහන් කළේය. කොළඹ ඇසෙට් ආකේඩ් ගොඩනැගිල්ලේ පිහිටි සංචාරක අමාත්‍යාංශයේ දී මේ උත්සවය පැවැත්විණි.

ඇමැති ප්‍රසන්න රණතුංග මහතා මෙහිදී වැඩිදුරටත් පෙන්වා දුන්නේ පසුගිය කාලයේ ලොව වැඩිම අභියෝගයට මුහුණ දුන්නේ සංචාරක කර්මාන්තය බවයි. කොවිඩ් වසංගතයත් සමග එම කර්මාන්තය සම්පූර්ණයෙන්ම කඩාවැටුණු අතර මේ වනවිට නැවත සංචාරක ව්‍යාපාරය ආරම්භ වෙමින් තිබේ. කොවිඩ් වසංගතය පැවැතිය ද සංචාරක ව්‍යාපාරය නැවත ආරම්භ කෙරුණු රටවල් අතලොස්සෙන් එකක් බවට ශ්‍රී ලංකාව පත්වූයේ ජනාධිපතිවරයා ප්‍රමුඛ වත්මන් ආණ්ඩුව ගෙනගිය වැඩපිළිවෙළ නිසා බවද ඇමැතිවරයා කීය.

රජයේ ඉලක්කය වී ඇත්තේ කොවිඩ් වසංගතයට පෙර තිබූ තත්ත්වයටත් වඩා ඉහළ මට්ටමකට මෙරට සංචාරක ව්‍යාපාරය ගෙන ඒමයි. ඒ සඳහා සංචාරක අමාත්‍යාංශයත්, සංචාරක සංවර්ධන අධිකාරියත් එක්ව කටයුතු කළයුතුයි. සංචාරක ක්ෂේත්‍රයට අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී මධ්‍යම රජයත්, පළාත් සභාවත් පළාත් පාලන ආයතනත් ඒකාබද්ධව කටයුතු කළ යුතුය. රටේ ක්‍රියාත්මක කළ යුත්තේ එක් සංචාරක සංවර්ධන සැලැස්මකි.

ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරන්නේ එම අරමුණ පෙරදැරිව බවද ඇමැතිවරයා මෙහිදී පෙන්වා දුන්නේය. සංචාරක ක්ෂේත්‍රය සියයට 99ක්ම යැපෙන්නේ පෞද්ගලික අංශයෙනි. රජය කළ යුත්තේ ඔවුන්ට අවශ්‍ය සහයෝගය හා පසුබිම සැකසීමයි. නීතිරීති මගින් සංචාරක ක්ෂේත්‍රය ඉදිරියට ගෙන යාමට බාධා ඇති කිරීම රජයේ ප්‍රතිපත්තිය නොවන බව පෙන්වා දුන් ඇමති ප්‍රසන්න රණතුංග මහතා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සෞභාග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්ති රාමුවට අනුව මෙරට සංචාරක කර්මාන්තය පරිසර හිතකාමී දේශීය සංස්කෘතික හිතකර සහ පුළුල් වශයෙන් මහජන සහභාගිත්වයෙන් යුතු කර්මාන්තයක් ලෙස නවීකරණය කරන බවද කීය.

සංචාරක අමාත්‍යාංශයේ ලේකම් එස්.හෙට්ටිආරච්චි, අතිරේක ලේකම් දීපා සන්නසූරිය, ගුවන් සේවා හා අපනයන සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් මාධව දේව සුරේන්ද්‍ර මහත් මහත්මීහු ද මේ අවස්ථාවට එක්ව සිටියහ.


# ලංසු සඳහා ආරාධනයයි (IFB)

**මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය**

## කොළඹ 05 පිහිටි, මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ පවත්නා ගොඩනැගිල්ල නවීකරණය කිරීම - පියවර 1

**කොන්ත්‍රාත් අංකය : SMGJ/ADM/05/01/02**

1. මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය වෙනුවෙන් අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ (MPC) සභාපති විසින් පහතින් විස්තර කොට ඇති පරිදි, **කොළඹ 05 පිහිටි මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ පවත්නා ගොඩනැගිල්ල නවීකරණය කිරීම - පියවර 1** සඳහා සුදුසුකම්ලත් හා නිපුණතාපූර්ණ ලංසුකරුවන් වෙතින්, මුද්‍රා, තැබූ ලංසු කැඳවනු ලැබේ. එහි ඇස්තමේන්තුගත පිරිවැය (වැට් රහිතව) **රුපියල් මිලියන 25 කි.**

   අදළ කාර්යයට, පවත්නා ගොඩනැගිල්ලේ වහල දීර්ඝ කිරීම, වහල ස්ලැබ් ජලරෝදනය කිරීම හා අවශ්‍ය යාන්ත්‍රික හා විදුලිමය සේවා සැපයීම ද ඇතුළත්ව, පළමු මහලේ ලොබි ප්‍රදේශය හා දෙවන මහලේ බැල්කනිය නවීකරණ කටයුතු සම්පූර්ණ කිරීම ඇතුළත් වේ. අදළ කාර්යය, මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත රාජ්‍ය අමාත්‍යාංශයේ එදිනෙද කටයුතුවලට අවහිරතා හා බාධා නොවන අයුරින් සංවිධානය කළ යුතු වේ. අදළ රාජ්‍ය අමාත්‍යාංශයේ හා අනෙකුත් කාර්යාල මෙම ගොඩනැගිල්ලේ පිහිටා ඇති බැවින් නවීකරණ කටයුතු කෙරෙමින් පවත්නා අතරතුර අමාත්‍යාංශයේ කාර්යාල කටයුතු සාමාන්‍ය පරිදි පවත්වාගෙන යාමට හැකි විය යුතු ලෙසට කටයුතු සංවිධානය කළ යුතු වේ.

   අදළ වැඩබිම, කොළඹ 05, ඇල්විටිගල මාවතේ, අංක 561/3, මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශ පරිශ්‍රයේ පිහිටා ඇත.

   අදළ ඉදිකිරීම් කාලය **දින 84 කි**

2. ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාපටිපාටිය තුළින් මෙම ලංසුකරණය පවත්වනු ලැබේ.

3. කොන්ත්‍රාත් ප්‍රදනයට සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අපලේඛනගත වූ අයකු නොවිය යුතු අතර, පහත සඳහන් අවශ්‍යතා සපුරාලිය යුතුය,
   - ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියෙහි (සීඩා) ගොඩනැගිලි ඉදිකිරීම් වැඩ ක්ෂේත්‍රයෙහි C4 හා C5 ශ්‍රේණිවල ලියාපදිංචිය සතුවිය යුතුය.
   - ලංසු මුදල **රුපියල් මිලියන 5.0** ඉක්මවන සෑම ලංසුවක් සඳහාම (පනතේ 2 වන වගන්තිය බලන්න) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතෙහි 8 වන වගන්තිය ප්‍රකාරව පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කළ වලංගු සහතිකයක් සතුවිය යුතුය.

4. කොන්ත්‍රාත් ප්‍රදනයට අවශ්‍ය සුදුසුකම් අතරට මේවාද ඇතුළත්ය.
   - පසුගිය වසර පහ තුළ ඉටුකළ ඉදිකිරීම් කාර්යයන්හි වාර්ෂික පිරිවැටුමේ සාමාන්‍යය අවම වශයෙන් **රුපියල් මිලියන 50 ක්** විය යුතුය.
   - පසුගිය වසර පහ තුළ, ප්‍රධාන කොන්ත්‍රාත්කරු/ උප කොන්ත්‍රාත්කරු ලෙස සමාන ස්වභාවයේ හා සංකීර්ණතාවයේ හා ව්‍යාපෘති වටිනාකම අවම වශයෙන් **රුපියල් මිලියන 25 ක්** හෝ ඊට වැඩි වටිනාකමින් යුත් ගොඩනැගිලි නවීකරණ ව්‍යාපෘතියක් සාධාරණ කාල රාමුවක් තුළ සාර්ථකව සම්පූර්ණ කොට තිබිය යුතුය.
   - තිබිය යුතු අවම ද්‍රවශීල වත්කම් සහ / හෝ ණය පහසුකම් ප්‍රමාණය, මෙම කොන්ත්‍රාත්තුව යටතේ කෙරෙනු ලබන යම් අත්තිකාරම් ගෙවීම් හැර රුපියල් මිලියන 15 කට නොඅඩු විය යුතුය.

5. උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට අවශ්‍ය වැඩිදුර විස්තර, කොළඹ 05, ඇල්විටිගල මාවතේ, අංක 561/3, මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ - සැලසුම් (**දුරකථන - 011-2589087, ෆැක්ස් : 011-2369790, ඊමේල් smjadm@gmail.com**) වෙතින් ලබාගත හැකි අතර, **2021.04.15 දින සිට 2021.04.30 දින දක්වා 09.00 පැය හා 15.00 පැය අතර**, කාලය තුළ, ලංසු ලේඛන පරීක්ෂා කොට බැලිය හැක.

6. ආපසු ගෙවනු නොලබන ගාස්තු ශ්‍රී ලංකා රුපියල් අටදහසක් (රුපියල් 8,000.00) ගෙවීමෙන් හා කොළඹ 05, ඇල්විටිගල මාවතේ, අංක 561/3, මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ, පරිපාලන අංශයේ පරිපාලන නිලධාරී වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් **2021.04.15 දින සිට 2021.05.05 දින දක්වා, 09.00 පැය හා 15.00 පැය අතර,** කාලය තුළ උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කරන ලද සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිලදී ගත හැක. ගෙවීම්, මුදලින්ම කළ යුතු වේ.

7. ලංසු, පිටපතක් සහිතව, කොළඹ 05, ඇල්විටිගල මාවතේ, අංක 561/3, මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය වෙත, **2021.05.07 දින 14.00 පැයට** හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ. අදළ භාර ගැනීමේ කාලය අවසන් වූ වහාම, පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන්ගේ ඉදිරියේ ලැබී ඇති ලංසු විවෘත කරනු ලැබේ.

8. ලංසු, **2021.08.05** දින දක්වා වලංගු විය යුතුය.

9. සියලුම ලංසු සමග, ශ්‍රී ලංකා රුපියල් තුන් ලක්ෂයක් (රුපියල් 300,000.00) වටිනා, කොළඹ 05, ඇල්විටිගල මාවතේ, අංක 561/3, මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් නමට ගත්, **2021.09.02** දින දක්වා වලංගු, ලංසු ඇපකරය බැගින් තිබිය යුතුය.

10. මේ සම්බන්ධ පෙර - ලංසු හමුවක්, **2021.04.28 දින 10.00 පැයට**, කොළඹ 05, ඇල්විටිගල මාවතේ, අංක 561/3, මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ, 02 වන මහලේ, සම්මන්ත්‍රණ කාමරයේදී පැවැත්වීමට නියමිත අතර, එයට පසුව වැඩබිම් චාරිකාවක් සංවිධානය කෙරේ.

    ඉහතින් යොමු කළ ලිපිනය වනුයේ :

**සභාපති,**
**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව (MPC),**
**මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය,**
**අංක 561/3, ඇල්විටිගල මාවත, කොළඹ 05.**



## ජනමාධ්‍ය අමාත්‍යාංශයේ පිළිගැනීමේ නිලධාරී තනතුරෙහි පුරප්පාඩුව සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවීම

ජනමාධ්‍ය අමාත්‍යාංශයේ පුරප්පාඩුව පවතින පිළිගැනීමේ නිලධාරී තනතුර සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතු වේ)

**01. බඳවා ගැනීමේ සුදුසුකම්**

**1.1 අධ්‍යාපන සුදුසුකම් :**

සිංහල / දෙමළ, ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හයකින් (06) අ.පො.ස. සා/පෙළ සමත් වී තිබීම.

සහ

අ.පො.ස. උ/පෙළ විභාගයේදී අවම වශයෙන් විෂයන් එකක්වත් (01) සමත්වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර)

**1.2 වෘත්තීය සුදුසුකම්** : අදළ නොවේ

**1.3 පළපුරුද්ද** : අදළ නොවේ

**1.4 කායික සුදුසුකම්** : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**1.5 වෙනත්** :
I. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
II. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
III. තනතුරකට බඳවාගැනීම සඳහා අවශ්‍ය 1.1 සිට 1.6 දක්වා සඳහන් සියලුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**1.6 වයස**

1.6.1 **අවම සීමාව** – අවුරුදු 18 ට නොඅඩු

1.6.2 **උපරිම සීමාව** – අවුරුදු 30 ට නොවැඩි

**සටහන :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ඉහළම ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් අතුරෙන් කුසලතාවය අනුව පවතින පුරප්පාඩුවලට බඳවාගනු ලැබේ.

සෑම අයදුම්කරුවකුම තනතුරට අදළ සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන දිනයේ හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

**02. බඳවා ගැනීමේ ක්‍රමය** : යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් මගින්

2.1 ලිඛිත විභාගය : අදළ නොවේ

2.2 වෘත්තීය පරීක්ෂණය : අදළ නොවේ

2.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදළ නොවේ

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේදීම සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

| ලකුණු ලබාදෙන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 25 | අදළ නොවේ |
| භාෂා ප්‍රවීනතාවය | 25 | අදළ නොවේ |
| පරිගණක දැනුම | 15 | අදළ නොවේ |
| පළපුරුද්ද | 30 | අදළ නොවේ |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | 05 | අදළ නොවේ |
| **එකතුව** | **100** | **අදාළ නොවේ** |

**03. වැටුප් පරිමාණය** : රු. 27,140 – 10X300 – 11X350 – 10X495 – 10X660 – රු. 45,540/-

**04. සාවද්‍ය තොරතුරු සැපයීම**

මෙම පුරප්පාඩු පිරවීමේදී කිසියම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවකදී ඔහුගේ හෝ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. සේවයට බඳවාගත් පසුවද අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් තොරතුරක්, එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින් වසන් කර ඇති බව පෙනී ගියහොත් ඔහුගේ / ඇයගේ සේවය අවසන් කිරීමටත් රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

**05. අයදුම්පත්‍ර යොමු කිරීම**

තමන් විසින් සකසා ගන්නා ලද අයදුම්පතක් සහ ජීව දත්ත සටහන 2021.05.04 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලේකම්, ජනමාධ්‍ය අමාත්‍යාංශය, ඇසිදිසි මැදුර, අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පසුව ලැබෙන හා තැපෑලේදී සිදුවන ප්‍රමාදයන් සලකා බලනු නොලැබේ. අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ පිළිගැනීමේ නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීම යනුවෙන් පැහැදිලිව සඳහන් කර එවිය යුතුය.

**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි**

**ලේකම්,**
**ජනමාධ්‍ය අමාත්‍යාංශය,**
**ඇසිදිසි මැදුර,**
**අංක 163, කිරුළපන මාවත,**
**පොල්හේන්ගොඩ,**
**කොළඹ 05.**



### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ පහත සඳහන් නම සහ අංකය යටතේ, සමාගමක් සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

**සමාගමේ නම :**
මාර්නි ඉන්ටර්නැෂනල් (පීවීටී) එල්ටීඩී
**ලියාපදිංචි අංක :** පී වී 00236491
**සංස්ථාගත කළ දිනය :** 2021 මාර්තු 13 දින
**ලියාපදිංචි ලිපිනය :**
අංක 395, පරණ නුවර පාර,
දළුගම, කැලණිය, ශ්‍රී ලංකාව.
**අධ්‍යක්ෂක මණ්ඩලය අණ පරිදි**
**මාර්නි ඉන්ටර්නැෂනල් (පීවීටී) එල්ටීඩී**

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ පහත නම සහ අංකය යටතේ, සමාගමක් සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.


**සමාගමේ නම :**
නීට් ආර්. ඕ කන්සල්ටන්ට්ස් (පීවීටී) එල්ටීඩී
**ලියාපදිංචි අංක :** පී වී 00235772
**සංස්ථාගත කළ දිනය :** 2021 මාර්තු 01 දින
**ලියාපදිංචි ලිපිනය :**
අංක 39/73, තෙල්සන් පටුමග, කොළඹ 03,
ශ්‍රී ලංකාව.
**අධ්‍යක්ෂක මණ්ඩලය අණ පරිදි**
**නීට් ආර්. ඕ කන්සල්ටන්ට්ස් (පීවීටී) එල්ටීඩී**

### වාසගම වෙනස් කිරීම

අනුරාධපුර දිස්ත්‍රික්කයේ පණ්ඩුලගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 311, පරසන්ගස්වැව ග්‍රාම සේවා වසමේ අඩුකැටියාව ව්‍යාපෘතිය පරසන්ගස්වැව පදිංචි **උක්කුබණ්ඩලාගේ සිසිර කුමාර** වන මම මින් ඉදිරියට **පියරත්න මුදියන්සේලාගේ සිසිර කුමාර** යන නම භාවිත කරන බව ශ්‍රී ලංකා ජනරජයේ ලක්වාසී සැමටත් මෙයින් දැනුම් දෙමි.

පියරත්න මුදියන්සේලාගේ සිසිර කුමාර

ඔබ සොයන වාහනය තෝරාගන්න බලන්න



ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
**පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය**

### ලංසු සඳහා ආරාධනයයි (IFB)

**වෛද්‍ය සැපයුම් ගබඩාවක් සඳහා, තාවකාලික පදනම මත, ගබඩා ගොඩනැගිල්ලක් (ගොඩනැගිලි) බද්දට ලබාගැනීම**

01. 2021 අප්‍රේල් 1 වන දින දිනමිණ පුවත්පතෙහි පළකරන ලද ලංසු ආරාධනය කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.
02. 8 වන ඡේදයෙහි දක්වා ඇති ලංසු ඉදිරිපත් කිරීමේ අවසාන වේලාව 2021 අප්‍රේල් 27 වන දින 14:00 පැය දක්වා මෙයින් දීර්ඝ කරනු ලැබේ.
03. ඉහත කී ලංසු ආරාධනයෙහි ඇති අනෙකුත් සියලු විධිවිධාන නොවෙනස්ව පවතී.

**ලේකම්,**
**පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය.**

NSB
National Savings Bank

### ජාතික ඉතිරිකිරීමේ බැංකුව

**ටෙන්ඩර් අංකය : NSB/PT/2021/06**

**ප්ලාස්ටික් කැට ප්‍රසම්පාදනය සඳහා වන ටෙන්ඩරය අවලංගු කිරීම**

නොවැළැක්විය හැකි හේතු මත ඉහත ටෙන්ඩරය අවලංගු කරන බව 2021 අප්‍රේල් 06 වන දින ප්‍රකාශයට පත් කරන ලද එම ටෙන්ඩරය කැඳවීමට ප්‍රතිචාර දැක්වීමට අපේක්ෂා කරන නිෂ්පාදකයන් / සැපයුම්කරුවන් / පිළිගත් දේශීය නියෝජිතයන් වෙත ජාතික ඉතිරිකිරීමේ බැංකුව දැනුම් දෙයි.

**සභාපති**
**ආයතනික ප්‍රසම්පාදන කමිටුව - සුළු පරිමාණ,**
**ජාතික ඉතිරිකිරීමේ බැංකුව,**
**අංක 255, ගාලු පාර,**
**කොළඹ - 03.**

# ලංසු සඳහා ආරාධනයයි (IFB)

## තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

# ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

01. ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව වෙනුවෙන්, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (DPC) හි, සභාපති විසින් ආසන්න වශයෙන් රුපියල් මිලියන 12 කට (වැට් බදු හැර) ඇස්තමේන්තුගත කර ඇති සහ පහත උපලේඛනයේ සඳහන් පරිදි වන කාර්ය කර්මාන්තය සඳහා යෝග්‍යතාපූර්ණ හා සුදුසුකම්ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු දැන් භාරගනු ලැබේ.

| අයිතම අංකය | කොන්ත්‍රාත්තුවේ අංකය | ව්‍යාපෘතියේ නම | ඉදිකිරීම් කාලසීමාව දින | අවම ICTAD ලියාපදිංචිය | ආපසු ගෙවනු නොලබන ගාස්තුව (රුපියල්) | ලංසු සුරක්ෂණය (රුපියල්) |
|---|---|---|---|---|---|---|
| 01 | DSD/DEV/04/14/2020 | කොළඹ 07, ටොරින්ටන් හි දැනට පවතින නේවාසිකාගාරය, ෆෙඩරේෂන් ගොඩනැගිල්ල සහ ක්‍රීඩා මණ්ඩපය සඳහා විදුලි කේබල් සැපයීම හා ඇදීම | දින 60 | EM3 (EI-LV) සහ C6 හෝ ඉහළ | 5,000.00 | බැංකු ඇපකරය 180,000.00 හෝ මුදල් තැන්පතුව 90,000.00 |

02. සමස්ත කර්මාන්තය සම්පූර්ණ කිරීමේ කාලසීමාව, ආරම්භක දින සිට දින 60 ක් දක්වා වනු ඇත.

03. කාර්ය වැඩ බිම් කොළඹ 07, ටොරින්ටන් ක්‍රීඩා සංකීර්ණයේ පිහිටා ඇත.

04. කර්මාන්තයට, ප්‍රධාන වශයෙන් මූලික හා ප්‍රාථමික වැඩ කැණීම්, හැරීම් වැඩ, කේබල් සැපයීම හා ඇතිරීම, විදුලි පැනල් පුවරු ස්ථාපනය කිරීම, ජෙනරේටර් කාමරය ඉදිකිරීම, පරීක්ෂා කිරීම හා ක්‍රියාත්මක කර පෙන්වීම අන්තර්ගත වනු ඇත.

05. ලංසුකරණය, ජාතික තරඟකාරී ලංසුකරණ පටිපාටිය යටතේ මෙහෙයවනු ලැබේ.

06. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛන ගත නොවී සිටිය යුතු වන අතර, EM3 (EI-LV) සහ C6 හෝ ඊට ඉහළ ශ්‍රේණි සඳහා ICTAD හි, අදාළ ලියාපදිංචිය ලබා සිටිය යුතුය. සමාන ස්වභාවයේ කර්මාන්ත පිළිබඳව අඩුම තරමින් ව්‍යාපෘති තුනක පසුගිය වර්ෂ 2 ඇතුළත, පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

07. අභිලාෂී ලංසුකරුවන්හට වැඩිදුර තොරතුරු ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ, අධ්‍යක්ෂක (ඉංජිනේරු සේවා) වෙතින් ලබාගත හැකි වන අතර, ලංසු ලිපිලේඛන පහත සඳහන් ලිපිනයේදී රාජකාරී දිනවලදී, පැය 9.00 සිට පැය 15.00 දක්වා අතරතුර පරීක්ෂා කර බැලිය හැකිය.

08. අභිලාෂී ලංසුකරුවන්හට, ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කර ඇති අංගසම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ සරප් වෙත ආපසු ගෙවනු නොලබන රු. 5,000.00 ක ගාස්තුවක් මුදලින් ගෙවීමෙන් හා ඉහත ලිපිනයේ, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, **2021 අප්‍රියෙල් මස 20 වන දින සිට 2021 මැයි මස 11 වන දින දක්වා** පැය 9.00 සිට පැය 15.00 තෙක් මිලදී ගත හැකිය.

09. ලංසු සුරක්ෂණය වශයෙන් වගුවේ සඳහන් පරිදි (රු. 180,000.00) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක පිළිගත් වාණිජ බැංකුවකින් ලබාගත් හෝ ඉදිකිරීම් ඇපකර අරමුදල මගින් ලබාගත් ඇපකරයක් ලෙස හෝ මෙම දෙපාර්තමේන්තුවේ සරප් වෙත මුදල් තැන්පතුවක් ලෙස (රු. 90,000.00 ක මුදල) කොළඹ 07, පිලිප් ගුණවර්ධන මාවතේ, අංක 09 හි, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ, අධ්‍යක්ෂ ජනරාල් නමට ගෙවීමෙන් හෝ ඉදිරිපත් කළ හැකිය. ලංසු සුරක්ෂණය ලංසු විවෘත කරනු ලබන දින සිට දින 119 ක් දක්වා වලංගු විය යුතුය.

10. ලංසු, එම ලංසු විවෘත කරනු ලබන දින සිට දින 90 ක් දක්වා වලංගු විය යුතුය.

11. මුද්‍රා තබන ලද ලංසු, අනුපිටපතකින් යුක්තව, මුල් පිටපත හා අනු පිටපත වශයෙන් සලකුණු කර, පහත ලිපිනයට 2021 මැයි 13 වන දින පැය 1400 ට හෝ ඊට පෙර ලැබෙන සේ භාරදිය යුතුය. ලංසු, ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ, දෙවන මහලේ, ප්‍රසම්පාදන ශාඛාවේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය. ප්‍රමාද ලංසු භාරගනු නොලැබේ. ලංසු එම ලංසු භාරගන්නා අවසාන වේලාව ඉක්මවූ වහාම පැමිණ සිටින ලංසුකරුවන් ඔවුන්ගේ නියෝජිතයින් ඉදිරියේදී විවෘත කරනු ලැබේ.

12. පූර්ව ලංසු හමුවක් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ, බිම් මහලේ පිහිටි, සංවර්ධන ශාඛාවේදී 2021 මැයි මස 04 වන දින පැය 10.00 ට පැවැත්වීමට නියමිතය.

ඉහත සඳහන් ලිපිනය වනුයේ :

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව,**
**අංක 09, පිලිප් ගුණවර්ධන මාවත, කොළඹ 07.**

**දුරකථන : 0112 669884**
**ෆැක්ස් : 0112 669884**

# ලංසු සඳහා ආරාධනය - 2021/1

## පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව

# උතුරු පළාත් සභාව

01. **උතුරු පළාතේ, පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති** විසින් පහත වගුවේ විස්තර කොට ඇති සිවිල් කාර්යයන් සඳහා සුදුසුකම්ලත් යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

02. **ලංසුකරණය ජාතික තරඟකාරී ලංසුකරණ ක්‍රියා පටිපාටිය මගින් මෙහෙයවනු ලබන අතර, පිළිවෙළින් 2020.10.09 හා 2021.01.11 දතම හා අංක 03/2020 හා 03/2020(i) දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ යොදා ගනු ඇත.**

03. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට සාර්ථක ලංසුකරු අසාධු ලේඛන ගත නොවූවකු විය යුතු අතර, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිය සහ පහත ලැයිස්තුගත කොට ඇති සුදුසුකම් අවශ්‍යතාවයන් සපුරා ලිය යුතුය. අමතර විස්තර ලංසුකරණ ලිපිලේඛනවල ලබා දී ඇත.

04. සුදුසුකම් අවශ්‍යතාවයන් ලංසුකරණ ලිපිලේඛනවල 4 වන වගන්තියෙහි දක්වා ඇත. අමතර විස්තර **උපලේඛනය / ලංසුකරණ දත්ත හා කොන්ත්‍රාත් දත්ත (5 වන වගන්තිය)** හි ලබාදී ඇත.

05. අභිලාෂී ලංසුකරුවන්ට, **යාපනය, කන්දර්මඩම්, පලාලි පාර, නො. 280, උතුරු පළාත, ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂ වෙතින් (දුරකථනය : 021-2057108 හා ෆැක්ස් අංක 021-2057109)** වැඩිමනත් තොරතුරු ලබාගත හැකි අතර, ඕනෑම කාර්යාල දිනයක 9.00 පැය සිට 15.00 පැය දක්වා එම ලිපිනයේදීම ලංසුරකණ ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැකිය.

06. **2021.04.21 දින සිට 2021.05.12 දින තෙක් ඕනෑම කාර්යාල දිනයක 9.00 පැය සිට 15.00 පැය දක්වා යාපනය, කන්දර්මඩම්, පලාලි පාරේ, නො. 280, උතුරු පළාත,** ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ, මුදල් ශාඛාව වෙත ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා **රුපියල් තුන්දහස් පන්සියයක (රු. 3,500/-) ආපසු නොගෙවන ගාස්තුවක් මුදලින් ගෙවීමෙන්** අනතුරුව අභිලාෂී ලංසුකරුවන්ට ඉංග්‍රීසි බසින් වන ලංසුකරණ ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය.

07. ලංසු (මුල්පිටපත හා අනු පිටපත) 2021.05.12 දින 10.00 පැයට හෝ ඊට පෙර, **යාපනය, කන්දර්මඩම්, පාලිලි පාරේ, නො. 280, උතුරු පළාත, ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති** වෙත ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. නැතහොත් ගෙනැවිත් භාරදිය යුතුය. ලිපි කවරයේ වම් ඉහළ කෙළවරේ ලංසු අංකය සඳහන් කළ යුතුය. ප්‍රමාදවී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කෙරේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම එම අවස්ථාවට සහභාගි වීමට රිසි ලංසුකරුවන්ගේ නියෝජිතයින් ඉදිරිපිටදී ලංසු විවෘත කරනු ලැබේ.

08. ලංසු පත්‍රිකාවේ (4 වන වගන්තියෙහි) දක්වා ඇති පරිදි ලංසු වලංගු විය යුතුය.

09. සෑම ලංසුවක් සමගම, 9 වන වගන්තියෙහි සඳහන් ආකාරයට ලංසු සුරක්ෂණයක් එවිය යුතුය. ලංසු සුරක්ෂණයේ වටිනාකම සහ වලංගුතාව 5 වන වගන්තියෙහි දී ඇති පරිදි විය යුතුය.

10. පූර්ව ලංසු රැස්වීම, **යාපනය, කන්දර්මඩම්, පලාලි පාරේ නො. 280, උතුරු පළාත,** ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේදී 2021.05.03 දින 10.00 පැයට පැවැත්වේ.

ඉහතින් සඳහන් වූ වගුව මෙසේය.

| ලංසු අංකය | කොන්ත්‍රාත්තුවේ නම | ප්‍ර.ක. | යෝජිත කොන්ත්‍රාත් මිල (රු. මිලියන) | ලංසු සුරක්ෂණයේ වටිනාකම (රු.) හා වලංගුතාව | ඉදිකිරීම් කාලය | අවශ්‍ය CIDA ලියාපදිංචිය |
|---|---|---|---|---|---|---|
| PSDG/RDD/MUL/2021/01 | මුලතිව් දිස්ත්‍රික්කයේ, ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාල සඳහා කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම | දෙ ප්‍ර.ක. | 9.17 | 150,000.00 සහ 2021.08.25 | දින 180 | C 7 හෝ C 6 (ගොඩනැගිලි ඉදිකිරීම්) |

**ප්‍ර.ක : ප්‍රසම්පාදන කමිටුව**

**දෙප්‍රක : දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව**

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව,**
**උතුරු පළාත.**

**දුරකථනය : +94-21-2057108**
**ෆැක්ස් : +94-21-2057109**

**දිනය : 2021.04.19**

# දිවුලපිටිය ප්‍රාදේශීය සභාව

## කොටදෙනියාව සතිපොළ භූමියේ කපා දමා ඇති තේක්ක කඳන් අලෙවි කිරීම සඳහා මිල ගණන් කැඳවීම

| කඳන් අංකය | වර්ගය | දිග (M) | වට (M) | $Dm^3$ | B මිල | වටිනාකම |
|---|---|---|---|---|---|---|
| 1 | තේක්ක | 2.4 | 2.46 | 1056 | 101.14 | 116,917.84 |
| 2 | තේක්ක | 3.1 | 2.00 | 1019 | 101.14 | 103.061.66 |
| 3 | තේක්ක | 2.4 | 1.60 | 489 | 75.99 | 37,159.11 |
| 4 | තේක්ක | 2.0 | 1.56 | 387 | 75.99 | 29,408.13 |
| 5 | තේක්ක | 1.9 | 1.35 | 294 | 71.80 | 21.109.20 |
| 6 | තේක්ක | 1.3 | 1.24 | 171 | 56.99 | 9,745.29 |
| 7 | තේක්ක | 2.5 | 0.84 | 146 | 29.73 | 4,340.58 |
| 8 | තේක්ක | 4.6 | 0.90 | 297 | 30.38 | 9,022.86 |
| 9 | තේක්ක | 1.8 | 0.90 | 116 | 30.38 | 3,524.08 |
| 10 | තේක්ක | 3.0 | 0.85 | 177 | 29.73 | 5,262.21 |
| 11 | තේක්ක | 1.8 | 1.40 | 281 | 66.08 | 18,568.48 |
| 12 | තේක්ක | 3.0 | 2.00 | 955 | 101.14 | 96,588.70 |
| 13 | තේක්ක | 3.2 | 1.60 | 652 | 75.99 | 49,545.48 |
| | | | | | එකතුව | 504,253.62 |

- තේක්ක කඳන් සියල්ලම එක් ගැනුම්කරුවෙකු සඳහා නිකුත් කළ යුතු බැවින් තේක්ක කඳන් සියල්ලටම එක් මිලක් ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.
- මිල ගණන් ඉදිරිපත් කිරීම සඳහා අදාළ අයදුම්පත් සමග ආපසු නොගෙවනු ලබන රු.500.00ක මුදලක් ගෙවීම් කළ යුතුය.
- අදාළ අයදුම්පත් ප්‍රධාන කාර්යාලයෙන් ලබා ගත හැක. එම අයදුම්පත් සම්පූර්ණ කොට 2021.05.06 දින 14.30 පැයට පෙර ප්‍රධාන කාර්යාලයට ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ ටෙන්ඩර් පෙට්ටිය තුළට රැගෙන විත් බහාලිය හැකිය.
- මිල ගණන් විවෘත කිරීම සඳහා 2021.05.06 දින 14.45 පැයට අදාළ ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ නියෝජිතයාට සහභාගී විය හැකිය.
- තෝරාගන්නා ටෙන්ඩර්කරු ඉදිරිපත් කර ඇති සම්පූර්ණ මුදල සතියක් ඇතුළත ප්‍රධාන කාර්යාලයට ගෙවීම් කළ යුතු අතර, දින 14ක් ඇතුළත මිලදී ගත් තේක්ක කඳන් ඉවත් කරගත යුතුය.

| | | |
|---|---|---|
| අයදුම්පත් භාර ගැනීම ආරම්භය | - | 2021.04.22 |
| මිල ගණන් පත් නිකුත් කිරීමේ අවසාන දිනය | - | 2021.05.06 දින 14.30 පැය දක්වා |
| මිල ගණන් විවෘත කිරීම | - | 2021.05.06 දින 14.45 ට |

**සභාපති - ටී.ටී. ඉන්දික ජයසිංහ , දිවුලපිටිය ප්‍රාදේශීය සභාව.**
**ලිපිනය :- ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය සභාව, දිවුලපිටිය.**
**වැඩි විස්තර සඳහා - T.P 0312246275**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

**මහාමාර්ග අමාත්‍යාංශය**

**මාර්ග සංවර්ධන අධිකාරිය**

# ලංසු ආරාධනයයි

1. මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති මාර්ග සංවර්ධන අධිකාරිය වෙනුවෙන් පහත විස්තර කර ඇති වාපෘතිය සඳහා යෝග්‍යතාපූර්ණ ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවා සිටී:-

| කොන්ත්‍රාත් අංකය | කොන්ත්‍රාත්තුවේ නම | ආපතිකතා හැර ඉංජිනේරුවාගේ තක්සේරුව රු මි | ලංසු ආරක්ෂණය (රු.) | කාලය (දින) |
|---|---|---|---|---|
| RDA/DC/ EP/ GOSL/2021/02 | කූල්වාඩි - සෙන්ට්‍රල්කෑම්ප් මාර්ගයේ ඇස්ෆෝල්ට් ඇතිරීම (2+300 - 5+250) | 59.5 | 600,000.00 | 182 |

2. මෙහි වැඩකටයුතුවලට මතුපිට සකස් කිරීම, පදික වේදිකාව ඉදිකිරීම, ගේබියන් වැඩ කටයුතු සහ ඇස්ෆෝල්ට් ඇතිරීම ඇතුළත් වේ.
3. ලංසු කැඳවීම ජාතික තරඟකාරීත්ව ලංසු පටිපාටිය අනුව සිදු කෙරෙනු ඇත.
4. කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා යෝග්‍ය වීමට සාර්ථක ලංසුකරුවා මහාමාර්ග ඉදිකිරීම සම්බන්ධ විශේෂඥතාවයේ C4, C3 සහ ඊට ඉහළ ශ්‍රේණියට අදාළව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ලියාපදිංචි වී සිටිය යුතු ය.
5. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට පහත කාර්යාලවලින් වැඩි දුර තොරතුරු ලබාගත හැකි අතර **2021.04.21** සිට **www.rda.gov.lk** හරහා ලංසු ලේඛන පරීක්ෂා කළ හැකි ය.
   a. අතිරේක පළාත් අධ්‍යක්ෂ (නැගෙනහිර), මාර්ග සංවර්ධන අධිකාරිය, අක්කරෙයිපත්තු
      දු: 067 - 2277428, ෆැක්ස් අංකය: 067 - 2278971
   b. අධ්‍යක්ෂ (ඉදිකිරීම්), 3 වන මහල, "මගනැගුම මහමැදුර", ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
      දු: 011 - 2864388, ෆැක්ස් අංකය:011 - 2861821
6. පූර්ව ලංසු රැස්වීම **2021.04.28 දින පැය 10:00ට** අතිරේක පළාත් අධ්‍යක්ෂ (නැගෙනහිර) කාර්යාලය, මාර්ග සංවර්ධන අධිකාරිය, අක්කරෙයිපත්තු හිදී පැවැත්වෙනු ඇති අතර අවශ්‍ය වන්නේ නම්, ඉන් පසු වැඩ බිම් සංචාරයක් සැලසුම් කළ හැකිය.
7. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **පළාත් අධ්‍යක්ෂ (නැගනහිර), මාර්ග සංවර්ධන අධිකාරිය, අක්කරෙයිපත්තු හෝ අධ්‍යක්ෂ (ඉදිකිරීම්) 3 වන මහල, "මගනැගුම මහමැදුර", 216 ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල** වෙතින් **2021.04.21** දින සිට **2021.05.10** තෙක් **පැය 09:00** සිට **15:00** දක්වා නැවත ගෙවනු නොලබන ටෙන්ඩර් ගාස්තුවක් ගෙවා ඉංග්‍රීසි භාෂාවෙන් සැකසුණු සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිල දී ගත හැකිය.

   **රු.3780.00ක්** වන නැවත ගෙවනු නොලබන ටෙන්ඩර් ගාස්තුව (වැට් සහිත) පහත ගිණුමට තැන්පත් කළ හැකි ය.

   අ) ගිණුමේ නම : අධ්‍යක්ෂ ජනරාල් - මාර්ග සංවර්ධන අධිකාරිය
   ආ) ගිණුම් අංකය : 0000001943
   ඇ) බැංකුවේ නම : ලංකා බැංකුව - ආයතනික ශාඛාව

   1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් පනත අනුව, ටෙන්ඩරය ලබාගැනීමට සමාගම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි වී සිටිය යුතු ය.
8. ලංසු, **2021.09.07** දක්වා වලංගු ලංසු ආරක්ෂණයක් සමග ඉදිරිපත් කළ යුතු ය.
9. ලංසු, පිටපත් දෙකකින් යුතුව, **2021.05.11** දින **පැය 14:00** හෝ එදිනට පෙර **සභාපති, මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රසම්පාදන කමිටුව, අධ්‍යක්ෂ ජනරාල් බාරේ, මාර්ග සංවර්ධන අධිකාරිය, 1 මහල, "මගනැගුම මහමැදුර", ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල** වෙත ලැබෙන්නට සැලැස්විය යුතු ය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම, සහභාගි වීමට අපේක්ෂා කරන ලංසුකරුවාගේ නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කෙරෙනු ලැබේ.
10. ලංසු **2021.08.10** දක්වා වලංගු විය යුතු ය.

**සභාපති**
**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව**
**මහාමාර්ග අමාත්‍යාංශය,**
**ප්‍රසම්පාදන අංශය, 7 වන මහල, "මගනැගුම මහමැදුර",**
**ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.**

දශක ගණනාවක ලුහුඬු දැන්වීම්කරුවන්ගේ විශ්වසනීය වෙළඳපොළ
සිළුමිණ වටපිට
ලුහුඬු දැන්වීම්
පල දරන්න - පළ කරන්න
පියුමි - 011 2 429 383 / ශයනි - 011 2 429 342
රමණි - 011 2 429 347 / සුසන්ත - 011 2 429 343

# ශ්‍රී ලංකාව කොරෝනා වසංගතය පැතිරීම කළමනාකරණය කළ ආකාරය ආශ්චර්යවත්

## එල්.පී.ඊ.සී. ආයතනයේ ඩිප්ලෝමා ප්‍රදානයට එක් වෙමින් මහාචාර්ය සුදන්ත ලියනගේ කියයි

**අනුර ප්‍රේමලාල්**

ශ්‍රී ලංකාව කොවිඩ් 19 හෙවත් නව කොරෝනා වසංගතය කළමනාකරණය කළ ආකාරය ඉතාම ආශ්චර්යවත් බව ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුදන්ත ලියනගේ මහතා ප්‍රකාශ කරයි.

ඒ මහතා මේ බව සඳහන් කළේ ඉකුත් (12) බණ්ඩාරනායක අනුස්මරණ අන්තර්ජාතික සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැති එල්.පී.ඊ.සී. ආයතනයේ ඩිප්ලෝමා ප්‍රදානයට ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගී වෙමින්ය. එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඒ මහතා මෙසේද කීය.

අපිත් කැමැතියි වෙනත් ආකාරයකට අධ්‍යාපනය ලබන අය ඇමැතිමට ලංකාවේ අධ්‍යාපනය හුගාක් වෙනස් ඒ වගේම සෘජුයි. විශ්වවිද්‍යාල වරම් අපේක්ෂිත ප්‍රමාණයට තරම් මෙරට තිබෙන විශ්වවිද්‍යාල ගණන ප්‍රමාණවත් නැහැ. විශ්වවිද්‍යාලවලට ඇතුළත් වන ප්‍රමාණය අඩු නිසා මේ තුළ තරගකාරිත්වයක් තිබෙනවා.

උපාධියක තිබෙන්නේ ක්‍රමික විකාශනයක්. ඒ අනුව පළමු වසර ඩිප්ලෝමා, දෙවන වසර උසස් ඩිප්ලෝමා, තෙවන වසර සාමාන්‍ය උපාධි හා සිවුවන වසර ගෞරව උපාධි තිබෙනවා. රටේ තිබෙන නොනැමෙන සෘජු තත්ත්වය නිසා අපිට විශ්වවිද්‍යාලවලට ඩිප්ලෝමාධාරීන් බඳවා ගැනීමට තිබෙන අවස්ථාව ඉතා කුඩායි. විශේෂයෙන් මම කතා කරන්නේ බාහිර පාඨමාලා ගැන නොවේ අභ්‍යන්තර පාඨමාලා ගැනයි.

එහෙත් මේ රටේ ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනඥයෙක් ලෙස මම විශ්වාස කරනවා අපේ රටේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළත් ඩිප්ලෝමා, උසස් ඩිප්ලෝමා හා උපාධි හා ගෞරව උපාධි කියන මෙම ක්‍රමික විකාශය ලෙස නිර්මාණය වෙනවාට.

මම ඩිප්ලෝමාධාරීන්ට කැමැති වන හේතු හුගාක් තිබෙනවා. වෘත්තීය හා තෘතීයික අධ්‍යාපන කොමිසමේ සාමාජිකයකු ලෙසත් මම ක්‍රියා කරනවා. ඒ නිසා මම හිතනවා මේ රටට ඩිප්ලෝමාධාරීන් හා උසස් ඩිප්ලෝමාධාරිනුත් හුගාක් අවශ්‍යයි කියලා. ඒ නිසා අපේ යුතුකමකුත් තිබෙනවා මෙවැනි අවස්ථාවලට සහභාගි වෙලා ඔබවත් මෙවැනි ඩිප්ලෝමා හා උසස් ඩිප්ලෝමා දෙන ආයතන දිරිමත් කරන්න. මමත් ජාතික පාසලකින් පැමිණි අයෙක්. මේ රටේ ජාතික පාසල් තුන්සිය හතළිස් එකක් තිබෙනවා මේක වහාවහා ප්‍රසාරණය විය යුතුයි කියලා මම විශ්වාස කරනවා. අපි මේ කර්තව්‍යට උරදීලා තිබෙනවා. මේ මාසයේ (28) සිට අපි ආරම්භ කරනවා අලුත් ජාතික පාසල් දහසක් නිර්මාණය කිරීමට. අප අත් කර ගත් අභිමානය සෑම ළමයකුටම ලැබෙන්න අවශ්‍ය යැයි සිතන නිසා.



උපකුලපති මහචාර්ය සුදන්ත ලියනගේ මහතා ඩිප්ලෝමා සහතිකයක් ප්‍රදානය කළ අවස්ථාව. එල්.පී.ඊ.සී. ආයතනයේ සභාපති හා කළමනාකාර අධ්‍යක්ෂ මධුසංඛ සෙනෙවිරත්න මහතා අසල සිටී. ඩිප්ලෝමා ප්‍රදානයන් සඳහා මහාචාර්ය ලක්ෂ්මන් ආර්.වටවල , මහාචාර්ය එච්.එම්. හේරත් යන විද්වත්හුද එක් වූහ.

පසුගිය කාලයේ බැලුවාම අපේ ජීවිත අපේක්ෂාව ඉහළ ගොස් තිබෙනවා. පනහ හැට දශකය බැලුවාම පිරිමි වසර හැටක් කාන්තාවන් වසර හැටහතරක් ජීවත් වුණා. අද මේ ප්‍රමාණය පිරිමියා වසර හැත්තෑ දෙක දක්වාත් කාන්තාවකගේ වයස අවුරුදු හැත්තෑ හය දක්වාත් දීර්ඝ වෙලා තියෙනවා. ඒ අනුව ඉකුත් වසර පනහ තුළ අපේ ජීවිත අපේක්ෂාව වසර දොළහකින් ඉහළ ගොස් තිබෙනවා.

ඒ නිසා ආණ්ඩුවට ප්‍රශ්නයක් වෙලා තියෙනවා. එදා පනස්පහෙන් විශ්‍රාම ගියාට අද පනස් පහ කියන්නේ වයස්ගතවීමක් නොවේ. ඒ නිසා එක්සත් ජාතින්ගේ මිනුම් දණ්ඩ අනුව තරුණයා යනු වයස 18-65ත් අතර අයට. ඒ නිසා විශ්‍රාම ගැන්වීමේ වයස ඉහළ නැංවීමක් තියෙනවා. සමහර බටහිර රටවල නම් නියම වයසක් තීරණය කර නැහැ. සෞඛ්‍ය සම්පන්න නම් ඔබට ඒ වෘත්තියේ රැඳී සිටින්න පුළුවන්. වෛද්‍යවරුන් තමන්ගේ වෘත්තීය කාලය වයස අවුරුදු හැටතුන දක්වා දිර්ඝ කර ගත්තා. ඊට වෛද්‍යවරුන්ගේ හිගයත් බල පෑවා. වයස යන අයගේ ප්‍රමාණය වැඩිවීමත් සමග අපිට කළමනාකරණය වැදගත් වෙනවා. මානව සම්පත් කළමනාකරණය ඊට වැදගත්. මම රසායනික විද්‍යාඥයන් අතළොස්සක් අතුරින් අයෙක්. කොවිඩ්19 හෙවත් නව කොරෝනා වසංගතයත් සමග විද්‍යාව අසමත් වුණා කියලා මම පිළිගන්නවා.

මානව සම්පත් කළමනාකරණයේ හොඳම රීතිය අපිට පැහැදිලි කළේ චාල්ස් ඩාවින්. ඔහුගේ ක්‍රමයට ඉතාම සරල නිගමනයක් තමයි දෙන්නේ. එහිදි දුබලයා පරාජය කොට ප්‍රබලයා නැගී සිටියි. ඔබගේ ප්‍රතිශක්ති කරණය ප්‍රබල නම් ඔබට කිසිම දෙයක් වෙන්නේ නැහැ.

ඔබගේ ප්‍රතිශක්ති කරණය දුබල නම් කොවිඩ්19 වසංගතයත් හැදෙනවා ඉන් මියැදෙන්න තිබෙන ඉඩකඩත් වැඩියි. අපේ බොහෝ දෙනකු මාස්ක් දමන්න කැමැති නැහැ. අපේ විශ්වවිද්‍යාලයෙත් එහෙමයි.

ඇෆ්ලටොක්සීන් කියන එක දියර සෑම ආහාරයකම සෑදෙනවා. මේ විස දීර්ඝ කාලයක් ආහාරයට ගැනිමෙන් විවිධ ලෙඩ රෝග වැලඳිය හැකියි. අපේ රටේ හැසිරෙන්න අපි උදේට පොල් තෙල් භාගයක්වත් බොන ආකාරයටයි. අනතුරුව රාත්‍රියටත් පොල් තෙල් භාගයක් බීලා පසුවදාට පිළිකා හැදිලා ජාතියම අවසානයි කියලා. තව පැත්තකින් කියාගෙන යනවා වනාන්තර ඉවරයි කියලා. ඔක්සිජන් නැතිවෙනවා කියලා. ඔක්සිජන් අපට අවශ්‍ය වෙන්නේ ජනගහනය වැඩිවෙන නිසයි. ලංකාවේ දිනකට ආසන්න ලෙස හාරසිය විස්සක් පමණ මියැදෙනවා. දහසක් දරුවන් ඉපදෙනවා. මෙහිදි මරණත් සමග සලකා බලනවිට හයසීයක් පරතරයක් තිබෙනවා මෙයට තමයි මානව සම්පත් කළමනාකරණය අවශ්‍ය වෙන්නේ.

අපේ හුගාක් වාසනාවන්ත රටක් කොවිඩ් 19 මරණ හුගාක් අඩු රටක්. කොවිඩ්19 ආශ්චර්යවත් ලෙස කළමනාකරණය කළ රටක් ඒකට ක්‍රමවේදයක් තිබුණා. අපි දුරස්ථ භාවය ආරක්ෂාත් කරනවා එය සමහර තැන්වල නැහැ. සමහරු මාස්ක් දානවා සමහරු නැහැ. රට වසා දමලත් තිබෙනවා. සමහර ස්ථාන එසේ කරලත් නැහැ. බස් රථවල මේ නීති රීති බිඳ දමා මිනිසුන් පුරවාගෙන ගමන් කරනවා. මේකට ජානමය ප්‍රශ්නයක් තිබෙනවා. අපි ඇවිල්ලා තියෙන්නේ ඉන්දියාවෙන් නම් ඒ රටේ තමයි ඉහළම කොවිඩ් ආසාදිතයන් වාර්තා වුණේ මීට එන්නතක් නිෂ්පාදනය කරන රටේයි. ඊට අසලින් සිටින අපේ රටේ එහෙම වුණේ නැති නිසා මේ ගැන සිතා බැලිය යුතුයි. මේ ගැන අපි විද්‍යානුකූලව සිතිය යුතුයි. කළමනාකරණයේ නීතිරීති තවත් අලුත් කර සිතනවා නම් නිර්මාණය කරනවා නම් අපේ ප්‍රශ්න තවත් අඩුයි. අපි උගන්වන දේවලට වඩා වැඩිදෙයක් මේ පරිසරයේ තිබෙනවා. ඒ නිසා මෙවැනි ඩිප්ලෝමා හැදෑරීම වැදගත්. මෙතැනින් නතර නොවී අවස්ථාවක් පැමිණියොත් උසස් ඩිප්ලෝමාවක් උපාධියක් හදාරන්න. ඒ වගේම අපේ රටේ වටින දෙයක් තමයි සංස්කෘතිය එහිදි පවුල වැදගත් දරුවන් ඉගෙන ගන්න ගැහැනු ළමයි කසාද බඳින් ප්‍රමාද කරනවා. ඒක අපිට තිබෙන ප්‍රශ්නයක් අපි විශ්වාස කරනවා ගැහැනු දරුවෙකු වසර විසිදෙකක් හා විසිහතත් අතර පළමු දරුවා ප්‍රසූත කළ යුතුයි කියලා. එහෙම වුණොත් රටක ජාන තාටාකය බොහෝම ශක්තිමත්. ඒ නිසා අපි ඊට වෙනම ව්‍යාපෘතියක් හඳුන්වා දෙනවා වසර දහ අටේදී විශ්වවිද්‍යාල ඇතුළත් කිරීම් කරන්න කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරන්නත් බලාපොරොත්තු වෙනවා. අපේ රටේ තමයි වයස්ගතම දරුවන් සිටින්නේ විශ්ව විද්‍යාලවල ඒ අය ඊට පසු කසාද බැඳලා දරුවන් හදන්න කම්මැළියි.

මෙහිදි පිළිගැනීමේ කතාව .එල්.පී.ඊ.සී. ආයතනයේ සභාපති හා කළමනාකාර අධ්‍යක්ෂ මධුසංඛ සෙනෙවිරත්න මහතා සිදුකළ අතර සි.එම්.ඒ ආයතනයේ සභාපති මහාචාර්ය ලක්ෂ්මන් ආර්. වටවල මහතා, වයඹ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පීඨයේ මහාචාර්ය එච්.එම්.හේරත් මහතාද කෙටි දෙසුම් සිදු කළහ. මේ අවස්ථාවට තවත් විද්වත්හු එක්ව සිටියහ.

# කොවිඩ් 19 වසංගතය හමුවේත් විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ඉහළ ගිහින්

**මහින්ද අලුත්ගෙදර**

කොවිඩ් 19 වසංගත තත්ත්වය හමුවේ වුවද ශ්‍රී ලංකාවේ ආර්ථිකයට දැවැන්ත දායකත්වයක් ලබා දෙමින් විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සියයට 13.2 කින් ඉහළ ගොස් තිබේ.

පසුගිය 2020 වසරේ මුල් මාස දෙකේ දී පමණක් ඇමෙරිකානු ඩොලර් මිලියන 1,108 ක මුදලක් විදේශ සේවා නියුක්තිකයන් විසින් මෙරටට ප්‍රේෂණය කර තිබෙන අතර ඊට සාපේක්ෂව මේ වසරේ මුල් මාස දෙකේ දී පමණක් ප්‍රේෂණය කර තිබෙන ප්‍රමාණය අමෙරිකානු ඩොලර් මිලියන 1,255 ක් බව ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කළ නවතම වාර්තාවක් මගින් පෙන්වා දෙයි.

මේ අතර පසුගිය 2020 වසරේ පෙබරවාරි මාසයේ දී පමණක් විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ අමෙරිකානු ඩොලර් මිලියන 527ක් වන අතර ඊට සාපේක්ෂව සියයට 9.9 ක වර්ධනයක් පෙන්නුම් කරමින් මේ වසරේ පෙබරවාරි මාසයේ දී විදේශ සේවා නියුක්තිකයන් ප්‍රේෂණය කර තිබෙන ප්‍රමාණය අමෙරිකානු ඩොලර් මිලියන 580 කි.

මේ වසරේ පෙබරවාරි මාසයේ දී පූර්ව වසංගත මට්ටම දක්වා අපනයන වර්ධනය වීම, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සැලකිය යුතු ලෙස වැඩිවීම සහ දේශීය විදේශ විනිමය වෙළෙඳපොළෙහි ඇති වූ ස්ථාවරත්වය 2021 වසරේ පෙබරවාරි මාසයේ ශ්‍රී ලංකාවේ විදේශීය අංශය කෙරෙහි හිතකර බලපෑමක් ඇතිකර තිබෙන අතර 2021 වසරේ පෙබරවාරි මාසයේ වෙළෙඳ හිඟය මීට වසරකට පෙර වාර්තා වූ මට්ටමේ ම නොවෙනස්ව පැවතුණි. මූල්‍ය ගිණුම සැලකීමේ දී, 2021 වසරේ පෙබරවාරි මාසයේ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළ සහ කොළඹ කොටස් වෙළෙඳපොළ වෙතින් විදේශීය ආයෝජන හා සම්බන්ධ ශුද්ධ ගෙවීම් වාර්තා විය.

2020 ජූලි මාසයේ දී දකුණු ආසියානු කලාපීය සහයෝගිතා මූල්‍ය සංවිධානයේ පහසුකමක් වශයෙන් ඉන්දියානු සංචිත බැංකුව හරහා ලබාගත් එක්සත් ජනපද ඩොලර් මිලියන 400 ක විදේශ විනිමය හුවමාරු පහසුකම කල් පිරීමෙන් අනතුරුව 2020 පෙබරවාරි මාසයේ දී ගෙවා නිමකරන ලද අතර මාසය තුළ දේශීය විදේශ විනිමය වෙළළෙඳපොළ වෙත වූ ශුද්ධ ලැබීම් විනිමය අනුපාතිකය මත ඇති වූ පීඩනය ලිහිල් කර තිබේ.

ක්‍රියාත්මක කරනු ලැබූ නියාමනයන් හේතුවෙන් ශුද්ධ පදනම මත මහ බැංකුවට විදේශ විනිමය අවශෝෂණය කර ගැනීමට අවකාශය සැලසී ඇතැයි ද ශ්‍රී ලංකා මහ බැංකුව පෙන්වා දෙයි.

# සියැට් සමාගම දේශීය ටයර් ඉල්ලුම සම්පූර්ණ කිරීමේ වගකීම කරට ගනී

**මහින්ද අලුත්ගෙදර**

ආනයන සීමාවන් තුළින් විදේශ විනිමය ඉතිරි කර ගැනීමට රජය ගෙන යමින් තිබෙන ජාතික උත්සාහයට තවදුරටත් සහයෝගය දක්වමින් එළැඹෙන ජූනි මාසය වනවිට සියැට් ටර්මිනක් බස් රේඩියල් (TBR) ටයර් සංඛ්‍යාව සියයට 125 කින් වැඩිකිරීමට සියැට් කැලණි හෝල්ඩින්ග්ස් සමාගම කටයුතු කර තිබේ.

ට්‍රක් රථ, ප්‍රයිම් මූවර්ස් සහ බස් රථ සඳහා යොදා ගන්නා සියැට් Winmile AW 10.00 R 20 ප්‍රමාණයෙන් යුතු ටයර් නිෂ්පාදනය අදියර දෙකක් යටතේ ඉහළ දමමින් වසරකට ටයර් 18,000ක නිෂ්පාදන ධාරිතාවය ටයර් 40,200ක් දක්වා වැඩිකරන බවද එම සමාගම සඳහන් කරයි. මෙම නිෂ්පාදනය ඉහළ දැමීමත් සමග මෙම අංශයේ මෙරට ටයර් අවශ්‍යතාවයෙන් සියයට 42 ක ප්‍රමාණයක් සැපයීමට සියැට් සමත්වනු ඇත.

සියැට් Winmile AW ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරන ට්‍රක් බස් රේඩියල් ටයරය වන අතර නිෂ්පාදන ධාරිතාවය වර්ධනය කිරීමට, නිෂ්පාදන පරාසය සහ ගුණාත්මක තත්ත්වය ඉහළ දැමීමට, සමාගම විසින් මීට වසර තුනකට පෙර රුපියල් බිලියන 03 ක මුදලක් ආයෝජනය කර තිබෙන අතර සියැට් සමාගමේ ට්‍රක් බස් රේඩියල් ටයර් නිෂ්පාදනය 2019 අප්‍රේල් මාසයේ සිට ආරම්භ කළ අතර තවත් ටයර් නිෂ්පාදන යන්ත්‍ර තුනක් සවිකිරීමට සමාගම කටයුතු කර ඇත.

මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් සියැට් කැලණි සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂ රවී ඩඩ්ලානි මහතා පෙන්වා දෙන්නේ අපගේ මුල්ම ආයෝජන සැලැස්ම දියත් කරනු ලැබුවේ රජය විසින් තෝරාගත් භාණ්ඩ සඳහා තාවකාලික ආනයන සීමා පැනවීමට පෙර නමුත්, මෙම ආනයන සීමා නිසා වෙළෙඳපොළ ඉල්ලුම සපුරාලීම සඳහා එසේ සීමාකර ඇති ටයර් වර්ගවල සහ ප්‍රමාණයන් වල නිෂ්පාදනය ද වැඩිකිරීමට අඛණ්ඩව කටයුතු කර තිබෙන බවත්ය.



ට්‍රක් සහ බස්රථ ටයර් ආනයන සීමා මේ වනවිට ක්‍රියාත්මක වෙන්නෙ නෑ. නමුත්, පසුගිය වසරේ අගෝස්තු මාසයේ සිට bias-ply සහ TBR ටයර් නිෂ්පාදනය වැඩි කරමින් මෙම අංශයේ ටයර් අවශ්‍යතාවය සියයට 100ක්ම සැපයීමේ හැකියාව සමාගම ලබාගෙන තිබෙනවා. මෙමගින් රටට රුපියල් බිලියන 11ක පමණ විදේශ විනිමයක් ඉතිරිකර ගත හැකියි. මෙම අංශයේ ටයර් නිෂ්පාදනය තවදුරටත් වර්ධනය කිරීම මගින් තවත් විදේශ විනිමය ඉතිරිකර ගැනීමට හැකි වනු ඇතැයි අපට විශ්වාස යැයි ද හෙතෙම සඳහන් කරයි.

ඉහළම බරක් දරා ගනිමින් වැඩිම කිලෝ මීටර් ප්‍රමාණයක් ධාවනය කිරීම සඳහා නිර්මාණය කර තිබෙන සියැට් Winmile AW ටයරය අනිකුත් තරගකාරී ටයර් සන්නාම සමග සැසඳුවිට කිලෝමීටරයක් සඳහා අඩුම පිරිවැයක් ලබාදෙන අතර සියැට් Winmile AW ටයරයේ බර සහ වේග දර්ශකය 146/143K වේ. මනා පාලනයක් පවත්වා ගනිමින් කල්පවත්නා අයුරින් ඉහළම ශක්තියක් සහ කාර්ය සාධනයක් ටයරයට ලැබෙන පරිදි මෙම ටයර් නිෂ්පාදනය කරයි. එසේම, මෙම ටයරයේ තිබෙන සුවිශේෂ කට්ට රටාවට අනුව වැඩිම දුරක් ධාවනය කළ හැකිබව සමාගම සඳහන් කරයි.

සියැට් සමාගම විසින් මේ ආකාරයෙන් ට්‍රක් බස්රථ රේඩියල් ටයර් නිෂ්පාදනය වැඩි කිරීමට සමගාමීව මෝටර් රථවල 12" සිට 14" දක්වා රිම් ප්‍රමාණ සඳහා වන රේඩියල් ටයර් නිෂ්පාදනය ද වැඩි කිරීමට කටයුතු යොදා ඇත. රේඩියල් නිෂ්පාදනය පුළුල් කිරීමේ පළමු අදියරේ දී වසරකට රේඩියල් ටයර් 72,000 ක් අලුතින් එකතුකළ අතර දෙවැනි අදියරේ පුළුල් කිරීම් සමග 2021 මැයි මාසයේ දී සමාගමේ රේඩියල් ටයර් නිෂ්පාදනය වසරකට අළුතින් තවත් රේඩියල් ටයර් 100,000 ක් බව සමාගම සඳහන් කරයි.

මෙරට නිෂ්පාදන අංශය තුළ ඉතාමත් සාර්ථක ඉන්දියා - ශ්‍රී ලංකා ඒකාබද්ධ ව්‍යාපෘතියක් ලෙසින් සැලකෙන සියැට් කැලණි සමාගම ශ්‍රී ලංකාවේ ටයර් නිෂ්පාදන ක්ෂේත්‍රයේ විශාලතම සමාගමයි. සමාගම මේ දක්වා ශ්‍රී ලංකාවේ මෙම ඒකාබද්ධ ව්‍යාපාරය සඳහා සමස්තයක් ලෙස රුපියල් බිලියන 08 ක මුදලක් ආයෝජනය කර තිබේ. සමාගම විසින් මගී මෝටර් රථ, වෑන්, වාණිජ (බයස්-ප්ලයි සහ රේඩියල්) යතුරු පැදි, ත්‍රී රෝද රථ සහ කෘෂි කාර්මික වාහන සඳහා ටයර් මෙරට නිෂ්පාදනය කරයි.

# එමිරේට්ස් ගුවන් සමාගමේ යානාවලින් ශ්‍රී ලංකාවට එන අයට විශේෂ ගුවන් ගාස්තු

**මහින්ද අලුත්ගෙදර**

ශ්‍රී ලංකාවේ සිට සංචාරය කරන සංචාරකයන්ට ප්‍රතිලාභ ලබාදීම වෙනුවෙන් විශේෂ ගුවන් ගමන් ගාස්තු හඳුන්වාදීමට එමිරේට්ස් සමාගම තීරණය කරයි.

ඒ අනුව, එමිරේට්ස් ගුවන් සමාගමේ ප්‍රවේශ පත් මිලදී ගැනීමේ නම්‍යශීලී ප්‍රතිපත්තිය යටතේ මෙම විශේෂ ගාස්තු සහිත ප්‍රවේශ පත් වෙන් කර ගනිමින් ඒවා සැප්තැම්බර් 30 දක්වා භාවිතා කිරීමේ අවස්ථාව මෙන්ම ප්‍රවේශ පත්‍රවල වලංගු කාලය වසර තුනක් දක්වා දීර්ඝ කිරීමේ සහනය පාරිභෝගිකයන්ට සළසාදී තිබේ.

එමගින් සමාගම බලාපොරොත්තු වන්නේ අවිනිශ්චිත කාල පරිච්ඡේදයක් තුළදී ඉතාමත් නම්‍යශීලී සහ විශ්වාසයෙන් යුතුව ගුවන් ගමන් සැලසුම් කිරීමේ අවස්ථාව සිය මගීන්ට ලබාදීමට වන අතර මෙහිදි, එමිරේට්ස් ගෝලීය ජාලයේ සියලු ගමනාන්ත සඳහා මෙම විශේෂ ගාස්තු වලංගු වන අතර ඉකොනොමි පන්තියේ අවම ගාස්තුව රුපියල් 68,700කින් සහ ව්‍යාපාරික පන්තියේ අවම ගාස්තුව රුපියල් 257,500කින් ආරම්භ වන බව එම සමාගම සඳහන් කරයි.

මෙම විශේෂ ගාස්තු වෙන්කර ගැනීම මේ මස 13 වනදා සිට 26 වනදා දක්වා සිදුකළ යුතු බවත් එසේ වෙන්කර ගන්නා ප්‍රවේශපත් මගින් 2021 අප්‍රේල් 16 වනදා සිට සැප්තැම්බර් 30 වනදා දක්වා සංචාරය කළහැකි බවත් සමාගම පවසයි.

මෙම ප්‍රවර්ධන වැඩසටහන යටතේ ලබාදෙන ඉකොනොමි පන්තියේ ආරම්භක ගාස්තු එම සමාගම විසින් ප්‍රකාශයට පත්කර තිබෙන අතර ඩුබායි දක්වා යාමට සහ ඒමට ඇමරිකානු ඩොලර් 342 ක් (රුපියල් 68,700) ද, මිලාන් සඳහා ඇමරිකානු ඩොලර් 654ක් (රුපියල් 131,300) ද, පැරිසිය සඳහා ඇමරිකානු ඩොලර් 644ක් (රුපියල් 129,300) ද, නිව්යෝර්ක් සඳහා ඇමරිකානු ඩොලර් 1,117ක් (රුපියල් 224,200) ද, ටොරොන්ටෝ සඳහා ඇමරිකානු ඩොලර් 1,303ක් (රුපියල් 261,500) සහ නයිරෝබි සඳහා ඇමරිකානු ඩොලර් 966ක් (රුපියල් 193,900) ද වේ.

මෙම ප්‍රවර්ධන වැඩසටහන යටතේ ව්‍යාපාරික පන්තියේ ආරම්භක ගාස්තු ද ප්‍රකාශ කර තිබෙන අතර ඩුබායි දක්වා යාමට සහ ඒමට ඇමරිකානු ඩොලර් 1,283ක් (රුපියල් 257,500) ද, මිලාන් සඳහා ඇමරිකානු ඩොලර් 3,127ක් (රුපියල් 627,600) ද, පැරිසිය සඳහා ඇමරිකානු ඩොලර් 2,860ක් (රුපියල් 574,000) ද, නිව්යෝර්ක් සඳහා ඇමරිකානු ඩොලර් 3,618 ක් (රුපියල් 726,100)ද, ටොරොන්ටෝ සඳහා ඇමරිකානු ඩොලර් 3,654 ක් (රුපියල් 733,300) සහ නයිරෝබි සඳහා ඇමරිකානු ඩොලර් 2,179 ක් (රුපියල් 437,300) ද වේ.

මෙම සියලු ප්‍රවේශපත් වල මිල ප්‍රවේශපත් මිලදී ගන්නා දිනයේ දී තිබෙන විනිමය අනුපාතය අනුව තීරණය වන අතර මෙම විශේෂ ගාස්තු ලබාදීම යටතේ තෝරාගත් ගමනාන්තවලට කිලෝ ග්‍රෑම් 05 ක අමතර භාණ්ඩ රැගෙන යෑමේ දීමනාවක් ද ඇතුළත් වන බව එමිරේට්ස් සමාගම සඳහන් කරයි. මීට අමතරව, එමිරේට්ස් සහ ෆ්ලයිඩුබායිහි, ලෝයල්ටි වැඩසටහන වන එමිරේට්ස් ස්කයිවර්ඩ්ස් මගින් විශේෂ Cash+Miles ගෙවීමේ විකල්පය තුලින් තම සංචාරවලින් උපරිම ප්‍රතිලාභ ලබාගැනීමේ අවස්ථාව මගීන්ට ලබාදෙයි.

ස්කයිවර්ඩ්ස් සාමාජිකයන්ට තමන් එකතු කරගත් ස්කයිවර්ඩ්ස් ලකුණු මගින් ගුවන් ප්‍රවේශපත් ගාස්තුවලින් කොටසක් ගෙවීමේ අවස්ථාව සමාගම විසින් සළසාදී ඇත.

# ඉන්දියාවේ කොවිඩ් රැල්ල දරුණු අතට







## නවදිල්ලිය සතියකට වසා දමයි



## රටවල් රැසක කොවිඩ් ආසාදිතයන්ගේ ගණන ඉහළ නඟී

ඉන්දියාවේ කොවිඩ් ආසාදිතයන්ගේ සංඛ්‍යාව දිනෙන් දින වර්ධනය වෙමින් තිබෙන අතර, පෙරේදා දිනයේ වාර්තා වූ ආසාදිතයන් සංඛ්‍යාව දෙලක්ෂ හැත්තෑපන්දහස ඉක්මවා ඇත. එය මෙතෙක් ඉන්දියාවෙන් වාර්තා වූ වැඩිම ආසාදිතයන් සංඛ්‍යාව වන අතර, ඊට පෙර දින ආසාදිතයන් දෙලක්ෂ හැටදහස ඉක්මවා ගියේය.

නවදිල්ලි අගනුවර ඊයේ (19) මධ්‍යම රාත්‍රියේ සිට ලබන සඳුදා වනතුරු අගුළු ලෑමට පියවර ගෙන ඇති අතර, රට පුරා රෝහල්වල ආසාදිතයන් සඳහා වෙන් කළ ඇඳන් සහ දැඩි සත්කාර අංශවල ඔක්සිජන් ප්‍රමාණවත් නොවන බවත් වාර්තා වේ.

එරටින් වාර්තා වන සමස්ත ආසාදිතයන්ගේ සංඛ්‍යාව කෝටි එකහමාර සීමාව පසු කර ඇතැයි ද වාර්තා වේ.

මේ මොහොතේ අගනුවර වසා නොදැමුවහොත් තත්ත්වය තවත් දරුණු අතට හැරෙනු ඇතැයි නවදිල්ලි ප්‍රධාන ඇමැති අරවින්ද් කෙජ්රිවාල් ප්‍රකාශ කර තිබේ.

මෙවැනි පසුබිමක් පැවැතියද එරට ඇතැම් ප්‍රාන්තවල පැවැත්වීමට නියමිත මැතිවරණ වෙනුවෙන් දේශපාලන පක්ෂ තව දුරටත් දැවැන්ත මහජන රැලි පවත්වමින් සිටින බව ද වාර්තා වේ.

මේ අතර හින්දු ආගමික උත්සවයක් වන කුම්භ මේලා උත්සවයට සහභාගි වූ මිලියන ගණනක බැතිමතුන්ට සති දෙකක කාලයක් නිරෝධායනය වන ලෙස සෞඛ්‍ය අංශ උපදෙස් දී තිබේ.

මේ වන විට ලොවපුරා කොවිඩ්-19 ආසාදිතයන් කෝටි 14ක්, මරණ ලක්ෂ 30ක් වාර්තා වී ඇති අතර, වේගයෙන් ව්‍යාප්ත වෙමින් තිබෙන කොවිඩ්-19 වසංගතය නතර කිරීමට හැකි වන්නේ නිසි ආකාරයට ආරක්ෂක පියවර අනුගමනය කිරීමෙන් පමණක් බව ලෝක සෞඛ්‍ය සංවිධානය දිගින් දිගටම අනතුරු අඟවමින් සිටී.

එන්නත ලබාගත් පුද්ගලයන්ට ද නැවත නැවත රෝගය වැළඳෙන අවස්ථා වාර්තා වී ඇති අතර, එය විකෘති වයිරස් තත්ත්වයක් දක්වා වර්ධනය වී තිබේ.

කොවිඩ් මර්දන එන්නත් සොයා ගනු ලැබුවද එම එන්නත කෙතරම් කාලයක් මිනිස් සිරුරේ පවතින්නේ දැයි යන්න ගැන තවම නිශ්චිතව ප්‍රකාශ කිරීමට කාලය ප්‍රමාණවත් නොවන බවත්, වසංගතය කෙතරම් කලක් පවතී ද එය අඩු වීමට කෙතරම් කලක් ගත වේ දැයි යන්නත් අවිනිශ්චිත තත්ත්වයක පවතින බවත් පර්යේෂකයන්ගේ මතය වී තිබේ.

ලොව වැඩිම කොවිඩ් ආසාදන ඇති අමෙරිකාවේත්, ආසාදන අතින් දෙවැනි මට්ටමේ පසුවන ඉන්දියාවේත්, කොවිඩ් මරණ අතින් දෙවැනි ස්ථානයේ පසුවන බ්‍රසීලයේත් සංඛ්‍යා දත්ත ඉතාම අවදානම් තත්ත්වයක පවතින අතර, පෙරේදා වන විට අමෙරිකාවේ කොවිඩ් ආසාදන 32,404,454ක් ද මරණ 581,061ක් ද, ඉන්දියාවේ ආසාදන 15,061,919ක් සහ මරණ 178,793ක් ද, බ්‍රසීලයේ ආසාදන 13,943,071ක් ද, මරණ 373,442ක් ද වාර්තා වී තිබිණි.

AROUND THE WORLD ලොව වටා





## සිරියාවේ ජනපතිවරණය ලබන මාසේ

සිරියාව ලබන මාසයේ ජනාධිපතිවරණයක් පැවැත්වීමට නියමිත බව එරට පාර්ලිමේන්තුව පවසයි. ජනාධිපති බෂාර් අල් අසාද්ගේ බලය පවත්වා ගැනීමට මෙම පියවර ගෙන ඇතැයි වාර්තා වේ. අඛණ්ඩ ගැටුම් සහ වර්ධනය වන ආර්ථික අර්බුදයක් තිබියදීත් අසාද් මහතා බරපතල ජනතා විරෝධයකට මුහුණ දෙනු ඇතැයි අපේක්ෂා නොකෙරේ. වසර 10 ක යුද්ධයෙන් පසු සිරියානු රජය රටේ විශාල ජනගහනයක් ඇති ප්‍රදේශයක් පාලනය කරයි. යුද්ධයෙන් පුද්ගලයන් 400,000 ක් පමණ මිය ගොස් ඇති අතර, සිරියානුවන්ගෙන් අඩකට වඩා අවතැන් වී ඇත.

වසර හතක ධුර කාලයක් සඳහා සේවය කරන ජනාධිපතිවරයකු සඳහා පැවැත්වෙන ජනාධිපතිවරණය මැයි 26 වනදා පැවැත්වෙන බව කථානායක හමූඩා සබ්බාග් මහතා පැවසීය. මැතිවරණය සඳහා අපේක්ෂිත අපේක්ෂකයන්ට සඳුදා සිට ලියාපදිංචි වීමට අවස්ථාව ලැබී ඇති අතර, විදේශගතව සිටින සිරියානු වැසියන්ට මැයි 20 වනදා තානාපති කාර්යාලවල ඡන්දය ප්‍රකාශ කළ හැකිය. සිවිල් යුද්ධය මධ්‍යයේ සිරියාවේ පවත්වන දෙවැනි ජනාධිපතිවරණය මෙය වේ. සිරියාවේ සහ එක්සත් ජනපදය හා යුරෝපා සංගමය සහ විරුද්ධවාදීන් විසින් ප්‍රජාතන්ත්‍ර විරෝධී යැයි අර්ථකථනය කරනු ලැබූ 2014 ජනාධිපතිවරණයේදී අසාද් මහතා 92% ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගත්තේය.

## බ්‍රිතාන්‍ය අගමැතිගේ ඉන්දීය සංචාරය අවලංගු කෙරේ

බ්‍රිතාන්‍ය අග්‍රාමාත්‍ය බොරිස් ජොන්සන්ගේ ඉන්දීය සංචාරය අවලංගු කර තිබේ. ඉන්දියාවේ වත්මන් කොරෝනා වයිරස් තත්ත්වය හේතුවෙන් එම සංචාරය අවලංගු කළ බව වාර්තාවේ. ඊයේ දිනයට නියමිතව තිබූ එම සංචාරය ලබන සතියේදී සිදු කෙරෙනු ඇතැයි බ්‍රිතාන්‍ය අගමැති කාර්යාලය පවසයි. බ්‍රිතාන්‍යයේ කොවිඩ්-19 ආසාදන ඉහළ මට්ටමක පැවති නිසා බ්‍රිතාන්‍ය අගමැතිවරයා ජනවාරි මාසයේ සිට අවලංගු කරනු ලැබූ දෙවැනි සංචාරය මෙය වේ.



## ප්‍රදර්ශනයක් අතරතුර ගුවන් යානයක් මහ මුහුදේ!

අමෙරිකාවේ ෆ්ලොරිඩා නුවර ගුවන් ප්‍රදර්ශනයක් අතරතුර යාන්ත්‍රික දෝෂයක් හේතුවෙන් ගුවන් යානයක් පසුගියදා අත්ලාන්තික් සාගරයට කඩා වැටී ඇත. දෙවැනි ලෝක මහා යුද්ධ සමයේදී භාවිතයට ගෙන තිබූ මේ පැරණි ගුවන් යානය කොකෝවා බීච් ගුවන් ප්‍රදර්ශනයේදී යුධ ගුවන්යානා පෙළපාළියකට එක්වී තිබිණි. ආපදා කාර්ය මණ්ඩලය වහාම එම ස්ථානයට ගොස් නියමුවා බේරාගෙන තිබේ. ඔහු යහපත් තත්ත්වයේ පසුවන බව වාර්තා වැඩිදුරටත් පවසයි. මුහුදට කඩා වැටුණු බැවින් ගුවන්යානයට හෝ නියමුවාට බරපතළ හානි සිදුවී නැත. ජාතික නාවික ගුවන් කෞතුකාගාරයට අයත් මේ ඇවෙන්ජර් යානය ප්‍රථම වරට එක්සත් ජනපද ටෝර්පිඩෝ බෝම්බකරුවකු ලෙස 1941 දී භාවිතා කරන ලද්දකි.

## පාකිස්තාන අන්තවාදී කල්ලිය ඇපයට ගත් පොලිස් නිලධාරීන් නිදහස් කරයි

පාකිස්තාන අන්තවාදී ඉස්ලාමීය දේශපාලන කණ්ඩායමක් ආරක්ෂක හමුදා අතර ඇති වූ දරුණු ගැටුම් මධ්‍යයේ නැගෙනහිර ලාහෝර් නුවරදී ප්‍රාණ ඇපකරුවන් ලෙස රැගෙන ගිය පොලිස් නිලධාරීන් 11 දෙනෙකු දිනකට ආසන්න කාලයක් රඳවාගෙන සිට නිදහස් කර ඇතැයි එරට අභ්‍යන්තර කටයුතු අමාත්‍යවරයා ඊයේ (19 දා) පැවසීය. දැඩි මතධාරී ටෙහ්රික්-ඊ-ලාබයික් පාකිස්තාන පක්ෂයේ ආධාරකරුවන් උද්ඝෝෂණයක් අතරතුර ඒ අසල පිහිටි පොලිස් ස්ථානයකට පහර දී පොලිස් නිලධාරීන් ප්‍රාණ ඇපයට ගෙන තිබේ. මෙම කණ්ඩායම ඔවුන්ගේ නායක සාද් රිස්වි අත්අඩංගුවට ගැනීමට විරෝධය පළ කරන අතර, මුහම්මද් නබි පිළිබඳ අපහාසාත්මක විකට රූප ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් ප්‍රංසයේ තානාපතිවරයා වහාම පාකිස්තානයෙන් නෙරපා හරින ලෙස අගමැති ඉම්රාන් ඛාන්ගේ රජයට බලපෑම් කරමින් සිටී



## කයිරෝ නුවර දුම්රියක් පීලි පැනීමෙන් 11ක් මියයයි

ඊජිප්තුවේ කයිරෝ නුවරට උතුරින් මගී දුම්රියක් පීලි පැන 11 දෙනෙකු මියගොස් 98 දෙනෙකු තුවාල ලබා ඇතැයි ඊජිප්තු බලධාරීහු පවසති. මෑත කාලයේ එරට දුම්රිය අනතුරු කිහිපයක්ම සිදුවී තිබිණි. මේ අනතුරින් දුම්රිය මැදිරි හතරක් දුම්රිය මාර්ගයෙන් ඉවතට විසිවී ගිය බව දුම්රිය අධිකාරිය නිවේදනයක් නිකුත් කරමින් කියා සිටී. දුම්රිය මැදිරි පෙරළී යෑමෙන් පසු මගීන් ආරක්ෂිතව ඉන් පිටව යන ආකාරය සමාජ මාධ්‍යවල වීඩියෝ හරහා මුදා හැර තිබිණි. අනතුරින් අවම වශයෙන් පුද්ගලයින් 98 දෙනෙකු තුවාල ලබා ඇති බව සෞඛ්‍ය අමාත්‍යාංශය නිවේදනයක් නිකුත් කරමින් කියා සිටී. ගිලන්රථ 60 ක් පමණ එම ස්ථානයට යවා ඇති අතර, තුවාල ලැබූවන් අවට රෝහල් වෙත ගෙන ගොස් තිබේ.

## ප්‍රංසයෙන් පැහැර ගත් දැරිය හමු වෙයි



නැගෙනහිර ප්‍රංසයේදී පැහැරගත් අට හැවිරිදි දැරියක් ඇගේ මව සමඟ ස්විට්සර්ලන්තයේදී සොයාගෙන ඇත. දැරිය සොයා ගෙන ඇත්තේ මායිම් ගම්මානයක් වන සාන්ත ක්‍රොයික්ස් හි අතහැර දමා ඇති කර්මාන්ත ශාලාවක සිටියදීය. දැරිය යහපත් සෞඛ්‍ය තත්ත්වයෙන් හමු වූ බව ප්‍රංස නීතිඥ ෆ්‍රැන්කොයිස් පෙරේන් පැවසීය. ඇගේ මව ලෝලා මොන්ටෙමාගි ස්විට්සර්ලන්ත පොලිස් භාරයට ගෙන තිබේ. දැරිය සිය අත්තම්මාගේ නිවෙසේ සිටියදී පැහැරගෙන ඇතැයි බලධාරිහු පවසති.

වොස්ජස් ප්‍රදේශයේ පූලියර්සහි පිරිසක් විසින් දැරිය පැහැරගෙන ඇති බවත් ඔවුන් ඇය මවට බාර දී ඇති බවත් බලධාරීන් මීට පෙර ප්‍රකාශ කර තිබිණි. පැහැර ගැනීම සිදු වූ දින මව සහ දියණිය ස්විට්සර්ලන්තයට ඇතුළු වී ප්‍රංසයේ දේශ සීමාව අසල එස්ටාවියර්-ලෙ-ලැක් හි හෝටලයක රාත්‍රිය ගත කළ බවට සැක කෙරේ. පසුව ඔවුන් අසල පිහිටි නියුවෙටෙල් නගරයට ගොස් ඇති බවත් එහි දී තවත් රාත්‍රියක් ගත කර ඇති බවත් වාර්තා වේ. දැරිය නැවත ඇගේ අත්තම්මාට බාර දී තිබේ.






## ටෙක්සාස් ප්‍රාන්තයේ වෙඩි තැබීමකින් 3ක් මරුට

ටෙක්සාස්හි ඔස්ටින්හි දී සිදු වූ වෙඩි තැබීමකදී පුද්ගලයන් තිදෙනකු මියගොස් ඇතැයි වාර්තා වේ. පොලිසිය සැකකරු ලෙස හඳුනාගෙන ඇත්තේ 41 හැවිරිදි ස්ටීවන් නිකලස් බ්‍රොඩ්රික් ය. වෙඩි තැබීමෙන් පසු පලා ගිය ඔහු සොයා මෙහෙයුම් ආරම්භ කර තිබේ.

වෙඩි තැබීම සිදු කළ පුද්ගලයා ෂෙරිෆ් කාර්යාලයක හිටපු රහස් පරීක්ෂකයකු වන අතර, ඔහු කුඩා දරුවකුට ලිංගික අතවර කිරීමේ චෝදනාවට ලක්ව සිටියේය. මේ චෝදනාව මත අත්අඩංගුවට ගත් බ්‍රොඩ්රික් රැකියාවෙන් ඉල්ලා අස් වූයේ පසුගිය වසරේදීය.

වෙඩි ප්‍රහාරයට ලක් වූ පුද්ගලයන් අතර කාන්තාවෝ දෙදෙනෙක් ද වූහ. සැකකරු සෙවීම අඛණ්ඩව සිදුවන බැවින් නිවැසියන්ට දිගටම නිවෙසේ රැඳී සිටීමට උපදෙස් දී ඇතැයි වාර්තා වේ.

## දවසේ රාහු කාලය

සවස 03.14 සිට 04.47 දක්වා / අලුයම 03.04 සිට 04.32 දක්වා



සුබසෙත ජ්‍යෙෂ්ඨ කර්තෘ ප්‍රවීණ ජ්‍යොතිෂවේදී **අජිත් ධර්මසිරි**

## දින තත්ත්වය

මේෂ, රවි 07 භාග පුර අටවක තිථිය ලත් කුජ දින ඉර උදාව 06.00 ට ඉර බැසීම 06.19ට පුනාවස නැකත උදේ 06.53න් ගෙවී පුෂ නැකත ලබා පවතී. පුර සතවක තිථිය අලුයම 12.01න් ගෙවී පුර අටවක තිථිය ලබා පවතී. ධෘති යෝගය රාත්‍රී 07.39න් ගෙවී සුබ යෝගය ලබා පවතී. වණිජකරණය අලුයම 12.01න් ගෙවී විෂ්ටිකරණය ලබා එය දහවල් 12.25න් ගෙවී බවකරණය උදා වේ.

විෂ කලාව - නළල / අමෘත කලාව - තනය

මරු සිටින දිශාව - බටහිර / සුබ දිශාව - උතුර

## 2021 අප්‍රේල් 20 කුජ දින හෝරාව ලබා ගෙවී යන අයුරු.

**උදේ**
06.00 - 07.00 දක්වා - කුජ හෝරාව
07.00 - 08.00 දක්වා - රවි හෝරාව
08.00 - 09.00 දක්වා - සිකුරු හෝරාව
09.00 - 10.00 දක්වා - බුධ හෝරාව
10.00 - 11.00 දක්වා - සඳු හෝරාව
11.00 -12.00 දක්වා - සෙනසුරු හෝරාව

**සවස**
12.00 - 01.00 දක්වා - ගුරු හෝරාව
01.00 - 02.00 දක්වා - කුජ හෝරාව
02.00 - 03.00 දක්වා - රවි හෝරාව
03.00 - 04.00 දක්වා - සිකුරු හෝරාව
04.00 - 05.00 දක්වා - බුධ හෝරාව
05.00 - 06.00 දක්වා - සඳු හෝරාව

**රාත්‍රී**
06.00 - 07.00 දක්වා - සෙනසුරු හෝරාව
07.00 - 08.00 දක්වා - ගුරු හෝරාව
08.00 - 09.00 දක්වා - කුජ හෝරාව
09.00 - 10.00 දක්වා - රවි හෝරාව
10.00 - 11.00 දක්වා - සිකුරු හෝරාව
11.00 - 12. 00 දක්වා - බුධ හෝරාව

**අලුයම**
12.00 - 01.00 දක්වා - සඳු හෝරාව
01.00 - 02.00 දක්වා - සෙනසුරු හෝරාව
02.00 - 03.00 දක්වා - ගුරු හෝරාව
03.00 - 04.00 දක්වා - කුජ හෝරාව
04.00 - 05.00 දක්වා - රවි හෝරාව
05.00 - 06.00 දක්වා - සිකුරු හෝරාව

**බබාට නමක්**

උදේ 06.53 දක්වා පුනාවස නැකත උදාවන නිසා කෙ - කො - හ - හි අකුරු ද ඉන්පසුව පුෂ නැකත උදා වන නිසා හෙ - හො - ඩ - අක්ෂර ද දිනට අනුව ක - බ - ග - ඩ අකුරු ද මුල්කොට බබාට නමක් දැමීම සුබයි.




## දවසේ ලග්න පලාපල

### මේෂ ලග්නය -පැවති ගැටලු අවසන් වේ

මේෂ ලග්නය හිමි ඔබට අද දින යහපත් දිනකි. විශේෂයෙන් රවි සිකුරු ලග්නගතව සිටින අද දින චන්ද්‍රයා 04 වැන්නේ ආර්ථික ලාභ, රැකියා ලාභ මෙන්ම ලැබීම් අතින් උසස් තත්ත්වයකි. දැනට තිබූ ගැටලු අවසන් වනු ඇත. නිවසේ කටයුතු නව ප්‍රබෝධයකින් යුතුව කෙරෙන අතර සතුට, සමාදානය අතින් අන් අය සමග සුහදත්වය මතු කෙරෙනු ඇත

### වෘෂභ ලග්නය - දූ දරුවන්ගේ කටයුතු සුබවාදී වෙයි

වෘෂභ ලග්නයට අනුව අද ඔබට සිතේ කනස්සලු බවක් මතු කෙරේ. එහෙත් ලැබීම් අතින් උසස් වනු ඇත. පිටරට සහසම්බන්ධතා මතු කෙරෙන අද දින ලැබීම් අතින් ද යහපත් වනු ඇත. දේපළ හිමිකම් මව් පාර්ශ්වයේ ලැබීම් මතු කෙරේ. විශේෂයෙන් චන්ද්‍රයා 03 වැන්නේ බලවත් වීම තුළ දූ දරුවන්ගේ කටයුතු ද සුබවාදී වනු ඇත.

### මිථුන ලග්නය - ශල්‍යකර්ම විය හැකි දිනක්

මිථුන ලග්නයට අනුව අද ඔබට පෙර පිං මහිමය නිසා ජීවිතය සුරක්ෂිත වන නමුදු හදිසි අනතුරු උපද්‍රවවලින් නම් අඩුවක් නොවේ. හිසට, තුනටියට, යටි බඩට අගුණයි. වැටීම්, තැලීම් මෙන්ම ශල්‍යකර්ම පවා ඒමට පුළුවන. තම ඥාති පාර්ශ්වයෙන් ලැබෙන සහයෝගය නිසා ජීවිතයේ ඉදිරි සැලසුමක් සකස් වනු ඇත. උඩ නැගීම් සුබ නැත. රාත්‍රී කාලයේ ගමන් අවම කරන්න.

### කටක ලග්නය - සිතේ සතුට වැඩි වේ

කටක ලග්නයට අනුව අද දින ඔබට ඉතා සුබයි. චන්ද්‍රයා බලවත්ව ලග්න ගත වීම එම සුබ වීමට හේතු වෙයි. තම මව් පාර්ශ්වයෙන් ලැබීම් මතු කෙරේ. හදිසි ධන සම්පත් උදා කෙරේ. ව්‍යාපාර සඵල වේ. නව ව්‍යාපාරයකට අත ගසයි. කෙසේ නමුදු උදරය ආශ්‍රිත රෝග බහුල කෙරේ. මේ දිනවල තෙල්, සැර, උෂ්ණ කෑම අවම කරන්න. සිතේ පවතින පැහැදිලි බව නිසා නිර්මාණශීලී ශක්තිය උදා කෙරේ.

### සිංහ ලග්නය - ආර්ථික ප්‍රතිලාභ

සිංහ ලග්නයට අනුව අද චන්ද්‍රයා 12 හි සංක්‍රමණය වීම ද ගුරු 07ට හා කුජ 11ට සුබවාදී ආර්ථිකයක් ගොඩනැගේ. ඉංජිනේරු අංශ, තාක්ෂණික අංශ නියෝජනය කෙරෙන වෘත්තීන් නියෝජනය කරන අයට සුබ වෙයි. හදිසි ආර්ථික ප්‍රතිලාභ ඇති කෙරේ. විවාහ සහකරු හෝ සහකාරිය සමග ඉතා ළෙන්ගතුව කටයුතු කෙරෙන අතර දූ දරුවන්ගේ කටයුතු කෙරේ ද වැඩි නැඹුරුවක් දැක්වෙන දිනකි.

### කන්‍යා ලග්නය - සතුරු කරදර බහුල වේ

කන්‍යා ලග්නයට අනුව අද දින ඔබට ඉතා සුබයි. චන්ද්‍රයා 11 හි ආර්ථික ප්‍රතිලාභ. ගුරු 05 ට දරු සම්පත් උදා කිරීම ද පෙන්වයි. සෙනසුරු 05 වැන්නේ අජීර්ණ අපහසුතා ද පෙන්වයි. කුජ 10ට රැකියාවේ ගැටලු කීපයකට මුහුණ දීමට සිදු වේ. තමාට සතුරු කරදර ඇති කෙරේ. මිතුරු වෙසින් එන සතුරන් පිළිබඳ සැලකිළිමත් වන්න.

### තුලා ලග්නය - රැකියා ප්‍රතිලාභ

තුලා ලග්නයට අනුව අද ඔබට ඉතා සුබයි. රැකියාවේ සුබවාදී වෙනසක් පෙන්වයි. ආර්ථික ප්‍රතිලාභ පෙන්වයි. නව රැකියා ප්‍රතිලාභ උසස්වීම් හා ස්ථාන මාරු සුබවාදී ලෙස සිදු වෙයි. ව්‍යාපාරික කටයුතුවල නියැළෙන අයගේ ව්‍යාපාර දියුණු වේ. වියදම අධික කෙරෙන දිනයකි. ඒ සඳහා හදිසි නොසිතූ ආකාරයේ කටයුතු එළඹෙනු ඇත.

### වෘශ්චික ලග්නය - පියාගේ කටයුතු කෙරේ වැඩි නැඹුරුවක්

වෘශ්චික ලග්නයට අනුව අද ඔබට කාර්යබහුල දිනකි. එහෙත් වෙහෙස මහන්සියේ තරමට ප්‍රතිලාභ ලැබේ. වාහන, ඉඩම්, නිවාස ප්‍රතිලාභ ද භූමියේ නව ඉදිකිරීමකට යොමුවන තත්ත්වයක් ද ඇති කෙරේ. තමා තම පියාගේ කටයුතු කෙරේ වැඩි නැඹුරුවක් දක්වන දිනයක් වන අතර තමාගේ ගෘහ ජීවිතයේ කටයුතු අඩාළ වීමක් නිසා පසුතැවෙන තත්ත්වයක් ද පෙනෙන්නට තිබේ.

### ධනු ලග්නය -ආර්ථික ප්‍රතිලාභ

ධනු ලග්නයට අනුව අද ඔබට ලැබීම් අතින් සුබයි. එහෙත් ඉතා අවදානම පවතින්නේ කුජ 7 හි විවාහගත ගැටලු මතු කිරීමට හේතු විය හැකි නිසාය. චන්ද්‍රයා ද 8ට එම අගුණ තව තවත් දෙගුණ තෙගුණ කරන නිසාය. තම ලැබීම් අතර තමාට අහිමි වී තිබූ දේපළක් හෝ කෙනෙකුට දී තිබූ ණය මුදලක් තමා අතට පත්වීමට ඉඩ ඇත. උගුරේ ආසාදන, සෙම ගතිය මතු කිරීමට හේතු වෙයි.

### මකර ලග්නය - යුගදිවි සතුට මතුකෙරේ

මකර ලග්නයට අනුව අද ඔබට නිවසේ උත්සවශ්‍රීයක් උසුලන දිනකි. අවිවාහක අයට මංගල යෝග ඇති කෙරේ. විවාහක අයගේ යුගදිවි සතුට අභිවෘද්ධිය මතු කෙරේ. දූ දරුවන් නිසා සිතට සතුට සැනසුම ඇති වේ. තම එදිනෙදා කටයුතුවල කාර්යබහුලකමක් දක්නට ලැබුණද ඒවා සාර්ථක වීම තුළ සිතේ සතුටට හේතු වෙයි. වියදම් අතින් ශීඝ්‍ර ඉහළ යාමක් පෙන්වන අතර සුපරීක්ෂාකාරී වීම වැදගත් වෙයි.

### කුම්භ ලග්නය - ගුරුවරයකුගේ හමුවක්

කුම්භ ලග්නයට අනුව අද ඔබට ඉතා සැනසුම් සහගත දිනක් වෙයි. ව්‍යාපාර සඵල වන, ආදායම් ඉහළ යන දිනකි. ආගමික කටයුතු රැසක නියැළීමට හැකි වේ. දුරබැහැර කටයුතුවලට යාමට සිදුවන නමුදු ඒ සඳහා තමාට අවස්ථාව නොමිලයේම ලැබෙන අතර ඒ සඳහා ප්‍රතිපාදන ලැබෙනු ඇත. තමාගේ ගුරුවරයකුගේ මුණගැසීම නිසා අනාගත අභිවෘද්ධියකට පසුබිම වැටේ.

### මීන ලග්නය - නැවතුණ කර්මාන්තයක් යළි අරඹයි

මීන ලග්නයට අනුව අද ඔබට දූ දරු සම්පත් හිමිවන අතර තමා අත්හැර දමා තිබූ කර්මාන්තයක් යළි පණගන්වා ක්‍රියාත්මක කිරීමට පෙළඹේ. ඒ සඳහා බොහෝ දෙනෙකුගේ ඇප උපකාර ලැබේ. පිය පාර්ශ්වයේ ඥාතියකුගෙන් ලැබෙන මූල්‍යමය පරිත්‍යාගයක් ඒ වෙනුවෙන් යෙදවීමට වාසනාව උදාවේ. තම ආත්ම ගරුත්වය සුරැකෙන අයුරින් කටයුතු කිරීමට අවස්ථාව උදාවනු ඇත.

# වැවුරුකන්නල විහාරාධිපති දික්වැල්ලේ තිස්ස නාහිමියෝ අපවත් වෙති

**දික්වැල්ල විශේෂ, සහ ලස්ගල සමූහ**


දික්වැල්ල, වැවුරුකන්නල බුදුරජ මහා විහාරාධිපති අමරපුර සිරි සද්ධම්මවංශ මහා නිකායේ අනුනායක ධුරන්ධර, කලාවිදු, ආචාර්ය දික්වැල්ලේ තිස්ස අනු නාහිමියෝ වසර 81ක් ආයු වළඳා, ඊයේ (19) අපවත් වූහ. කෙටි කලක් උන් වහන්සේ රෝගාතුරව සිට ඇත.

1940 මාර්තු මස 19 වැනි දින දික්වැල්ල වැලිහිටියේදී උපන් උන් වහන්සේ, දික්වැල්ලේ කුමාරතුංග මහ විදුහලින් මූලික අධ්‍යාපන ලබා, පසුව දික්වැල්ල උතුර මහා විදුහලට ඇතුළත්ව වැඩිදුර අධ්‍යාපනය ලබා ගත්හ.

වැවුරුකන්නල විහාරාධිපතිව වැඩ සිටි රාජකීය පණ්ඩිත දික්වැල්ලේ විමලතිස්ස නායක හිමිගේ උපාධ්‍යායත්වයෙන් 1950 සැප්තැම්බර් මස 28 වැනි දින උන් වහන්සේ පැවිදි දිවියට ඇතුළත් වූහ. 1961 ජුනි මස 25 වැනි දින කල්‍යාණි සීමාමාලකයේදී උපසම්පදා ශීලයට පත් වූ තිස්ස හිමියෝ ශ්‍රී ලංකා විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ උපාධිධාරියෙකි. 1982 දී එම පිරිවෙනෙහි කෘත්‍යාධිකාරී ධුරයට පත් වූ තිස්ස හිමියෝ පණ්ඩිත දික්වැල්ලේ විමලතිස්ස නායක හිමිගේ අපවත්වීමෙන් පසු එම විහාරස්ථානයේ විහාරාධිපති පදවියට පත් විය. එතැන් පටන් වසර 40ක් වැවුරුකන්නල විහාරස්ථානයේ විහාරාධිපති ධුරය හෙබ වූ උන් වහන්සේ, අමරපුර සිරි සද්ධම්මවංශ මහා නිකායේ අනුනායක ධුරය ද දැරීය.

වැවුරුකන්නල පිරිවෙන් විහාරස්ථානයේ වත්මන් ප්‍රබෝධයට මහත් කැපවීමෙන් කටයුතු කළ උන් වහන්සේ ප්‍රදේශයේ ජාතික, ආගමික සහ සමාජීය කටයුතුවලදී ඉදිරියෙන්ම සිට කටයුතු කළ යතිවරයෙකි.

ආදාහනය පිළිබඳ පසුව දැනුම් දෙන බව දායක සභාව ප්‍රකාශ කරයි.



ඡායාරූපය - දික්වැල්ල විශේෂ



හිසතෙල් ගෑමේ පොළොන්නරුව දිස්ත්‍රික් රාජ්‍ය උත්සවය හිටපු ජනපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ ප්‍රධානත්වයෙන් කදුරුවෙල ජයන්ති මහා විහාරස්ථාන පරිශ්‍රයේදී පැවැත්වූ අයුරු.

උතුරු මැද පළාතේ ප්‍රධාන අධිකරණ සංඝනායක කදුරුවෙල ජයන්ති විහාරාධිපති කදුරුවෙල ධම්මපාල නාහිමිගේ අනුශාසකත්වයෙන්, පොළොන්නරුව නගරාධිපති, උප නගරාධිපති සහ මන්ත්‍රීවරුන් ප්‍රමුඛ කාර්ය මණ්ඩලයේ සංවිධානත්වයෙන් මේ උත්සවය සංවිධාන කර තිබිණි.

ඡායාරූපය - ලංකාපුර සමූහ

# ආර්ථික ස්ථාවරභාවයෙන් රටක ස්වෛරීභාවය ඇති වෙනවා

## මහාචාර්ය මැදගොඩ අභයතිස්ස හිමි

**උපාලි කරුණාරත්න**

කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පිළිබඳව මේ දිනවල ප්‍රකාශ වන අදහස් ජනතාව නොමඟ යවන සුළු ප්‍රකාශ බවත්, ආර්ථික ස්ථාවරභාවයෙන් රටක ස්වෛරීභාවය ඇති වන බවත් මහාචාර්ය මැදගොඩ අභයතිස්ස හිමියෝ පැවැසූහ.

උන් වහන්සේ එසේ ප්‍රකාශ කළේ පැපිලියාන සුනේත්‍රාදේවි මහ පිරිවෙනේදී ඊයේ (19) පැවති ජාතික විද්වත් භික්ෂු සංසදයේ මාධ්‍ය හමුවට සහභාගි වෙමිනි.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ උන් වහන්සේ මෙසේ ද කීහ.

'කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පිළිබඳව ජාතික විද්වත් භික්ෂු සංසදයේ මතය අප පළ කරනවා. මේ සම්බන්ධව පසුගිය දිනවල විවිධ පර්ශ්ව විවිධ මත පළ කළා. කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පාර්ලිමේන්තුවෙන් සම්මත වීමට ඉදිරිපත් කර තිබෙන පනතක්. මේ පනතෙන් මේ රටේ ස්වාධිපත්‍යයට, ඒකීයභාවයට හානියක් වෙයි කියා අදහසක් පසුගිය දිනවල පළ වුණා. එය ඉතාමත්ම වැරදි සහගත ජනතාව නොමඟ යවන සුළු ප්‍රකාශ ලෙස අප මුලින්ම සඳහන් කරනවා.

කොළඹ වරාය නගරය කොළඹ දිස්ත්‍රික්කයේ කොටසක් ලෙස හිටපු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ කාලයේදී ඒ මහතා පැහැදිලි ලෙසම නම් කර තිබෙනවා. මෙය නාගරික සංවර්ධන අධිකාරියට පවරා දී තිබෙනවා. නාගරික සංවර්ධන අධිකාරිය තමන්ගේ ඉඩමක් ලෙස ගැසට් කළ එකක්. ඒ නිසා මෙය චීන කොලනියක් ලෙස නම් කිරීම වැරදියි. මෙහි කොටස් තුනක් තිබෙනවා. ලංකා රජයට, චීනයේ සමාගමට සහ පොදු කොටස පවතිනවා. මේ සියල්ල පාලනය වන්නේ ලංකා රජයෙන් ජනාධිපතිවරයා විසින් පත් කරන කොමිසමක් යටතේ.



රටක ඒකීයභාවය, ස්වාධිපත්‍ය, නිවහල්භාවය රැකෙන්නේ ඒ රටේ පොහොසත් මිනිසුන් සිටියොත් පමණයි. රටක මිනිසුන් ආර්ථික වශයෙන් සමෘද්ධිමත්ව සිටියොත් ඒ රටේ මිනිසුන් යටපත් කරන්න බෑ. සිංගප්පූරුව, ඩුබායි දිහා බලන්න. ආර්ථික ස්ථාවරභාවයෙන් ස්වෛරීභාවය ඇති වෙනවා.

මේ පෝට් සිටි ක්‍රියාදාමයට විරුද්ධ කණ්ඩායම් කවුද? ඔවුන් මෙහෙයවන්නේ කවුරුන්ද? කියන එක පිළිබඳවත් සිතන්න ඕනෑ. පසුගිය දිනවල කොළඹ වරායේ නැඟෙනහිර ජැටිය පිළිබඳව ගැටලු ඇති වූ අවස්ථාවේ එය අදානි සමාගමට නොදිය යුතු බවට ජාතික සංවිධාන පැවැසුවා. මේ රටට හානි වන දෙයක් කවුරු කිරීමට හැදුවත් ඒවාට එරෙහිව අප රට වෙනුවෙන් කටයුතු කරනවා. රටේ සංවර්ධනයට හේතු වන ක්‍රියා විරෝධය දක්වා නතර කර ගතහොත් ගැටලු ඇති වෙනවා. ඉදිරියේදී ලෝක බලවතා බවට පත් වන්නේ චීනය. චීනයත් සමඟ අප කරන ගනුදෙනුව ඇතැම් රටවලට ගැටලුවක් වන්න ඇති.

මේ සම්බන්ධයෙන් කොමිෂන් සභාවක් පත් කරන්න ගත් තීරණය නිවැරදි තීන්දුවක් ලෙස සලකනවා. මෙරට පුරවැසිභාවය තිබෙන වරාය නගරයේ පුද්ගලයන්ට ජනාධිපතිවරණයට, මහා මැතිවරණයට ඡන්දය දිය හැකියි.'

ආචාර්ය මාදුරුඔයේ ධම්මිස්සර හිමි ද මෙහිදී අදහස් දැක්වූහ.

# නිරෝගිමත් වසරක් ප්‍රාර්ථනය කරමින්

## ආදිවාසී නායකයා හිසතෙල් ගල්වමින්......



සිංහල හා දෙමළ අලුත් අවුරුද්දේ හිසතෙල් ගෑමේ චාරිත්‍රය පසුගිය 17 වැනිදා පෙරවරුවේ ආදිවාසී නායකතුමන්ගේ ප්‍රධානත්වයෙන් ආදිවාසී ගම්මානයේදී සිදු කළ අතර, නායකතුමාගේ බාල සහෝදරයකු වන ගුණබංඩියා ඇත්තන්ගේ හිස තෙල් ගල්වා මේ චාරිත්‍රය ආරම්භ කළ අයුරු.

ඡායාරූප - මාපාකඩවැව සමූහ





# බද්දර මල්ල

සතියේ 'තුන පහ' මඩිස්සලේ

# පුංචි පවුල රත්තරන්



මේ අවුරුදු මාසයේදී මා අපේ මහ ගෙදරට දිවෙන පඩිපෙළ නැංගේ දෙවසරකට පමණ පසුවය. එය වෙනදා මෙන් පහසු කටයුත්තක් නොවීය. එදවස නම් අප එහා වංගුවෙන් බසයේ හඬ ඇසෙද්දී පඩිපෙළ බැස ගොස් බසයට නැගුණේ තත්පරයට දෙකටය. මෙදා මට පඩිපෙළ නැග යන්නට මිනිත්තු කිහිපයක්ම ගත විය. ඒ මඟ දෙපසින් වැවී තිබූ රුක් අත්තන පඳුරුවල අතු ඉති ද, බැල තණ පඳුරු ද පඩිපෙළෙන් අඩක්ම අවුරා ගෙන තිබූ හෙයිනි.

ශ්‍රීපාද සමයේදී මා පැයකට යන බස් ගණින ගණින් කළේද අම්මාත් අක්කලාත් සමග එක වැලට වාඩි වී උකුණන් බැලුවේද මේ පඩිපෙළෙහි වාඩි වීගෙනය.

එකල සිංහල අලුත් අවුරුද්ද කිට්ටු වන විට පඩිපෙළ, ඒ අවට හා මුළු ගෙවත්ත ද තණකොළ පඳුරකට හෝ ඉඩක් නොතබා සුද්ද බුද්ද කරන්න අපි පුරුදු වී සිටියෙමු.

අවුරුද්ද ආසන්න වන විට නිවෙසෙහි හුණු පිරියම් කිරීම ද අනිවාර්ය අංගයක් විය.

"මේ වතාවෙ අපි සමර ගාමු. හැමදාමත් වගේ ගාන්නෙ සුදු පාටමනෙ."

අම්මාගේ යෝජනාවට අනුව ඉඳහිට වසරක අපේ නිවෙසෙහි බිත්ති ක්‍රීම් පාටින් වර්ණවත් විණි.

ඒ බිත්ති දැන් දුර්වර්ණ වී ඇත. ඒවා වසර ගණනාවකින් වර්ණ ගන්වා නැත. අවුරුද්ද ආසන්න වූවායැයි මහ ගෙදර බිත්තිවල තීන්ත ආලේප කරන්න, මකුළු දැල් කඩන්න, ගෙවත්තෙහි වල් උදුරා දමන්න දැන් එහි කිසිවකුත් නැත. ඔංචිලි බඳින්න තබා ඔංචිලි පදින්න ද කිසිවෙකුත් නැත.

බිත්තිවල පහළ වාටි සියල්ල පාහේ දියසෙවෙල බැඳීමෙන් කොළ පැහැ ගැන්විලාය.

සෑම තැනකම විසිර ඇත්තේ අවපැහැයමය.

බිත්ති පාමුලින් වහලය සොයා දිවෙන වේ දල්ලක් මා සූරා දැමුවේ අසල වූ කෝටු කැබැල්ලක් අවුලා ගෙනය. මට දැනුණේ හදවත ද ඒ කෝටු කැබැල්ලෙන්ම එක්වර සූරා දැමුණු සෙයකි.

මම නිවෙස වටා ඇවිද බැලුවෙමි. කුස්සියේ වහලයේ උළු කැටයක් බිඳී ඇත්තේ ඒ ආසන්නයේ වූ උසැති බෙලි ගසෙන් ඉදුණු බෙලි ගෙඩියක් වැටීම නිසා විය යුතුය. උළු වහලය මත ලී කැබලි කිහිපයක්ම රැඳී ඇත්තේ අහල පහළ කොලු කුරුට්ටන් අඹ ගසටත් රඹුටන් ගසටත් එල්ල කළ ඒවා වන්නට ඇත.

නිවෙසේ ඉදිරිපස හා පසුපස මිදුල ද පැති මිදුල් දෙකම ද පඩිපෙළ වාගේම වල් බිහිව ඇත. අප බාල කාලයේදී හැම අලුත් අවුරුද්දටම කොණ්ඩ කැවුම් බැදුණේ වම් පැත්තේ මිදුලේ තිබූ විසල් දෙහි ගස යටය. බොහෝ විට කැවුම් බැද්දේ ඇලිස් නැන්දාය.

"මෙතන හොඳයි. මගෙ වැඩේ නිදහසේ කර ගත්තැකි."

ඇය ටකරමක් මත ගල් හෝ ගඩොළු කිහිපයක් පිළිවෙළට තබා ළිපක් ද තනා ගන්නීය.

සමහර විට ඇගේ කැවුම් බැදිල්ල හමාර වන්නේ මහ රාත්‍රියේදීය. මන්ද, අහල පහළ නිවෙස් කිහිපයකටම එහිදී ඇගේ අතින් කැවුම් බැදෙන බැවිනි.

"අනේ ඇලිස් අක්කෙ, මටත් ඔය ගමන්ම කැවුම් ගෙඩි හත අටක් හදා දියන්කො. මට හොඳට කොණ්ඩෙ ගන්ඩ බෑ, ඒකයි."

ඈ පිසූ ඉතා මෙළෙක පැණි කැවුම්වල ප්‍රණීත රසය දැනුදු සිහිපත් කර ගත හැකි තරමිය. කැවුම් පිසින අතරේ ඈ ගැයූ අගේ ඇති පැරණි කවි ද කියූ රස කතන්දර ද කැවුම්වල රසය තව තවත් රස ගැන්වූවා විය යුතුය.

**"දිරන තුරු වහළ පොල් අත්ත නොබඳිති**
**ඉරෙන තුරු රෙද්ද තවෙකක් නොම ගනිති**
**කෙරෙන තුරු යමක් එහි තරම නොදනිති**
**මැරෙන තුරු ඉගෙන ගන්නට දේ තිබෙති."**

ඒ ඇලිස් නැන්දා මෙන්ම මා ද ප්‍රිය කළ ජන කවියකි.

ගමේ ගැහැනුන් කිහිප දෙනකුම එතැනට ඇදී එන්නේ කැවුම් සුවඳ ඔස්සේය.

"කොච්චර වැඩ තිබුණත් රබන් පදේකුත් ගහන්ඩම හිතෙනව. රබන් සද්දයක් නැති අවුරුද්දක් මොකට ද?"

නෝනා පුංචි අම්මා ඇගේ නිවෙසට දිව ගොස් ඇගේම රබාන අපේ මිදුලට ගෙන එන්නේ ආඩම්බරයෙනි. ඇය අපේ අම්මා සොයා දෙන අපේ රබාන ද ප්‍රතික්ෂේප කරන්නීය.

"මේ රබාන වගේ හොඳ අඩක් නෑ, ඔය කොයි රබානකවත්."

රබාන යටින් ගිනි කබලක් තබා රත් කරගන්නා ඇය රබාන හඬවන්නේ අපූරු රංගනයක ද යෙදෙමිනි.

**"හඳුන් කැලේ අපි යන කොට රිළවු පනිනවා**
**එක රිළවෙක් බඩ බැඳ ගෙන පිනුම් ගහනවා**
**පිනුම් ගහනවා**
**තක දොං පිනුම් ගහනවා"**

* * *

"අක්කෙ දැන් ද ආවේ? මෙන්න යතුර. මට මේ දවස්වල වැඩ වැඩි නිසා මිදුල් ටික අතු ගාලා දමන්ඩවත් බැරිවුණා."

එහා ගෙදර රමණී නංගී අපේ ගෙදර යතුර මා අතට පත් කළාය. මේ දිනවල අපේ ගෙදර යතුර ඇත්තේ ඈ අතය. විවේක ඇති විටෙක නිවස ද ගෙමිදුල් ද සුද්ද පවිත්‍ර කරන්න ඈ කැමැත්ත පළ කොට ඇත.

දොර හැර ගෙතුළට ගිය හොත් හිත තවත් ටිකක් කීරි ගැස්සෙනවාට සැකයක් නැත. ඒ හැරුණු විට හැන්දෑවේ හයට අම්මා ද රැගෙන පෞද්ගලිකක රෝහලක වෛද්‍යවරයකු මුණගැසිය යුතුව ඇත. ඒ ඇයගේ කකුලේ ආබාධයට ප්‍රතිකාර ගැනීමටය. එකී වෛද්‍යවරයාට දිනයක් සහ වේලාවක් වෙන් කරගත්තේ ද අසීරුවෙනි.

"නෑ කමක් නෑ... අනිත් දවසෙ ආවම දොර අරිනව. දැන් වෙලාවක් නෑ නංගි."

මම යතුර නැවත ඇය අතට පත් කොට ආපසු හැරෙමි.

මිදුලේ පිරී තිබූ අඹ කොළ ද, කොස් කොළ ද, රඹුටන් කොළ ද පෑගීමෙන් මට ඇසුණු කර කර හඬ නැවතත් මගේ සිත පීරි ගා දැම්මේය. හරියට තියුණු ආයුධයකින් කොනහන්නා සේය.

පඩිපෙළ පහළ මා එන තුරු අම්මා රැඳී සිටියාය. කකුලේ ආබාධය නිසා ඇයට පඩිපෙළ නැඟීම අසීරුය. ඈ එහි නොයෑම වඩාත් හොඳය. මේ අම්මාත් තාත්තාත් බොහෝ දුක් විඳ තනා ගත් නිවහනය. මහා ලොකු ගෙයක් නොවූව ද අප සියලු දෙනා එකතුව සතුටත්, ශෝකයත් එකා වන්ව බෙදා හදා ගත් අපේ මහ ගෙදරය.

ඔවුන් දෙදෙනා දරුවන් සිව්දෙනකු සමඟ ප්‍රාර්ථනා කන්දරාවක් පුරවා තබා ගෙන ජීවත් වූයේ මේ නිවෙස තුළය.

ඒ මහ ගෙදර රැඳෙන්න සිතේ ඇල්ම තිබුණා වුණත් කිසිවකුටත් ඉස්පාසුවක් නැත. තාත්තාගේ වියොවින් පසුව අම්මාට එහි තනිව රැඳී සිටීම ද අසීරු කටයුත්තකි. අපේ අම්මාගේ මුනුපුරු මිනිපිරියන් අතළොස්සට ද එසේමය.

සියල්ලෝ එක හැල්මට දිවි ගමනේ දුවමින් සිටිති.

"මට හරියටම මුනුපුරාලා දුසිමයි. මිනිපිරියො දුසිමයි."

දැනට වසර පහළොවකට පෙර මළවුන් අතරට ගිය අපේ ආච්චි අම්මා නිතර එසේ පැවසූවාය.

එහෙත් අපේ අම්මාට සිටින්නේ මුනුපුරු මිනිපිරියන් සත් දෙනෙක් පමණකි. ඉනුත් තිදෙනෙක්ම මුහුදෙනුත් එතෙරය.

ඉදින් මේ මහ ගෙදර කවුරු රැඳෙන්න ද?

'පුංචි පවුල රත්තරන්.'

අප පාසල් යන අවධියේදී ගුවන් විදුලිය තොරතෝංචියක් නොමැතිව කෑගැසූ හැටි මට සිහි වේ. අපේ පාසල් බසයේ ද තුන් හතර පොළකම එවැනි ස්ටිකරයක් අලවා තිබිණි.

රට පුරා මහ ගෙවල් අප්‍රමාණ සංඛ්‍යාවක් එලෙස පාළු වී යන්න ඇත්තේ ඒ වචන තුනෙහි බලමහිමයටයැයි මට නොයෙක් වර සිතේ.

**සුනිලා විජේසිංහ**



# ඒදා අවුරුදු සිරිත්-විරිත්

ගෙමිදුලේ අඹ ගහේ කොළතුරින් කොවුලාගේ මියුරු කූජනය නැඟෙයි. මැනවින් සුසර කරන ලද මියුරු මීයැසියක් සේ ගම් නියම්ගම් සිසාරා නැඟෙන කොවුල් නද සිංහල අවුරුද්දේ අසිරිය නිම නොවූ වග අපට සිහිපත් කරයි. සිංහල අවුරුද්ද සංකේතවත් කරන විවිධ පරිසර සකේතාදියෙන් අද වන විට ඉතිරිව ඇත්තේ සුමියුරු කොවුල් රාවය පමණකැයි විටෙක මට සිතෙයි. සෙසු සියලු සංකේතාදිය මෙන්ම සිරිත් විරිත් ආදිය ද අවුරුදු ආකල්ප ද කාලය, සමාජ ආකල්ප හා තාක්ෂණය තුළ විපරිණාමයට බඳුන් වී ඇත්තේය.

අද සිංහල අවුරුදු උදා වන බව කියන්න ඇසෙන්නේ රතිඤ්ඤා හඬය. එය විටෙක යුද්ධයකදී ඇසෙන වෙඩි හඬ සේය. විටෙක අවට ඇති සද්දන්ත කඳු හෙල් පිපිරී යන්නා සේය. පත්තු කරන දරුවන්ට ද බොහෝ හානි සිදු වෙයි. ඇස් පෙනීම අහිමි වීම, ඇඟිලි අහිමි වීම් ආදි ආබාධ බොහෝය. පරිසරයේ වෙසෙන කුරුල්ලන් ආදී සියුම් ශ්‍රවණේන්ද්‍රියන් ඇති සතුන්ට සිදු වන ශ්‍රවණාබාධ ගණනය වන්නේ ද නැත. එබැවින් අද කාලයේ අවුරුද්ද පරිසර හිතකාමී නොවන බව කියන්න වන්නේ කනගාටුවෙනි.

එහෙත් අතීත ගමේ තිබුණේ උණ වෙඩි පත්තු කිරීමයි. සකසා ගත් උණ ලීයකට පිඹ දැල්වීමෙන් උණ වෙඩි පත්තු කෙරිණි. ළමයින්ට උණ වෙඩි අනාරාක්ෂිත යයි කල්පනා කළ වැඩිහිටියෝ උණ වෙඩි පත්තු කරන්නට ළමයින්ට ඉඩ නුදුන්හ. ළමයින්ට තිබුණේ බීරංගයයි. එය යකඩමය අත්දණ්ඩක් සහිත යකඩයකි. එයට වඩිබෙහෙත් දමා කූරකින් වසා ගලක් මත වේගයෙන් ගැසූ විට වෙඩි හඬ නිකුත් වෙයි.

එදවස අවුරුදු උදාවන්නට පෙර ගම් ගෙවල් කලඑළි කිරීම සිදුවෙයි. දිගු රිටකට කැප්පිටියා අතු තබා බැඳ, බිත්ති, වහල මකුළු දැල් කඩා පිරිසිදු කිරීම සිදු වේ. උදෑසනින්ම එළ ගොම සපයාගන්නා ගෘහිණිය ගෙමැද්දේ ගොමගායි. ළිප්බොක්ක ද පිරියම් කොට ගනියි. ගෙයි බිත්තිවල සුණු පිරියම් කෙරෙයි. මැටි ආලේපිත ගෙයක් නම් කිරි මැටි ගා ඔප දැමෙයි.

අවුරුදු උදා වන විට ගොවි ගෙදර ගෘහිණියට නැවුම් හැළිවළං ඇවැසි වෙයි. සිංහල අවුරුද්දට නැවුම් මුට්ටි, ඇතිලි, නැඹිලි, මැටි කෝප්ප ආදිය සිය කරත්තයේ පුරවාගෙන, එහෙමත් නැත්නම් කත් බැඳගෙන වළං කරත්තකාරයා හෝ කත්කාරයා ගමට එන බැවින් එහි අපහසුවක් ද නැත. ගමගෙදර දරු දැරියන්ට කුඩා කෙළි වළන් ද එහි ඇති බැවින් දරුවෝ ද සතුටු වෙති. ගෙදර පිහි, වප් පිහි, කැති, මන්නා, පුවක් කපන පිහි ආදිය අවුරුදු සමයේ මුවහත් තැබෙයි. ඉතින් ගමේ යමන්නාට ද වැඩ වැඩි කාලයකි.

අවුරුදු සමයේ නෑගම් යන විට තෑගි දෙන්නට මෙන්ම නෑගම් එන විට තෑගි දෙන්න ද රෙදි පෙරෙදි ඇවැසි වෙයි. ගෙදර ළමා ළපටීන්ට ද රෙදි පිළි ඇවැසිය. මේ වුවමනාවන් සපුරන්නට මුස්ලිම් වෙළෙන්දා රෙදි පෙරෙදි පමණක් නොව ළමිස්සියන් ප්‍රිය කරන සබන්, පුයර ආදිය ද රැගෙන ගෙට ගොඩ වෙයි.

එදවස ගමේ නැකැත්රාල අවුරුදු නැකැත් සීට්ටුව සකස් කර ගෙන ගමේ ගෙවල්වලට බෙදන සිරිතක් තිබිණි. ගමේ හැමෝ ම අවුරුදු තෑගිබෝග රැගෙන අවුරුදු සමයේ නැකැත් රාලගේ නිවෙසට ගියහ. නැකැත් රාල බෙදන නැකැත් සීට්ටුවේ මුලින්ම තිබුණේ තෙල් වළං ළිප තැබීමේ නැකැතයි. මේ වන විට ගෘහිණිය ඒ සඳහා ඇවැසි පිටි කොටාගෙන කිතුල් පැණි ආදිය රැස් කරගෙන සිටින්නී ය. නැකැතට අනුව කොණ්ඩ කැවුම් පිසින විට පිසින මුල්ම කැවුම කෝඳුරු කැවුමයි. කැවුම් පිසින තැනට ආසන්නයෙන් එල්ලා තැබෙන එහි අයිතිය කෝඳුරුවන්ටය.

කොණ්ඩ කැවුම්වලට අතිරේකව මුං කැවුම්, අතිරස, කොකිස්, ආස්මී ආදිය වත් පොහොසත්කම්වලට අනුරූපව පිසගැනේ. වැඩ කටයුතුවලට යෝග්‍ය නොවන කාලයක් සේ සැලකෙන නොනගතයේ දී ගෘහිණිය ළිප නිවා අස් කොට සියලු වැඩ අත්හරී. සාමාන්‍යයෙන් කුස්සියේ කුණු එකතු වන්නේ මුල්ලකටය. පසුදා ඒ කුණු කොළපොතකට එක් කොට ඉවත් කිරීම සිදුවෙයි. අවුරුද්දට වැඩ අත්හරින විට සියලු කුණු එකතු කරන ගෘහිණිය ඒ කුණු පරණ කුල්ලට දමයි. ඒ මත පරණ අවුරුද්දට අතු ගෑ ඉලපත තබයි. ඒ මත අලුත් අවුරුද්ද වෙනුවෙන් පිසින ලද කොණ්ඩ කැවුම්, මුං කැවුම්, කොකිස් ආදී කැවිලිවලින් එක බැගින් තබයි. ඇය කුල්ල රැගෙන ගොස් වත්තේ පාළු තැනකට දමා එයි. ඇය එය පුදන්නේ අපේ ගම් පළාත්වල නම් මීදුම් අම්මාටය. සත් කෝරලය පැත්තේ නම් කුණු මුත්තාටය. සීනාදී සිව්කෝරලේ නම් අළු බොක්කාටය. පළාතෙන් පළාතට නම වෙනස් වෙයි. එහෙත් අද වන විට ඉඩම්කඩම් කුඩා කැබලි බවට පත්ව ගිය හෙයින් ඒ සිරිත නොකෙරෙන තරමිය.

පුණ්‍ය කාලය නමින් නොනගතය හැඳින්වෙන්නේ කිසිදු සුබ කටයුත්තක නොයෙදෙන එකී කාලයේ ගමේ විහාරය කරා ගොස් පින්දහම් කරන්නට යෝග්‍ය බැවිනි. කුස්සියෙන් නිවාඩු ලද ගෘහණියෝ ළමා ළපටීන් සමඟ විහාරයට යති. ළමයින්ට කෙළි සෙල්ලම් සඳහා ඉඩකඩ ලැබුණත් නොනගතයේදී පොත්පත් කියවන්නටඉඩකඩ නොලැබේ. ළමයි එකතු පහදු වී පංච කෙළිති. ඔළිඳ කොලොම්බුවේ ඔළිඳ කෙළිති (මෙය ගැහැනු ළමයින් හා තරුණියන් සහභාගී වූවකි). නෙරෙංචි පෙතේ නෙරෙංචි අදිති. එළිමහන් ක්‍රීඩා ද තිබෙයි. ගුඩු කෙළිය, වළකජු, එල්ලේ කෙළිය ආදිය ගැළපෙන්නේ එළිමහනටය. එළිමහනේ බඳින ඔංචිල්ලාව දින ගණනක් එලෙසම තිබෙයි. ගමේ කතුරු ඔංචිල්ලා බැඳෙයි (කතුරු ඔන්චිල්ලා පදින්නෝ පිරිමි වෙති. ගැහැනුන්ට ඊට ඉඩ නැත). මීට අමතරව ඇතැම් පෙදෙස්වල බඹර ඔංචිල්ලා තිබිණි. පානම්පත්තුව පැත්තේ තෙරුක් ඔංචිල්ලා තිබිණි. කොහොමටත් නොනගත කාලයේ මෙන්ම අවුරුදු සමයේත් ගමම කෙළිදෙළෙනි.

පන්සලේ සණ්ටාරය නද දෙන හඬ ඇසෙයි. ඒ හාම උණ වෙඩි හා බීරංග හඬ ඇසෙයි. ඒ ආහාර පිසීමේ නැකත ආරම්භ වූ බව කියන්නය. ගෘහිණිය නැකැතට කුස්සියේ ගිනි දල්වා කිරිබත හා හත්මාළුව පිස ගැනීමට යුහුසුලු වෙයි. කිරි කජු මුල් කර ගෙන මෑ, වම්බටු, කොට දිඹුල, කොස්ඇට, තම්පලා කොළ, වට්ටක්කා දලු, කහට දලු ආදියෙන් පහසුවෙන් සපයා ගත හැකි දෑ සොයාගෙන හත්මාළුව පිළියෙල කෙරේ. කොහොමටත් අවුරුදු සමය කජු එල දරන සමයයි. එදවස අවුරුද්දට ආහාර වේලක් දෙන විට කිරි කජු මාළුව අනිවාර්ය වෙයි.



අවුරුද්දේ විචිත්‍රවත්ම අවස්ථාව ආහාර අනුභවය, ගනුදෙනු කිරීම හා වැඩ ඇල්ලීමේ නැකැතයි. ඇතැම් පෙදෙසක නැකැතට අනුභව කරන්නට පෙර අවුරුදු කුමාරයාට හා පිරිවරට කෑමබීම හා කැවිලි එළියෙන් තබා නැකතට පහන් දල්වන සිරිතක් තිබිණි. කෙසෙල් කොළ ගොටු දෙකක් තනා එකක් උසින් ද අනෙක පහතින් ද තැබේ. සියලු කෑම බීම හා කැවිලි ගොටු දෙකට දමයි. උසින් ඇති ගොටුව අවුරුදු කුමරුටය. පහතින් ඇති ගොටුව ඔහු හා එන පිරිවරටය.

මේ සිරිත නොතිබෙන පළාත්වල ද පහන් පැලක් ගෙයි ඉදිරිපිට තනා ගෙහිමියා අතින් දැල්වීම සිදුවෙයි. නැකතට අනුභව කරන විට පැදුරු එළා පවුලේ දරු දැරියෝ බිම හිඳ ගතිති. ගෘහිණිය කිරිබත්, හත්මාළුව මෙන් ම කැවිලි ද ගෙන එයි. පවුලේ අයට ආහාර බෙදා දෙන්නේ ගෘහපති තැනය. (ළමයින්ගේ පියා හෝ අත්තා) සියල්ලෝ නියමිත දිශාව බලා ආහාර අනුභව කරති. ඊළඟට වැඩ ඇල්ලීමේ කටයුත්තයි. ගේ ඉදිරිපිට සිටුවා ඇති කිරි ගහකට (කිරිගහ වෙනුවට කල්තබා කොස් අත්තක් සිටුවා ගැනේ). කොටා කැත්තෙන් ද වළක් කපා එල දරන පැළයක් රෝපණය කිරීමෙන් උදැල්ලෙන් ද වැඩ අල්ලයි. ළමා ළපටි පොතපත කියවීමෙන් වැඩ අල්ලති.

බුලත් කොළ මත තැබූ කාසිවලින් පවුලේ සෙස්සෝ ගෘහපති තැන සමඟ ගනුදෙනු කරති. ගෘහිණිය ළිඳ සමඟ ගනුදෙනු කරයි. ඇය මිරිස් කරලක්, දුරු වර්ග ස්වල්පයක්, වී ඇට ටිකක් සමඟ රෙදි කැබැල්ලක ගැට ගැසූ කාසියක් ළිඳට දමයි. අනතුරුව ළිඳෙන් පුරවා ගත් වතුර බෝතලයක් ගෙට ගෙන යයි. ඒ ඊළඟ අවුරුද්ද උදා වන තුරු ගෙයි තබන්නය.

ඒ එදා සිංහල අවුරුද්ද ගැන සංක්ෂිප්ත විස්තරයකි. මෙදා සමරන අවුරුදු කුමාරයා නොව වෙළෙඳ ආකල්ප තනන්නන් මත ගොඩනැගුණු අවුරුද්දක් නොවේ.

**මහානාම දුනුමාල**

# බද්දර මල්ල

සතියේ 'තුනපහ' මඩිස්සලේ



## ටොම්සන් මහත්තයා

## දේශපාලන හස්තය

ටොම්සන් මහත්තයා සාලයේ සිට 'හොක් හොක්' ගා සිනා සෙන හඬ ඇසුණු උන්නැහේද, ඇම්බන් මහත්තයාද සාලයට දිව ආහ.

"මොකද ටොම්සන් මහත්තයා... මොකක් හරි කෑමක් වැරදිලා වගේ ද? තනියම හිනා වෙන්නේ...?" කියා ඇම්බන් මහත්තයා ඇසුවේය.

ටොම්සන් මහත්තයා නැවතත් 'හොක් හොක්' ගා තනිවම සිනා සුණේය.

"හරි හරි ඉතින් හොක් හොක් ගගා ඉන්නේ නැතිව කියන්නකෝ කාරණේ මොකක්ද කියලා..." කියා උන්නැහේ ඇසුවේය.

"හරි... උන්නැහේ මං මේ කියන කතාව අහලා උත්තරයක් දෙන්න. දැන් ඕං ඉස්කෝලෙයක් තියෙනවා. ඒකේ ලොක්කා තමයි විදුහල්පති. ඉස්සර නම් ප්‍රධානාචාර්ය... නැතිනම් ලොකු මහත්තයා කියමුකෝ. ඉස්කෝලේ වත්ත වටේට වැට කැඩිලා... කොයි වෙලාවේ හරක් ඉස්කෝලේ වත්තට පනියිද දන්නෙ නෑ..."

"වැට කැඩෙන කොට හදා ගන්න එපායැ...." කියා ඒ සැරේ උන්නැහේ 'හොක් හොක්' ගා සිනා සුණේය.

"එහෙම නෙවෙයි උන්නැහේ... වැට හදා ගන්න ඕනෑ තමයි.. ඒ වුණාට වැට කැඩිලා නේ... ඉතින් ලොකු මහත්තයා මුර කාරයාට කතා කරලා කියනවා ඉක්මනට වැට හදාගන්ඩ. අනික් එක හරක් පනින්නත් පුළුවන් කියලා. හැබැයි මුර කාරයා වැට හදන්නේ නෑ... ඉතින් එක දවසක් ඉස්කෝලේ වත්තට හරක් පැනලා..."

"එහෙනං ඉතිං ඉස්කෝලේ වත්තේ වගාව ඔක්කොම ඉවරයි...! අනේ අපොයි...!" කියා ඇම්බන් මහත්තයා කීවේය.

"එහෙම වගාව විනාශ වුණා කියමුකෝ. ඉතින් මේ කාරණේ පොලීසියට ගිහින් කියන්නේ ලොකු මහත්තයාත් නෙවෙයි. අර මුරකාරයා... ඉතින් පොලීසියෙන් ඇවිල්ලා ලොකු මහත්තයාගෙන් අහනවා... මේ ගැන..."

"නියමයි... එහෙම තමයි වෙන්න ඕනෑ... ඉතින් ලොකු මහත්තයා මොකක්ද කීවේ...?" කියා උන්නැහේ ඇසුවේය.

"ඒක තමයි නියම උත්තරේ... ලොකු මහත්තයා කියනවා මං මුරකාරයාට කිව්වා වැට හදන්න කියලා.. අනික හරක් පනියි කියලත් කිව්වා... ඉතින් මගේ වැඩක් ද වැට හදන එක... අනික හරක් පනින කොට මට ද කියන්නේ ගිහින් උන් එළවන්න කියලා..."

උන්නැහේ සාලයේ මැද්දට පැන කරණමක් ගැසුවේය.

"මේවා තමයි නියම ආතල්... අනේ ඉතින් ලොකු මහත්තයා කියන්නේ මොකක්වත් කරන්න දන්නේ නැති, මොකක්වත් තේරෙන්නේ නැති තොත්ත බබෙක් නේ..."

ටොම්සන් මහත්තයා ගෙයින් පිට වී එළියට බැස්සේය. ඇම්බන් මහත්තයා ද ඒ පස්සෙන් වැටුණේය.

"මට නං ඔය රස්තියාදු ගහන්න එන්න විදිහක් නෑ... මට වැඩ තියෙනවා..." කියා උන්නැහේ ගෙදර නතර වුණේය.

ටොම්සන් මහත්තයා ඇම්බන් මහත්තයාත් සමඟ ඇවිද ගෙන ගියේය.

"අර ගමේ කතාවක් තියෙන්නේ... හතර බීරි කතා කියලා... ඒ වගේ තමයි මේ සමහර කතාවල් ඇහුණාම." කියා ටොම්සන් මහත්තයා ඇවිද ගෙන යන ගමන්ම කීවේය.

"ඇයි ටොම්සන් මහත්තයා... මොකක්ද ඒ හතර බීරි කතාව..." කියා ඇම්බන් මහත්තයා ඇසුවේය.

"ඒකට හතර බීරි කතාව කියලා කිව්වත් මදි වගේ... වෙන විදිහක කතාවක් ඒකට හොයා ගන්න ඕනෑ... ඇම්බන් මහත්තයා දැක්ක ද පත්තරේ තිබුණා, අගරදගුරු තුමාගේ කතාව පිටිපස්සේ දේශපාලන හස්තයක් තියෙනවා කියලා කවුද කියලා තිබුණා." ටොම්සන් මහත්තයා බොහොම බරතපළ ලෙස කීවේය.

"දැක්කා... දැක්කා... මේ වෙලාවේ තමන්ගේ එකා බේරා ගන්න එපායැ... ඒකනේ සත්ගුණවත්කම කියන්නේ... වෙන මොනවා කරන්න ද? තමන්ගේ එකා බිල්ලට දෙන්න පුළුවන් ද? බෑ නේ... "ඇම්බන් මහත්තයා කෝචොක් එකට සිනා සෙමින් කීවේය.

"මොකක්ද බිල්ලට දෙනවා කියන්නේ...? බිලි පූජාවක් තියෙනවා ද?" කියා ටොම්සන් මහත්තයා ඇසුවේ බස් නැවතුම් පොළේ අසුනක හිඳ ගනිමිනි.

"බිලි පූජාවක් තමයි... දැන් ඉතින් බිලි පූජාව ඉවරයිනේ... දැන් ඉතින් බිලි පූජාව කරන කල් සද්ද නැතිව මඟ ඇරලා ගිය අය බේරා ගන්න ක්‍රමයක් හොයා ගන්නත් එපා යැ..."

බස් නැවතුම් පොළේ හිඳ ගෙන සිටි වයසක මහත්තයෙක් ටොම්සන් මහත්තයා දෙසට හැරී කතාව මැද්දට පැන්නේය.

"මොන බිලි පූජා ද ටොම්සන් මහත්තයා... ඇත්තටම දැන ගෙන හිටියා නම් එහෙම බිලි පූජා වෙන්න දීලා මඟ ඇරලා යනවා ද? නෑ නේ... ඉතින් අහිංසක මිනිස්සුන්ට දොස් කියන්න එපා... ඇල් වතුරත් නිවලා බොන ජාතියේ අහිංසක මනුස්සයෙක්..."

ටොම්සන් මහත්තයාත්, ඇම්බන් මහත්තයා ද වයසක මහත්තයා දෙස හැරී බැලුවෝය.

"අපොයි... අහිංසක නේන්නම්... ඔය බණ කතාවලත් තියෙන්නේ අහිංසක කෙනෙක් ගැන.. ඒ වගේ තමයි.. නැද්ද මං අහන්නේ..?" කියා ඇම්බන් මහත්තයා කීවේය.

"නෑ නෑ... එහෙම අහිංසක කෙනෙක් ගැන නෙවෙයි මං කිව්වේ... දැන් බලාගෙන ගියාපුවාම මේ ඔක්කොම පිටුපස්සේ තියෙන්නේ දේශපාලන හස්තයක් නේ..." කියා වයසක මහත්තයා කීවේය.

"මට ඒක නම් තේරුණේ නෑ... මොකක්ද පිටුපස්සේ දේශපාලන හස්තයක් කියන්නේ..." කියා ඇම්බන් මහත්තයා ඇසුවේය.

"දේශපාලන හස්තයක් තමයි.. නැති නම් අර රදගුරු තුමා අර වගේ කතාවක් කියන්නේ නෑ නේ... ඒ කතාව පිටුපස්සේ තියෙන්නේ දේශපාලන හස්තයක් නැති නම් වෙන මොකක් ද?" කියා වයසක මහත්තයා බොහොම සැරෙන් ඇසුවේය.

"මට නම් තේරෙන්නේ එහෙම නෙවෙයි..." කියා ටොම්සන් මහත්තයා කීවේය.

"ඇයි? මොකක්ද තේරෙන්නේ? කිව්වා නම් අපටත් අහ ගන්න..." කියා වයසක මහත්තයා ඇසුවේය.

"මේකනේ මහත්තයා... මොකක් ද පිටුපස්සෙන් දේශපාලන හස්තයක් කියන්නේ... ඉස්සරහිනුත් තියෙන්නේ දේශපාලන හස්තයක් තමයි... හතර පැත්තෙන්ම තියෙන්නේ දේශපාලන හස්ත තමයි... මොකද මේක එහෙම පිටින්ම දේශපාලන සත්තු සම්බන්ධ වෙච්ච් බිලි පූජාවක් නේ..." කියා ටොම්සන් මහත්තයා කීවේය.

"මට ඕකේ තව පැත්තක් හිතෙනවා" කියා ඇම්බන් මහත්තයා කීවේය

"ඒ මොකක්ද ඇම්බන් මහත්තයා...?" කියා ටොම්සන් මහත්තයා ඇසුවේය.

"පොඩි ඉස්පිල්ලකුයි කොම්බුවකුයි විතරයි වෙනස් කරන්න ඕනෑ... මේක පිටුපස්සේ ඉන්නේ දේශපාලන හස්තියෙක් වෙන්නත් පුළුවන්..." කියා ඇම්බන් මහත්තයා 'හොක් හොක්' ගා සිනා සුණේය.

**බන්දුල පී. දයාරත්න**



# කළු මුහුදු තීරයේ ලියවුණු සොඳුරු මිතුදම

සාගරය, ගංගා, ඇළ-දොළ, ගහ-කොළ සහ වන සතුන් පිළිබඳ ලියවුණු නිර්මාණාත්මක කෘතිවලින් ලෝක සාහිත්‍යයට අඩුවක් නැත. එසේ කියන විටම අපගේ සිතට නැගෙන විශිෂ්ට සාහිත්‍ය කෘති කීපයක් නම් හෙමිංවේගේ 'මහල්ලා සහ මුහුද', ඕර්වල්ගේ 'සත්ත්ව ගොවිපළ' කිප්ලිංගේ 'වන කතා', ජැක් ලන්ඩන්ගේ 'වන පෙත හඬ ගසයි' සහ ස්ටැන්ඩිෂ්ගේ 'අලි පාර' ය.

පද්‍ය හෝ ගද්‍ය වශයෙන් ප්‍රකාශිත මේ ශානරයට අයත් නිර්මාණ තුළ දක්නට ලැබුණු පොදු තේමාව වූයේ මිනිසා සහ සොබාදහම අතර පැවති සබඳතාවයය. එහිදී ඒ ලේඛකයෝ සංත්‍රාසය, කුතුහලය, වික්‍රමාන්විත බව මෙන්ම මිනිස් සිතේ ජනිත වන ප්‍රේමය, කරුණාව, ශෝකය වැනි හැඟීම් ද විචිත්‍ර ලෙසත්, ගැඹුරු ලෙසත් ඉදිරිපත් කිරීමෙහි යෙදුණහ.

පද්‍ය සාහිත්‍යයෙන් නිදර්ශනයක් ගත හොත්, අමෙරිකානු කිවිවර රොබර්ට් ෆ්‍රොස්ට්ගේ 'හිම වැටෙන සැඳෑවක, වන පෙතක් අසල' (Stopping by woods on a snowy evening) නමැති යුග යුග සම්භාවිත නිර්මාණය දැක්විය හැකියි. ඉන් කියවෙන්නේ හිම පතිත වන සවස් කාලයක වන ගත විල් තෙරක් අසල අසු පිට නැඟී බලා සිටින්නකු තුළ ඇති වන හැඟීමකි. බැලූ බැල්මට මෙය සරල කවි පෙළක් සේ පෙනී ගියත් එය නැවත නැවත කියැවීමේදී ගැඹුරු අරුතක් මතු කර ගත හැකි වෙයි.

ෆ්‍රොස්ට්ගේ කවි පෙළ නිමා වන්නේ 'නින්දට පෙර ගෙවා යා යුතු දුර බොහෝ' යැයි (And miles to go before I sleep) කියමිනි. ඉන් ඉඟි කෙරෙන්නේ දිවි ගමන නිමාවීමට පෙර, කළ යුතු දේ බොහෝ බවය. ඒ කළ යුතු දේ කුමක් ද? ආත්ම විමුක්තිය සෙවීම ද? ආධ්‍යාත්මික පාරිශුද්ධතාවක් අත්පත් කර ගැනීම ද? රසිකයාට, එම පැදියේ යටිපෙළ තුළින්, බොහෝ දේ උකහා ගත හැකිය.

ගම්බද ජීවිතය සොබාදහම, පරිසර වර්ණනා ආදිය දැක්වෙන කවි එකල හැඳින්වුණේ ගැමි කවි හෝ ගොපලු කවි (Pastoral poetry) නමිනි. ඉන් බොහෝවක් හුදු වදන් සිතුවම් වූ නමුදු, ඇතැම් කවි තුළින් මිනිසාගේ ආත්මීය හුදෙකලාව හා සුනරුත් දිවි පෙවෙත ද මතු කෙරිණි. එඩ්මන්ඩ් ස්පෙන්සර්, රොබර්ට් හෙරික්, ජෝන් මිල්ටන්, මැතිව් ආර්නල්ඩ් හා ෂෙලී ආදීන්ගේ කාව්‍ය ඊට නිදසුන්ය.

ප්‍රබන්ධ සාහිත්‍යයෙහි ද, ගැමි-ගොපලු ශානරයක් තිබිණි. ඇතැම් විට ඒවා නාගරික දිවියෙන් කලකිරීමට පත් වූවන්ගේ අතීතකාමී ආවර්ජනයක් විය. වර්තමානයේ පවා සිංහලට පරිවර්තනය වන බටහිර ගොවිපළ ආශ්‍රිත කතා ද ඊට නිදසුන්ය.

පරිසරය හා මුසු වෙමින් ළමා විය හා යොවුන් විය තුළ මෝදු වන සියුම් හැඟුම් තේමා කර ගත් කාව්‍යමය, කුඩා නිර්මාණ ද විශ්ව සාහිත්‍යය තුළ දක්නට ලැබෙයි. මීට දශක දෙකකට පමණ ඉහත ගුවන්විදුලි සංස්ථාවේ අධ්‍යාපන සේවය සඳහා මම එබඳු කතා රැසක් නාට්‍ය ස්වරූපයෙන් රචනා කළෙමි [ඉන් තෝරා ගත් නාට්‍ය කීපයක් 2010 දී 'මාන කොකා' (ගොඩගේ ප්‍රකාශන) මැයින් ප්‍රකාශයට පත් කෙරුණි].

ඊට ඇතුළත් වූ එක් කතාවක් වූයේ සෝවියට් - රුසියානු ලේඛකයකු වූ සර්ගේයි අලෙක්සිවිච් වොරොනින් (Sergei Voronin) ගේ 'ගන්ටියාඩි' ය (Gantiadi: කළු මුහුදු තීරයේ පිහිටි නගරයකි). මා එය නම් කළේ කතාවේ තේමාවට අදාළ වන සේ 'හක්බෙල්ලා' යනුවෙනි.

සිය මව සමඟ කෙටි නිවාඩුවක් ගත කිරීමට ගන්ටියාඩි නමැති මුහුදුබඩ නගරයට එන නටාෂා නමැති කුඩා දැරියකට, වෙරළේ ක්‍රීඩා කරමින් සිටින කෝල්යා නමැති කුඩා පිරිමි ළමයකු මුණ ගැසෙයි. ඔහු එම පෙදෙසෙහිම ජීවත් වන්නෙකි. නටාෂා නගන කුතුහලාත්මක ප්‍රශ්නවලට පිළිතුරු ලැබෙන්නේ කෝල්යාගෙනි.

පළමු දිනයේ මුහුදු වෙරළට යන නටාෂා කෝල්යා ඇතුළු කොලු රැනක්, රළපතර අතරේ පිහිනමින් විනෝද වන සැටි ආශාවෙන් බලා සිටී. මොහොතකට වෙරළට එන කෝල්යා, දුර සිට බලා සිටින නටාෂාට ද පිහිනීමට එන මෙන් කතා කරයි.

මුහුදු රළ උණුසුම්ය. නාන ඇඳුමින් සැරසී සිටින නටාෂා ද මවගෙන් අවසර ගෙන රළ අතරට යයි. කෝල්යා ඈතට පිහිනා යයි. එක්වරම දිය යටින් එන අඳුරු සෙවණැල්ලක් වැනි දෙයක් දකින නටාෂා බිය වෙයි. ඒ මත්ස්‍යයකු විය හැකිය. මත්ස්‍යයා, නටාෂාගේ පාදයකින් අදී. ඈය බියපත්ව ගොඩට එයි. පාදයෙන් අදින්නේ කෝල්යාය. එහෙත් ඒ බවක් නොපවසන ඔහු දැරිය බියපත් කරයි.

"ඔයාගෙ පස්සෙන් ආවෙ මෝරෙක්. මම මගේ පිහියෙන් ඇන්නම ඌ ආපහු ගියා."

"මේකෙ මෝරු ඉන්නව ද?"

"නෑ මං විහිළුවට කිව්වේ."

කෝල්යා ආපසු මුහුදට යයි. ඈත ගල්පරයක් වෙත යන ඔහු දිය යට නොපෙනී යන්නේ නටාෂා තුළ බියක් ජනිත කරමිනි. මොහොතකින් යළි මතු වන ඔහු නටාෂා වෙත එන්නේ තරමක් ලොකු හක් බෙල්ලකු රැගෙනය. එය නටාෂා අත තබමින් ඔහු මෙසේ පවසයි:

"මේ හක් බෙල්ලෙක් කොපෙක් දහයක් විතර වටිනවා. ලොකු එකෙක් කොපෙක් විස්සකට දෙතෑකි."

"ඔයා මේවා එකතු කරන්න ද ගල්පරය දිහාට යන්නෙ"

"ඔව්, මං මේවා විකුණලා 'ඇක්වලන්ග්' එකක් ගන්නයි යන්නෙ (Aqualung : මුහුද යට කිමිදීමේදී හුස්ම ගැනීමට භාවිත කරන උපකරණයකි).

ඒ අසන නටාෂා හක් බෙල්ලා නැවත, කෝල්යාට දීමට සැරසෙයි. "එපා, ඕක ඔයාට. ඔය හක් බෙල්ලා කනේ තියලා බලන්න."

ඈය, එය කනේ තබා ගනී. ඉන් මුහුදේ නොනවතින හඬ බඳු ඒකාකාරී ශබ්දයක් ඇසෙන්න වෙයි.

මේ අතර කෝල්යාගේ වැඩිමල් සොහොයුරා එතැනට එයි. ඈත මුහුදේ කිමිදීමට යෑම ගැන ඔහු කෝල්යාට දොස් කියයි. නටාෂා අත ඇති හක්බෙල්ලා දකින ඔහු මෙසේ පවසයි:

"එහෙනං ඔයා හින්දයි මෙයා කිමිදෙන්න ගිහිං තියෙන්නෙ. ඒ වැඩේ මෙයාට හොඳ නෑ. නිකං මුහුදෙ කිමිදුණාම කන් ඇහෙන්නෙ නැතුව යනවා; කන් දෙකෙන් ලේ ගලන්න ගන්නවා."

"අනේ, මම නෙවෙයි මෙයාට කිමිදෙන්න කිව්වෙ, ආ... මේක මට එපා..."

නටාෂා හක් බෙල්ලා ආපසු දීමට සැරසෙයි. කෝල්යා ඈතට දිව යයි.

නටාෂා හා මව දින කීපයක් ගන්ටියාඩිහි නතර වීමේ අදහසින් ආ නමුදු ඔවුන්ට හදිසියේම ආපසු යෑමට සිදු වන්නේ, රාජකාරියකට දුර පළාතකට ගොස් සිටි පියා එය කලින්ම අවසන් කළෙන්, පෙරළා නිවෙසට එන බව දැන්වීම නිසාය.

දුම්රියෙන් ආපසු යන අතරේ, නටාෂා කෙමෙන් අඳුරේ ගිලෙන මුහුද දෙස බලා සිටී. ඈය තම ගමන් මල්ලෙන් හක්බෙල්ලා පිටතට ගෙන එය කනේ තබා ගනී. ඉන් නැගෙන හඬත් සමඟ, පෙළින් පෙළ නැගෙන මුහුද රළ සේ, නොයෙක සිතිවිලි ඈ තුළ උපදින්නට වෙයි. හිරු රැස් වතළ මුහුදු රළ, උණුසුම් වෙරළ, සිතාගත නොහැකි තරම් ගැඹුරු මුහුදු පත්ල හා එහි ඇති විසිතුරු දෑ දුඹුරු ඇස් ඇති දඟකාර පිරිමි ළමයි රංචුව. කෝල්යාගේ තෑග්ග මුහුදු උපකරණය ගැනීම අමතක කර, ඔහු ඈයට හක් බෙල්ලා තිළිණ කළේ ඇයි? බිහිරිවීමට ඇති අවදානම පවා නොතකා, ගැඹුරු දියේ කිමිද, හක්බෙල්ලන් සෙවූයේ ඇයි? හක් බෙල්ලා තුළින් නොනවතින නාදයක් නැගෙන්නේ කිම ද?

මව කල්පනාකාරිව පසු වන දියණියගේ මුහුණ සිප ගනී.

"දුවේ... හොඳ වෙලාවට අපට මේ කෝච්චිය අල්ල ගන්න ලැබුණේ. ඒ නිසා ඉක්මනටම තාත්තව බලන්න පුළුවන් වෙයි. ඒ ගැන හිතන්න."

නටාෂා නිහඬය. ඒ ගත වූ දින දෙක-තුනේ ඇසූ දුටු දෑ ගැන ඈයට බොහෝ දේ කල්පනා කිරීමට ඇත.

සර්ගෙයි වොරොනින් නවකතා දෙකක් ද කෙටි නව කතා හා කෙටි කතා සංග්‍රහ 6ක් ද, ළමා කතා ද රචනා කළ, 1940-60 කාලය තුළ, සෝවියට් සාහිත්‍ය ක්ෂේත්‍රයේ ජනප්‍රියත්වයක් ඉසිලූ ලේඛකයෙකි. ඔහුගේ ප්‍රථම කෙටිකතා සංග්‍රහය වූයේ 1947 දී පළ වූ 'Meetings' (හමුවීම්) ය. 1956-64 කාලය තුළ ඔහු 'නෙවා' (Newa) නමැති මාසික සාහිත්‍ය සඟරාවේ සංස්කාරක වශයෙන් ද කටයුතු කළේය.

වොරොනින් සිය ප්‍රතිභාව වඩාත් දැක්වූයේ කෙටි නවකතා හා කෙටි කතා තුළදී බව විචාරකයින්ගේ ද අදහස විය. ඉහත දැක්වූ 'ගන්ටියාඩි' වැනි කෙටිකතාවකදී ද මතු වන්නේ ඉතා සුළු දෙයකින් කාව්‍යාත්මක කතා සංකල්පයක් නිර්මාණය කිරීමට ඔහු තුළ වූ හැකියාවය. එහිදී ඔහු පාඨකයාට සිතන්නට යමක් ඉතිරි කරයි. 'ගන්ටියාඩි' කතාවේ එන 'හක්බෙල්ලා' කුඩා ගැහැනු ළමයකු හා පිරිමි ළමයකු අතර ඇති වන කෙටිකාලීන මිතුදමක් පිළිබඳ සංකේතයකි.

ලියවන පට්ටල් යාන්ත්‍රිකයකු, දුම්රිය මාර්ග ඉංජිනේරුවරයකු හා පත්‍ර කලාවේදියකු වශයෙන්, විවිධ වෘත්තීන්හි යෙදීමෙන් ලද අත්දැකීම් ඇති, වොරොනින් බොහෝ රුසියානු ලේඛකයන් මෙන්ම, සෝවියට් දේශය පුරා සංචාරයට ද කාලය වැය කළ කෙනෙකි. පරිසර වර්ණනාවෙහිදී වොරොනින් දැක්වූ දක්ෂතාවට ද ඔහුගේ සංචාරක ජීවිතයේ අත්දැකීම්, උපකාරී වන්න ඇත. එක් විචාරකයකු සඳහන් කළ අන්දමට සොබාදහම හා ඈයගේ කඳුවැටි, ගංගා, වැව් ආදි නිර්මාණ ගැන වර්ණනයේදී වොරොනින් 'වදන්' නමැති වර්ණ යොදා ගන්නා සිත්තරකු බවට පත් වෙයි. ඔහු ලියූ 'Farewell to the Forest' (වන ගැබින් සමු ගැන්මක්) ඊට මනා නිදසුනකි.

එසේම, ඔහුගේ 'Man in a Storm' නව කතාවේදී කුණාටුවකට හසු වන මිනිසකු ඊට මුහුණ දෙන නිර්භීතභාවය තේමා කර ගනු ලැබේ.


ප්‍රේමය ද, වොරොනින්ට විෂයය විය. ගැහැනියකට දක්වන ප්‍රේමය, මවකට දක්වන ප්‍රේමය මෙන්ම දේශප්‍රේමය ද ඔහුගේ කෘති තුළ පිළිබිඹු විණි.


සර්ගේයි වොරොනින්ගේ සාහිත්‍ය නිර්මාණ කිසිවක් සිංහලයට පරිවර්තනය වී නැතැයි සිතමි (මා 'ගන්ටියාඩි' ද සිංහලට නැඟුවේ, ගුවන් විදුලි නාට්‍යය පිටපතක් ලෙසිනි). අපට ඔහු කියවන්නට ලැබුණේ, ඉංග්‍රීසියෙන් වුව ද, කෙටි ප්‍රබන්ධයෙහිදී (minor prose) දක්වා ඇති ප්‍රතිභාව එතුළින් ද දැනෙයි. විශේෂයෙන් ම ඔහු එහිදී සමකාලීන රුසියානු ජන ජීවිතයෙහි ඇති සොඳුරු තැන් මෙන්ම සියුම් තැන් ද සාහිත්යික සමීප රූපයකට නංවා, පාඨක මනසට ප්‍රක්ෂේපණය කරයි.

**කපිල කුමාර කාලිංග**

## උඩුපෙළ සහ යටිපෙළ






## කවි කොළම



### අපොයි ඕකිව කොටිය කාපං!

කොළොම්තොට යන බසයෙ මං හිටි
අසුන කෙළවර පහසුවෙන් හිඳ
එබී ජංගම තිරේ පීරන
පුන් සඳක් මං ඇහින් දුටුවා
ඇගේ රතු තොල් හිනැහි හිනැහී
කාට දෝ මොනවද කියද්දී
අනේ ඒ හුරතලේ දැකලා
මගේ සිතුවිලි දෙගොඩ තැළුවා
මැදින් බෙදලා දෙපැත්තට දැමූ
අක් බඹරු කෙස් වැටිය හදමින්
ටිකක් ළා රතු ඒත් පියකරු
ඇස් කොනින් මට බැල්ම හෙළුවා
ඇගේ බැල්මේ වෙළී පැටලී
ගෙවූ තප්පරයෙනුත් කාලට
හිතේ පෙම්බර හැඟුම් ඉතිරී
කැලති කැලතී දෝරෙ ගැලුවා

ගෙවූ තිස් අවුරුද්ද ඇතුළේ
ගනින්නට බැරි තරම් ගණනක්
කෙල්ලො පස්සෙන් ගිහින් තිබුණත්
හරි ගියේ නෑ එකක්වත් මට
මගේ ලග්නෙට සිකුර උච්චලු
උදේ ටීවී එකෙත් කීවා
මේක වත් හරි ගියොත් සත්තයි
මඟුල් කනවා කියල ගමකට
ඇඳේ මෙට්ටෙත් හද්ද පරණයි
එයා කොහොමද ඒකෙ ඉන්නේ
ටිකක් වැඩි ගානක් ගියත්
අරගන්න ඕනෑ එකක් අද හෙට
සිනිඳු පාටයි දෑතෙ දසැඟිලි
හුරුත් නැතුවැති ගෙදර වැඩපොළ
උයන පිහිනා රාජකාරිත්
හොඳ වෙලාවට හුරුයි නෙවැ මට

හෙල්ලි හෙල්ලිම සීරුමාරුවෙ
බස් ටිකට් එක අරන් අතකට
නොම්බරේ නොවැරදී ලිවුවේ
ලේසි-පාසුවකින් නෙවෙයි මං
කරේ එල්ලූ දුඹුරු මල්ලේ
කොනට වෙන්නට රැඳවූ තුණ්ඩුව
බලන් හිටියේ ගනී කියලා
ඇගේ සියුමැලි අතට දැන් දැන්
මල්සරා මේ සැරේ විද්දේ
වැරදි තැනකට නෙවෙයි වාගේ
නොම්බරේ ඈ අතට ගත්තා
දෙයියො බලලා වගේ යන්තම්
දේව මණ්ඩලයටම පින් දී
බලපු ඩිංගට හැරිල ආයෙත්
වීසි කෙරුවා නේද තුණ්ඩුව
අපොයි ඕකිව කොටිය කාපං

**දිල්රූ ජයසේකර**

# බද්දර මල්ල

සතියේ 'තුනපහ' මඩිස්සලේ

# හඳ දකින, කොහා හඬ ඇසෙන කවීන්ට ගම-රට සිහි වේ...





නිර්මාණකරුවා තම අත්දැකීම් නව්‍ය අත්දැකීම් ලෙස ප්‍රතිනිර්මාණය කරන්නේ අපූර්ව ගුණයෙන් යුතුවය. ප්‍රතිභාන්විත නිර්මාණකරුවා විසින් තම පරිකල්පනය ඔස්සේ තමන්ගේ නිර්මාණයට අදාළ ප්‍රකාශන මාධ්‍යය තුළ මවනු ලබන නිර්මාණ රසික ජනයා වෙත ප්‍රදානය කරනු ලබන්නේ ඊට පෙර දැක ඇති අසා ඇති විඳ ඇති ජීවිතානුභූතියකින් ඔබ්බට ගිය රසයක් විඳ ගැනීමට හැකි වන අයුරිනි. සියුම් කලා මාධ්‍යයක් කවියෙහිදී අපූර්වත්වය අත්‍යවශ්‍යම ගුණයක් වන්නේ පිළුණු වූ නීරස අත්දැකීම් රැගත් නිර්මාණ කෙරෙහි රසිකයන් රුචියක් නොදක්වන බැවිනි. අපූර්ව ගුණය මතු කර ලීමෙහි ලා කවියාගේ භාෂාව, සංකල්ප රූප මැවීමෙහි නිපුණත්වය කාව්‍යෝක්ති නිර්මාණය ආදි ලක්ෂණ විශද කෙරෙන නිර්මාණ පාඨකයන් විසින් වැළඳ ගනු ලබන්නේ ඔවුනට ඉන් රසයක් මෙන්ම ඥාණයක් ද ලැබෙන බැවිනැයි සිතමි. මෙවර තීරුවට අපූර්ව ගුණයෙන් හෙබි කාව්‍ය රචනා දෙකක් පිළිබඳ සිහියට නැගුණේ ඒ නිර්මාණ ද්වයෙහිම අත්දැකීමෙහි සාම්‍යයක් ඇති බැවිනුත් ඒවායේ රසය අද වුවත් විඳ ගැනීමට හැකි අයුරින් කවියට නැඟී ඇති නිසාත්ය. විප්‍රවාසයක ජීවත් වන හෝ කාලයක් ගත කරන්න සිදු වන පුද්ගලයකු සිත තුළ තම උපන් මව් රට තමන්ගේ දූදරුවන් සැමියා හෝ බිරිඳ, නෑදෑ හිත මිතුරන් ගහ කොළ සතා සීපාවා සිහියට නැගෙන්නේ නිතැතිනි. එවන් මොහොතක ඔවුන්ට අත් විඳීමට සිදුවන හුදෙකලාව පාළුව මෙලෙස කවියට නඟනු ලැබ ඇත්තේ අපගේ විශිෂ්ටතම කවියකු හා කලාකරුවකු වන මහගම සේකර හා සම්මානිත කවියකු විචාරකයකු හා පරිවර්තකයකු වන විමල් දිසානායක විසිනි.

1970 දී පළ වූ 'බෝඩිම' කවි එකතුවෙහි එන 'හඳ හා නිව්යෝර්ක් නුවර' කාව්‍ය රචනය මෙන් ම 2002දී පළ කොට ඇති 'නාගල කන්ද' කවි එකතුවෙහි හමු වන අවුරුදු දා කාව්‍ය නිර්මාණය ද අප සිත් ගන්නේ එහි අන්තර්ගතයෙන් ප්‍රකටවන අත්දැකීමෙහි සර්වකාලීන අගය නිසාය. නවීන නිර්මාණයක් ලෙස නැවත නැවතත් රස විඳින්න හැකි ගුණයෙන් මේ නිර්මාණ ද්වයම අනූනය. සේකර කවියා නිව්යෝර්ක් නුවරට ගිය අවස්ථාවක දී ද විමල් දිසානායක කවියා හොංකොං පුරවර ජීවත් වූ සමයෙහි ද මේ කාව්‍ය ඔවුන් විසින් රචනා වන්නට ඇත.

**කළු ගැහී තරගයට ඉගිළ ගිය**
**සිමෙන්ති බිත්ති මිසක**
**ඇසට නිලට**
**අහසක් ගහක් කොළක්**
**අවටක් නැත.**
**නිව්යෝර්ක් නම් පුරවර**
**සියක් මහල් එක්ටැම් ගෙය මුදුනේ**
**දොර ජනේල වසා සිර කළ කාමරයක**
**ඇඳක් - පුටුවක් - මේසයක්**
**මම**

කථකයා අත් විඳින හුදෙකලාව පාළුව පිළිබඳ විසල් චිත්ත රූපයක් එක්වරම සිතෙහි ඇඳේ. ඇසට හුරු පුරුදු නිල්වන් අහස, ගහ කොළ සියක් මහල් තුඟු මේ එක්ටැම් ගෙයි මුදුනට කෙසේ පෙනෙන්න ද?

ඇඳක්, පුටුවක් හා මේසයක් මැද ඔහු තනි වී සිටිනු අපට පෙනේ.

**මහ පොළොවෙ අනිත් පැත්තෙ**
**සෙනෙහැති දෙමාපියන්**
**නෑ මිතුරන් අඹු දරුවන්**
**මට සිහි වෙයි**
**පලවන්නට මළ පාළුව**
**කවියක් හඬ නගා කියමි**
**නින්නාදව ආපසු එයි මගෙ කටහඬ**
**මගෙ කනටම**
**යා යුතු අතක් නොදැන**

ඔහුට අඹු දරුවන් හිත මිතුරන් නෑසියන් සිහි වේ. එහෙත් ඔවුන් සිටින්නේ ලොව ඈත කෙළවරය; මුදු හතක් එහාය. මේ පාළුව විඳ දරා ගත නොහෙන තන්හි ඔහුට පුරුදු කවියක් මහ හඬින් කීවත් එය කුටිය තුළම නින්නාදව ආපසු ඔහු කනටම එයි. ඔහු කවුළුව හැර බලයි. ඔහුට අත් විඳින්නට සිදු වන්නේ කුමක් ද? සීතල කඩා පනින්නේ මූණට කටු ඇනගෙනය. එය දරා ගත නොහෙන රිදුමකි.

**කවුළුව හැර එබී බලමි**
**ප්‍රපාතයට එබී බලමි**
**මූණට කටු ඇන ගෙන**
**සීතල කඩා පනින**

වාහන මොර දී ගෙන යන්නේ ඉවසිල්ලකින් තොරවය. කුහුඹුවන් වැනි මිනිස් යන්ත්‍ර ඒ මේ අත දිව යයි. මග තොට දී හමු වී නැවතී ඔහු සමග ආදරයෙන් බලන කිසිවකු, තොරතුරු විමසන කෙනෙක්, දන්නා අඳුනන්නෙක් මෙහි නොවේ. ඔවුන් සියල්ලන්ම සිටින්නේ ලොව අනිත් කෙළවරේය; ගව් ගණනක් දුරු කතරය.

**අසු වී විදුලි එළිය පිටාරයට**
**මොර දී ගෙන යයි වාහන ඒ මේ අත**
**ඉවසිල්ලක් නොමතිව**
**දිව ගෙන යයි ඒ මේ අත**
**කුරා කුහුඹු මිනිස් යන්ත්‍ර**
**මොහොතක් නැවතී මා දෙස**
**ආදරයෙන් බලන කෙනෙක්**
**වගතුග අසන කෙනෙක්**
**දන්නා අඳුනන්නෙක්**
**මෙතැන නොමැත**
**ඒ හැම දෙන මහ පොළොවේ**
**අනිත් පැත්තෙ**

## ඒ දවස සොඳුරුමය

**මට සිහි වෙයි**

ඔහු ඉහළ අහස දෙස බලන්නේ දුකකිනි. පුදුමයකි. ඔහුගේ පාළුව තනිකම සැණින් මැකී යයි. කුමක් ද මේ අරුමය? නිව්යෝර්ක් නුවර ආකාසයේ පායා ඇති හඳ ඔහු දකී. කෙබඳු හඳක් ද? රන් පිඟානක් සේ දිලිසෙමින් පායා ඇති හඳ ඔහු දන්නා හඳුනන ගමේ වෙල් එළියට, පෝයදාට බෝ මළුවට පායන හඳයි.

**මහා දුකින් ඉහළ බලමි**
**දිලිහි දිලිහි ආකාසේ**
**රන් පිගාන සේ**
**හඳ**
**මා දන්නා අඳුනන**
**අපේ ගමේ වෙල් එළියට පායන හඳ**
**පෝයදාට බෝ මළුවට පායන හඳ**

කථකයාගේ තනිකම පාළුව මැකී යන්නේ ඔහුට දන්නා හඳුනන මිතුරකු හමු වූ කලක මෙනි. ගමේ වෙල් එළිය, පෝයදාට බෝ මළුවට පායන හඳ ඔහුගේ ජීවිතයට සමීපය. ඒ හඳම නොවෙ ද නිව්යෝර්ක් නුවර දී ඔහු දකින්නේ?

විමල් දිසානායක කවියා හොංකොං පුරවරයේ ජීවත්ව සිටියදී විඳි අත්දැකීමක් වැන්න 'අවුරුදු දා' නම් මේ නිර්මාණය. සේකර කවියා මෙන් නොව විමල් දිසානායක කවියා විප්‍රවාසයේ ජීවත් වන්නෙකි. කලබල නගරයෙහි රිය හඬ මැද, පා හඬ මැද පුර ගොස මැද දුර අහසින් ඔහුට ඇසෙන හඬකි. ඔහුට ඒ හඬ හුරු පුරුදුය. හඬ නගන විහඟ කොහි සිට හඬන්නේ දැයි ඔහු විමසා බලයි. ඔහු හඬ හඳුනා ගනී.

**රිය හඬ මැද**
**පා හඬ මැද**
**පුර ගොස මැද**
**දුර අහසින්**
**කොහාගෙ හඬ**
**සවනෙ වැකෙයි**
**හිස ඔසවා**
**බලමි යුහුව**
**පෙනෙන්ට නැත**
**කිසි විහඟෙකු**
**යළිත් ඇසෙයි**
**කොහාගෙ හඬ**

**හොංකොං පුර**
**ගැබ මේ ලෙස**
**නද දෙන්නේ**
**කොහා මෙලෙස**
**කොහි සිටදැයි**
**විමසමි මම**

කොහාගේ හඬ ඔහුගේ මතකය අවදි කරයි. කොහාගේ හඬ ඇසෙන්නේ බක් මාසයේ අවුරුදු උලෙළ දා බව ඔහුට සිහි වේ. කැවුම් කොකිස් සුවඳ ඔහුට දැනෙන්නේ චීන අවන් හල් අතරිනි. ළමා ළපටි හඬ පවා. කිනම් උත්ප්‍රාසයක් ද? චීන අවන් හලකින් කැවුම් කොකිස් සුවඳ නැඟීම?

**කැවුම් කොකිස්**
**සුවඳ නැගෙයි**
**චීන අවන්**
**හල් අතරින්**
**ළපටි සිනා හඬ පැතිරෙයි**

අවුරුද්ද සංකේතවත් කරන සියල්ල කථකයාට සිහි වේ. රතු පාට එරබදු මල් විකසිත වන්නේ ඔහු සිතෙහිය. අවුරුද්ද සමග අලුත් සරම්, අලුත් කමීස හැඳගෙන වෑ කන්ද උඩින් පන්සල් යන පොඩි දරුවන් ගේ රූ ඔහු සිතෙහි මැවෙයි. ඔවුන් අතර කථකයාත් වේ දැයි විපරම් කොට බලයි.

**හද තුළ මා**
**විකසිත වෙයි**
**එරබදු මල්**
**පොට්ටු පොට්ටු**
**රත් පැහැයෙන්**
**ලොව පුබුදා**

**අලුත් සරම්**
**අලුත් කමිස**
**හැඳ ගෙන වැකන්ද උඩින්**
**පන්සල් යති පොඩි දරුවෝ**

**ඔවුන් අතර**
**මාත් ඇද්ද**
**කුහුල් සිතින්**
**දෙනෙත් යොමා**
**බලමි බලමි**
**විපරම් කර**

ඔහු දකින පොඩි දරුවන් අතර කථකයා වේ දැයි බැළු මුත් ඔහු හමු නොවේ. එහෙත් මුව පුරා සිනා සෙමින් ඔහු දෙස බලා සිටින ඔහුට හුරු පුරුදු නාගල කඳු මුදුන ඔහු දෙස බලා සතුටින් හිස සොලවනු දකී. නාගල කඳු මුදුන ඔහු හඳුනා ගෙන නොවේ ද?


**මුව පුරාම**
**සිනා සෙමින්**
**හිස සොලවයි**
**ම දෙස බලා**
**නාගල කඳු**
**මුදුන තුටින්**

**චීන මුහුණු**
**චීන වචන**
**අතර මෙලෙස**
**කොහාගෙ හඬ**
**මතු වන හැටි මට පුදුමයි**

එතෙර රටක කලක් ගත කළ සේකර කවියාට මෙන්ම එතෙර රටක දිගු කාලීනව ජීවත් වන විමල් දිසානායක කවියාගේ අත්දැකීම්හි අත්තේ අපට හුරු පුරුදු සමීප බවකි.

නාගල කඳු මුදුන හිස් සලා තුටින් සිනා සෙන්නේ කථකයා හඳුනා ගෙන යැයි සිතීම අපූරු සංකල්ප රූපයකි. එය ගම සංකේතවත් කරන වස්තුවකි. චීන මුහුණු, වචන මැද කොහාගෙ හඬ මතු වුණේ කෙසේදැයි කථකයාටම ප්‍රශ්නයකි. ඒ හඬ නොවේ ද කථකයාගේ කල්පනා ලොව ගම රට වෙත කැඳවාගෙන ගොස් ඇත්තේ? මහගම සේකර හා විමල් දිසානායක කවීන්ගේ නිර්මාණ ඔස්සේ ජීවිතය දෙස නව ඇසකින් දකින්න, බලන්න අපට කරනු ලබන ඇරියුම තුළ මතු වන අතීතකාමී හැඟුම් අප සිත් පැහැර ගනී.




**බුද්ධදාස ගලප්පත්ති**

# සර්පයන්ගෙන් පරිස්සම් වෙමු!

අල්ලපු ගෙදර ලොකු කලබලයක්. වත්තෙ වැඩ කර කර හිටපු තාත්තට සර්පයෙක් දෂ්ඨ කරලා. සිහි කල්පනාව හොඳින් තිබුණත් තාත්තා හිටියේ හොඳටම බය වෙලා. කෙනෙක් රෙදි පටියක් තුවාලය තියෙන තැනට උඩින් තදට ගැටගැහුවෙ විස පැතිරෙන එක නවත්තන්න කියලා. තව කෙනෙක් කිවුවේ තුවාලයේ තියෙන විස දන්න කෙනකුට කියලා උරවන්න ඕනෑ කියලා.

සර්පයෙක් දෂ්ඨ කළාම වැදගත්ම දේ තමයි කලබල නොවී ඉන්න එක. මොකද සර්ප දෂ්ඨනයකදී ලෙඩාට කරදරයක් වෙන්න නම් සර්පයා විෂ සහිත වෙන්න ඕනෑ වගේම ඒ විෂ ලෙඩාගෙ ඇඟට ඇතුළු වෙලා තියෙන්න ඕනෑ.

ඒ නිසා ලෙඩාව බලාගන්න අතරෙ දෂ්ඨ කරපු සර්පයා අඳුන ගන්න හරි අල්ල ගන්න හරි පුළුවන් නම් ගොඩක් හොඳයි.

ලංකාවටම ඉන්නෙ උග්‍ර විෂ සර්පයෝ හත් දෙනයි. නයා, තෙල් කරවලා, මුදු කරවලා, තිත් පොළඟා, වැලි පොළඟා, කියන පස් දෙනයි, ඊට අමතරව කුණකටුවා සහ වාලක්කඩියා.

මේ අතරිනුත් වාලක්කඩියා එහෙම නැත් නම් මුහුදු නයාගේ දෂ්ඨ කිරීම් වාර්තා වෙලාම නැති තරම්.

සර්පයා හඳුනා ගන්න බැරි වුණොත් ලෙඩා ඉස්පිරිතාලෙකට ගෙනියන කල් සර්පයා විෂ සහිත එකෙක් කියලා හිතාගෙන වැඩ කරන එක තමයි හොඳ. දැන් බලන්න ඕනෑ සර්ප දෂ්ඨනයකදී අප මොනවද කරන්න ඕනෑ, ඒ වගේම නොකරන්න ඕනෑ කියලා.

මුලින්ම ලෙඩාට කතා කරලා එයාගෙ බය නැති කරන්න. තුවාලය තියෙන්නේ අතක හරි කකුලක හරි නම් ඒ අත හරි කකුල හරි හෙලවෙන්නේ නැතුව තියා ගන්න පුළුවන් නම් හොඳයි. ඒකට පොඩි ලී පතුරක් වගේ දෙයක් තියලා බඳින්න පුළුවන් නම් තවත් හොඳයි.

මොකද අත පය හෙලවෙන කොට ලේ ගමනාගමනය වැඩි වන නිසා ඇඟ ඇතුළට විෂ යන්න තියෙන ඉඩ-කඩ වැඩි වෙනවා.

හැබැයි කිසිම වෙලාවක තුවාලයට උඩින් තදින් ගැටගහන එක වත් තුවාලය පළලා ලේ අයින් කරන එක වත් කරන්න හොඳ නෑ. ඒකෙන් ලෙඩාගෙ තත්ත්වය නරක අතට හැරෙන්න පුළුවන් වගේම ගොඩක් වෙලා ගැට ගහලා තිබ්බොත් අතට හරි කකුලට හරි ලේ යන එක අඩු වෙලා ඒ අත හරි කකුල හරි කපන්න වෙන්නත් පුළුවන්.

තුවාලය සබන් ටිකක් දාලා ගලා යන වතුරෙන් සේදුවාම හොඳටම ඇති.

ලෙඩාට වේදනාව තියෙනවා නම් පැරසිටමෝල් පෙති දෙකක් දුන්නට කමක් නෑ. හැබැයි ඒ ඇරෙන්න වෙන කිසිම බෙහෙතක් දෙන්න එපා.

වැදගත්ම දේ ලෙඩාව පුළුවන් තරම් ඉක්මනින් ඉස්පිරිතාලෙකට අරගෙන යන එක. හැබැයි සර්පයෙක් දෂ්ඨ කලාම කරන දේ දැනගන්නවට වඩා වැදගත් වෙන්නෙ සර්ප දෂ්ඨනයක් වෙන්න කලින් ඒක නවත්ත ගන්න එක.

ලංකාවෙ සර්ප දෂ්ඨන ගොඩක් වෙන්නෙ වගා කරන්න ගිහින්, කැලෑ කිට්ටුව. ඉතිං හුරු පුරුදු නැති වුණත් පුළුවන් හැම වෙලාවකම මොකක් හරි ආරක්ෂිත පාවහන් දෙකක් ඒ කියන්නෙ බූට් සපත්තු දෙකක් දාගෙන ඉන්න එක හරිම වටිනවා.

අඩි පාරක යනවා නම් පාරෙන් එළියේ තියෙන උස පන් ගොල්ලවලට නොයා පාර

දිගේම යන එක හොඳයි. ඒ වගේම දිග ලීයක් වගේ දෙයකින් අවට තියෙන තණකොළ පඳුරුවලට තට්ටු කරන්න පුළුවන් නම් සර්පයින් ඉන්න තැනින් ඈතට යවන්න පුළුවන්.

රෑ පයින් ගමන් යනවා නම් හොඳ එළියක් අරගෙන යන්න. වැසිකිළිය තියෙන්නේ ගෙදරට දුරින් නම්, පුළුවන්කමක් තියෙනවා නම් මොකක් හරි එළියක් පත්තු කරලා තියන්න.

ගෙදර ඇතුළේ වගේම ගෙදර ළඟ සර්පයන්ට ඉන්න පුළුවන් තැන්, ඒ කියන්නේ පිදුරු ගොඩවල්, උළු ගඩොළු ගොඩවල්, අඩු කර ගන්න. නිඳන පැදුරු තියෙනවා නම් දවල්ට ඒවා වහලේ එල්ලලා තියන්න පුළුවන් නම් හොඳයි.


ගේ ඇතුළේ මීයො ගෙම්බො වගේ සත්තු ඉන්න එක අඩු කර ගන්න. උන් පස්සෙ එන සර්පයෝ හදිස්සියට ගෙදර අයට දෂ්ඨ කරන්න පුළුවන්. එහෙම කළොත් අපට පුළුවන් වෙයි රටක් හැටියට සර්ප දෂ්ඨන අඩු කර ගන්න. ඒක ඉසිපිරිතාලෙට ඇවිත් අමාරුවෙන් ජීවිතේ බේරා ගන්නවාට වඩා ගොඩක් ලේසි වෙයි.











**නුවන් තොටවත්ත**



# හෙට කරුවල ද දන්නෙ නෑ

## මතක පොතෙන්

මං හිටියෙ බලාගෙන. ජනේලෙ ඇරිල, කරුවරත් වැටිල. ඒත් ඉන්නෙ මං මඟ බලාගෙනමයි. දහය පහුවෙද්දි දොරගුළු වැටුණා. කළුවර වැඩි වුණා තවත්. දුවව තුරුළු කරන් වැටුණා මං මහ නින්දකට.

ජයන්ත ගිහින්. කොහේටද? කා ළඟට ද? කිරිඳිවැලට නෙවෙයි මහිතෙ. දැන් අලුත්ම ඉසව්ව කඳාන.

ඇගේ නම ප්‍රින්සි. නඩත්තු නඩුවකට කතා කරන්න ගිය වෙලාවකයි මුණ ගැහිල තියෙන්නෙ ඇයව. ඈ වැඩ කෙරුවෙ නීතිඥ මහත්තයගෙ ලේකම්වරිය විදියට

ප්‍රින්සිට සලකනව නීතිඥ මහත්තය හොඳට. හැන්දෑවකට හෝටලේකට. සති අන්තයට ඈත දුරක, පොඩිත්තක් විවේකීව සන්සුන් සිතින් ගත කරන්න. නීතිඥ මහත්තයගෙ ආදරණීය බිරියටවත්, දෙදරුවන්ටවත් මේ වගෙ සුන්දර අවස්ථාවක් නං ලැබිල නැතුවැති. ලේකම්වරියට තමයි හැම සකලමනා පින්සාර පුදපෙත් ලැබෙන්නෙ.

දැන් දැන් ඒ වාසිය පොඩ්ඩකට කණපිට පෙරලිච්ච ගානයි. මොකද්දෝ මන්දා හේතුවකට ප්‍රින්සිට දැන් හිතක් පහළ වෙලා පවුලක් පන්සලක් වෙන්න. ජයන්ත මහත්තයට දැන් ඕනෑ අවුරුදු ගානක් තිස්සෙ ඔඩුදිව්ව කොටි වලිගෙන් ගැලවෙන්න. ප්‍රින්සිගෙ ලොකු මහත්තය නං මේ වගෙ නඩුවලට කප් ගහපු මනුස්සයෙක්. නඩුව භාර දුන්නෙ හරිම බලුපොරොත්තු ගොඩක් එක්ක. නඩත්තු නඩුවෙන් නිදහස් වෙලා පුළුවන් ජයන්තට පරණ කසාදෙ කටු ගාන්න. ප්‍රින්සිටත් ආවෙ තවත් ආදරණීය හැඟීමක් ජයන්ත ගැන. නීතිවේදියා එක්ක තියෙන ගනුදෙනුව අකාමකා දාලා අලුත්ම අලුත් කැදැල්ලක් හදන්න පුළුවන් වෙයි ජයන්තත් එක්ක.

හරි අපූරු සද්දන්ත රූපකායක් තියෙන්නෙ ජයන්තට. කලින් බැංකුවකත් වැඩ කරපු මහත්තයෙක්. ප්‍රින්සි දවස් ගැන්නේම ඔහුත් එක්ක එක නිවහනකට ගොඩ වදින්න. ඒ හීනෙ නං වැඩිකල් නොයාම එකලාසයක් වේවි.

නීතිවේදියාගේ ආදරණීය සහකාරිය,

ඔහුගේ ලේකම්වරිය; අහස උසට බලාපොරොත්තු පොදි බැන්දා. කොච්චර ආදරයක් තිවුන ද කිව්වොත් ජයන්තට තියෙන පරණ බයිසිකලය විකුණලා අලුත් හොණ්ඩා එකක් අරන් දෙන්නත් ප්‍රින්සි මුදල් දුන්නා ජයන්තට. අලුත් 'බයික්' එක මෝටර් වාහන කාර්යාලයෙ ලියාපදිංචි

වුණේ නම් මගෙ නමට.

නඩු දිනය උදා වුණා. රුපියල් විසි පන්දාහක වන්දියට යටත්ව කසාදෙ කටුගෑවුනා. ප්‍රින්සි කඳානෙ දුම්රිය පටුමගේ අලුත් ගේකට ගියා පදිංචියට තනි නොතනියට හිටියෙ අම්මා.

මෙහෙම යනව තව ටික කාලයක්. මං හිටියෙ මඟ බලාගෙනම අද එයි ද හෙට එයි ද කියල, ජයන්ත.

හිටියෙ එතකොට මට චූටි දුව විතරයි.

තවත් දවසකදි ආවා ප්‍රින්සි ජයන්තව හොයාගෙනම. එදාත් ඔහු ගෙදර හිටියෙ නෑ. මං විතරයි.

"කව්ද ඔයා?" "

මං ප්‍රින්සි. දන්නව ඇතිනෙ මාව." "

අහල තියෙනව." "

එහෙමද ?

" "ඇයි ආවෙ ඉතින්?"

"ආවෙ ජයන්තව බලන්න."

"ටික දවසක ඉඳං මෙහේ නෑ.

ඩිවෝස් එක හරිනෙ දැන්." "අපි ඉන්නෙ මැරි කරන්න. කිව්වෙ නැද්ද ඔයාට?" "

ඒකෙ මට කියන්න තරං වැදගත්කමක් නැතුවැති." "

අහ්..එහෙමද?

පුළුවන් ද එයාගෙ ඇඳුම් ටික මට දෙන්න?" "

ඇඳුම්!!ඔයාට මොනවටද කාගෙවත් ඇඳුම්?" "

එයා මං මැරි කරන්න ඉන්න එක්කෙනා.

මට තියෙනව ඉල්ලන්න අයිතියක්." "

එහෙනං අයිතිකාරයත් එක්කම ඇවිල්ල ගෙනියන්න." "

එහෙමද? දන්නව ද මං වැඩ කරන්නෙ සුප්‍රිම් කෝට් එකේ ලෝයර් කෙනෙක් ගාව." "

ඔයා කා ළඟ වැඩ කළත් මට මොකද?" "

හරි මං හෙටම එන්නං එයත් එක්කම."

කොණ්ඩෙ ලස්සනට කපපු හැඩකාර ලේකම්වරිය ඇගේ විලවුන් සුවඳ විතරක් දොරකඩ ඉතුරු කරල උස් පාවහන් පද්දමින් ඉවත යන හැටි බලන් හිටියෙ මගෙ පුංචි දුව විතරයි.

තවත් දින දෙක තුනක් ඇවෑමෙන් ජයන්ත ආවා ගෙදර. මං හිටියෙ මොකුත්ම නොදන්න ගාණට.

"යන්තං අවුරුදු ගානක් ඇදල ඇදල ඔන්න මට හම්බ වුණා ඩිවෝස් එක." "

කොච්චර දෙයක් ද?" "

ඒක නේන්නං. දැන්ම මට බෑ කාවවත් බඳින්න. තව තුන් මාසයක්වත් යන්නෝන."

"එතකොට එහෙනං අර සෙකට්‍රි ආවෙ මොනවට ද ඔයාව හොයාගෙන?" "

ආ! ඒකි ආවද මෙහේ?" "

ඔව් ආවෙ ඇඳුම් අරං යන්න ඔයාව බඳින්න කියල." "

ඇයි යකඩො මාව බඳින්න මගෙ ඇඳුම් මොනවට ද?" "

ඒව මං දන්නෙ නෑ. බඳින එක ඔයාගෙ කැමැත්ත." "

මේ මගෙන් මොකුත් අහගන්නැතුව ඉන්නව.....!"

ජීවිතේ තවත් සතියක් දෙකක් ගෙවීගෙන යනව.

තවත් සතියක මං ගෙදර එද්දි වැඩ ඇරිල; අපේ ගෙදර සෙටියෙ කුෂන් කවර කෑලි කෑලිවලට ඉරල. වැඩට අඳින මගෙ සාරි කපල දාල.

කවුද දෙයියනේ මේ වගේ අසික්කිත වැඩ කරන්නෙ? බලද්දි ජයන්ත අර කාන්තාවට කියල අපි යතුර හංගල තියන තැන. ඇය යතුර අරං ගෙට රිංගල මේ වින්නැහිය කරල. මදෑ ඔයිං ගියා

ජයන්ත එයාගෙ යතුරු පැදිය අරං හිටි පිම්මේම ගියේ ප්‍රින්සියි එයයි හිටපු ගෙදරට. ඉන් එහා දෙයක් අහන්ට ගියෙ නෑ මං. යද්දි ඒ කුලී ගෙදර නීතිවේදියාගෙ සැප පහසු වාහනේ නවත්තල. සාලය නිදහස්. පුංචි කාමරය නිදහස් අම්මත් ගෙදර නැතිලු. ප්‍රින්සිගෙයි ලෝයර් මහත්තයගෙයි ආදරය, ප්‍රේමය, ආනුරතිය ගලං යනව මහ කාමරේ හතර පැත්තෙන්. මහ සෝණා රීරි යකා අඬලන ඒ රාත්තිරි යාමයේ දි, ළඟම තිබ්බ්ච බූමිතෙල් කෑන් එක වැක්කෙරුව අර හීතල දියපිරුණු වතුර බොන ළිඳට.

ඒත් ඊළඟ පරිච්ඡේදය වඩාත් විඩාබර වුණේ මගේ කාර්යාලයට. නිර්නාමික කුණුහරුප ඇමතුම් ගණනාවක්ම ආවෙ මට.

ඊළඟ ජවනිකාව වුණේ යතුරු පැදියේ අයිතිය ලියා පදිංචි කරල තිවුනෙ මගෙ නමට. බයික් එකේ සල්ලි ප්‍රින්සිගෙලු රහස් පොලීසියේ හතරවෙනි තට්ටුවට මං කී පාරක් ගියා කියල ද සාක්කි දෙන්න.

මට තිවුනෙ මං දන්න ඇත්ත කියන්න විතරයි.

කාලය හෙම්හිටම ඇවිදගෙන යන්න ගියා. ප්‍රින්සිට බැරිවුණා පවුල් ජීවිතයක සුන්දර සිහිනයට මගේ දියණියගේ පියාව උගස් කර ගන්න.

ඈ මට කොතෙකුත් වෛර කරන්නට ඇති. ඈ මට කොතෙකුත් අවලාද කරන්නට ඇති. මං හිටියෙ මට හුරුපුරුදු රටාවෙන්. ඊළඟ අඩව්ව ජයත්ත කොතනින් අල්ලයි ද කියල කවුද දන්නෙ?

මං බලාගෙනම ඉන්නව පුරුදු විදියටම.

**ලක්ෂ්මී බෝම්බුවල.**

2021 අප්‍රේල් 20 අඟහරුවාදා
දිනමිණ
බද්දර මල්ල
සතියේ 'තුනපහ' මඩිස්සලේ



# අවුරුදු කුමාරි

අවුරුදු ඉවර වුණා. ලංකාව කියන දූපතට කිලෝමීටර හයදාස් ගාණක් ඈතින් තියෙන මහද්වීපෙක ජීවත්වෙන මට එරබදු පිපෙනවා පෙනුණෙ වත්, කොහා අඬනවා ඇහුණෙ වත් නෑ. ඒත් අවුරුදු කාලෙ කිට්ටු වෙනකොට අවුරුදු මතක එරබදු මල් වෙලා හිතේ පිපෙන්න පටන් ගත්තා. දුර ඈත ඉන්න අම්මා මතක් වෙලා හිත දුකින් පිරුණා. "අවුරුදු තියෙන්නෙ හිතේ". හිත නිවන කතාවක් මං මටම කියාගත්තා. ඒත් ඇත්ත ඒක නෙමෙයිය කියලා මගේ හිත දන්නවා. වාසනාවට මෙහේ අවුරුදු කැවිලි පෙවිලි හදන අඩුම කුඩුම මිලට ගන්න තිබුණා. ලංකාවෙ වගේම ඒ කැවිලි පෙවිලි හදන උදවියත් මෙහෙ ඉන්නවා. ඒ හන්දා "අවුරුදු" කියන නොස්ටැල්ජියානු හැඟීමෙන් ඇතිවෙන දුක යාන්තමට පිරියම් වෙනවා.

අවුරුදු කාලෙට ගම්වල වගේම නගරවල තියෙන අවුරුදු උත්සවවලත් අවුරුදු කුමාරි තරග තියනවා. ඉන ගාවට කොණ්ඩෙ තියෙන, රවුම් පැහැපත් මූණුවල අයිතිකාරියො වෙච්ච තරුණ ගෑණු ළමයි අවුරුදු කුමාරි තරගවල වේදිකාව උඩ ඇවිදිනවා. ඒ උදවියගෙන් වැඩිපුරම ගැමි උරුවෙ රූප සොබාවක් තියෙන ගෑනු ළමයා අවුරුදු කුමාරි කිරුළට අයිතිකාරකම් කියනවා. මං ජීවිතේ කවදාවත්ම අවුරුදු කුමාරියක් හැටියට කිරුළු පළඳලා නෑ. ඒ විතරක් නෙමෙයි කවදාවත්ම ආසාවකටවත් අවුරුදු කුමාරි තරගෙකට ඉදිරිපත්වෙලත් නෑ. ජීවිත කාලෙ පුරාවටම උරහිස ගාවට කොට කොණ්ඩයක් තිබ්ච්චි මං ඉස්කෝලෙ ලොකු පන්තිවලදි පවත්වපු අවුරුදු කුමාරි තරගෙක විස්තර විචාරය කළා මිසක ඊට එහායින් අවුරුදු කුමාරි තරග ගැන අත්දැකීමක් ලබලා නෑ.

හැම අවුරුදු උත්සවේකම අවුරුදු කුමාරි කිරුළ අයිති වෙන්නෙ වැඩිපුරම ලස්සන රූපවන්තිට නෙමෙයිය කියන එක බොහොමයක් ඇස් සාක්ෂි දරන කාරණයක්. ඉස්කෝලෙ කාලෙ අවුරුදු කුමාරි තරග තිබුනම අංශ භාර ටීචර්ගෙ දුව අවුරුදු කුමාරි වෙනවා. එහෙම වුණාම අංශ භාර ටීචර්ම හරිම සන්තෝසෙන් ගිහින් මල් පොකුරක් අතට දීලා ඔලුව ඉඹලා තමන්ගෙ දූට සුබ පතනවා. ගමේ අවුරුදු කුමාරි වෙන්නෙ ඉහළ පෙළේ තානාන්තරයක් දරන කෙනකුගේ නෑදෑයො වෙන ගෑනු දරුවෙක්. ඔහොම ඉහළට ඉහළට ගියාම ලංකාවෙ තියෙන රටේ හැමෝටම සහභාගි වෙන්න පුළුවන් අවුරුදු කුමාරි තරගෙ විතරක් ලස්සනම ලස්සන රූපවන්තිට කිරුළ අයිති වෙයිය කියලා හරියටම කියන්න බෑ.

ජීවිතේ සාධාරණ තීරණ ලැබෙන්නේ බොහොම අතලොස්සක් කරුණු කාරණාවලදි විතරයි. සාධාරණේ ඉෂ්ඨ නොවෙන තැන්වලදි නොදැක්කා වගේ ඇස් කන් පියාගෙන නොගැටී අයිනට වෙලා පාඩුවේ තමන්ගේ ගමන යන එක අසාධාරණ සිද්ධ වෙන බොහෝමයක් තැන්වලදි පරිණත උදවිය ප්‍රතිචාර දක්වන විදිහක්. එහෙම එකේ අවුරුදු කුමාරි තරගෙ විතරක් සර්ව සාධාරණ විදියට අහවර වෙයිය කියලා බලාපොරොත්තු වෙන එකත් ඇත්තටම සාධාරණ නෑ.

### ගොනල්ලි කතන්දර

අංශ ප්‍රධාන ටීචර්ගෙ දුව අවුරුදු කුමාරි තරගෙ දින්නාම අපි හැමෝම අත්පුඩි ගැහුවා. ළඟට ගිහිල්ලා එයාට සුබ පැතුවා. වාසනාවට කවුරුවත් එයාගෙ අතේ තිබ්බ්ච මල් පොකුර උදුරගෙන ගිහිල්ලා දෙවනියා වෙච්ච ගෑනු ළමයට දීලා "හුරේ....ඔයා තමයි දැන් පළවෙනියා" කියලා කියුවේ නෑ. ඒක හන්දා අපේ ඉස්කෝලේ නමට හානියක් වුණේ නෑ."අපෝ ඔය ඉස්කෝලෙට ළමයා දාන්න එපා. ඕකෙ ඉන්න ළමයි හරියට රණ්ඩු වෙනවා" කියලා රටේ උදවියට කතා වෙන්න නිමිත්තක් හැදුනේ නෑ.

අවුරුදු තිස්පහකට පස්සෙ ගිය අවුරුද්දේ වාසනාවන්ත දවසක ලංකාවේ කාන්තාවක් "ලෝක විවාහක රූ රජිණ" විදිහට කිරුළු පැළැඳුවා.

අවුරුදු තිස් පහකට පස්සෙ ලංකාවට ලැබිච්ච අභිමානය ගැන මිනිස්සු උදම් වුණා. හිතේ පතුලෙන්ම සන්තෝස වුණා. ඒත් ඊට අවුරුද්දකට පස්සෙ එයාම ලංකාව පාට කරපු අභිමානයේ පාට සෝදලා මූදට වීසි කරලා දැම්මා. ලෝක විවාහක රූපරාජිණී නෝනගේ මනාපෙට අනුකූලව ඊට පස්සෙන් පහු අවුරුද්ද වෙච්චි 2021 අවුරුද්දෙ ලංකාවෙ විවාහක රූ රජිණ තෝරපු නැති හන්දා උරණ වෙලා, දෙකේ පන්තියේ පොඩි ළමයෙක් කරන විදිහට රූ රජිණගේ කිරුළ ගලවලා දෙවැනියා වෙච්ච ගෑනු ළමයට පළඳවන්න තරම් "ලෝක විවාහක රූ රජින" නෝනා එඩිතර වුණා.

ඒ කතාව රේඩියෝවේ "අවාසනාවට ඇත්ත කතාවක්" වැඩසටහනේ ප්‍රචාරය වුණේ නැති උනාට,ලෝකේ පුරාම රූපවාහිනී නාලිකාවල ප්‍රධාන ප්‍රවෘත්තියක් හැටියට ප්‍රචාරය වුණා. "අනේ එයා කරපු වැඩේ සාධාරණයි. අසාධාරණේට විරුද්ධව නැගිටින්න ඕනෑ" කියලා සමහරු කිවුවා. ඒත් "බය නොවන්න අයියණ්ඩි මැරෙනා හැටි මං පෙන්නන්නම්" කියන මද්දුම බණ්ඩාර න්‍යාය හැමතැනටම ගැළපෙන්නේ නැති විත්තිය රූපරාජිණී නෝනා තරගෙට සහභාගී වෙන්න කලින් ඉගෙන ගත්තු පාඩම්වල තිබිලා නෑ.

ලෝකය පිළිගත්ත සම්මානයක් දිනාගත්තාම තමන් සන්නාමයක් වෙනවය. ඒ සන්නාමය රැකගන්න එක ප්‍රසිද්ධියේ තමන්ම පළඳවපු කිරුළ තමන්ගෙම අතින් ගලවලා අසාධාරණයට විරුද්ධව සිනා සපයන අරගලයක් කරනවාට වැඩිය රටට වැදගත්ය, කියලත් ඒ නෝනට කවුරු-වත් කියලා දීලා තිබුණේ නෑ.

එයාගේ වීර ක්‍රියාවේ ප්‍රතිඵලයක් විදිහට ලෝකේ අනිත් රටවල "ලංකාවේ කාන්තාවන්ගේ ප්‍රතිරූපය" හේදිලා ගියාට මං හිතන්නෙ එයාට රිදුණේ නෑ.

හයිය සිමෙන්ති බදාමවලින් නිමවෙච්චි නැති ඕනෑම ගොඩනැගිල්ලක් කොච්චර හැඩ පාට ගෑවත් පුංචි ස්වාභාවික විපතකින් බිමට සමතලා වෙලා යන විත්තිය ඉගෙන ගන්න පතපොතේ දැනුමම ඕනෑ වෙන්නෙ නෑ.

**දසුනි හෙට්ටිආරච්චි**

# කොහෝ නදත් එක්ක නිධානයක්

අවුරුද්දට පෙරම එරබදුමල් මෝදු මෝදු වුව ද කෝකිල කූජනය ඇසුනේ නැත.

"කොහාගෙ සද්දයක්වත් නෑ නෙ අම්මේ."

මැසිවිලි නගන්නේ අලුත් අවුරුද්දට අලුත් ඇඳුම් අඳින්නට, කැට ගසන්නට හා රතිඤ්ඤා දල්වන්නට පෙරුම් පිරූ බාලයාය. "කොහාට කොරෝනා ද මන්දා."යි ඔහුගේ නිවුන් සහෝදරයා ද ප්‍රශ්න කළේ ලතැවුලෙනි.

"තාමත් කොරෝනා වසංගතය හමාර වෙලා නැති බව මතක තියාගෙන තමා අපි කොයි දේත් කරන්න ඕනෑ." යි මම අනතුරු ඇඟවීමි.

කොල්ලන්ගේ එක බඳු මුහුණු අවපැහැ ගැන්වෙයි. එහෙත් හිස නගා ඈත මෑත බලන කල නෙක තුරු නව සළු පිළියෙන් සැරසෙන අලංකාරය දැකගත හැකිය. ලපල්ලෙන් ගැවසීගත් අතු ඉති මතින් මහත් ප්‍රභාවක් විහිදේ. ලෝකය භීතියෙන් හා කම්පනයෙන් සලිත කළ වසංගතයක වගක් නොදැන වගේ තුරුලිය පැරණි පත් බිම හෙලා නවමු ළදල්ලෙන් හැඩවැඩ වන අපූරුව. මංගල්‍යයක අසිරියෙන් මදකුදු වෙනස් නොවන බක්මහ අරුමැසිය මනුස්ස අප තුළ පමණක් නොව සතා සීපාවා තුළද ජනිත කරන්නා වූ ප්‍රබෝධයට ඉමක් කොණක් නැත්තා සේය.

මීගමුව දිස්ත්‍රික් මහ රෝහලේ වෛද්‍ය තරුෂි පෙරේරා දියණිය සහ හලාවත මහා රෝහලේ වෛද්‍ය හසිත ලක්මාල් ජයවර්ධන දැලබණ්ඩාර පුතණුවන් නිසාම දැන හඳුනාගත් අකිලා නදීශානී බණ්ඩාර වෙතින් ලද සුභාරංචියෙන් මම ප්‍රමුදිත වීමි.

"අලුත් අවුරුද්දට අලුත් පොතක් තෑගි කරනවා. අපේ C.K මීඩියා ලංකා ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය මගින්. ඇත්තටම අපි නත්තලටත් මේ විදියට පොත් තෑගි කළා. මේ සංකල්පය පිළිබඳව ස්තුතිවන්ත වෙන්න ඕන දිනේෂ් විජයවංශ ට."



ඇඳුම් පැලඳුම් තෑගි දීමේ සම්මත ආකල්පයෙන් ඔබ්බට යමින් පොතක් තෑගි දීම ද පැලයක් සිටුවීම ද අලුත් අවුරුද්දේ අනිවාර්ය අංගයන් බවට එක් කර ගන්නේ නම් කොතරම් ඵලදායක ද?

රුහුණ විශ්ව විද්‍යාලයේ හිටපු කථිකාචාර්ය (ඉතිහාස අධ්‍යයන අංශය) රිවිර පුවත්පතේ ප්‍රධාන කර්තෘ චන්දන කාරියවසම් මහතා C.K මීඩියා ලංකා ප්‍රයිවට් ලිමිටඩ් ප්‍රකාශන ආයතනය ආරම්භ කරන්නේ 2019 වසරේ දීය. විදේශගතව සිටිමින් ඊට උපකාර කරන රොහාන් මිරිහාගල්ල හා දිනේෂ් විජයවංශ තරුණ මහත්වරුන් දෙපළ ද සිහිපත් කළ යුතුය.

### කැදැල්ලක නෙත

"අපි කටාන ප්‍රදේශයේ දහම් පාසලකටත් පොත් තෑගි කළා. මේ පොත් තෑගි දීම මීට වඩා විධිමත්ව, ඒ කියන්නේ පාසලක් එවැනි යම් ස්ථානයක් තෝරා ගෙන පොත් රාක්ක හා අල්මාරි එක්කම ලබා දෙන්නයි අපි සැලසුම් කරන්නේ."

අකිලාගේ ජීවයෙන් පිරුණු හඬ දුරකථනය ඔස්සේ ගලා එද්දී "අභියෝගත් ඇති නේද? ඕන පදම්." මම අතුරු ප්‍රශ්නයක් නැගුවෙමි.

"අභියෝගත් ආශිර්වාදයක් කරගන්න පුළුවන්, ධෛර්යවන්ත මිනිස්සුන්ට. අලුත් සංකල්පවලට බිය විය යුතු නැහැ. හෙමින් වුණත් අලුත් සංකල්ප කරා ඇදී එන අපේ සමාජය දුෂ්කරයි කියා අත්හැරිය යුතු නෑ කිසිවක්." ඇය කියන්නේ සැබෑවකි. නව ලෝකයේ නව දැනුම කරපින්නා ගෙන පෙරට යාමේදී ගතානුගතිකත්වය සමග අභියෝග සහ දුෂ්කරතා ද අරගලයක් සේම ආශිර්වාදයකි.

"අපට වුවමනා කරන්නේ සාම්ප්‍රදායික පොත් කලාවෙන් බැහැර වෙලා නව සංකල්ප සමග හුදු ව්‍යාපාරික ලාභයම අරමුණු කර නොගෙන යම් මෙහෙවරකුත් කරන්න."

අකිලා නදීශානී බණ්ඩාර සමග කළ පිළිසඳර හමාර වීමෙන් පසුව ද මා කල්පනා කළේ නව අදහස් සහ ආකල්ප නව ලෝකයක් බිහි කරන්නට කොතෙක් නම් ඉවහල් වන්නේ ද යන වගයි. C.K මීඩියා ලංකා ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය මගින් කරනු ලබන සත්කාරය උදෙසා සහාය වන නන්දා කුමාරි, ගීතානි අර්චනා, ජයසංඛ ප්‍රනාන්දු, අරෝෂ පූර්ණ, අනුහස් මාලන් සහෘදයන් ද ගෞරවාදරයෙන් සිහිපත් කරමි.

මේ පැරණි ලෝකයට අවශ්‍ය වන්නේ නව අදහස් මිසක සුපුරුදු අච්චුවේම සිරගතව සිටින්නන් නොවේ. ගහකොළ නව පත් දරන්නාක් මෙන්ම මිනිසා ද නිබඳ නව සංකල්පනාවන් උදෙසා තෝතැන්නක් විය යුත්තේය.

**ශාන්ති දිසානායක**

බද්දර මල්ල
සතියේ 'තුනපහ' මඩිස්සලේ
සංස්කරණය - දිල්රූ ජයසේකර

'බද්දර මල්ල' ගැන ඔබේ අදහස් අපට කියන්න
'බද්දර මල්ල', දිනමිණ, අංක 35, ලේක් හවුස්,
ඩී.ආර්. විජයවර්ධන මාවත, කොළඹ 10.
baddaramalla@lakehouse.lk

2021 අප්‍රේල් 20 අඟහරුවාදා කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 35 දරන ස්ථානයේ පිහිටි ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසින් මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.